208 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 208 - இல. 8
**Volume 208 - No. 8**

2012 මැයි 25 වන සිකුරාදා
2012 மே 25, வெள்ளிக்கிழமை
**Friday, 25th May, 2012**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
පීඩිත ජනතාවට සහන

**ශෝක ප්‍රකාශය:**
ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා

**කල් තැබීමේ යෝජනාව:**
පුරාවස්තු සහ නිධන් වස්තු  කොල්ල කෑම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
பாதிப்புற்ற மக்களுக்கு நிவாரணம்

**அனுதாபத் தீர்மானம் :**
மாண்புமிகு அநுருத்த ரத்வத்தே

**ஒத்திவைப்புப் பிரேரணை:**
தொல்பொருள் மற்றும் புதைபொருட் கொள்ளை

---

# PRINCIPAL  CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Relief for Suffering Masses

VOTE OF CONDOLENCE:
Hon. General Anurudha Ratwatte

ADJOURNMENT MOTION:
Looting of Artefacts and Treasure Hunting

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 මැයි 25 වන සිකුරාදා***
*2012 மே 25, வெள்ளிக்கிழமை*
*Friday, 25th May, 2012*

***අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.30 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන්, 2010 වර්ෂය සඳහා සේවක අර්ථ සාධක අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කම්කරු හා කම්කරු සබඳතා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
மனுக்கள்
PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මහතා - පැමිණ නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මම කෝන්ගහවෙල, "3 කණුව, ඇලහැර පාර, සුජීව අමරනාත් මහතා බාරේ" යන ලිපිනයෙහි පදිංචි ජී.වී.කේ. සුගතදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වී.කේ. ඉන්දික මහතා - පැමිණ නැත
ගරු හේමාල් ගුණසේකර මහතා - පැමිණ නැත.
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය - පැමිණ නැත.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ගරු කථානායකතුමනි, මම පානදුර, මහවිල, ශ්‍රමදාන මාවත, 25 ඩී යන ලිපිනයෙහි පදිංචි කමාන්ඩර් ආර්.එස්. ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

### අයි.ඕ.සී. සමාගමේ ඉන්ධන පිරවුම් හල් : බදු
ஐ.ஓ.சீ. கம்பனி எரிபொருள் நிரப்பு நிலையங்கள்: செலுத்திய வரி
IOC FILLING STATIONS : TAXES

1167/'11

2. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) 2009 වර්ෂයේදී අයි. ඕ. සී. (IOC) නමැති ඉන්දියානු සමාගමට බදු නිදහස් පදනමින් ඉන්ධන පිරවුම් හල් 100 ක් ලබා දී තිබේද;

(ii) එම ඉන්ධන පිරවුම් හල්වලින් රජයට බදු ගෙවිය යුතු වන්නේද;

(iii) එසේ නම්, 2006, 2007, 2008 සහ 2009 වර්ෂවලදී රජයට ගෙවන ලද බදු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉන්ධන පිරවුම් හල්වලින් ගෙවීම පැහැර හරින ලද බදු රජයට ගෙවන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අයි. ඕ. සී. සමාගම වෙත දන්වා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සමාගම බදු ගෙවිය යුතු නැති බව ආයෝජන මණ්ඩල සභාපතිවරයා විසින්ම නැවත අදාළ සමාගමට දන්වා තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) එවැනි දැනුම් දීමක් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

[ගරු අනුර දිසානායක මහතා]

(ඇ) අයි. ඕ. සී. සමාගම රජයට ගෙවිය යුතු බදු නොගෙවා පැහැර හැරීමට එරෙහිව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2009 ஆம் ஆண்டில் ஐ.ஓ.சீ. (IOC) எனும் இந்தியக் கம்பனிக்கு வரி விடுப்பு அடிப்படையில் 100 எரிபொருள் நிரப்பு நிலையங்கள் வழங்கப்பட்டுள்ளனவா;

(ii) மேற்படி எரிபொருள் நிரப்பு நிலையங்கள் அரசாங்கத்திற்கு வரி செலுத்த வேண்டுமா;

(iii) ஆமெனில், 2006, 2007, 2008 மற்றும் 2009ஆம் ஆண்டுகளில் அரசாங்கத்திற்குச் செலுத்தப்பட்ட வரியின் பெறுமதி தனித்தனியாக எவ்வளவு

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) எரிபொருள் நிரப்பு நிலையங்களினால் செலுத்தத் தவறிய வரியை அரசாங்கத்திற்குச் செலுத்துமாறு இலங்கை முதலீட்டுச் சபை ஐ.ஓ.சீ கம்பனிக்கு அறிவித்துள்ளதா;

(ii) ஆமெனில், அத்திகதி யாது;

(iii) அக்கம்பனி வரி செலுத்த வேண்டியதில்லையென முதலீட்டுச் சபையின் தவிசாளராலேயே சம்பந்தப்பட்ட கம்பனிக்கு அறிவிக்கப்பட்டுள்ளதா;

(iv) ஆமெனில், அத்திகதி யாது;

(v) அத்தகைய அறிவித்தல் வழங்கியமைக்கான காரணம் யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) ஐ.ஓ.சீ. கம்பனி அரசாங்கத்திற்குச் செலுத்தவேண்டிய வரியைச் செலுத்த தவறியமைக்கு எதிராக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state -

(i) whether 100 filling stations have been given to an Indian Company known as IOC on the basis of exemption of tax in year 2009;

(ii) whether taxes have to be paid to the government by these filling stations; and

(iii) if so, the value of the taxes paid to the government in years 2006,2007,2008 and 2009 separately?

(b) Will he inform this House -

(i) whether the Board of Investment of Sri Lanka has instructed the IOC to pay the Government the taxes the filling stations have defaulted;

(ii) if so, the date it was done;

(ii) whether the Chairman of the Board of Investment himself has informed the relevant company that it need not pay taxes;

(iii) if so, the date it was done; and

(iv) the reasons for making such an intimation?

(v) Will he state the steps to be taken against IOC for defaulting to pay the due taxes?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මෙය බදු පිළිබඳ ප්‍රශ්නයක් නිසා, ඇත්ත වශයෙන්ම මෙම ප්‍රශ්නය යොමු කළ යුත්තේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයටයි. නමුත් ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම මෙම ප්‍රශ්නයට පිළිතුර සපයනවා.

(අ) (i) පිරවුම් හල් 100ක් සඳහා අවසර ලබා දී නැත.

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 12/10/2009 දිනැති ලිපියට අනුව ඉන්ධන පිරවුම් හල් 48ක් වෙනුවෙන් රජයට නියමිත බදු ගෙවිය යුතුය.

(iii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නොදනී. ගෙවිය යුතු බදු ප්‍රමාණයන් පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දන්වා නැත.

(ආ) (i) නියමිත බදු ගෙවන ලෙස දන්වා ඇත.

(ii) 2008 ජූලි 11 වන දින.

(iii) අදාළ සමාගමට දන්වා නැත.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා IOC සමාගම 19/08/2010 වන දින පරිපූරක ගිවිසුමකට එළඹුන අතර එහි බලපෑමක් ලෙස IOC සමාගමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ 05/12/2002 දින අත්සන් කරන ලද ප්‍රධාන ගිවිසුමේ සඳහන් බදු නිදහස් කිරීම සඳහා හිමිකම් ලබන බැවින් රජයට ගෙවිය යුතු බදු නොගෙවා පැහැර හැරීම සම්බන්ධයෙන් පියවර ගත යුතු නොවේ.

(ඈ) පැන නොනඟී.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම ප්‍රශ්නයේ (ආ) (i) කොටසට ඔබතුමා දුන් පිළිතුර අනුව, 2008 ජූලි මාසයේ 11 වැනිදා එවැනි බදු ගෙවීම් පැහැර හැරීමක් පිළිබඳ ආයෝජන මණ්ඩලයෙන් දැනුම් දීලා තිබෙනවා. එහෙම තමයි ඔබතුමා කිව්වේ. එතකොට එයින් පෙන්නුම් කරන්නේ බදු ගෙවීම පැහැර හැර තිබෙන බව නේද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, මේ සමාගමේ මුල් ගිවිසුමත් එක්ක, එහෙම නැත්නම් 2003දී රජයත් සමඟ ඇති කර ගත් ගිවිසුමත් එක්ක විශේෂයෙන්ම අපි දන්වා තිබුණා බදු ගෙවිය යුතුයි කියලා. ඒ පිළිබඳව මා ඔබතුමාට සම්පූර්ණයෙන් පැහැදිලි කිරීමක් කරන්නම්.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව යවන ලද 2009 ඔක්තෝබර් 12 දින ලිපිය අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, Lanka IOC සමාගම, වරලත් ඉන්ධන පිරවුම්හල් පිළිබඳ ආදායම ගෙවන ලෙස දැන්වූවා. අපි දැන්වූවා. ඊළඟට ඒ හේතුවෙන් ඒ අය ගියා, බේරුම් කාරක මණ්ඩලයක් - International Chamber of Commerce - හමුවට. ගිහිල්ලා ඒ ගොල්ලන් කරුණු ඉදිරිපත් කළා, 2003 ගිවිසුම් ප්‍රකාරව වසර 10ක් යන තුරු ඒ ගොල්ලන්ට බදු සහනය තිබෙනවා කියලා.

2013 වෙනකම් ඒ ගොල්ලන්ට මේ බදු සහනය තිබෙනවා. 2013 දී තමයි සියයට 15ක වාර්ෂික බද්දක් ගෙවිය යුත්තේ. ඒ ගොල්ලෝ කලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 30ක් දීලා තිබෙනවා. ඒ අනුව ඒ අය ලංකාවට තවත් ගෙවීම් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ. ඒ අය බේරුම්කාර මණ්ඩලයේදී දන්වලා තිබෙනවා, එක එක කාරණා සම්බන්ධයෙන් ඒ ගොල්ලෝ ලංකා ආණ්ඩුවට ගෙවලා තිබෙන සම්පූර්ණ මුදල් ප්‍රමාණය. ඉන්ධන ගබඩාවලට -ඉන්ධන හල් නොවෙයි, තෙල් ටැංකිවලට- වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් 1,000 බැගින් වෙනම බද්දකුත් ඒ ගොල්ලෝ ගෙවනවා. පරිපාලනමය කටයුත්තක් නිසා ඒ ගොල්ලෝ මේක අරගෙන තිබෙන්නේ. "මෙන්න මේ හේතුන් මත ලංකා ආණ්ඩුවත් එක්ක අප ගිවිසුමට එළඹිලා තිබෙන්නේ, අවුරුදු 10ක බදු සහනයක් තිබෙන නිසා, 2013 වෙනකම් ඒ බදු සහනය ක්‍රියාත්මක වෙන නිසා බදු සහනය අයිතියි" කියලා ඒ අය කියා තිබෙනවා. බේරුම්කාර මණ්ඩලය ආයෝජන මණ්ඩලයට උපදෙස් දීලා තිබෙනවා, පරිපූරක ගිවිසුමකට එළඹෙන්න කියලා. ඒ අනුව ආයෝජන මණ්ඩලය පරිපූරක ගිවිසුමකට එළඹුණා. පරිපූරක ගිවිසුමකට එළඹුණු නිසා බදු ගෙවීමක් අවශ්‍ය වන්නේ නැහැ. අප උත්සාහ කළා බදු ගන්න. බදු ගන්න උත්සාහ කළේ බදු ගෙවිය යුතුයි කියන පදනම මතයි. නමුත් මේ අනුව අපට ඒකට අවස්ථාවක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒ අනුව තමයි ප්‍රශ්නය පැන නඟින්නේ. අපේ රටේ IOC එක තවත් එක් ව්‍යාපාරයක් ලෙස තමයි තෙල් බෙදා හැරීම සිදු කරනු ලබන්නේ. එතකොට අපේ රටේ සෑම ව්‍යාපාරයකටම විවිධ වර්ගයේ බදු පනවනවා නම් ඒ බදුවලින් IOC විතරක් නිදහස් කරන්නේ ඇයි?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ. IOC එකට බදු නිදහස් කිරීමක් කරලා නැහැ. 2013 ඉඳලා බදු ගෙවිය යුතුයි. ඕනෑම ආයෝජනයක් රටට එන කොට ආයෝජනයට එළැඹෙන ගිවිසුම් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔවුන් ආයෝජනයකට ආපු බව සැබෑව. හැබැයි ඔවුන් මිල දී ගත්තේ අලුතින් කර්මාන්තශාලා ඉදි කිරීමක් හෝ අලුතින් ඉඩමක් හෝ අලුතින් ගොඩනැඟිලි ඉදි කිරීමක් හෝ නොවෙයි. ඒ, අපේ තෙල් සංස්ථාව විසින් ඒ වෙලාව වන කොටත් පරිහරණය කරමින් තිබුණු petrol sheds, ඒ වාගේම අපේ තෙල් සංස්ථාවට අයිතිව තිබුණු කොළොන්නාව ගබඩා සංකීර්ණයේ CPSTL කියන සමාගම හදලා ඒකෙන් තුනෙන් එකක්. ඒ කියන්නේ එතකොටත් ක්‍රියාත්මකව තිබුණු ඒවායි. ඒවා ඒ වෙලාවේත් business එකක යෙදුණු ආයතන. එතකොට ඒ ආයතන තමයි IOC එකට පවරා දෙන්නේ. එතකොට තෙල් සංස්ථාවට මේ බද්ද තිබෙනවා. IOC එකට මේ බද්ද නැහැ. ඒ නිසා IOC එක ගිණුම් වාර්තාවල තමන්ගේ ලාභය පිළිබඳ විවිධ ගනුදෙනු ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා අපේ අනික් හැම ව්‍යාපාරයකටම බදු අය කරන්නා සේ මේ ව්‍යාපාරයට බදු අය කළ යුතුයි. මොකද මේ අලුත් ඉදි කිරීමක් නේ. ඔබතුමා කියන එක ඇත්ත. හෝටල් සමාගමක් ඉදි කරන්න යන කොට ඒ පිළිබඳව සැලකිල්ලක් කළ යුතුයි. ඒ නිසා ඒ පිළිබඳ බේරුම්කාරක මණ්ඩලයට තමුන්නාන්සේලාගේ ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් කවුද සහභාගි වුණේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය විතරක් අහන්න. විස්තර එපා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
බේරුම්කාරක මණ්ඩලයේදී ඉතාමත් පැහැදිලිව අප තර්ක කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා මට අවස්ථාවක් දෙනවා නම් බේරුම්කාරක මණ්ඩලයට ගිය අයත් මට මෙහිදී සඳහන් කරන්නට පුළුවන්. ඒ බේරුම්කාරක මණ්ඩලයට යවපු කණ්ඩායමක් වෙනම ඉන්නවා.

විශේෂයෙන්ම අපි නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය නීතිපති ෆරිසානා ජමීල් මහත්මිය, ජ්‍යෝෂ්ඨ රජයේ නීතිඥ රජීව් ගුණතිලක මහතා මේ සඳහා පත් කළා. ඔවුන්ගේ නීති උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ආයෝජන) හා විධායක අධ්‍යක්ෂ (නීති) යන නිලධාරින්ගේ නිර්දේශයන් ද සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව බේරුම් කරන ලද කෘත්‍ය සමථයකට පත් කර ගැනීමේ අරමුණෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති අධ්‍යක්ෂ ජනරාල්වරයා ලංකා IOC එක සමඟ 2004 ජූනි මස 01 වන දා සිට බලපැවැත්වෙන පරිදි සමාගම ඉල්ලා සිටි වරලත් ඉන්ධන හල් ඇතුළත් කොට පරිපූරක ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කළා. ඒ බේරුම්කාර මණ්ඩලය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුනම ඉවරයි. [බාධා කිරීමක්] ඔබතුමාගේ අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි. [බාධා කිරීමක්] මම හොඳටම බලා ගෙන හිටියා. [බාධා කිරීමක්] ඒ ගැන වැඩිදුර කථා කරන්නට ඕනෑ නම් විවාදයක් ඉල්ලනවා නම් හොඳයි පස්සේ.

## මැණික්දිවෙල - තිස්මඩ මාර්ගය ප්‍රතිසංස්කරණය : වෙන් කළ මුදල

மெனிக்திவெல- திஸ்மட வீதி புனரமைப்பு: நிதி ஒதுக்கீடு

RECONSTRUCTION OF MENIKDIWELA-THISMADA ROAD : AMOUNT ALLOCATED

1327/'11

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, පොත්තපිටිය මාර්ගයේ, මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා කොටස ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අතරමග නවතා දමා වර්ෂයක පමණ කාලයක් ගතවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) ඉහත පරිදි ප්‍රතිපාදන වෙන් කර තිබේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ආරම්භකර ප්‍රදේශයේ ජනතාවගේ ගමනාගමන පහසුකම් සලසාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கண்டி மாவட்டத்தின் பொத்தபிட்டிய வீதியில் மெனிக்திவெலவில் இருந்து திஸ்மட வரையான பகுதியைப் புனரமைக்கும் பணிகள் இடைநடுவில் கைவிடப்பட்டு ஏறக்குறைய ஒரு வருடகாலம் கழிந்துள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீதியின் புனரமைப்புப் பணிகளுக்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை யாது;

(ii) மேலே உள்ளவாறு நிதி ஏற்பாடுகள் ஒதுக்கீடு செய்யப்பட்டிருப்பின் புனரமைப்புப் பணிகள் நிறுத்தப்படக் காரணம் யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி வீதியின் புனரமைப்புப் பணிகளைத் துரிதமாக ஆரம்பித்து பகுதிவாழ் மக்களின் போக்குவரத்து வசதிகளை வழங்க நடவடிக்கை எடுப்பாரா;

(ii) ஆமெனில் அதற்காக எடுக்கும் காலம் எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils :

(a) Is he aware that nearly a period of one year has lapsed since the reconstruction work of the stretch of road from Menikdiwela to Thismada on Poththapitiya Road in Kandy District, was stopped half way?

(b) Will he state-

(i) the amount allocated for the reconstruction of that road;

(ii) the reasons for abandoning the reconstruction if allocations have been made in the above manner?

(c) Will he inform this House-

(i) whether measures will be taken to start reconstruction of that road speedily and provide transport facilities for the people of that area; and

(ii) if so, of the time frame required for that?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මේ ප්‍රශ්නයට මා පිළිතුරු දෙනවා.

(අ) ප්‍රතිසංස්කරණ කටයුතු අතරමඟ නවතා දමා නොමැත.

(ආ) (i) රු.3,838,100/-

(ii) 2011 වර්ෂයේ අගෝස්තු මස වන විට වැඩ අවසන් කර ඇත.

(ඇ) (i) දැනටමත් ඒ සඳහා කටයුතු සලසා ඇත.

(ii) පැන නොනඟී.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය යොමු කරන අවස්ථාවේදී තිබුණු තත්ත්වයක් සම්බන්ධයෙන් ඇසුවේ. මේ වන විට මේ කටයුත්ත සිද්ධ වෙලා තිබෙන නිසා අතුරු ප්‍රශ්න ඇසීමක් කරන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 6-2027/'11 -(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
*(The Hon. Sajith Premadasa)*

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රන්ටැඹේ ශිෂ්‍යභට පුහුණු කඳවුර : විස්තර
## ரன்டம்பே இளவல் படையணி பயிற்சி முகாம்: விபரம்
## RANTEMBE CADET TRAINING CAMP: DETAILS

2033/'11

7. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රන්ටැඹේ පිහිටි ශිෂ්‍යභට පුහුණු කඳවුර ආරම්භ කළ දිනය කවරේද;

(ii) මේ වන විට එම කඳවුරේ පහසුකම් සකසා ඇති ශිෂ්‍යභට බළඇණි සංඛ්‍යාව කොපමණද;

(iii) එම කඳවුරේ එක් වරකදී නේවාසික පුහුණුව ලැබිය හැකි ශිෂ්‍යභටයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සංඛ්‍යාව ඉක්ම වූ සිසුන් සංඛ්‍යාවක් සහභාගි කර පුහුණු කඳවුරු පවත්වා තිබේද;

(v) ශිෂ්‍යභට පුහුණුව ලැබිය හැකි සිසුන්ගේ අවම වයස් සීමාව කොපමණද;

(vi) එම වයස් සීමාවට අඩු වයස්වල සිසුන් එම කඳවුරේ පුහුණුව ලබා තිබේද;

(vii) එසේ නම්, එම සිසුන් සහභාගි කර ගත් කඳවුරු භාරව කටයුතු කළ නිලධාරින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ரன்டம்பேயில் அமைந்துள்ள இளவல் படையணி பயிற்சி முகாம் ஆரம்பிக்கப்பட்ட திகதி யாது;

(ii) தற்போது அந்த முகாமில் வசதிகள் வழங்கப்பட்டுள்ள இளவல் படையணிகளின் எண்ணிக்கை எவ்வளவு;

(iii) அந்த முகாமில் ஒரே தடைவையில் தங்கியிருந்து பயிற்சி பெறக்கூடிய இளவல் படையணி மாணவர்களின் எண்ணிக்கை எவ்வளவு;

(iv) அந்த எண்ணிக்கையைத் தாண்டிய மாணவர் எண்ணிக்கையை பங்குகொள்ளச் செய்து பயிற்சி முகாம்கள் நடத்தப்பட்டுள்ளதா;

(v) இளவல் படையணிப் பயிற்சியைப் பெறக்கூடிய மாணவர்களின் ஆகக் குறைந்த வயதெல்லை யாது;

(vi) மேற்படி வயதுக்குக் குறைந்த மாணவர்கள் அந்த முகாம்களில் பயிற்சி பெற்றுள்ளார்களா;

(vii) அவ்வாறெனின் அந்த மாணவர்களை பங்குகொள்ளச் செய்த முகாம்களுக்கு பொறுப்பாக இருந்த உத்தியோகத்தர்கள் தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) of the date on which the Cadet Training Camps situated in Rantembe were started;

(ii) of the number of Cadet platoons that have been accommodated at the aforesaid camp at present;

(iii) of the number of Cadets who can undergo residential training in the aforesaid camp at a time;

(iv) whether any training Camps have been conducted with the participation of a number of Students, exceeding the aforesaid number;

(v) of the minimum age limit of the students who are eligible for the cadet training;

(vi) whether students below the minimum age limit have under gone Cadet training of the aforesaid camp; and

(vii) if so, the action that will be taken regarding the officers who were incharge of the camps that were conducted with the participation of the aforesaid students?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1990 දෙසැම්බර් මස 02 දින

(ii) 80යි. (අසූවයි)

(iii) 2000යි. (දෙදහසයි)

(iv) නැත.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(v) වයස අවුරුදු 14 යි. (දාහතරයි)

(vi) නැත.

(vii) පැන නොනඟී.

(ආ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, රන්ටැඹේ පිහිටි ශිෂ්‍ය භට පුහුණු කඳවුර 1981 දී ආරම්භ කර තිබෙනවා. පසු ගිය ඔක්තෝබර් මාසයේ 06 වැනිදා පොල්ගහවෙල, රත්මල්ගොඩ මහා විද්‍යාලයේ ඉෂාරා සඳමාලි රත්නායක ශිෂ්‍යාව මේ කඳවුරේ පුහුණුව ලබමින් සිටින කොට මිය ගොස් තිබෙනවා. ඒ වන විට ඇයගේ වයස අවුරුදු 15යි. මගේ ප්‍රශ්නයේ අහලා තිබෙනවා, ශිෂ්‍යභට පුහුණුව ලැබිය හැකි සිසුන්ගේ අවම වයස් සීමාව කොපමණද කියලා. ඔබතුමා උත්තර දුන්නා, වයස අවුරුදු 14යි කියලා.

ඇත්ත වශයෙන් මේකට බලපාන්නේ 1985 අංක 40 දරන මිනිස් බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනතයි. ගරු කථානායකතුමනි, ඒ පනතේ ශිෂ්‍යයා කියන වචනය අර්ථ දක්වලා තිබෙන්නේ, "අවුරුදු 16ට වැඩි වූද ලංකාවේ නීතිවලට අනුකූලව පිහිටුවනු ලැබූ අධ්‍යාපනය ලබා දෙන පාසලක ශිෂ්‍යයකු වූද ශ්‍රී ලංකා පුරවැසියෙක් අදහස් වේ" කියායි. ඇත්තටම දැන් මේ ප්‍රශ්නයට දීලා තිබෙන උත්තරය සම්පූර්ණයෙන් වැරදියි ගරු කථානායකතුමනි. අවම වයස් සීමාව අවුරුදු 14 නොවෙයි. මම එය බොහොම පැහැදිලිව නීතිමය කාරණාත් එක්ක ඔප්පු කරන්නේ. 1985 අංක 40 දරන මිනිස් බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනතේ තිබෙන්නේ වයස් සීමාව අවුරුදු 16 කියලායි. ඉතින් වයස අවුරුදු 14ක් වූ ශිෂ්‍යයෝ රන්ටැඹේ පිහිටි ශිෂ්‍යභට පුහුණු කඳවුරට සහභාගි කරන්න අවසර දුන්නේ මොන පනතක් යටතේද කියලා මම අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ සීඑස් 6320 හා 1996 ජූලි 18 දිනැතිව නිකුත් කර ඇති ලිපිය ප්‍රකාරව වයස් සීමා ප්‍රකාශයට පත් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියන අසූ ගණන්වල කතන්දරය හුඟක් පරණයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇත්ත වශයෙන්ම ගරු කථානායකතුමනි- [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, ඔය ලිපිය වැරදියි. ඔබතුමාට ලිපිය එව්ව කෙනාවත් මම දන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම පනතක් ගැනයි කිව්වේ. ගරු ඇමතිතුමනි, ඊට පසුව නිකුත් කරලා තිබෙන ඔබතුමා සඳහන් කළ ලිපිය සභාගත කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කියෙව්වේ අසූ ගණන්වල නිකුත් කරපු පනතක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කාරණය තිබුණේ 1985 අංක 40 දරන මිනිස් බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනතේ. එතැනින් පස්සේ මේ සම්බන්ධව මොකුත් පනතක් සම්මත වෙලා නැහැ. මමත් කරලා තිබෙනවා junior cadetting. අවුරුදු 14-16 කාලයේ ඒක කෙරුණා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර වැඩක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් junior cadetting නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා හැම දාම junior නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක විහිළුවට කාරණයක් නොවෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Senior වෙන්න, senior cadetting කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මේක විහිළුවට කාරණයක් නොවෙයි. ගරු කථානායකතුමනි, මේක ශිෂ්‍යාවක් මිය ගිය කාරණයක්. මම අහන්නේ මේ පනත සංශෝධනය කරන්නේ නැතිව - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා දැන් පිළිතුරක් දුන්නා. ඊළඟ ප්‍රශ්නය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක පළමුවැනි කාරණය. අනික් කාරණය වශයෙන් මම කියන්නේ කරුණාකරලා මේක පනතක් හැටියට සම්මත කරන්නය කියලායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එවැනි බලයක් පනතේ තිබෙනවා. රෙගුලාසි යටතේ තිබෙන බලය තමයි පාවිච්චි කරලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රන්ටැඹේ පුහුණු කඳවුරේ තනි හට නිවාස තිබෙන්නේ 25යි. යුගල හට නිවාස තිබෙන්නේ 03යි. මේ ඔක්කොගෙම දමන්න පුළුවන් ශිෂ්‍ය හට බණ්ඩ සංඛ්‍යාව 31යි. ඒ කියන්නේ සාමාන්‍යයෙන් එකක 25 ගණනේ දැම්මොත් 775 දෙනෙක් විතර තමයි දමන්න පුළුවන් වෙන්නේ. හැබැයි මේ උත්තරයෙන් කියා තිබෙනවා, 2000කට වැඩිය දමන්න පුළුවන්ය කියලා. ගරු කථානායකතුමනි, මේක ලොකු ප්‍රශ්නයක්. එක ඇඳක ශිෂ්‍යයන් දෙතුන් දෙනෙක් නිදා ගන්න තත්ත්වයක් තිබෙන්නේ. හමුදා පුහුණුවක් දුන්නාට අපට ප්‍රශ්නයක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නිසා මම අහන්නේ, ශිෂ්‍යයන් ගෙනල්ලා 775 දෙනෙකුට නවාතැන් පහසුකම් තිබෙන කඳවුරක 2000ක් දමලා හමුදා පුහුණුව දෙන එක සුදුසුද කියායි. මේ සඳහා පහසුකම් හදන්න ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළක් නැද්ද කියායි, මම අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව නවත්වලා ප්‍රශ්නය අහනවා නම් උත්තර දෙන්න පුළුවන්. [බාධා කිරීමක්] නැහැ, නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැඩිය කථා කරන්න යන්න එපා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේකේ ශිෂ්‍ය හට බණ්ඩ 80කට පහසුකම් තිබෙනවා. ඒ කියන්නේ platoons 80ක්. සංඛ්‍යාත්මක වශයෙන් එය 2000ක්.

තමුන්නාන්සේට ඔය පරණ පත්‍ර වාර්තාවක් කවුදෝ දීලා. එය ඉතාම පැරණි පත්‍ර වාර්තාවක්. ඔය පත්‍රයේ දිනය කියන්නකෝ. [බාධා කිරීම්] You are quoting an old document; it is a very old document. - [*Interruption.*]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔහොම ඉන්න. උත්තරය ඉවර වුණාට පස්සේ අනික් අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක තමයි පිළිතුර. මේ ගරු මන්ත්‍රීතුමා පදනමක් නැති කරුණුයි අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරු දුන්නා. දැන් තුන්වන අතුරු ප්‍රශ්නය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, පත්‍රයක් උස්සා ගෙන කථා කරනවා නොවෙයි. මේ පත්‍රයට මේ කරුණු ටික දීලා තිබෙන්නේ ඒ අනු කණ්ඩයේ සේවය කරන නිලධාරින්. මා ඔවුන්ගේ නම් මෙම ගරු සභාවට කියන්න සූදානම් නැහැ. එතකොට ඔවුන් පිටි පස්සේ එළවා ගෙන යනවා. එම නිසා මා කියන්න කැමැතියි, අවුරුදු 16ට අඩු දරුවන්ට මේ රටේ හමුදා පුහුණුව ලබා දීලා ඔවුන්ව -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවුරුදු 16ට අඩු අයට පුහුණුව ලබා දීලා තිබෙනවාද කියා අහන්න, වැඩි විස්තර කියන්නේ නැතුව.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පුහුණුව ලබා දීලා තිබෙනවා. ඒකයි, මා කියන්නේ. [බාධා කිරීම්] මෙය ඒ ශිෂ්‍යයනුත් හමුදාකරණයට ලක් කරන්න හදන ආණ්ඩුවේ ක්‍රියාදාමයක්ද කියා මා අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා, ශිෂ්‍ය හට කියන එකයි, හමුදාව කියන එකයි අතර වෙනස ඔබතුමා දන්නේ නැත්නම් පනත ආපසු කියවන්න. [බාධා කිරීමක්] ඔබතුමා කථා කරන්නේ පදනමක් නැතුවයි. ශිෂ්‍ය හට කියන්නේ වෙනම පුහුණුවක් ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. අපි බලමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. හමුදා පුහුණුවක් දෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
How can you equalize that? [බාධා කිරීමක්] නැහැ. ඒ දෙකම එකක් කියා කියන්නේ කොහොමද? දෙකම එකක් නොවෙයි. ඒකයි ගැටලුව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාත් එක්ක ගෙන ගිහින් පෙන්නුවා නම් හොඳයි, මේක ඇත්තද කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඊළඟ ප්‍රශ්නයට යමු. [බාධා කිරීම්]

## අත හැර දමා ඇති ඇඳුරාගල වතුයායට අයත් ගොඩනැඟිලි : ඵලදායී කටයුත්තක් සඳහා යෙදවීම
### எந்துராகல தோட்டத்திலுள்ள கைவிடப்பட்டுள்ள கட்டிடங்கள்: பயன்பாடு
### ABANDONED BUILDINGS AT ENDURAGALA ESTATE : GAINFUL USE

1656/'11

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි ඇඳුරාගල වතුයායට අයත් කොටගල වැවිලි සමාගමේ තේ සහ රබර් කර්මාන්තශාලා පරිශ්‍ර ගොඩනැඟිලි වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන අත හැර දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තශාලාව නැවත විවෘත කර ප්‍රදේශයේ ජනතාවට සහනයක් සැලසීමට කටයුතු කරන්නේද;

(ii) නො එසේ නම්, එය වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ කටයුතු කරන්නේ නම්, ඒ කුමන කටයුත්තක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) களுத்துறை மாவட்டத்தின் இங்கிரிய பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள எந்துராகல தோட்டத்துக்கு உரித்தான கொட்டகல பெருந்தோட்டக் கம்பனியின் தேயிலை மற்றும் இறப்பர் தொழிற்சாலை சுற்றயலில் உள்ள கட்டிடங்கள் பல வருட காலமாக பயன்படுத்தப்படாது கைவிடப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி தொழிற்சாலையை மீண்டும் திறந்து பிரதேச மக்களுக்கு நிவாரணம் வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) இன்றேல், அதனை வேறு பயனுள்ள நடவடிக்கைக்கு பயன்படுத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) அவ்வாறாயின், எவ்வகையான நடவடிக்கைக்கு பயன்படுத்தப்படும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Is he aware that the buildings at the tea and rubber factories of the Kotagala Plantations Company belonging to the Enduragala Estate located in the Ingiriya Divisional Secretary's Division of the Kalutara District have remained abandoned for many years without being put to use?

(b) Will he inform this House-

(i) whether action will be taken to reopen this factory and grant relief to the people of the area;

(ii) if not, whether action will be taken to use it for some other gainful purpose; and

(iii) if action is so taken, the purpose for which it will be used?

(c) If not, why?

**ගරු අර්ල් ගුණසේකර මහතා (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர - பெருந்தோட்டக் கைத்தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Earl Gunasekara - Deputy Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

ඇඳුරාගල වතුයාය 1992 වසරේ සිට බදු පදනම යටතේ අවුරුදු 53ක කාලයක් සඳහා කොටගල වැවිලි සමාගම වෙත ලබා දී ඇත. වතුයායේ අතහැර දමා තිබූ තේ කර්මාන්තශාලා පරිශ්‍රය ඊ.බී. ක්‍රීසි සමාගමට ( E.B. Creasy & Co., PLC) 2006.06.16වන දින ස්වර්ණමය කොටස් හිමිකරුගේ අනුමතිය සහිතව ලී ඇඹරීමේ කර්මාන්තශාලාවක් සඳහා අවුරුදු 38කට උප බදු පදනම යටතේ ලබා දී ඇත.

(ආ) (i) නැත.

(ii) ඔව්.

(iii) පොදුජන කටයුත්තක් සඳහා.

තේ කර්මාන්තශාලා පරිශ්‍රය සහිත ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බැවින්, ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 5 වගන්තිය යටතේ අත්පත් කරගන්නා බවට ගැසට් නිවේදනයක් ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇත. එම ගැසට් නිවේදනය **<u>සභාගත</u>*** කරමි.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ගැසට් නිවේදනය:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட வர்த்தமானி அறிவித்தல் :*
*Gazette Notification tabled:*

2A III කොටස – ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය – 2011.03.16

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, වැඩබලන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය සිරිපාල ගම්ලත් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නිමලගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේඑ/අයිඑන්ජී/09/824 දරන පූගමන අනුරේඛනයේ සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.4861ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස:

කැබලි අක්ෂර 'ඒ' – ඉංගිරිය වත්ත ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.4861ක් පමණ

උතුරට: මු.පි.ක. 2396 හි කැබලි අංක 04; නැගෙනහිරට: මු.පි.ක. 2396 හි කැබලි අංක 04 හා පාර; දකුණට: පාර, මාර්ග (මා.සං.අ.) හා මු.පි.ක. 3387 හි කැබලි අංක 02; බටහිරට: මු.පි.ක. 3387 හි කැබලි අංක 02 හා මු.පි.ක. 3387 හි කැබලි අංක 04.

සිරිපාල ගම්ලත්,
වැඩබලන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය

යොමු අංකය: එල්ඩී/05/2009/වීපී/23.
ප්‍රා. ලේ. යොමු අංකය: 04/07/01/53.
2011 පෙබරවාරි මස 02 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 – 99

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. මෙය පොදු කටයුත්තක් සඳහා යොදා ගන්නවාය කියලා කිව්වා. මේ යොදා ගන්නා කටයුත්ත පිළිබඳව ඔබතුමන්ලා දැනුවත් කර තිබෙනවාද? එහෙම නම් මොන කටයුත්තක් සඳහාද මෙය යොදා ගන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එක ප්‍රශ්නයට දෙකක් අහනවා.

**ගරු අර්ල් ගුණසේකර මහතා**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)
ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් අහන්න ඕනෑ, ඒ පොදු කටයුත්ත මොකක්ද කියා. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අයිති නැද්ද?

**ගරු අර්ල් ගුණසේකර මහතා**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)
ගරු කථානායකතුමනි, ඒක අපේ අමාත්‍යාංශයට අයිති නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. තේ කර්මාන්තශාලා භූමිය මේ මොහොත වන විට තිබෙන්නේ කවුරු සතුවද?

**ගරු අර්ල් ගුණසේකර මහතා**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)
ඒ සම්බන්ධව උත්තරයේ සඳහන් වී තිබෙනවා. වත්ත අයිති රජයට. බදු දීලා තිබෙන්නේ අවුරුදු 53කට. අපේ රජයේ අනුමැතිය ඇතුව උප බදු පදනමක් දීලා තිබෙනවා, ඊ.ඩී. ක්‍රිසි සමාගමට. ඒකයි තත්ත්වය. මේ ගැන පිළිතුරේදී කලින් ඔබතුමාට කියලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර හරියට කිව්වා. ප්‍රශ්නයට උත්තරය දුන්නා. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම අහන්නේ මේකේ පරිහරණ අයිතිය මේ මොහොතේ තිබෙන්නේ කාටද කියලායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඒක කිව්වා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේ මේ මොහොතේ පරිහරණ අයිතිය තිබෙන්නේ කාටද කියන එකයි.

**ගරු අර්ල් ගුණසේකර මහතා**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)
පරිහරණ අයිතිය?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්. මේ මොහොතේ පරිහරණ අයිතිය තිබෙන්නේ කාටද?

**ගරු අර්ල් ගුණසේකර මහතා**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)
උප බදු දීලා තිබෙන අයට තමයි පරිහරණ අයිතිය තිබෙන්නේ. නමුත් රජයේ අවශ්‍යතාවක් සඳහා ගැසට් නිවේදනයක් මඟින් ප්‍රාදේශීය ලේකම් විසින් ඒක නැවත රජයට පවරා ගෙන තිබෙනවා. මේක තමයි උත්තරය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අවසාන විග්‍රහය වශයෙන් ඔබතුමා කියන්නේ දැනට ඒක රජය සතුව තිබෙනවාය කියලාද?

**ගරු අර්ල් ගුණසේකර මහතා**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)
ගැසට් නිවේදනයක් නිකුත් කරලා දැන් රජය පවරා ගෙන තිබෙනවා. දැන් රජය සතුයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9-1747/'11-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මහජන නියෝජිතයින් නොවන පුද්ගලයින්ට රජයේ ආරක්ෂාව : විස්තර
## மக்கள் பிரதிநிதிகள் அல்லாதவர்களுக்கான அரச பாதுகாப்பு: விபரம்
## GOVERNMENT SECURITY TO NON-REPRESENTATIVES OF PUBLIC: DETAILS

2035/'11

11. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහජන නියෝජිතයින් නොවන පුද්ගලයින්ගේ ආරක්ෂාව සඳහා රජයේ ආරක්ෂක නිලධාරින් යොදවා තිබේද;

(ii) එසේ ආරක්ෂාව සලසා ඇති පුද්ගලයින්ගේ නම් සහ අනෙකුත් තොරතුරු කවරේද;

(iii) ඔවුන්ගේ ආරක්ෂාවට යොදවා ඇති නිලධාරින් පොලිස් නිලධාරින් ද, ඇමති ආරක්ෂක අංශයේ නිලධාරින් ද, නැතහොත් හමුදා නිලධාරින් ද;

(iv) ඉහත පරිදි ආරක්ෂාව සලසා ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන එක් එක් පුද්ගලයාට ලබා දී ඇති පසුපෙළ රථ (backup vehicles) සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කිසියම් පුද්ගලයෙකු සඳහා ප්‍රභූ ආරක්ෂාව ලබා දිය යුතු බවට තීරණය කරන බලධාරියා කවුරුන්ද;

(ii) එම ආරක්ෂාව ලබාදීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மக்கள் பிரதிநிதிகள் அல்லாத நபர்களின் பாதுகாப்புக்காக அரச பாதுகாப்பு உத்தியோகத்தர்கள் ஈடுபடுத்தப்பட்டுள்ளனரா;

(ii) அவ்வாறு பாதுகாப்பு வழங்கப்பட்டுள்ள நபர்களின் பெயர்கள் மற்றும் ஏனைய தகவல்கள் யாவை,

(iii) இவர்களின் பாதுகாப்புக்கு ஈடுபடுத்தப்பட்டுள்ள உத்தியோகத்தர்கள் பொலிஸ் உத்தியோகத்தர்களா, அமைச்சர் பாதுகாப்புப் பிரிவின் உத்தியோகத்தர்களா, அல்லது இராணுவ உத்தியோகத்தர்களா;

(iv) மேற்கூறியவாறு பாதுகாப்பு வழங்கப்பட்டுள்ள பாராளுமன்ற உறுப்பினர்கள் அல்லாத ஒவ்வொரு நபருக்கும் வழங்கப்பட்டுள்ள பின்தொடர் பாதுகாப்பு வாகனங்களின் ( Backup vehicles) எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) எவரேனும் ஒருவருக்கு விசேட பாதுகாப்பு வழங்கப்பட வேண்டுமென்பதை தீர்மானிக்கின்ற அதிகாரம்வாய்ந்தவர் யார்;

(ii) அத்தகைய பாதுகாப்பு வழங்கப்படும் முறைமை யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) whether government security officers have been deployed for the security of persons who are not representatives of the public;

(ii) the names and other details of the persons who have been provided with security in the aforesaid manner;

(iii) whether the officers who have been deployed for their security are police officers, officers of the Ministerial Security Division or officers of the army; and

(iv) separately, the number of backup vehicles provided to each person, who is not a Member of Parliament and has been provided with security as mentioned above?

(b) Will he inform this House-

(i) the authority who decides whether a certain person should be provided with VIP security; and

(ii) the methodology of providing the aforesaid security?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ආරක්ෂක හේතූන් මත මෙම තීරණය ගන්නා අතර මේ පිළිබඳ විස්තර ආරක්ෂක හේතූන් මත ලබා දිය නොහැක.

(iii) අදාළ අවස්ථාවට අනුව පොලිස් නිලධාරින්, ඇමති ආරක්ෂක නිලධාරින්, හා යුද හමුදා නිලධාරින් යොදවනු ලැබේ.

(iv) ආරක්ෂක හේතූන් මත මෙම තීරණය ගන්නා අතර මේ පිළිබඳ විස්තර ආරක්ෂක හේතූන් මත ලබා දිය නොහැක.

(ආ) (i) පොලිස්පති

(ii) අදාළ පුද්ගලයන්ට ඇති ආරක්ෂක තර්ජන පිළිබඳ බුද්ධි වාර්තා පදනම් කර ගෙන සුදුසු ආරක්ෂාව සැලසීම.

(ඇ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න නැද්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව උත්තර දෙන්න තිබෙනවා. Backup vehicles පිළිබඳව?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පසු පෙළ රථ. ඒක තමයි කිව්වේ. තොරතුරු දීමට හැකියාවක් නැහැ ආරක්ෂක හේතු මත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ පළාත් සභාවල ඇමතිවරු නොවෙන වෙනත් පුද්ගලයන්ට ආරක්ෂාව ලබා දීම ගැන ප්‍රශ්න ගණනාවක් සමාජයේ ඇති වෙමින් තිබෙනවා; ඇති වෙලාත් තිබෙනවා. ඒක නිසා තමයි මම මේ ප්‍රශ්නය මතු කළේ. මම විශ්වාස කරනවා මේ ආරක්ෂාව දීලා තිබෙන්නේ කාටද කියලා මේ පාර්ලිමේන්තුව දැන ගත්තාට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා. ආරක්ෂාව සපයන පුද්ගලයන්ගේ නම් නේ අවශ්‍ය වෙන්නේ නැත්තේ. ආරක්ෂාව දීලා තිබෙන ප්‍රභූ පුද්ගලයෝ කවුද කියලා අපිට කිව්වොත්, පාර්ලිමේන්තුව විධියට අපිට ඒකේ වටිනාකමක් තිබෙනවා කියලායි මම හිතන්නේ. එහෙම ආරක්ෂාව දීලා තිබෙනවා කියලා අපි දන්නවා නේ. ඒ නිසා ඇයි මේ තොරතුරු කියන්න බැරි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා ඒකට පැහැදිලිව පිළිතුරු දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි දන්නා විධියට ආරක්ෂාව දීපු එක එක උපදේශකයන් ඉන්නවා; අමාත්‍යවරුන්ගේ සමහර ලේකම්වරු ඉන්නවා; සංස්ථා සභාපතිවරු ඉන්නවා; නිළියෝ ඉන්නවා. ඒ වාගේ අයටත් ආරක්ෂාව දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම චෝදනා කරන්න එපා හරියට ඒ පිළිබඳව සාක්ෂියක් නැතිව.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒ ලැයිස්තුව දුන්නා නම් හරි නේ. [බාධා කිරීමක්] නිලධාරින් ටික අපට කියන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ආරක්ෂාව දීපු කෙනෙක්,- [බාධා කිරීමක්] ඒ විධියට ගම්පහ පළාත් සභා මන්ත්‍රීවරයෙකුට ආරක්ෂාව ලබා දීලා, පසුව චෝදනාවකට හසු වෙලා ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව මම පාර්ලිමේන්තුවේදී කියලා තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මන්ත්‍රීවරු ගැන නෙමෙයි ප්‍රශ්නයෙන් අහන්නේ. ඔබතුමා දැන් අහන්නේ මන්ත්‍රීවරයෙක් ගැන.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පොඩ්ඩක් ඉන්න. පළාත් සභා මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දීලා තිබුණේ නැහැ. නමුත්, ඒ මන්ත්‍රීතුමාට ආරක්ෂාව දීලා තිබුණා. මම ඒ ගැන පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කළා. ඒ ගැන බලන්නම් කියලා කිව්වා. ඔන්න බලලා තිබෙන හැටි. මං කොල්ල කෑමකට කොන්ත්‍රාත් එකක් දීලා දැන් එයා මිනී මැරුම් නඩුවකට අහු වෙලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මේ ප්‍රශ්නයට අදාළද? මහජන නියෝජිතයන් නොවන පුද්ගලයන් කියලා ප්‍රශ්නයෙන් අහන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, වෙනත් අයටත් ආරක්ෂාව දීලා තිබෙනවා කියලා මුළු රටම දන්නවා. ඒ කට්ටියට දෙන එක ගැන අපිත් දැන ගන්න ඕනෑ. අඩු තරමින් පාර්ලිමේන්තුවවත් දැන ගන්න ඕනෑ. ඒකයි මම මේ ප්‍රශ්නය ඇහුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතකොට එයාලට ආපහු තර්ජනයක් වන එකක් නැද්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, කිසිම තර්ජනයක් වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ ගොල්ලන්ගේ ආරක්ෂක නිලධාරින් ගිහිල්ලා තැන් තැන්වල කරන වැඩවලින් ජනතාවටයි තර්ජනයක් වෙලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම පැමිණිලි තිබෙනවා නම් කරුණාකරලා ඉදිරිපත් කරන්න. ඊට පස්සේ ඒ ගැන විභාගයක් කරලා ඒ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, උතුරුකරයේ ඉතිරි වෙලා ඉන්න දේශපාලනඥයන් ටික දෙනා ඉතිරි වෙලා ඉන්නේ මේ හේතුව නිසායි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමාට දැන ගන්න ඕනෑ දේවල් මම කියන්නම්. ඒ අය මන්ත්‍රීවරු හෝ දේශපාලන පක්ෂවල නායකයන් හෝ නියෝජිතයන් හෝ නොවන අයයි. ඉතින්, ඒ වාගේ අයට අපි ආරක්ෂාව දීලා තිබෙනවා. [බාධා කිරීමක්] පක්ෂය බලලා නොවෙයි ආරක්ෂාව දීලා තිබෙන්නේ. ඒ නිසා අපට නම් ගම් කියන්න බැහැ. අපි ආරක්ෂාව දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විශේෂ දෙයක් තිබෙනවා නම් කරුණාකරලා ඒ අයගේ නම් ඉදිරිපත් කරන්න. ඒ නම් ඉදිරිපත් කරලා මේ අයටත් ආරක්ෂාව දීලා තිබෙනවාද කියලා ප්‍රශ්නය අහන්න.

හොඳයි, තුන්වැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, දැන් ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා ජනාධිපති සමාව ලැබිලා එළියට ඇවිල්ලා ඉන්නවා. එතුමා හිටපු හමුදාපතිවරයෙක්. එතුමා මේ රටට කර තිබෙන සේවය ගැනත් සලකා, හිටපු හමුදාපතිවරයකු විධියට, හිටපු මන්ත්‍රීවරයකු විධියට එතුමාටත් ආරක්ෂක නිලධාරින් ලබා දීලා, එතුමාගේ ජීවිතය ආරක්ෂා කරන්න රජය විසින් යම් කිසි ක්‍රියා මාර්ගයක් ගන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද, නැද්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ජනරාල් සරත් ෆොන්සේකා මහතා එහෙම ඉල්ලීමක් කරලා නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමා කියනවා නම්, ඔබතුමන්ලාගේ ජනාධිපති අපේක්ෂකයා හැටියට ඉදිරිපත් වුණු ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාට ඔබතුමන්ලාගෙන් තර්ජනයක් තිබෙනවා කියලා, අපි ඒ ගැන සොයා බලා එතුමාව ආරක්ෂා කර දෙන්න කටයුතු කරන්නම්. ඒ ගැන ගැටලුවක් නැහැ. දැනටමත් ඔබතුමන්ලා පිල් දෙකකට වෙලා ගහගන්නවා සරත් ෆොන්සේකා මහත්තමයා නිදහස් කර ගැනීම ගැන.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ ඔබතුමන්ලාගෙන් තර්ජනය තිබෙන අයට ආරක්ෂාව දෙන්නේ නැහැ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වන්න.

## සමෘද්ධි දීමනාව : වැය කළ මුදල
## சமுர்த்தி முத்திரைக் கொடுப்பனவு: செலவிட்ட பணம்
## SAMURDHI RATION ALLOWANCE : MONEY SPENT

2269/’12

12. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2011 වර්ෂය තුළ සමෘද්ධි මුද්දර දීමනාව වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම වර්ෂයේම සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුනරාවර්තන වියදම් කොපමණද;

(iii) ඉහත සඳහන් පුනරාවර්තන වියදම්වලට සාපේක්ෂව සමෘද්ධි මුද්දර දීමනාව වෙනුවෙන් වඩා වැඩි මුදලක් වෙන් කිරීම සුදුසු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011 ஆம் ஆண்டில் சமுர்த்தி முத்திரைக் கொடுப்பனவுக்காக செலவிடப்பட்டுள்ள மொத்தத் தொகை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி ஆண்டில் சமுர்த்தி நிகழ்ச்சித்திட்டத்தை அமுல்படுத்துவதற்கான மீண்டுவரும் செலவினம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி மீண்டுவரும் செலவினங்களுக்கு ஒப்பீட்டளவில் சமுர்த்தி முத்திரைக் கொடுப்பனவுக்கு அதிக நிதியை ஒதுக்குவது உகந்ததென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state -

(i) the total amount of money spent for Samurdhi ration allowance during 2011;

(ii) the recurrent expenditure for implementing the Samurdhi programme in that year;

(iii) whether he admits the fact that it is appropriate to allocate more funds for the Samurdhi ration allowance when compared to the aforesaid recurrent expenditure?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, මම ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2011 වර්ෂය තුළ සමෘද්ධි මුද්දර දීමනාව වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල රුපියල් මිලියන නවදහස් හතලිස්තුනයි දශම හතරයි හතරකි.(රු.මි. 9,043.44කි.)

(ii) එම වර්ෂයේදීම සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුනරාවර්තන වියදම් රුපියල් මිලියන එකසිය හතලිස්පහයි දශම හතරයි හතකි. (රු.මි. 145.47කි.)

(iii) සමෘද්ධි දීමනාව සඳහා වැඩි මුදලක් වෙන් කිරීම සුදුසු බව පිළිගනිමි. 2012 වසරේ අප්‍රේල් මස සිට සමෘද්ධි දීමනාව රුපියල් මිලියන 3,751කින් වැඩි කර ඇති අතර, එය 2011 වසරට සාපේක්ෂව සියයට 33ක වැඩිවීමකි. ඒ අනුව 2011 වසරේ පුනරාවර්තන වියදම, සමෘද්ධි මුද්දර දීමනාව වෙනුවෙන් වැය කරන ලද මුදලට සාපේක්ෂව සියයට 1.6ක් පමණි.

(ආ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න තුනක් අහන්න තිබෙනවා. ගරු ඇමතිතුමා සඳහන් කළ ආකාරයට -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ අතුරු ප්‍රශ්න තුනම මූලික පිළිතුරට අනුව පැන නඟින කරුණුද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අනිවාර්යයෙන්ම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම නම් අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ අතුරු ප්‍රශ්න තුන, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ලබා දුන් පිළිතුරට සාපේක්ෂවයි. මෙම ප්‍රශ්නයේ (අ)(iii) කොටසට දුන් පිළිතුරට අනුව ඔබතුමා සඳහන් කළා, මේ වසරේ අප්‍රේල් මාසයේ සිට සමෘද්ධි දීමනාව සියයට 33කින් වැඩි කර තිබෙනවාය කියලා. මම ඔබතුමාට මේ කාරණය සඳහන් කරන්නට කැමැතියි. විශේෂයෙන්ම පසු ගිය දවස්වල අපි දැක්කා, රුපියල් 250-615 දක්වා තිබුණු මුද්දරවල වටිනාකම රුපියල් 750 දක්වා වැඩි කර තිබෙනවා. රුපියල් 950කට තිබුණු මුද්දරය රුපියල් 1,200 දක්වා වැඩි කර තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා ජීනීවා යෝජනාවට මුවා වෙලා පෙට්‍රල්වල, ඩීසල්වල, භූමි තෙල්වල මිල වර්ධනයක් කළා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔය කථාවක් නේ කරන්නේ, මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම මේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම එකක් මේ ප්‍රශ්නයේ නැහැ. කෙළින්ම ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හොඳයි, කෙළින්ම අහන්නම්. ජිනීවා යෝජනාවට, අලුත් අවුරුද්දට, වෙසක් පෝයට මුවා වෙලා ජීවන බර වර්ධනය කළා. මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. ඔබතුමන්ලාගේම රජයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් කියනවා, හතර දෙනෙක් ඉන්න පවුලකට මාසයකට ජීවත් වන්න රුපියල් 31,331ක් අවශ්‍යයි කියලා. එතකොට ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේ පිළිතුරට ඒක අදාළ නැත.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අදාළයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මම නේ ඒක තීරණය කරන්නේ. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම මේ ප්‍රශ්නය අහන්නේ. ඔබතුමන්ලා සමෘද්ධි මුද්දරය වර්ධනය කළායි කියලා කිව්වාට ඒ වර්ධනය කළ ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ. ඔබතුමන්ලාගේම රජයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරුවලට අනුව ජීවත් වන්න රුපියල් 31,000ක් අවශ්‍යයි. ඉතින් මම අහන්න කැමැතියි, මගේ ප්‍රශ්නය-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න අහන වෙලාවට අනවශ්‍ය කථා කළොත් මම ඒවා ප්‍රචාරය කරන්න දෙන්නේ නැහැ. කපලා දානවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි.

එහෙම නම් මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මම ඍජුවම අහන්න කැමැතියි, සමෘද්ධි මුද්දරය අඩුම ගණනේ මාසයකට රුපියල් 10,000ක්වත් කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මම හිතන හැටියට මෙතුමා රටේ නායකයා වෙන්න ඉන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාත් කෙළින්ම ඒකට පිළිතුර දෙන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මේ සමෘද්ධි මුද්දරය කියන එක මිනිස්සුන්ට ජීවත් වන්න දෙන මුද්දරයක් නොවෙයි. මෙතුමා කියන්නේ මුළු පඩියක් වාගේ සමෘද්ධි මුද්දරයක් දෙන්න කියලා. සමෘද්ධිය දෙන්නේ මිනිස්සුන්ට ජීවත් වීමට බඩු ගන්නම නොවෙයි. ඒකේ ප්‍රතිලාභ 17ක් තිබෙනවා. මේ සමෘද්ධි මුද්දරයත් එක්ක ඒ ප්‍රතිලාභ 17 මිනිස්සුන්ට ලැබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අනෙක් කාරණය ගරු කථානායකතුමනි, භූමිතෙල්වලට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පොඩ්ඩක් ඉන්න, දෙවෙනි අතුරු ප්‍රශ්නය අහනකම්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
භූමිතෙල් ගැන අහපු ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. අපි දුප්පත් අයට භූමිතෙල්වලට අවුරුද්දකට රුපියල් 1,200ක් දෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොහෙන්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නයද කොහෙදෝ ඇහුවා. [බාධා කිරීම්] ඒ අතුරු ප්‍රශ්නයට එකඟ වෙන්නේ නැද්ද? අතුරු ප්‍රශ්න අහන්න වෙනත් කාටවත් දෙන්නේ නැද්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අපි දෙන්නාම එකම දිස්ත්‍රික්කයේ නේ. පොඩ්ඩක් අවස්ථාව දෙන්න, මට ප්‍රශ්න අහන්න. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන එක නොවෙයි, තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ, දෙවැනි අතුරු ප්‍රශ්නය. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා දැන් මේ සමෘද්ධි සහනාධාරය ලබා දීමේ ක්‍රමය වෙනස් කරලා තිබෙනවා. ඒ කියන්නේ, වෙනදාට මෙය ලබා දුන්නේ සමුපකාර ප්‍රාදේශිකයෙන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ කියන එක වැඩක් නැහැ, වෙනස් කරලාද කියලා අහන්න. ප්‍රශ්න අහන හැටිත් දැන් මෙතැනින් උගන්වන්න වෙලා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වෙනස් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නය අහන්න අවස්ථාව ලබා දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර එපා. විස්තර වෙන තැනක කථා කර ගන්න. දැන් ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙතෙක් සමුපකාර ප්‍රාදේශිකය හරහා ක්‍රියාත්මක වුණු සමෘද්ධි සහනාධාරය ලබා ගන්නට දැන් සමෘද්ධි ප්‍රතිලාභියා සමෘද්ධි බැංකුව කරා යන්නට ඕනෑ. වෙනදාට පවුලේ ඕනෑම කෙනෙකුට ගිහිල්ලා මේ සමෘද්ධි සහනාධාරය ලබා ගන්න පුළුවන්. දැන් එය ලබා ගන්න යන්න පුළුවන් ගෘහ මූලිකයාට පමණයි. ඇයි එහෙම රස්තියාදු කරන්නේ කියලා මම අහන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ප්‍රශ්නය තේරෙනවා. කිසිම රස්තියාදුවක් නැහැ. දැන් ජනතාව ඉතාමත්ම කැමැත්තෙන් මෙය පිළිඅරගෙන තිබෙනවා. අපි මේ

සමෘද්ධිය සඳහා දෙන මුදල් ඒ අයගේ ගිණුමටයි තැන්පත් කරන්නේ. ගිණුමට මුදල් තැන්පත් කළාම ඒ සමෘද්ධි ප්‍රතිලාභින්ට ඒ මුදල් අරගෙන ඕනෑ දෙයක් කරන්න පුළුවන්. දැන් සමෘද්ධි ප්‍රතිලාභින් ඒ මුදල් නැවත ගන්නෙත් නැහැ. ඒක ණය මුදල්වලට පරිවර්තනය කරලා හොඳ අලුත් ක්‍රමවේදයකට සමෘද්ධිය ඇවිල්ලා තිබෙනවා. [බාධා කිරීම්] දැන් ඕනෑ වෙලාවට ඒ මුදල් ගන්න පුළුවන්. ඉස්සර සමුපකාරයෙන් දෙන ඕනෑ එකක් ගන්න ඕනෑ. අද සමෘද්ධිලාභියාට නිදහස තිබෙනවා, තමුන්ට ඕනෑ වෙලාවක ඕනෑ දෙයක් ගන්න. ඒ ගොල්ලන් දැන් ඒ මුදල ඇපයට තියලා ණය මුදල් ගන්නවා. ඒක හොඳ වැඩ පිළිවෙළක් හැටියට පිළිගෙන තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගෙන් අහන්න ඕනෑ, මේක හොඳ වැඩක්ද නැද්ද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. තුන්වැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔව්, ඉතින් රුපියල් සියයක වැඩි කිරීමට රුපියල් තුන්සියයක් වැය කරන්න ඕනෑ ඒක ගන්න. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැය කළාද කියලා අහන්නේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ, ඇහුවේ නැහැ. ගරු කථානායකතුමාට මාත් එක්ක පොඩි තරහක් තිබෙනවා වාගේ. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තරහක් නැහැ. මේ ක්‍රමය වැරැදියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න ඇසීමේදී අපට පොඩි ලිහිල්භාවයක් අරගෙන දෙන්න.

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේදී සඳහන් කළා, මේ සමෘද්ධි වැඩසටහන තුළ වැඩසටහන් 14ක් තිබෙනවා කියා. ඒ වාගේම ඔබතුමන්ලා පටන් අරගෙන තිබෙනවා, "දිවි නැඟුම" වැඩසටහන. දැන් පසු ගිය දවසක කඩුවෙල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී -ගරු විමල් වීරවංශ මැතිතුමා තමයි ඒ කමිටුවේ සභාපතිතුමා- එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සුරේෂ් ප්‍රියදර්ශන කියන නාගරික මන්ත්‍රීතුමා කියා තිබෙනවා, "දිවි නැඟුමෙන්" ලබා දෙන බීජ ඇට පැළ වෙන්නේ නැහැයි කියලා. ඉතින් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි- [බාධා කිරීමක්] නැහැ, නැහැ. මම කරුණු කාරණා, දත්ත සහිතවයි අහන්නේ. [බාධා කිරීමක්] ප්‍රශ්නය අහලා ඉවර නැහැ. ප්‍රශ්නය අහලා ඉවර වෙනකම් ඉන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහ ගෙන ඉන්න. දැන් බීජවලට ගිහිල්ලායි තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේවා සමෘද්ධි බීජ.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, සමහර ඇට තිබෙනවා, පැළ වෙන්නේ නැති ඒවා. පුස් ඒවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කථා කරන්නේ සමෘද්ධි බීජ ගැන. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ වාගේ ප්‍රමිතියෙන් තොරව, සමෘද්ධි ලාභීන්ට සැලකීම සුදුසුද, නුසුදුසු ද කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, අපි සමෘද්ධි ලාභියාට එහෙම සලකන්නේ නැහැ. සමෘද්ධි ලාභියා ඉතාමත්ම වැදගත් පුරවැසියෙක් හැටියටයි අපි සලකන්නේ. අපේ මේ ආණ්ඩුව සමෘද්ධි දීමනාව වැඩි කර තිබෙනවා. සමෘද්ධියට දෙන්න පුළුවන් ඉහළම ප්‍රමුඛත්වය ලබා දීලා තිබෙනවා. ලක්ෂ තිස්හත්දහසක් වැඩි කරලා තිබෙනවා, මේ අවුරුද්දේ.[බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, දැන් බීජවලින් කොළඹ- [බාධා කිරීමක්] තුන්වැනි අතුරු ප්‍රශ්නයට අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන් ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තවම ස්ථාවර නියෝග සංශෝධනය කළේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කෝටි 900යි සමෘද්ධි ලාභීන්ට-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කෝටි 900 නොවෙයි. ඔබතුමා අහ ගෙන හිටියේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අර පැළ වෙන්නේ නැති බීජ ගැන ටිකක් අවධානය යොමු කරන්න.

ප්‍රශ්න අංක 13 - 1657/'11 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මාතර නම් බණ්ඩක්කා ඇට දීපුවා පැළ වෙලා තිබුණා.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - உயர் கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake - Deputy Minister of Higher Education)
ගරු මන්ත්‍රීතුමා, ඒකද අහන ප්‍රශ්නය? ඔබතුමා එහෙන්ද මගෙන්ද මේ ප්‍රශ්නය අහන්නේ?

## වෛද්‍ය පීඨ සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව : විස්තර
மருத்துவபீடத்துக்கு இணைக்கப்பட்ட மாணவர்கள்: விபரம்
STUDENTS ENROLLED TO MEDICAL FACULTIES : DETAILS

1657/'11

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2005-2006 අධ්‍යයන වර්ෂයේ සිට 2010-2011 අධ්‍යයන වර්ෂය දක්වා රජයේ විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2009-2010 සහ 2010-2011 අධ්‍යයන වර්ෂවලදී වෛද්‍ය පීඨ සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009-2010 අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 2010-2011 අධ්‍යයන වර්ෂයේදී වෛද්‍ය පීඨ සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාවෙහි අඩු වීමක් තිබේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பல்கலைக்கழக மானிய ஆணைக்குழுவினால் 2005-2006 கல்வி ஆண்டு முதல் 2010-2011 கல்வி ஆண்டு வரை அரசாங்க பல்கலைக் கழகங்களுக்கு இணைத்துக் கொள்ளப்பட்ட மொத்த மாணவர்களின் எண்ணிக்கை வருடாந்த அடிப்படையில் தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) 2009-2010 மற்றும் 2010-2011 கல்வி ஆண்டுகளில் மருத்துவபீடத்துக்கு இணைத்துக் கொள்ளப்பட்ட மாணவ, மாணவிகளின் எண்ணிக்கை தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iii) 2009-2010 ஆம் கல்வி ஆண்டுடன் ஒப்பிடுகையில் 2010-2011 கல்வி ஆண்டில் மருத்துவ பீடத்துக்கு இணைத்துக் கொள்ளப் பட்ட மாணவர்களின் எண்ணிக்கையில் ஏதேனும் குறைவு ஏற்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறாயின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he inform this House -

(i) separately, of the total number of students enrolled by the University Grants Commission to the government universities in each of the years during the period from the academic year 2005 - 2006 up to the academic year 2010 - 2011;

(ii) separately, of the number of male students and female students enrolled to the medical faculties in the academic years 2009—2010 and year 2010 - 2011;

(iii) whether there is a decline in the number of students enrolled to the medical faculties in the academic year 2010 - 2011 in comparison with the academic year 2009 - 2010; and

(iv) if so, the reasons for it?

(b) If not, why?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| අධ්‍යයන වර්ෂය | බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 2005/2006 | 17,287 |
| 2006/2007 | 17,248 |
| 2007/2008 | 20,069 |
| 2008/2009 | 20,270 |
| 2009/2010 | 21,547 |
| 2010/2011 | 22,016 |

(ii)

| විශ්වවිද්‍යාලය | බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|
| | 2009/2010 අධ්‍යයන වර්ෂය | 2010/2011 අධ්‍යයන වර්ෂය |
| කොළඹ විශ්වවිද්‍යාලය | 190 | 192 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 148 | 152 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 159 | 163 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 195 | 196 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 140 | 144 |
| රජරට විශ්වවිද්‍යාලය | 180 | 180 |
| නැඟෙනහිර විශ්වවිද්‍යාලය | 54 | 50 |
| යාපනය විශ්වවිද්‍යාලය | 100 | 100 |
| එකතුව | 1166 | 1177 |

(iii) නැත.

(iv) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව වර්ෂ දෙක අතර ශිෂ්‍ය සංඛ්‍යාවේ වැඩි වීම තිබෙන්නේ හයයිද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඔබතුමා 1,177න් 1,166ක් අඩු කරලා බලන්න. ඒක තමයි වැඩි වීම.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
1,171යි කියලා නේද ඔබතුමා කිව්වේ?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
1,177යි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හරි, එහෙනම් 11යි නේ.

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මේකයි. ශිෂ්‍යයන් 11ක වැඩි වීමක් තමයි තිබෙන්නේ.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
වෛද්‍ය පීඨයේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වෛද්‍ය පීඨයේ තමයි. මේ ප්‍රශ්නය වෛද්‍ය පීඨය ඉලක්ක කරලා නේ අහලා තිබෙන්නේ. මීට අමතරව පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය සඳහා ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ. ඔබතුමා ඒක වෙනම ප්‍රශ්නයක් විධියට ඇහුවොත් ඒ සංඛ්‍යා ලේඛන හොයලා ඔබතුමාට පිළිතුරු දෙන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් දෙවැනි අතුරු ප්‍රශ්නයට යන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට ඔබතුමන්ලාගේ සම්බන්ධයක් තිබෙනවා නේ. ඒ නිසා ඔබතුමන්ලා ඒ ගැන දන්නේ නැද්ද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
අපේ සම්බන්ධයක් නැහැ. සමාගම් ලියා පදිංචි කිරීමේ පනත යටතේ තමයි ඔබතුමා අදහස් කරන ඔය වෛද්‍ය විද්‍යාල ඇති කර තිබෙන්නේ. අපි නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නයත් ඇහුවා. දැන් ඔබතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එහෙනම් ඒ වෙනුවෙන් ඇයි මේ අය මෙච්චර කඹුරන්නේ?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
අපි කඹුරන්නේ නැහැ. කඹුරනවා කියන්නේ වැඩ කරනවා කියන එක නේ. අප කඹුරන්නේ නැහැ. අප උත්සාහ දරනවා මේවා විධිමත් කරන්න. පෞද්ගලික විශ්වවිද්‍යාල පනතක් ගෙනැල්ලා සමාගම් යටතේ ලියා පදිංචි වෙච්ච ඒවා තිබෙනවා නම් විධිමත් ආකාරයෙන් රජයේ විශ්වවිද්‍යාලවල ආකාරයටම කරගෙන යන්න අප බලනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එතකොට සායනික පුහුණුව?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
අපේ ප්‍රමිතියට අනුව තමයි ඒවාත් කෙරෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14-1748/'11-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න හැම දාම කල් ඉල්ලනවා නේ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15-2036/'11-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති 3ක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගමන් වියදම් ගැන අහලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න අමාත්‍යවරුන් නොසිටින අවස්ථාවල කරුණාකර ඒ අමාත්‍යතුමා නියෝජ්‍ය අමාත්‍යවරුන්ට සභාවට පැමිණීමට උපදෙස් දෙන්නේ නම් හොඳයි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 4 - ගරු අජිත් කුමාර මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඉන්න නිසා ද කියන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, ඔබතුමා ඉස්සෙල්ලාම ප්‍රශ්නය අහනකොට ඇවිත් හිටියේ නැද්ද? මට මතක ඔබතුමා ඇවිල්ලා හිටියා වාගේ.

හොඳයි. මම කනගාටු වෙනවා.

ප්‍රශ්න අංක 1 - ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පිළිතුරක් ලැබේවායි කියලා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ. මම පිළිතුරු දෙනවා.

## ලැබී ඇති සමස්ත ණය සහ ප්‍රදානයන්: විස්තර
### பெற்ற கடன்கள் மற்றும் மானியங்கள்: விபரம்
### LOANS AND GRANTS RECEIVED : DETAILS

1064/'11

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2009, 2010 වර්ෂවලදී සහ 2011 වර්ෂයේ මේ දක්වා ලැබී ඇති සමස්ත ණය සහ ප්‍රදානයන්ගේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් අයුරින් ලැබුණු ණය සහ ප්‍රදානයන් යොද ගනු ලැබූ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අයුරින් ලබාගත් එක් එක් ණය මුදලට අදාළව,

(i) සියල්ල ඇතුළත් සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(ii) ණය කාල සීමාව කොපමණද;

(iii) ණය කාල සීමාව අවසානයේදී ගෙවා ඇති සමස්ත පොලිය සහ ණය ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2009, 2010, 2011 இற்றைவரைக்கும் பெற்றுக் கொள்ளப்பட்ட கடன்கள், மானியங்களை தனித்தனியாகவும் மொத்தமாகவும் எவ்வளவு என்பதையும்;

(ii) மேலே கூறப்பட்டவாறு பெறப்பட்ட கடன்கள் மானியங்கள் எக் கருத்திட்டங்களுக்காகப் பயன்படுத்தப்பட்டன என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஆ) பெறப்பட்ட கடன்களின்,

(i) அனைத்தும் உள்ளடங்கிய சராசரி வட்டி வீதம் எவ்வளவு என்பதையும்;

(ii) கடன் காலப்பகுதி எவ்வளவு என்பதையும்;

(iii) கடன் காலப்பகுதியின் முடிவில் மொத்த வட்டி மற்றும் கடன் கட்டணம் எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state-

(i) the total loans and grants received in 2009, 2010, 2011 to date separately; and

(ii) the projects on which the loans and grants received as per above have been used for?

(b) Will he also state on per loan taken-

(i) the all inclusive average interest rate;

(ii) the loan period; and

(iii) the total interest, loan fee at the end of the loan period?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2009, 2010 වර්ෂවලදී සහ 2011 වර්ෂයේ සැප්තැම්බර් 30 දින දක්වා ලැබී ඇති සමස්ත විදේශ ණය සහ ප්‍රදානයන්ගේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ:

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඇමෙරිකන් ඩොලර් මිලියන 123ක් ගැන කිව්වා. එය ප්‍රදානයක්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔව්, ප්‍රදානයක්.[බාධා කිරීමක්] ඇමෙරිකන් ඩොලර් මිලියන 123.6යි. ප්‍රදානයන් කියන්නේ grants. [බාධා කිරීමක්] අවුරුද්දෙන් අවුරුද්ද ප්‍රදානයන් වෙනස් වෙනවා නේ. That is nothing strange .

(ii) ණය සහ ප්‍රදානයන් යොදා ගනු ලැබූ ව්‍යාපෘති ඒ ඒ වර්ෂය අනුව ඇමුණුම 1හි දක්වා ඇත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වැඩියෙන්ම මුදල් වැය කරලා තිබෙන දෙකක් මට නම් කරන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

එකක් තමයි පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය. එය ඇ.එ.ජ. ඩොලර් 891,000,000. දෙවැනි එකත් ඔබතුමාට ඕනෑද? එය තමයි, පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය. ගරු කථානායකතුමනි, ඒ සියලු විස්තර ඇමුණුම 1හි දක්වා ඇත.

(ආ) (i) ඒ ඒ ව්‍යාපෘති ණය සඳහා අදාළ සියල්ල ඇතුළත් සාමාන්‍ය පොලී අනුපාතය ඇමුණුම 2හි දක්වා ඇත.

(ii) ඒ ඒ ව්‍යාපෘති ණය සඳහා අදාළ ණය කාල සීමාව ඇමුණුම 3හි දක්වා ඇත.

(iii) ගෙවා ඇති සමස්ත පොලිය සහ ණය ගාස්තුව පිළිවෙළින් ඇමුණුම 4හි තීරුව 4 හා 5හි දක්වා ඇත. ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) පැන නොනඟී.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
*Annexes tabled:*

ඇමුණුම 01

**2009 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ණය**

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ණය මුදල (ඇ.එ.ජ.ඩොලර්) |
|---|---|---|
| 2009/03/09 | කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 34,092,028 |
| 2009/04/16 | රුහුණුපුර ජලසම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 69,062,828 |
| 2009/01/12 | හතරවන ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය - යුරෝ කොටස | 19,598,316 |
| 2009/12/16 | ආපදා කළමණාකරන හා හදිසි ප්‍රතිචාර පද්ධතිය ව්‍යාප්ත කිරීම | 36,276,959 |
| 2009/07/17 | ලබුගම ජලපිරිපහදු බලාගාරය පුනරුත්ථාපනය කිරීම | 23,578,509 |
| 2009/07/17 | කලටුවාව ජලපිරිපහදු බලාගාරය පුනරුත්ථාපනය කිරීම | 24,523,482 |
| 2009/07/14 | සුනාමියෙන් හානියටපත් ප්‍රදේශයන්හි කැණීම්හි පිරිසිඳුකිරීම් සඳහා මඩ අදින යන්ත්‍රයක් සපයා ගැනීම | 22,129,924 |
| 2009/08/06 | හම්බන්තොට බංකර පහසුකම් හා තටාකාංගන ව්‍යාපෘතිය | 65,094,508 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ1, ඒ2, ඒ3, ඒ4 කොටස | 248,200,000 |
| 2009/12/25 | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - පියවර II | 891,000,000 |
| 2009/06/17 | පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 161,080,966 |
| 2009/06/29 | වියළි කලාපයේ ග්‍රාමීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 62,019,490 |
| 2009/10/22 | නැගෙනහිර හා උතුරුමැද පලාත්බද මාර්ග ව්‍යාපෘතිය | 71,804,757 |
| 2009/12/18 | මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතිය (OCR) සහ (ADF) | 100,612,421 |
| 2009/08/14 | සෞඛ්‍ය අංශය සංවර්ධනය කිරීම සඳහා අමතර මූල්‍යය | 25,318,522 |
| 2009/10/22 | දෙවෙනි ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 79,853,480 |
| 2009/11/07 | PPA- උතුර හා නැගෙනහිර ප්‍රාදේශය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූලික කටයුතු සැකසීම (අත්තිකාරම) | 1,000,000 |
| | **එකතුව** | **1,935,246,190** |

*සටහන්:* *ඇ.එ.ජ ඩොලර් විනිමයට හැරවීමේ දී ඒ ඒ ගිවිසුම් අත්සන් කරන ලද දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් උපයෝගීකර ගෙන ඇත.*

*ඇමුණුම 01 ඉතිරි...*

**2009 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ප්‍රදාන**

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) |
|---|---|---|
| 2009/11/19 | උතුරු නැගෙනහිර ප්‍රජා ප්‍රතිස්ථාපන හා සංවර්ධන වැඩසටහන II | 7,395,600 |
| 2009/11/19 | උතුරු ප්‍රදේශයේ ප්‍රතිසංස්කරණ හදිසි ව්‍යාපෘතිය | 11,093,400 |
| 2009/12/03 | උතුරු හා නැගෙනහිර පලාත්හි මානුෂීය සහාය | 20,061,740 |
| 2009/01/29 | අනුරධපුර ශික්ෂණ රෝහල වැඩිදියුණු කිරීම(අදියර II) | 4,326,313 |
| 2009/03/19 | 2 KR- වරප්‍රසාද නොලත් ගොවීන්ගේ ආහාර සුරක්ෂිතතාව -2008 | 5,416,477 |
| 2009/12/04 | සූර්ය බලශක්ති ජනන පද්ධති ආශ්‍රයෙන් පිවිතුරු බලශක්ති හඳුන්වාදීම | 9,745,281 |
| 2009/12/04 | යාපනයේ ඉපැරණි ලන්දේසි කොටුව පුනරුත්ථාපනය හා සංරක්ෂණය | 543,482 |
| 2009/06/01 | කර්මාන්තයන් පිළිබඳ ජාල ව්‍යාපෘතිය [ගැලපීමේ වැඩසටහන] | 99,995 |
| 2009/12/08 | යාපනය දිස්ත්‍රික්කයේ නිවාස වැඩසටහන සඳහා මුදල් ලබා දීම | 1,250,000 |
| 2009/08/20 | ගාල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය පුනරුත්ථාපනය කිරීම අදියර ii | 2,795,832 |
| 2009/08/25 | ඉහල උසාවි සංකීර්ණය හානිපූරණය හා නැවත සකස්කිරීම | 29,292 |
| 2009/11/23 | යන්ත්‍රෝපකරණ හා උපකරණ ප්‍රදානය | 2,423,118 |
| 2009/08/24 | ගෝලීය වෙළඳපොලේ තරඟකාරීත්වය වැඩිදියුණු කිරීම | 2,870,000 |
| 2009/08/20 | ඉලක්කගත වරප්‍රසාද නොලත් කණ්ඩායම් සමාජගත කිරීම | 1,029,838 |
| 2009/09/29 | සාමය, යහ පාලනය හා පුරවැසි අයිතිවාසිකම් | 2,371,000 |

ඇමුණුම 01 ඉතිරි...

| | | |
|---|---|---|
| 2009/11/24 | සාම ක්‍රියාවලිය සඳහා සහාය | 1,234,179 |
| 2009/06/17 | පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 2,200,000 |
| 2009/06/29 | වියළි කලාපයේ ග්‍රාමීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 25,220,000 |
| 2009/09/03 | පළාත්බද මාර්ග නියෝජිතායතනයන්ගේ ධාරිතා වර්ධනය සඳහා තාක්ෂණික සහාය | 800,000 |
| 2009/03/11 | අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා කෘෂිකාර්මික සහාය ලබාදීමේ කඩිනම් ව්‍යාපෘතිය | 360,000 |
| 2009/05/22 | දකුණු හා අග්නිදිග අසියානු කලාපයේ ධීවර ජනජීවිතය නැංවීමේ වැඩසටහන | 1,900,000 |
| 2009/06/02 | බෙංගාල බොක්ක ප්‍රදේශයේ මුහුදු පරිසර පද්ධතියේ තිරසාර කළමණාකරනය | 4,000,000 |
| 2009/09/30 | නැගෙනහිර පලාතේ ගොවිපවුල් අතර ආහාර සුරක්ෂිතතාව නැංවීම | 7,497,838 |
| 2009/09/29 | දකුණු පලාතේ ජලජ සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | 375,000 |
| 2009/10/02 | කෘෂිකර්ම හා ආහාර සුරක්ෂිතතාව සහාය ව්‍යාපෘතිය | 643,501 |
| 2009/07/23 | පශ්චාත් සුනාමි වෙරළ සංරක්ෂණ සහ සම්පත් කළමණාකරන ව්‍යාපෘතිය | 6,919,915 |
| 2009/08/06 | පශ්චාත් සුනාමි වෙරළ සංරක්ෂණ සහ සම්පත් කළමණාකරන ව්‍යාපෘතිය | 975,291 |
| 2009/06/16 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමනයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය | 472,634 |
| 2009/07/07 | සමෘද්ධි ආරක්ෂිත දැල් වැඩසටහනේ නියාමන හා පසුවිපරම වැඩිදියුණු කිරීම | 450,000 |
| 2009/01/02 | දූෂණයට එරෙහි සහාය ව්‍යාපෘතිය | 300,000 |
| 2009/02/02 | නිරිතදිග වැසි වනාන්තරයන්ගේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම | 225,450 |
| 2009/02/17 | දකුණු දකුණු සහයෝගීතාව තුළින් හැකියා වර්ධනය | 130,320 |
| 2009/01/12 | වතුකරයේ සමාජ සංවර්ධනය | 100,000 |
| 2009/04/06 | යුක්තිය සඳහා සම ප්‍රවේශය - අදියර II | 7,740,000 |
| 2009/04/30 | නවතාංවයන් පිළිබඳ ප්‍රතිස්ථාපන වැඩසටහන | 16,801,095 |
| 2009/07/10 | ප්‍රාදේශීය පාලනය ව්‍යාපෘතිය | 125,000 |
| 2009/02/02 | ආගන්තුක ආක්‍රමනකාරී ජීවීන් පාලනය කිරීමේ වැඩසටහන | 215,000 |
| 2009/11/25 | මානව අයිතිවාසිකම් ප්‍රතිබද්ධ වැඩසටහන | 300,000 |
| 2009/12/30 | වන එළිපෙහෙලි කිරීම, ඉඩම් සැකසීම හා නැවත පදිංචිකරුවන්ට සහන | 2,010,579 |
| 2009/12/30 | දිගුකාලීන සහන ප්‍රතිස්ථාපන මෙහෙයුම් වැඩසටහන | 134,907,780 |
| | **එකතුව** | **287,354,951** |

*සටහන්:* *ඇ.එ.ජ ඩොලර් විනිමයට හැරවීමේ දී ඒ ඒ ගිවිසුම් අත්සන් කරන ලද දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් උපයෝගීකර ගෙන ඇත.*

**2010 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ණය**

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ණය මුදල ඇ.එ.ජ.ඩොලර්) |
|---|---|---|
| 2010/12/16 | ප්‍රමුඛ මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 152,800,000 |
| 2010/04/17 | මහ ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය | 3,385,375 |
| 2010/03/02 | සුනාමියෙන් හානියටපත් හා දුෂ්කර රෝහල් සඳහා වෛද්‍ය උපකරණ, ශල්‍යාගාර හා ඔක්සිජන් සාන්ද්‍රකයන් ලබාදීම | 12,901,316 |
| 2010/03/10 | කොළඹ මාතර දුම්රිය මාර්ගය උත්ශ්‍රේණිගත කිරීම අදියර II | 67,400,000 |
| 2010/11/26 | ඕමන්තේ - පලාලි, මඩු - තලෙයිමන්නාරම හා මැදවච්චිය දුම්රිය මාර්ගය | 416,390,000 |
| 2010/03/26 | පළාත්බද / ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම පලාත හා සබරගමුව පලාත) | 99,047,097 |
| 2010/03/26 | පළාත්බද / ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (නැගෙනහිර පලාත) | 42,892,283 |
| 2010/03/26 | නැගෙනහිර පලාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 53,050,127 |
| 2010/03/26 | මහනුවර නගරයේ අපජල කළමණාකරන ව්‍යාපෘතිය | 152,389,303 |
| 2010/03/26 | ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය (II) | 49,242,288 |
| 2010/11/02 | හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 38,197,292 |
| 2010/08/30 | ගාල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය පුනරුත්ථාපනය කිරීම - අදියර ii | 1,604,273 |
| 2010/09/15 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 46,056,262 |
| 2010/07/06 | අම්පාර දිස්ත්‍රික්කයේ පහසුකම් නොලද ප්‍රදේශයන්හි ඒකාබද්ධ ජල සම්පාදන පද්ධතිය - අදියර III | 105,190,000 |
| 2010/01/17 | ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය 8 ක්‍රියාත්මක කිරීම | 83,413,056 |
| 2010/02/08 | රුසියානු ණය මාලාව | 300,000,000 |
| 2010/03/08 | ජය බහාලුම් පර්යන්තයේ බහාලුම් හැසිරවීමේ උපකරණ මිලදී ගැනීමේ හදිසි ව්‍යාපෘතිය | 35,000,000 |

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ඇමුණුම 01 ඉතිරි...

| | | |
|---|---|---|
| 2010/03/05 | මත්තල හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ව්‍යාපෘතිය | 190,785,771 |
| 2010/03/05 | දුම්රිය සේවය සඳහා ඩීසල් එන්ජින් 13ක් එක්කිරීමේ ව්‍යාපෘතිය | 102,730,800 |
| 2010/09/09 | එම්. ඒ. 60 ගුවන්යානා දෙකක් සැපයීමේ ව්‍යාපෘතිය | 41,114,296 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ බලශක්ති අංශය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීමේ වැඩසටහන | 31,659,392 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඒ009) ගල්කුලම සිට කි.මී.230 කණුව දක්වා) | 71,021,514 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (11බී) | 42,509,700 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (11ඒ)(මුලතිවු - කෝකිලායි) | 42,777,300 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඒබී020, ඒබී032, ඒබී016,ඒබී018) | 75,420,000 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය-A009 ( කි.මී.230 කණුව සිට යාපනය) | 70,583,452 |
| 2010/01/07 | පැරණි ලක්ෂපාන ජලවිදුලි බලාගාරය පුනරුත්ථාපනය | 34,776,820 |
| 2010/06/21 | නැගෙනහිර දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය | 10,540,002 |
| 2010/06/07 | රාජ්‍ය මූල්‍ය කළමණාකරන කාර්යක්ෂමතා ව්‍යාපෘතිය | 50,000,000 |
| 2010/06/07 | උතුරු නැගෙනහිර ප්‍රජාප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය II අතිරේක | 12,267,731 |
| 2010/06/07 | ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශ සඳහා හදිසි ව්‍යාපෘතිය | 150,000,000 |
| 2010/08/27 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය(OCR) සහ (ADF) | 154,408,211 |
| 2010/02/23 | ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 24,245,264 |
| 2010/01/11 | පලාත්බද මාර්ග ව්‍යාපෘතිය | 103,238,346 |
| 2010/01/11 | ගැටුම්වලින් හානියටපත් ප්‍රදේශයන්හි ජනජීවිතය නංවාලීම සඳහා හදිසි අමතර මූල්‍යය | 11,870,067 |
| 2010/01/11 | හදිසි උතුරු ප්‍රතිසාධන ව්‍යාපෘතිය | 63,879,703 |
| 2010/08/26 | 21වැනි ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | 38,839,873 |
| 2010/11/08 | තිරසාර සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 18,237,342 |
| 2010/11/08 | උතුරු නැගෙනහිර ප්‍රාදේශීය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 51,882,092 |
| 2010/11/08 | කුඩා හා මධ්‍යම ව්‍යවසායකත්ව සංවර්ධන සහාය ව්‍යාපෘතිය | 59,428,578 |
| 2010/10/04 | ජාතික මහාමාර්ග අංශ ව්‍යාපෘතිය | 8,000,000 |
| 2010/10/04 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 16,000,000 |
| | **එකතුව** | **3,135,174,926** |

සටහන්: ඇ.එ.ජ ඩොලර් විනිමයට හැරවීමේ දී ඒ ඒ ගිවිසුම් අත්සන් කරන ලද දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් උපයෝගීකර ගෙන ඇත.

**2010 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ප්‍රදාන**

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) |
|---|---|---|
| 2010/08/13 | උතුරු පුනරුත්ථාපන හදිසි ව්‍යාපෘතිය [Aus AID ප්‍රදාන] | 10,539,070 |
| 2010/01/19 | නැගෙනහිර පලාතේ පාලම් 5ක් ප්‍රතිසංස්කරණය කිරීම (විස්තරාත්මක සැලසුම්) | 319,980 |
| 2010/03/26 | යාපනය ශික්ෂණ රෝහලේ මධ්‍යගත ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම | 24,859,134 |
| 2010/05/25 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව පිළිබඳ ව්‍යාපෘතිය | 2,539,600 |
| 2010/11/25 | නැගෙනහිර පලාතේ පාලම් 5ක් ප්‍රතිසංස්කරණය කිරීම | 14,580,759 |
| 2010/06/28 | ජාතික ලේඛනාරක්ෂණාගාරයේ ඇති ලන්දේසි වාර්තා ප්‍රතිසංස්කරණය, සංරක්ෂණය හා මහජන ප්‍රදර්ශනය | 114,336 |
| 2010/11/17 | ආර්ථික හා තාක්ෂණ සහයෝගිතාව 2010 | 7,487,439 |
| 2010/07/01 | ගෝලීය වෙළඳපොලේ තරඟකාරීත්වය ඉහළ නැංවීම (ප්‍රතිපාදන එක්කිරීම) | 9,000,000 |
| 2010/09/15 | ගෝලීය වෙළඳපොලේ තරඟකාරීත්වය ඉහළ නැංවීම (ප්‍රතිපාදන එක්කිරීම) | 4,689,687 |
| 2010/07/21 | ඉලක්කගත වරප්‍රසාද නොලත් කණ්ඩායම් සමාජගතකිරීම වැඩිදියුණු කිරීම(ප්‍රතිපාදන එක්කිරීම) | 300,000 |
| 2010/09/17 | ඉලක්කගත වරප්‍රසාද නොලත් කණ්ඩායම් සමාජගතකිරීම වැඩිදියුණු කිරීම(ප්‍රතිපාදන එක්කිරීම) | 9,047,726 |
| 2010/01/06 | සාමය, යහ පාලනය හා පුරවැසි අයිතිවාසිකම්(ප්‍රතිපාදන එක්කිරීම) | 589,365 |
| 2010/09/17 | සාමය, යහ පාලනය හා පුරවැසි අයිතිවාසිකම්(ප්‍රතිපාදන එක්කිරීම) | 8,410,000 |
| 2010/05/20 | සාම ක්‍රියාවලිය සඳහා සහාය(ප්‍රතිපාදන එක්කිරීම) | 10,130,000 |
| 2010/09/03 | සාම ක්‍රියාවලිය සඳහා සහාය(ප්‍රතිපාදන එක්කිරීම) | 2,000,000 |

ඇමුණුම 01 ඉතිරි..

| | | |
|---|---|---|
| 2010/02/16 | ජනජීවිතය නැංවීම හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම | 3,000,000 |
| 2010/10/26 | උතුරු ප්‍රෙද්ශයේ අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා පශ්චාත් ගැටුම් හදිසි ආධාර | 2,500,000 |
| 2010/02/03 | මුඛ හා කුර රෝගයෙන් නිදහස් බවට ආවික්ෂණය | 184,000 |
| 2010/02/08 | කිරිගව සම්පත හා මී ගව සම්පත වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 335,000 |
| 2010/02/08 | උතුරු ප්‍රදේශ සඳහා බීජ සහ අනෙකුත් කෘෂි යෙදවුම් සැපයීම | 876,000 |
| 2010/03/01 | ධීවරයන් සඳහා පසු අස්වනු ක්‍රම හා වෙළඳපොල වැඩි දියුණු කිරීම | 85,800 |
| 2010/08/11 | අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන් සඳහා කෘෂිකාර්මික හා ආහාර සුරක්ෂිතතා සහාය | 4,283,361 |
| 2010/08/31 | කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය | 405,000 |
| 2010/09/14 | උතුරු ප්‍රදේශයේ ආහාර සුරක්ෂිතතාව හා ජන ජීවිතය නැංවීම | 1,483,435 |
| 2010/06/30 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ බිම්බෝම්බ ඉවත් කිරීම සඳහා පංගුකාරීත්වය(ප්‍රතිපාදන එක්කිරීම) | 3,250,000 |
| 2010/06/30 | දකුණු - දකුණු සහයෝගීතාව තුළින් හැකියා වර්ධනය (ප්‍රතිපාදන එක්කිරීම) | 360,000 |
| 2010/10/04 | විගණකාධිපති දෙපාර්තමෙන්තුවේ ධාරිතා ශක්තිමත් කිරීම | 105,000 |
| 2010/09/02 | අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පදිංචිකිරීම සඳහා සහාය | 530,787 |
| 2010/11/23 | අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පදිංචිකිරීම සඳහා සහාය (ප්‍රතිපාදන එක්කිරීම) | 1,616,918 |
| | **එකතුව** | **123,622,396** |

සටහන්: *ඇ.එ.ජ ඩොලර් විනිමයට හැරවීමේ දී ඒ ඒ ගිවිසුම් අත්සන් කරන ලද දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් උපයෝගීකර ගෙන ඇත.*

**2011 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ණය**

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ණය මුදල (ඇ.එ.ජ.ඩොලර්) |
|---|---|---|
| 2011/03/31 | ප්‍රමුඛ මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 500,000,000 |
| 2011/03/22 | මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 | 390,978,455 |
| 2011/03/22 | වවුනියා - කිලිනොච්චි විදුලි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය (II) | 17,545,171 |
| 2011/09/29 | ස්වභාවික විපත්වලින් සිදුවූ හානි පුනරුත්ථාපනය සඳහා වූ හදිසි ව්‍යාපෘතිය | 91,467,188 |
| 2011/09/08 | සත්ව පාලනය සඳහා සතුන් ආනයනය කිරීම (නෙදර්ලන්තය හා ඔස්ට්‍රේලියාව) | 12,944,058 |
| 2011/07/26 | පර්යන්ත සඳහා ටර්බර්ග් වර්ගයේ යන්ත්‍ර 50ක් මිලදී ගැනීම | 4,000,000 |
| 2011/06/17 | ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය 4 -දීර්ඝකිරීම | 54,163,022 |
| 2011/02/17 | දක්ෂිණ අධිවේග මාර්ගයේ පින්නදූව හා කොඩගොඩ කොටස (කි.මී.30සිට කි.මී. 45 දක්වා) | 75,140,000 |
| 2011/02/17 | දක්ෂිණ අධිවේග මාර්ගයේ කොඩගොඩ හා ගොඩගම කොටස(කි.මී 45 සිට කි.මී 61 දක්වා) | 63,070,000 |
| 2011/04/29 | නවටකුලි - කරෙතිවු -මන්නාරම මාර්ගයේ කි.මී. 67ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 48,367,814 |
| 2011/04/29 | පුත්තලම-මරිච්චිකඩේ-මන්නාරම මාර්ගයේ කි.මී.113ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 73,208,841 |
| 2011/07/19 | ඌව පලාත ආලෝකමත් කිරීම සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය | 24,928,047 |
| 2011/02/08 | යාපනය හා කිලිනොච්චියේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව OCR සහ ADF | 89,246,306 |
| 2011/06/20 | තිරසාර බලශක්ති අංශයේ ව්‍යාපෘතිය (OCR) සහ (XDR) | 120,306,017 |
| 2011/07/22 | දෙවෙනි නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදනය - අමතර මූල්‍යය(OCR) සහ (XDR) | 17,741,096 |
| 2011/04/29 | මාර්ග අංශයේ සහාය ව්‍යාපෘතිය - දෙවෙනි අමතර මූල්‍යය | 103,092,824 |
| | **එකතුව** | **1,686,198,839** |

සටහන්: *ඇ.එ.ජ ඩොලර් විනිමයට හැරවීමේ දී ඒ ඒ ගිවිසුම් අත්සන් කරන ලද දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් උපයෝගීකර ගෙන ඇත.*

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ඇමුණුම 01 ඉතිරි..

2011 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යායනය කිරීම සඳහා ලබාගත් ප්‍රදාන

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) |
|---|---|---|
| 2011/04/21 | වත්තරමුල්ලායි, ඔනත්වීමඩම් සහ මඩකලපුවේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇතිකිරීම | 3,053,392 |
| 2011/07/11 | නුවරඑළියේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඇතිකිරීම | 2,016,069 |
| 2011/06/09 | මඩකලපුවේ කාන්තාවන් සඳහා වෙළඳ පහසුකම් සහ ප්‍රජා පුහුණුව | 1,850,000 |
| 2011/07/21 | කන්සකන්තුරෛ වරාය ප්‍රතිසංස්කරණය කිරීම | 2,200,000 |
| 2011/02/10 | රූපවාහිනී සංස්ථාවේ රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන උපකරණ වැඩිදියුණු කිරීම | 505,261 |
| 2011/03/31 | වරප්‍රසාද නොලත් ගොවීන්ගේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ව්‍යාපෘතිය | 4,346,366 |
| 2011/09/13 | මඩකලපුව හරහා මන්මුනෛ පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 15,660,901 |
| 2011/07/11 | මහල් තුනකින් යුතු පාසල් ගොඩනැගිල්ල සඳහා පකිස්ථානු අධාර | 125,000 |
| 2011/08/11 | ගැටුම්වලින් හානියටපත් ප්‍රදේශ සඳහා හදිසි ආධාර | 1,500,000 |
| 2011/08/01 | යාපනය හා කිලිනොච්චියේ ග්‍රාමීය ප්‍රදේශ සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂාව | 2,000,000 |
| 2011/09/15 | මන්නාරම දිස්ත්‍රික්කයේ නැවත අභ්‍යන්තර පැමිණි අවතැන් වූවන්ගේ ආහාර සුරක්ෂිතතාව | 370,000 |
| 2011/03/08 | උතුරු ප්‍රදේශයේ අභ්‍යන්තර පැමිණි අවතැන් වූවන්ගේ අත්‍යවශ්‍ය කෘෂි යෙදවුම් සඳහා ආධාර | 4,999,999 |
| 2011/07/22 | දකුණු ආසියාවේ තිරසාර ලෙස ඉඩම් කළමනාකරනය හා දේශගුණ විපර්යාස සඳහා හැඩ ගැසීම | 488,000 |
| 2011/01/31 | උතුරු පලාතේ ප්‍රාදේශීය මට්ටමේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම | 2,731,700 |
| 2011/08/30 | අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් නැවත පදිංචි කිරීම හා සමාජගත කිරීම සඳහා සහාය | 627,661 |
| 2011/03/08 | තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ වැඩසටහන 2010-14 | 8,800,000 |
| 2011/08/26 | හදිසි ආපදා මෙහෙයුම් වැඩසටහන | 8,869,131 |
| 2011/08/26 | දිගුකාලීන සහන ප්‍රතිස්ථාපන මෙහෙයුම් වැඩසටහන | 39,755,501 |
| එකතුව | | 99,898,981 |

සටහන්: ඇ.එ.ජ ඩොලර් විනිමයට හැරවීමේ දී ඒ ඒ ගිවිසුම් අත්සන් කරන ලද දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් උපයෝගීකර ගෙන ඇත.

ඇමුණුම 02

2009 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යායනය කිරීම සඳහා ලබාගත් ණය

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) | සාමාන්‍ය පොලි අනුපාතය (සේවා ගාස්තු අනුපාතය ද ඇතුළත්ව) % |
|---|---|---|---|
| 2009/03/09 | කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 34,092,028 | 0.83 |
| 2009/04/16 | රුහුණුපුර ජලසම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 69,062,828 | 1.50 |
| 2009/01/12 | හතරවන ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය - යූරෝ කොටස | 19,598,316 | 0.25 |
| 2009/12/16 | ආපදා කළමණාකරන හා හදිසි ප්‍රතිචාර පද්ධතිය ව්‍යාප්ත කිරීම | 5,441,544 | 3.05 |
| 2009/12/16 | ආපදා කළමණාකරන හා හදිසි ප්‍රතිචාර පද්ධතිය ව්‍යාප්ත කිරීම | 30,835,415 | 5.02 |
| 2009/07/17 | ලබුගම ජලපිරිපහදු බලාගාරය පුනරුත්ථාපනය කිරීම | 23,578,509 | 1.82 |
| 2009/07/17 | කලටුවාව ජලපිරිපහදු බලාගාරය පුනරුත්ථාපනය කිරීම | 24,523,482 | 1.82 |
| 2009/07/14 | සුනාමියෙන් හානියටපත් ප්‍රදේශයන්හි කැණීම්හි පිරිසිදුකිරීම් සඳහා මඩ අදින යන්ත්‍රයක් සපයා ගැනීම | 22,129,924 | 1.82 |
| 2009/08/06 | හම්බන්තොට බංකර පහසුකම් හා තටාකාංගන ව්‍යාපෘතිය | 65,094,508 | 3.40 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ2 කොටස | 63,573,815 | 3.30 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ1 කොටස | 70,041,527 | 3.30 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ3 කොටස | 47,801,344 | 3.30 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ4 කොටස | 66,783,314 | 3.30 |
| 2009/12/25 | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - පියවර II | 891,000,000 | 1.25 |
| 2009/06/17 | පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 135,000,000 | 6 Month LIBOR + 0.15 |
| 2009/06/17 | පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 26,080,966 | 1.25 |
| 2009/06/29 | වියළි කලාපයේ ග්‍රාමීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 62,019,490 | 1.25 |
| 2009/10/22 | නැගෙනහිර හා උතුරුමැද පලාත්බද මාර්ග ව්‍යාපෘතිය | 71,804,757 | 1.25 |
| 2009/12/18 | මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතිය (OCR) | 80,000,000 | 6 Month LIBOR +0.6 |
| 2009/12/18 | මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතිය (ADF) | 20,612,421 | 1.25 |
| 2009/08/14 | සෞඛ්‍ය අංශය සංවර්ධනය කිරීම සඳහා අමතර මූල්‍යය | 25,318,522 | 0.63 |
| 2009/10/22 | දෙවෙනි ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 79,853,480 | 0.63 |
| 2009/11/07 | PPA- උතුර හා නැගෙනහිර ප්‍රාදේශය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූලික කටයුතු සැකසීම (අත්තිකාරම) | 1,000,000 | * |
| එකතුව | | 1,935,246,190 | |

සටහන්: LIBOR = ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය - මෙය විචල්‍ය අනුපාතයක් බැවින් සම්පූර්ණ ණය කාලසීමාවට අදාළව එහි සාමාන්‍ය අගයයක් ගණනය කල නොහැකිය.

* මූලික ගිවිසුමක් පමණි. ප්‍රධාන ගිවිසුම අත්සන් තිරීමත් සමග මෙම ගිවිසුම අහෝසි වේ. එබැවින් පොලි අනුපාතයක් සඳහන් කල නොහැකිය. මෙහි ප්‍රධාන ගිවිසුම 2010 නොවැම්බර් 08 දින අත්සන් කර ඇති අතර එහි සේවා ගාස්තු අනුපාතිකය 0.75% කි.

ඇමුණුම 02 ඉණ.

**2010 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ණය**

|ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) | සාමාන්‍ය පොලී අනුපාතය ( සේවා ගාස්තු අනුපාතය ද ඇතුළත්ව) % |
|---|---|---|---|
| 2010/12/16 | ප්‍රමුඛ මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 152,800,000 | 6 Month LIBOR + 2.9 |
| 2010/04/17 | මහ ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය | 3,385,375 | 1 |
| 2010/03/02 | සුනාමියෙන් හානියටපත් හා දුෂ්කර රෝහල් සඳහා වෛද්‍ය උපකරණ, ශල්‍යාගාර හා ඔක්සිජන් සාන්ද්‍රකයන් ලබාදීම | 12,901,316 | 0.6 |
| 2010/03/10 | කොළඹ මාතර දුම්රිය මාර්ගය උත්ශ්‍රේණිගත කිරීම අදියර II | 67,400,000 | 12 Month LIBOR + 0.5 |
| 2010/11/26 | ඕමන්තේ - පලාලි, මඩු - තලෛමන්නාරම හා මැදවච්චිය දුම්රිය මාර්ගය | 416,390,000 | 12 Month LIBOR + 0.5 |
| 2010/03/26 | පළාත්බද / ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම පළාත හා සබරගමුව පළාත) | 99,047,097 | 0.75 |
| 2010/03/26 | පළාත්බද / ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (නැගෙනහිර පළාත) | 42,892,283 | 0.375 |
| 2010/03/26 | නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 53,050,127 | 0.005 |
| 2010/03/26 | මහනුවර නගරයේ අපජල කළමණාකරන ව්‍යාපෘතිය | 152,389,303 | 0.375 |
| 2010/03/26 | ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය (II) | 49,242,288 | 0.15 |
| 2010/11/02 | හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 38,197,292 | 0.1 |
| 2010/08/30 | ගාල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය පුනරුත්ථාපනය කිරීම - අදියර ii | 1,604,273 | 0.5 |
| 2010/09/15 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 46,056,262 | 2 |
| 2010/07/06 | අම්පාර දිස්ත්‍රික්කයේ පහසුකම් නොලද ප්‍රදේශයන්හි ඒකාබද්ධ ජල සම්පාදන පද්ධතිය - අදියර III | 105,190,000 | 6 Month LIBOR+ 1 |
| 2010/01/17 | ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය 8 ක්‍රියාත්මක කිරීම | 83,413,056 | CIR+2 |
| 2010/02/08 | රුසියානු ණය මාලාව | 300,000,000 | 6 Month LIBOR + 3.5 |
| 2010/03/08 | ජය බහාලුම් පර්යන්තයේ බහාලුම් හැසිරවීමේ උපකරණ මිලදී ගැනීමේ හදිසි ව්‍යාපෘතිය | 35,000,000 | 6 Month LIBOR + 3.99 |
| 2010/03/05 | මත්තල හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ව්‍යාපෘතිය | 190,785,771 | 1.25 |
| 2010/03/05 | දුම්රිය සේවය සඳහා ඩීසල් එන්ජින් 13ක් එක්කිරීමේ ව්‍යාපෘතිය | 102,730,800 | 1.25 |
| 2010/09/09 | එම්. ඒ. 60 ගුවන්යානා දෙකක් සැපයීමේ ව්‍යාපෘතිය | 41,114,296 | 1.25 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ බලශක්ති අංශය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීමේ වැඩසටහන | 31,659,392 | 6 Month LIBOR + 2.8 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඒ009) ගල්කුලම සිට කි.මී.230 කණුව දක්වා) | 71,021,514 | 6 Month LIBOR + 2.4 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (11බී) | 42,509,700 | 6 Month LIBOR + 2.4 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (11ඒ)(මුලතිවු - කෝකිලායි) | 42,777,300 | 6 Month LIBOR + 2.4 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඒබී020, ඒබී032, ඒබී016,ඒබී018) | 75,420,000 | 6 Month LIBOR + 2.4 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය-A009 ( කි.මී.230 කණුව සිට යාපනය) | 70,583,452 | 6 Month LIBOR + 2.4 |
| 2010/01/07 | පැරණි ලක්ෂපාන ජලවිදුලි බලාගාරය පුනරුත්ථාපනය | 34,776,820 | 6 Month LIBOR +2.1 |
| 2010/06/21 | නැගෙනහිර දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය | 10,540,002 | EURIBOR +2.1 |
| 2010/06/07 | රාජ්‍ය මූල්‍ය කළමණාකරන කාර්යක්ෂමතා ව්‍යාපෘතිය | 50,000,000 | 6 Month LIBOR + 0.6 |
| 2010/06/07 | උතුරු නැගෙනහිර ප්‍රජාප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය II අතිරේක | 12,267,731 | 1 |
| 2010/06/07 | ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශ සඳහා හදිසි ව්‍යාපෘතිය | 150,000,000 | 6 Month LIBOR + 0.6 |
| 2010/08/27 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය(OCR) | 130,000,000 | 6 Month LIBOR + 0.6 |
| 2010/08/27 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය(ADF) | 24,408,211 | 1.25 |
| 2010/02/23 | ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 24,245,264 | 0.75 |
| 2010/01/11 | පළාත්බද මාර්ග ව්‍යාපෘතිය | 103,238,346 | 0.625 |
| 2010/01/11 | ගැටුම්වලින් හානියටපත් ප්‍රදේශයන්හි ජනජීවිතය නංවාලීම සඳහා හදිසි අමතර මූල්‍යය | 11,870,067 | 0.625 |
| 2010/01/11 | හදිසි උතුරු ප්‍රතිසාධන ව්‍යාපෘතිය | 63,879,703 | 0.625 |
| 2010/08/26 | 21වැනි ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | 38,839,873 | 0.625 |
| 2010/11/08 | තිරසාර සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 18,237,342 | 0.625 |
| 2010/11/08 | උතුරු නැගෙනහිර ප්‍රාදේශීය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 51,882,092 | 0.625 |
| 2010/11/08 | කුඩා හා මධ්‍යම ව්‍යවසායකත්ව සංවර්ධන සහාය ව්‍යාපෘතිය | 59,428,578 | 0.625 |
| 2010/10/04 | ජාතික මහාමාර්ග අංශ ව්‍යාපෘතිය | 8,000,000 | 1.875 |
| 2010/10/04 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 16,000,000 | 2.1 |
| | එකතුව | 3,135,174,926 | |

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ඇමුණුම 02 ඉතිරි

2011 වර්ෂයේ (සැප්තැම්බර් 30 දක්වා) සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ණය

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) | සාමාන්‍ය පොලී අනුපාතය ( සේවා ගාස්තු අනුපාතය ද ඇතුළත්ව) % |
|---|---|---|---|
| 2011/03/31 | ප්‍රමුඛ මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 500,000,000 | 6 Month LIBOR for US$ +2.90 |
| 2011/03/22 | මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 | 390,978,455 | 0.1 |
| 2011/03/22 | වවුනියා - කිලිනොච්චි විදුලි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය (II) | 17,545,171 | 0.375 |
| 2011/09/29 | ස්වභාවික විපත්වලින් සිදුවූ හානි පුනරුත්ථාපනය සඳහා වූ හදිසි ව්‍යාපෘතිය | 91,467,188 | 0.01 |
| 2011/09/08 | සත්ව පාලනය සඳහා සතුන් ආනයනය කිරීම (නෙදර්ලන්තය) | 2,419,566 | 6 Month LIBOR for US$ +1.95 |
| 2011/09/08 | සත්ව පාලනය සඳහා සතුන් ආනයනය කිරීම (නෙදර්ලන්තය හා ඔස්ට්‍රේලියාව) | 10,524,492 | 6 Month LIBOR for US$ +1.35 |
| 2011/07/26 | පර්යන්ත සඳහා ටර්බර්ග් වර්ගයේ යන්ත්‍ර 50ක් මිලදී ගැනීම | 4,000,000 | 3 Month LIBOR for US$ +2.8<br>and 3 Month LIBOR for US$ +2 |
| 2011/06/17 | ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය 4 -දීර්ඝකිරීම | 54,163,022 | 6 Month LIBOR for US$ + 1.25 |
| 2011/02/17 | දක්ෂිණ අධිවේග මාර්ගයේ පින්නදූව හා කොඩගොඩ කොටස (කි.මී.30සිට කි.මී. 45 දක්වා) | 75,140,000 | 6 Month LIBOR for US$ +2.4 |
| 2011/02/17 | දක්ෂිණ අධිවේග මාර්ගයේ කොඩගොඩ හා ගොඩගම කොටස(කි.මී 45 සිට කි.මී 61 දක්වා) | 63,070,000 | 6 Month LIBOR for US$ +2.4 |
| 2011/04/29 | නාවට්කුලි - කරෛතිවු -මන්නාරම මාර්ගයේ කි.මී. 67ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 48,367,814 | 6 Month LIBOR for US$ +2.4 |
| 2011/04/29 | පුත්තලම-මරිච්චිකඩේ-මන්නාරම මාර්ගයේ කි.මී.113ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 73,208,841 | 6 Month LIBOR for US$ +2.4 |
| 2011/07/19 | ඌව පලාත ආලෝකමත් කිරීම සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය | 24,928,047 | 6 Month LIBOR for US$ +2.8 |
| 2011/02/08 | යාපනය හා කිලිනොච්චියේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව OCR කොටස | 20,000,000 | 6 Month LIBOR for US$ +0.6 |
| 2011/02/08 | යාපනය හා කිලිනොච්චියේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව ADF කොටස | 69,246,306 | 1.25 |
| 2011/06/20 | තිරසාර බලශක්ති අංශයේ ව්‍යාපෘතිය (OCR) කොටස | 110,000,000 | 6 Month LIBOR for US$ +0.6 |
| 2011/06/20 | තිරසාර බලශක්ති අංශයේ ව්‍යාපෘතිය (ADF) කොටස | 10,306,017 | 1.25 |
| 2011/07/22 | දෙවෙනි නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදනය - අමතර මූල්‍යය(OCR) | 4,300,000 | 6 Month LIBOR for US$ +0.6 |
| 2011/07/22 | දෙවෙනි නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදනය - අමතර මූල්‍යය(XDR) | 13,441,096 | 1.25 |
| 2011/04/29 | මාර්ග අංශයේ සහාය ව්‍යාපෘතිය - දෙවෙනි අමතර මූල්‍යය | 103,092,824 | 0.625 |
| | එකතුව | 1,686,198,839 | |

ඇමුණුම 03

2009 වර්ෂයේ දී ලබාගන්නා ලද ණය

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) | ණය කාලසීමාව | | |
|---|---|---|---|---|---|
| | | | සහන කාලය (වර්ෂ) (අ) | ආපසු ගෙවීමේ කාලය (වර්ෂ) (ආ) | මුළු ණය කාලසීමාව (සහන කාලය සමග) (වර්ෂ) (අ) + (ආ) |
| 2009/03/09 | කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 34,092,028 | 7 | 20 | 27 |
| 2009/04/16 | රුහුණුපුර ජලසම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 69,062,828 | 10 | 20 | 30 |
| 2009/01/12 | හතරවන ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය - යුරෝ කොටස | 19,598,316 | 4 | 6 | 10 |
| 2009/12/16 | ආපදා කළමණාකරන හා හදිසි ප්‍රතිචාර පද්ධතිය ව්‍යාප්ත කිරීම | 5,441,544 | 2 | 2 | 4 |
| 2009/12/16 | ආපදා කළමණාකරන හා හදිසි ප්‍රතිචාර පද්ධතිය ව්‍යාප්ත කිරීම | 30,835,415 | 3 | 10 | 13 |
| 2009/07/17 | ලබුගම ජලපිරිපහදු බලාගාරය පුනරුත්ථාපනය කිරීම | 23,578,509 | 4 | 11 | 15 |
| 2009/07/17 | කලටුවාව ජලපිරිපහදු බලාගාරය පුනරුත්ථාපනය කිරීම | 24,523,482 | 4 | 11 | 15 |
| 2009/07/14 | සුනාමියෙන් හානියටපත් ප්‍රදේශයන්හි කැණීම්හි පිරිසිදුකිරීම් සඳහා මඩ අදින යන්ත්‍රයක් සපයා ගැනීම | 22,129,924 | 4 | 11 | 15 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2009/08/06 | හම්බන්තොට බංකර පහසුකම් හා ටැංකි සංගත ව්‍යාපෘතිය | 65,094,508 | 3 | 12 | 15 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ2 කොටස | 63,573,815 | 3 | 12 | 15 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ1 කොටස | 70,041,527 | 3 | 12 | 15 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ3 කොටස | 47,801,344 | 3 | 12 | 15 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ4 කොටස | 66,783,314 | 3 | 12 | 15 |
| 2009/12/25 | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - පියවර II | 891,000,000 | 5 | 15 | 20 |
| 2009/06/17 | පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 135,000,000 | 5 | 20 | 25 |
| 2009/06/17 | පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 26,080,966 | 8 | 24 | 32 |
| 2009/06/29 | වියළි කලාපයේ ග්‍රාමීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 62,019,490 | 8 | 24 | 32 |
| 2009/10/22 | නැගෙනහිර හා උතුරුමැද පළාත්බද මාර්ග ව්‍යාපෘතිය | 71,804,757 | 8 | 24 | 32 |
| 2009/12/18 | මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතිය (OCR) | 80,000,000 | 5 | 20 | 25 |
| 2009/12/18 | මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතිය (ADF) | 20,612,421 | 8 | 24 | 32 |
| 2009/08/14 | සෞඛ්‍ය අංශය සංවර්ධනය කිරීම සඳහා අමතර මූල්‍යය | 25,318,522 | 10 | 10 | 20 |
| 2009/10/22 | දෙවෙනි ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 79,853,480 | 10 | 10 | 20 |
| 2009/11/07 | PPA- උතුර හා නැගෙනහිර ප්‍රාදේශය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූලික කටයුතු සැකසීම (අත්තිකාරම) | 1,000,000 | * | - | - |
| | එකතුව | 1,935,246,190 | | | |

සටහන: * මෙය මූලික ගිවිසුමකි. ප්‍රධාන ගිවිසුම අත්සන් කිරීමත් සමග මේ යටතේ ප්‍රතිලාභී වූ අරමුදල් ප්‍රධාන ගිවිසුම යටතට ගැනේ. ප්‍රධාන ගිවිසුම 2010 වර්ෂයේ නොවැම්බර් 08වන දින අත්සන් තබා ඇති අතර ණය කාලසීමාව ඊලඟ පිටුවෙහි දක්වා ඇත.

ඇමුණුම 03 ඉතිරි..

2010 වර්ෂයේ දී ලබාගන්නා ලද ණය

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) | ණය කාලසීමාව | | |
|---|---|---|---|---|---|
| | | | සහන කාලය (වර්ෂ) (අ) | ආපසු ගෙවීමේ කාලය (වර්ෂ) (ආ) | මුළු ණය කාලසීමාව (සහන කාලය සමග) (වර්ෂ) (අ) + (ආ) |
| 2010/12/16 | පුඵුම මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 152,800,000 | 3 | 13 | 16 |
| 2010/04/17 | මහ ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය | 3,385,375 | * | - | - |
| 2010/03/02 | සුනාමියෙන් හානියටපත් හා දුෂ්කර රෝහල් සඳහා වෛද්‍ය උපකරණ, ශල්‍යාගාර හා ඔක්සිජන් සාන්ද්‍රකයන් ලබාදීම | 12,901,316 | 6 | 15 | 21 |
| 2010/03/10 | කොළඹ මාතර දුම්රිය මාර්ගය උත්ශ්‍රේණිගත කිරීම අදියර II | 67,400,000 | 4 | 11 | 15 |
| 2010/11/26 | ඕමන්තේ - පලාලි, මඩු - තලෙයිමන්නාරම හා මැදවච්චිය දුම්රිය මාර්ගය | 416,390,000 | 5 | 15 | 20 |
| 2010/03/26 | පළාත්බද / ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම පළාත හා සබරගමුව පළාත) | 99,047,097 | 10 | 20 | 30 |
| 2010/03/26 | පළාත්බද / ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (නැගෙනහිර පළාත) | 42,892,283 | 10 | 30 | 40 |
| 2010/03/26 | නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 53,050,127 | 10 | 30 | 40 |
| 2010/03/26 | මහනුවර නගරයේ අපජල කළමණාකරන ව්‍යාපෘතිය | 152,389,303 | 10 | 30 | 40 |
| 2010/03/26 | ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය (II) | 49,242,288 | 10 | 30 | 40 |
| 2010/11/02 | හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 38,197,292 | 10 | 30 | 40 |
| 2010/08/30 | ගාල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය පුනරුත්ථාපනය කිරීම - අදියර ii | 1,604,273 | 10 | 40 | 50 |
| 2010/09/15 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 46,056,262 | 5 | 15 | 20 |
| 2010/07/06 | අම්පාර දිස්ත්‍රික්කයේ පහසුකම් නොලද ප්‍රදේශයන්හි ඒකාබද්ධ ජල සම්පාදන පද්ධතිය - අදියර III | 105,190,000 | 3 | 10 | 13 |
| 2010/01/17 | ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය 8 ක්‍රියාත්මක කිරීම | 83,413,056 | 3 | 5 | 8 |
| 2010/02/08 | රුසියානු ණය මාලාව | 300,000,000 | 4 | 10 | 14 |
| 2010/03/08 | ජය බහාලුම් පර්යන්තයේ බහාලුම් හැසිරවීමේ උපකරණ මිලදී ගැනීමේ හදිසි ව්‍යාපෘතිය | 35,000,000 | 1 | 5 | 6 |
| 2010/03/05 | මත්තල හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ව්‍යාපෘතිය | 190,785,771 | 5 | 15 | 20 |
| 2010/03/05 | දුම්රිය සේවය සඳහා ඩීසල් එන්ජින් 13ක් එක්කිරීමේ ව්‍යාපෘතිය | 102,730,800 | 5 | 15 | 20 |
| 2010/09/09 | එම්. ඒ. 60 ගුවන්යානා දෙකක් සැපයීමේ ව්‍යාපෘතිය | 41,114,296 | 5 | 15 | 20 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ බලශක්ති අංශය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීමේ වැඩසටහන | 31,659,392 | 2 | 10 | 12 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඒ009) ගල්කුලම සිට කි.මී.230 කණුව | 71,021,514 | 3 | 12 | 15 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (11බී) | 42,509,700 | 3 | 12 | 15 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (11ඒ)(මුලතිවු - කෝකිලායි) | 42,777,300 | 3 | 12 | 15 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඒබී020, ඒබී032, ඒබී016,ඒබී018) | 75,420,000 | 3 | 12 | 15 |
| 2010/09/09 | උතුරු ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය-A009 ( කි.මී.230 කණුව සිට යාපනය) | 70,583,452 | 3 | 12 | 15 |
| 2010/01/07 | පැරණි ලක්ෂපාන ජලවිදුලි බලාගාරය පුනරුත්ථාපනය | 34,776,820 | 3 | 7 | 10 |
| 2010/06/21 | නැගෙනහිර දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය | 10,540,002 | 3 | 7 | 10 |
| 2010/06/07 | රාජ්‍ය මූල්‍ය කළමණාකරන කාර්යක්ෂමතා ව්‍යාපෘතිය | 50,000,000 | 5 | 20 | 25 |
| 2010/06/07 | උතුරු නැගෙනහිර ප්‍රජාප්‍රතිෂ්ඨාපන හා සංවර්ධන ව්‍යාපෘතිය II අතිරේක | 12,267,731 | 10 | 30 | 40 |
| 2010/06/07 | ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශ සඳහා හදිසි ව්‍යාපෘතිය | 150,000,000 | 8 | 24 | 32 |

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

| | | | | | |
|---|---|---|---|---|---|
| 2010/08/27 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය(OCR) | 130,000,000 | 5 | 20 | 25 |
| 2010/08/27 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය(ADF) | 24,408,211 | 8 | 24 | 32 |
| 2010/02/23 | ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 24,245,264 | 10 | 20 | 30 |
| 2010/01/11 | පලාත්බද මාර්ග ව්‍යාපෘතිය | 103,238,346 | 10 | 10 | 20 |
| 2010/01/11 | ගැටුම්වලින් හානියටපත් ප්‍රදේශයන්හි ජනජීවිතය නංවාලීම සඳහා හදිසි අමතර මූල්‍යය | 11,870,067 | 10 | 10 | 20 |
| 2010/01/11 | හදිසි උතුරු ප්‍රතිසාධන ව්‍යාපෘතිය | 63,879,703 | 10 | 10 | 20 |
| 2010/08/26 | 21වැනි ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | 38,839,873 | 10 | 10 | 20 |
| 2010/11/08 | තිරසාර සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 18,237,342 | 10 | 10 | 20 |
| 2010/11/08 | උතුරු නැගෙනහිර ප්‍රාදේශිය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 51,882,092 | 10 | 10 | 20 |
| 2010/11/08 | කුඩා හා මධ්‍යම ව්‍යවසායකත්ව සංවර්ධන සහාය ව්‍යාපෘතිය | 59,428,578 | 10 | 10 | 20 |
| 2010/10/04 | ජාතික මහාමාර්ග අංශ ව්‍යාපෘතිය | 8,000,000 | 5 | 15 | 20 |
| 2010/10/04 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 16,000,000 | 5 | 15 | 20 |
| | එකතුව | 3,135,174,926 | | | |

ඇමුණුම 03 ඉතිරි..

*2011 වර්ෂයේ දී ලබාගන්නා ලද ණය

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දින ය) | ව්‍යාපෘතියේ නම | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) | ණය කාලසීමාව | | |
|---|---|---|---|---|---|
| | | | සහන කාලය (වර්ෂ) (අ) | ආපසු ගෙවීමේ කාලය (වර්ෂ) (ආ) | මුලු ණය කාලසීමාව (සහන කාලය සමග) (වර්ෂ) (අ) + (ආ) |
| 2011/03/31 | ප්‍රමුඛ මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 500,000,000 | 3 | 12 | 15 |
| 2011/03/22 | මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 | 390,978,455 | 10 | 30 | 40 |
| 2011/03/22 | වවුනියා - කිලිනොච්චි විදුලි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය (II) | 17,545,171 | 10 | 30 | 40 |
| 2011/09/29 | ස්වභාවික විපත්වලින් සිදුවූ හානි පුනරුත්ථාපනය සඳහා වූ හදිසි ව්‍යාපෘතිය | 91,467,188 | 10 | 30 | 40 |
| 2011/09/08 | සත්ව පාලනය සඳහා සතුන් ආනයනය කිරීම (නෙදර්ලන්තය) | 2,419,566 | 2 | 1 | 3 |
| 2011/09/08 | සත්ව පාලනය සඳහා සතුන් ආනයනය කිරීම (නෙදර්ලන්තය හා ඔස්ට්‍රේලියාව) | 10,524,492 | 2 | 8 | 10 |
| 2011/07/26 | පර්යන්ත සඳහා ටර්බර්ග් වර්ගයේ යන්ත්‍ර 50ක් මිලදී ගැනීම | 4,000,000 | 1 | 6 | 6 |
| 2011/06/17 | ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය 4 -දීර්ඝකිරීම | 54,163,022 | 4 | 8 | 12 |
| 2011/02/17 | දක්ෂිණ අධිවේග මාර්ගයේ පින්නදූව හා කොඩගොඩ කොටස (කි.මී.30සිට කි.මී. 45 දක්වා) | 75,140,000 | 3 | 12 | 15 |
| 2011/02/17 | දක්ෂිණ අධිවේග මාර්ගයේ කොඩගොඩ හා ගොඩගම කොටස(කි.මී 45 සිට කි.මී 61 දක්වා) | 63,070,000 | 3 | 12 | 15 |
| 2011/04/29 | නවටකුලි - කරෙරතිවු -මන්නාරම මාර්ගයේ කි.මී. 67ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 48,367,814 | 3 | 12 | 15 |
| 2011/04/29 | පුත්තලම-මරිච්චිකඩේ-මන්නාරම මාර්ගයේ කි.මී.113ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 73,208,841 | 3 | 12 | 15 |
| 2011/07/19 | ඌව පලාත ආලෝකමත් කිරීම සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය | 24,928,047 | 2 | 10 | 12 |
| 2011/02/08 | යාපනය හා කිලිනොච්චියේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව OCR කොටස | 20,000,000 | 6 | 18 | 24 |
| 2011/02/08 | යාපනය හා කිලිනොච්චියේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව ADF කොටස | 69,246,306 | 8 | 24 | 32 |
| 2011/06/20 | තිරසාර බලශක්ති අංශයේ ව්‍යාපෘතිය (OCR) කොටස | 110,000,000 | 5 | 20 | 25 |
| 2011/06/20 | තිරසාර බලශක්ති අංශයේ ව්‍යාපෘතිය (ADF) කොටස | 10,306,017 | 8 | 24 | 32 |
| 2011/07/22 | දෙවෙනි නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදනය - අමතර මූල්‍යය(OCR) | 4,300,000 | 5 | 20 | 25 |
| 2011/07/22 | දෙවෙනි නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදනය - අමතර මූල්‍යය(XDR) | 13,441,096 | 8 | 24 | 32 |
| 2011/04/29 | මාර්ග අංශයේ සහාය ව්‍යාපෘතිය - දෙවෙනි අමතර මූල්‍යය | 103,092,824 | 10 | 20 | 30 |
| | එකතුව | 1,686,198,839 | | | |

ඇමුණුම 04

**2009 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ණය**

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) (1) | ව්‍යාපෘතියේ නම (2) | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) (3) | ණය කාලසීමාව අවසානයේ ගෙවා ඇති සමස්ත පොලිය (4) | ණය කාලසීමාව අවසානයේ ගෙවා ඇති වෙනත් ගාස්තු (5) |
|---|---|---|---|---|
| 2009/03/09 | කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 34,092,028 | 9,589,546 | 297,270 |
| 2009/04/16 | රුහුණුපුර ජලසම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 69,062,828 | 21,813,045 | 15,581 |
| 2009/01/12 | හතරවන ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය - යූරෝ කොටස | 19,598,316 | - | 1,202,445 |
| 2009/12/16 | ආපදා කළමණාකරන හා හදිසි ප්‍රතිචාර පද්ධතිය ව්‍යාප්ත කිරීම | 5,441,544 | 438,069 | - |
| 2009/12/16 | ආපදා කළමණාකරන හා හදිසි ප්‍රතිචාර පද්ධතිය ව්‍යාප්ත කිරීම | 30,835,415 | 8,859,552 | - |
| 2009/07/17 | ලබුගම ජලපිරිපහදු බලාගාරය පුනරුත්ථාපනය කිරීම | 23,578,509 | 2,169,385 | - |
| 2009/07/17 | කලටුවාව ජලපිරිපහදු බලාගාරය පුනරුත්ථාපනය කිරීම | 24,523,482 | 2,862,333 | - |
| 2009/07/14 | සුනාමියෙන් හානියටපත් ප්‍රදේශයන්හි කැණීම්හි පිරිසිදුකිරීම් සඳහා මඩ අදින යන්ත්‍රයක් සපයා ගැනීම | 22,129,924 | 2,608,945 | - |
| 2009/08/06 | හම්බන්තොට බංකර පහසුකම් හා තටාකාංගන ව්‍යාපෘතිය | 65,094,508 | 31,683,263 | 4,388,356 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ2 කොටස | 63,573,815 | 27,256,479 | 4,254,654 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ1 කොටස | 70,041,527 | 30,027,138 | 4,687,623 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ3 කොටස | 47,801,344 | 20,496,339 | 3,198,986 |
| 2009/08/06 | කොළඹ - කටුනායක අධිවේගී- ඒ4 කොටස | 66,783,314 | 28,635,685 | 4,469,308 |
| 2009/12/25 | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - පියවර II | 891,000,000 | 188,191,443 | 12,610,349 |
| 2009/06/17 | පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 135,000,000 | 18,803,981 | 780,078 |
| 2009/06/17 | පිවිතුරු බලශක්ති හා ඊට ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 26,080,966 | 5,955,706 | - |
| 2009/06/29 | වියළි කලාපයේ ග්‍රාමීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 62,019,490 | 14,031,857 | - |
| 2009/10/22 | නැගෙනහිර හා උතුරුමැද පලාත්බද මාර්ග ව්‍යාපෘතිය | 71,804,757 | 17,012,621 | - |
| 2009/12/18 | මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතිය (OCR) | 80,000,000 | 10,365,035 | 320,532 |
| 2009/12/18 | මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතිය (ADF) | 20,612,421 | 4,665,155 | - |
| 2009/08/14 | සෞඛ්‍ය අංශය සංවර්ධනය කිරීම සඳහා අමතර මූල්‍යය | 25,318,522 | 2,708,088 | - |
| 2009/10/22 | දෙවෙනි ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 79,853,480 | 6,809,661 | - |
| 2009/11/07 | PPA- උතුර හා නැගෙනහිර ප්‍රාදේශය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූලික කටයුතු සැකසීම (අත්තිකාරම) | 1,000,000 | - | - |
| | **එකතුව** | **1,935,246,190** | **454,983,323** | **36,225,182** |

ඇමුණුම 04 ඉතිරි.. | මුර පිටු ගණන 3

**2010 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් ණය**

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දිනය) (1) | ව්‍යාපෘතියේ නම (2) | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) (3) | ණය කාලසීමාව අවසානයේ ගෙවා ඇති සමස්ත පොලිය (4) | ණය කාලසීමාව අවසානයේ ගෙවා ඇති වෙනත් ගාස්තු (5) |
|---|---|---|---|---|
| 2010/12/16 | ප්‍රමුඛ මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 152,800,000 | 38,131,631 | 8,470,739 |
| 2010/04/17 | මහ ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය | 3,385,375 | * | * |
| 2010/03/02 | සුනාමියෙන් හානියටපත් හා දුෂ්කර රෝහල් සඳහා වෛද්‍ය උපකරණ, ශල්‍යාගාර හා ඔක්සිජන් සාන්ද්‍රකයන් ලබාදීම | 12,901,316 | 1,670,245 | - |
| 2010/03/10 | කොළඹ මාතර දුම්රිය මාර්ගය උත්ශ්‍රේණිගත කිරීම අදියර II | 67,400,000 | 7,139,310 | 169,240 |
| 2010/11/26 | ඕමන්තේ - පලාලි, මඩු - තලෛමන්නාරම හා මැදවච්චිය දුම්රිය මාර්ගය | 416,390,000 | 66,597,745 | - |
| 2010/03/26 | පළාත්බද / ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම පලාත හා සබරගමුව පලාත) | 99,047,097 | 26,213,254 | 251,709 |
| 2010/03/26 | පළාත්බද / ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (නැගෙනහිර පලාත) | 42,892,283 | 7,379,690 | 76,228 |
| 2010/03/26 | නැගෙනහිර පලාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 53,050,127 | 8,621,147 | 113,137 |
| 2010/03/26 | මහනුවර නගරයේ අපජල කළමණාකරන ව්‍යාපෘතිය | 152,389,303 | 22,399,483 | 659,141 |
| 2010/03/26 | ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය (II) | 49,242,288 | 2,597,966 | 123,559 |
| 2010/11/02 | හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 38,197,292 | 859,326 | - |
| 2010/08/30 | ගාල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය පුනරුත්ථාපනය කිරීම - අදියර (II) | 1,604,273 | 325,485 | 18,309 |
| 2010/09/15 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 46,056,262 | 8,482,024 | - |
| 2010/07/06 | අම්පාර දිස්ත්‍රික්කයේ පහසුකම් නොලද ප්‍රෙද්ශයන්හි ඒකාබද්ධ ජල සම්පාදන පද්ධතිය - අදියර III | 105,190,000 | 9,183,828 | 14,548,654 |
| 2010/01/17 | ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය 8 ක්‍රියාත්මක කිරීම | 83,413,056 | 14,423,445 | 4,061,837 |
| 2010/02/08 | රුසියානු ණය මාලාව | 300,000,000 | 71,530,214 | 3,076,441 |

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

| | | | | |
|---|---|---|---|---|
| 2010/03/08 | ජය මහාලූම් පර්යන්තයේ බහාලූම් හැසිරවීමේ උපකරණ මිලදී ගැනීමේ හදිසි ව්‍යාපෘතිය | 35,000,000 | 5,714,752 | 621,273 |
| 2010/03/05 | මත්තල හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ව්‍යාපෘතිය | 190,785,771 | 44,366,856 | 2,631,052 |
| 2010/03/05 | දුම්රිය සේවය සඳහා ඩීසල් එන්ජින් 13ක් එක්කිරීමේ ව්‍යාපෘතිය | 102,730,800 | 23,192,588 | 1,378,577 |
| 2010/09/09 | එම්. ඒ. 60 ගුවන්යානා දෙකක් සැපයීමේ ව්‍යාපෘතිය | 41,114,296 | 10,014,739 | 354,424 |
| 2010/09/09 | උතුරු පුදේශයේ බලශක්ති අංශය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීමේ වැඩසටහන | 31,659,392 | 5,457,718 | 380,139 |
| 2010/09/09 | උතුරු පුදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඒ009) ගල්කුලම සිට කි.මී.230 කණුව දක්වා) | 71,021,514 | 13,597,405 | 5,498,984 |
| 2010/09/09 | උතුරු පුදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (11බී) | 42,509,700 | 8,703,979 | 3,115,145 |
| 2010/09/09 | උතුරු පුදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (11ඒ)(මුලතිව් - කෝකිලායි) | 42,777,300 | 9,125,335 | 3,079,411 |
| 2010/09/09 | උතුරු පුදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඒබී020, ඒබී032, ඒබී016,ඒබී018) | 75,420,000 | 15,447,097 | 5,594,984 |
| 2010/09/09 | උතුරු පුදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය-A009 ( කි.මී.230 කණුව සිට යාපනය) | 70,583,452 | 14,633,499 | 5,182,703 |
| 2010/01/07 | පැරණි ලක්ෂපාන ජලවිදුලි බලාගාරය පුනරුත්ථාපනය | 34,776,820 | 5,404,980 | 841,622 |
| 2010/06/21 | නැගෙනහිර දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය | 10,540,002 | 2,398,033 | 1,220,683 |
| 2010/06/07 | රාජ්‍ය මූල්‍ය කළමණාකරන කාර්යක්ෂමතා ව්‍යාපෘතිය | 50,000,000 | 9,267,016 | 86,230 |
| 2010/06/07 | උතුරු නැගෙනහිර පුජාප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය II අතිරේක | 12,267,731 | 3,389,959 | - |
| 2010/06/07 | ගැටුම්වලින් හානියට පත් පුදේශ සඳහා හදිසි ව්‍යාපෘතිය | 150,000,000 | 33,958,190 | 329,615 |
| 2010/08/27 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය(OCR) | 130,000,000 | 20,412,856 | 516,313 |
| 2010/08/27 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය(ADF) | 24,408,211 | 5,948,839 | - |
| 2010/02/23 | ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 24,245,264 | 3,229,496 | - |
| 2010/01/11 | පළාත්බද මාර්ග ව්‍යාපෘතිය | 103,238,346 | 9,342,164 | 715,671 |
| 2010/01/11 | ගැටුම්වලින් හානියටපත් පුදේශයන්හි ජනජීවිතය නංවාලීම සඳහා හදිසි අමතර මූල්‍යය | 11,870,067 | 1,197,495 | 10,687 |
| 2010/01/11 | හදිසි උතුරු ප්‍රතිසාධන ව්‍යාපෘතිය | 63,879,703 | 6,384,275 | 175,414 |
| 2010/08/26 | 21වැනි ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | 38,839,873 | 3,491,961 | 426,930 |
| 2010/11/08 | තිරසාර සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 18,237,342 | 1,543,533 | 218,431 |
| 2010/11/08 | උතුරු නැගෙනහිර ප්‍රාදේශීය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 51,882,092 | 4,581,080 | 534,290 |
| 2010/11/08 | කුඩා හා මධ්‍යම ව්‍යවසායකත්ව සංවර්ධන සහාය ව්‍යාපෘතිය | 59,428,578 | 5,656,669 | 324,071 |
| 2010/10/04 | ජාතික මහාමාර්ග අංශ ව්‍යාපෘතිය | 8,000,000 | 3,001,075 | - |
| 2010/10/04 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 16,000,000 | 7,003,187 | - |
| | එකතුව | 3,135,174,926 | 562,019,567 | 64,805,642 |

සටහන: * මෙය මෙම ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේ අත්සන් කරන ලද ගිවිසුමට 2010 වර්ෂයේ දී ප්‍රතිපාදන එක්කිරීමකි.

*ඇමුණුම 04 දෙක..*

2011 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා ලබාගත් ණය

| ගිවිසුම්ගත දිනය (වර්ෂය/මාසය/දින ය) (1) | ව්‍යාපෘතියේ නම (2) | ගිවිසුම්ගත ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර්) (3) | ණය කාලසීමාව අවසානයේ ගෙවා ඇති සම්පත් පොලිය (4) | ණය කාලසීමාව අවසානයේ ගෙවා ඇති වෙනත් ගාස්තු (5) |
|---|---|---|---|---|
| 2011/03/31 | ප්‍රමුඛ මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 500,000,000 | 152,493,696 | 18,800,000 |
| 2011/03/22 | මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 | 390,978,455 | 17,442,369 | 1,300,486 |
| 2011/03/22 | වවුනියා - කිලිනොච්චි විදුලි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය (II) | 17,545,171 | 2,673,639 | 33,908 |
| 2011/09/29 | ස්වභාවික විපත්වලින් සිදුවූ හානි පුනරුත්ථාපනය සඳහා වූ හදිසි ව්‍යාපෘතිය | 91,467,188 | 204,078 | - |
| 2011/09/08 | සත්ව පාලනය සඳහා සතුන් ආනයනය කිරීම (නෙදර්ලන්තය) | 2,419,566 | 121,610 | - |
| 2011/09/08 | සත්ව පාලනය සඳහා සතුන් ආනයනය කිරීම (නෙදර්ලන්තය හා ඕස්ට්‍රේලියාව) | 10,524,492 | 955,299 | - |
| 2011/07/26 | පර්යන්ත සඳහා වර්බර්ග් වර්ගයේ යන්ත්‍ර 50ක් මිලදී ගැනීම | 4,000,000 | 279,163 | - |
| 2011/06/17 | ග්‍රාමීය විදුලිකරණ ව්‍යාපෘතිය 4 -දීර්ඝකිරීම | 54,163,022 | 4,290,256 | 242,563 |
| 2011/02/17 | දක්ෂිණ අධිවේග මාර්ගයේ පින්නදූව හා කොඩගොඩ කොටස (කි.මී.30සිට කි.මී. 45 දක්වා) | 75,140,000 | 17,000,782 | 5,322,015 |
| 2011/02/17 | දක්ෂිණ අධිවේග මාර්ගයේ කොඩගොඩ හා ගොඩගම කොටස(කි.මී 45 සිට කි.මී 61 දක්වා) | 63,070,000 | 14,002,052 | 4,532,908 |
| 2011/04/29 | නාවට්කුලි - කරෙරතිවු -මන්නාරම මාර්ගයේ කි.මී. 67ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 48,367,814 | 10,320,657 | 3,573,183 |
| 2011/04/29 | පුත්තලම-මරිච්චිකට්ටි-මන්නාරම මාර්ගයේ කි.මී.113ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 73,208,841 | 15,268,351 | 5,497,948 |
| 2011/07/19 | ඌව පළාත ආලෝකමත් කිරීම සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය | 24,928,047 | 8,382,295 | 259,830 |
| 2011/02/08 | යාපනය හා කිලිනොච්චියේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව OCR කොටස | 20,000,000 | 3,122,852 | 87,313 |
| 2011/02/08 | යාපනය හා කිලිනොච්චියේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව ADF කොටස | 69,246,306 | 16,070,128 | - |
| 2011/06/20 | තිරසාර බලශක්ති අංශයේ ව්‍යාපෘතිය (OCR) කොටස | 110,000,000 | 20,505,317 | 184,208 |
| 2011/06/20 | තිරසාර බලශක්ති අංශයේ ව්‍යාපෘතිය (ADF) කොටස | 10,306,017 | 2,437,520 | - |
| 2011/07/22 | දෙවෙනි නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදනය - අමතර මූල්‍යය(OCR) | 4,300,000 | 885,278 | 6,438 |
| 2011/07/22 | දෙවෙනි නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදනය - අමතර මූල්‍යය(XDR) | 13,441,096 | 3,266,812 | - |
| 2011/04/29 | මාර්ග අංශයේ සහාය ව්‍යාපෘතිය - දෙවෙනි අමතර මූල්‍යය | 103,092,824 | 9,503,447 | 985,535 |
| | එකතුව | 1,686,198,839 | 299,225,602 | 40,826,335 |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය වන්නේ මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර තුළින් අපට පෙනී යනවා, ණය ලැබීමත්, ප්‍රදානයන් ලැබීමත් ශීඝ්‍ර ලෙස අඩුවීමක් තිබෙනවාය කියන එක. උදාහරණයක් වශයෙන් 2009 වර්ෂයේ මිලියන 2,200ක් ලැබුණු එක 2011 සැප්තැම්බර් මාසය වන විට 99කට අඩු වී තිබෙනවා. මේ කථා කරන මුදල් වර්ෂය සම්බන්ධයෙන් බිලියන 1,263ක ආදායමක් තිබෙනකොට අප ණය සහ පොලී ප්‍රමාණය ගෙවනවා බිලියන 1,238ක්. ගරු අමාත්‍යතුමනි, මේ වාගේ අවස්ථාවක - මේ වැටිලා තිබෙන ආර්ථිකයක- ජනතාවට බරක් පටවන්නේ නැතිව අපට ඒ ණය ටික ගෙවන්න පුළුවන් වන්නේ කොහොම ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව මම ඔබතුමාට පිළිතුරක් දෙන්නම්. ණය වශයෙන් ලැබෙනවා. ඒ වාගේම ප්‍රදාන වශයෙනුත් ලැබෙනවා. සාමාන්‍යයෙන් ප්‍රදානයන් අප එච්චර විශාල වශයෙන් සලකන්නේ නැහැ. ඒක ද්විපාර්ශ්විකව ඒ රටවල් එක්ක කථා කර ගෙන- [බාධා කිරීමක්] ප්‍රදානයන් අපට ලැබිලා තිබෙනවා හුඟක් රටවලින්. [බාධා කිරීමක්] නැහැ. නැහැ. එහෙම දෙයක් නැහැ. ඔබතුමන්ලා ම මෙතෙක් කල් තර්ක කළේ ණය ගන්න එක අඩු කරන්නය කියා යි. [බාධා කිරීමක්] ණය ප්‍රශ්නය. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ අරින්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒක පැහැදිලිව තේරුම් කර දෙන්නට පුළුවන්. ගරු කථානායකතුමනි, හේතු කිහිපයක් තිබෙනවා. එක ව්‍යාපෘතියක් එක වර්ෂයක් තුළ ඉවර වන්නේ නැහැ. ඔබතුමා හොඳට දන්නවා, පළමුවන පියවර, දෙවන පියවර, තුන්වන පියවර වශයෙන් පියවරයන් කීපයක් තිබෙන බව. මුල් වර්ෂයේදී අප මුදල් විශාල ප්‍රමාණයක් ගන්නවා. දෙවන වර්ෂයේ අඩු වන්නට පුළුවන්. ඒක අනෙක් පැත්තට වන්නටත් පුළුවන්. ඒ ඒ අවස්ථාවේ පැන නඟින ප්‍රශ්න - situational factors - අනුව අපට ඒ තීන්දු ගන්නට වෙනවා. ඇත්ත වශයෙන් මම එකක් කියන්න ඕනෑ. අපේ ව්‍යාපෘති සකස් කරලා ඒ ව්‍යාපෘතිවලට ආධාර ගන්න අපට කිසි ප්‍රශ්නයක් නැහැ. මුළු ලෝකයේම අද ප්‍රශ්න තිබෙනවා. විශේෂයෙන්ම ඇමෙරිකාවේ සහ Euro Zone එකේ. මොකද, ඒ ගොල්ලන්ට තිබෙන මුදල් ප්‍රමාණය මදි. ඒක ඔබතුමා හොඳට දන්නවා. ඒ, ණය ගැන විතරක් නොවෙයි. ඒ ගොල්ලෝ භාණ්ඩ මිලදී ගැනීමත් විශාල ප්‍රමාණකින් අඩු කර තිබෙනවා. අපේ රටේ භාණ්ඩ විශාල ප්‍රමාණයක් පිට රටවලට විකුණන්නේ නැති නිසා අපට ඒ ප්‍රශ්න නැහැ. ගරු කථානායකතුමනි, අද ඉන්දියාවට මේ ප්‍රශ්නයට මුහුණ පාන්නට සිද්ධ වෙලා, ඉන්දියානු රුපියල අවපාත කරන්නට සිද්ධ වී තිබෙනවා. මොකද, ඒ ගොල්ලෝ - චීනය සහ ඉන්දියාව- විශාල වශයෙන් අපට වඩා අපනයන ක්ෂේත්‍රය මත තමයි රැඳී පවතින්නේ.

ඒ මත ඒගොල්ලන්ගේ විශාල සංවර්ධනයක් ඇති වුණා. සියයට 10කට වැඩි සංවර්ධන වේගයක් ඇති වුණා. බොහෝදුරට එය පදනම් වුණේ තමන්ගේ අපනයන ආදායම මතයි. චීනය සංවර්ධනය වුණේ සම්පූර්ණයෙන් තමන්ගේ අපනයන ආදායම මතයි. ඉන්දියාව එච්චරම නැහැ. නමුත් විශාල ප්‍රමාණයක් අපනයන ආදායම මත. දැන් ඒගොල්ලන්ට තර්ජනයක් තිබෙනවා. අපට පිළිගන්නට සිදු වනවා, ඇමෙරිකාවේ ආර්ථිකය පසුගාමී වෙලා තිබෙනවා කියලා. Euro Zone එකේ ආර්ථිකය ලොකු අර්බුදයකට යනවා. එතකොට පරණ විධියට කටයුතු කරන්නට ඒගොල්ලන්ට සල්ලි නැහැ. තමුන්නාන්සේට මා එකක් කියන්නම්. දැන් මේ අපේ ගරු සභාවත් ඒ ගැන දැන ගන්නට ඕනෑ. IMF එකෙන් ණය ලබා ගත්තාය කියලා අපට එක එක ඒවා කිව්වා. දැන් IMF එකේ සල්ලිවලින් සියයට 90ක් යන්නේ Euro Zone bailoutවලටයි. අපි ඒ වෙලාවේ ණය ගත්තු නිසා දැන් අපි ඒ ගණන ගෙවලා ඉවරයි. අපේ වැඩ කරගෙන ඉවරයි. අපි සාර්ථකව ඒ වැඩේ කළා, කොච්චර බැණුම් ඇහුවත්.

ගරු කථානායකතුමනි, නමුත් අද දියුණු වෙන රටවල්වලට අපි ලබා ගත් ඒ සහනය ලබා ගන්නට බැහැ. මොකද, IMF එක අද ඒ සල්ලි ඔක්කොම එකතු කරගෙන යුරෝපයේ ආර්ථිකයන් බේරා ගන්න කටයුතු කරනවා, ගරු කථානායකතුමනි. ග්‍රීසියට සල්ලි දෙන්න සිදු වෙනවා. ඉතාලියට දෙන්න සිදු වෙනවා. පෘතුගාලයට දෙන්න සිදු වෙනවා. ස්පාඤ්ඤයට දෙන්න සිදු වෙනවා. අයර්ලන්තයට දෙන්න සිදු වෙනවා. ඒ නිසා ඉස්සර IMF එකට බැණපු අය දැන් කථා කරන්නේ, "සංවර්ධනය වන රටවලට සල්ලි දෙන්නේ නැත්තේ ඇයි?" කියලා යි.

ගරු මන්ත්‍රීතුමා හොඳට දන්නවා ඇති. ඔබතුමාත් වොෂිංටන්වලට ගියා. එතකොට ඒ වෙලාවට අපි සොයා, බලා අවසන් තීන්දු ගන්නට ඕනෑ. ඒ ව්‍යාපෘති මොනවාද, ඒ සඳහා ගන්න පුළුවන් උපරිම ණය ප්‍රමාණ මොනවාද, ප්‍රදානයන් මොනවාද කියලා සොයා බලා තීන්දු ගන්නට ඕනෑ. ඒ අවස්ථා - situations - අනුව තීරණය කරන්නට ඕනෑ. මා එකක් කියන්නට කැමැතියි. ඉතාම සාර්ථක විධියට අපේ ණය කළමනාකරණය කරන්නට අපට පුළුවන් වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා අපිට ආණ්ඩුව භාර දෙනකොට අවසාන වශයෙන් සියයට 120ක ණය පරිමාණයක් තිබුණා, අපේ GDP එක බලපුවාම. අපි දැන් ඒ ප්‍රමාණය සියයට 80ක් දක්වා ගෙනල්ලා තිබෙනවා. අපි ඉලක්ක කරනවා, ඒ ප්‍රමාණය තවත් අඩු කර ගන්නට. මොකද, අපේ ධනය වැඩි වනකොට අනිවාර්යයෙන්ම ප්‍රතිශතය අඩු වනවා. ඒක අපේ ඉලක්කයයක්. ඔබතුමා එම ප්‍රශ්නය නඟපු එක ගැන මා බොහොම සන්තෝෂ වනවා, කෙටියෙන් හෝ මේ තත්ත්වය පැහැදිලි කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා එය අගය කරනවා. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා කිව්වා, අපි ඔබතුමන්ලාට රජය භාර දෙනකොට තිබුණු සියයට 120ක ණය ප්‍රමාණය, සියයට 80ක් දක්වා ඔබතුමන්ලා පහළ දැම්මා කියලා. මතක තබා ගන්න, නමුත් ස්පාඤ්ඤයේ සියයට 50ක ණය ප්‍රමාණයක් තිබිලත් ඒ රට අද බංකොලොත් වී ගෙන යනවා. ග්‍රීසියේ සියයට 46ක ප්‍රමාණයක් තිබිලත් ඒ රට බංකොලොත් වීගෙන යනවා. ඒ වාගේම තමයි, අපි නිදහස ලැබුදා සිට 2005 වර්ෂය දක්වා රටේ සම්පූර්ණ දේශීය සහ විදේශීය ණය ප්‍රමාණය බිලියන 1,784යි කියන එක. රුපියල් කෝටි වශයෙන් කියනවා නම් රුපියල් කෝටි එක්ලක්ෂ හැත්තෑඅට දහස් හාරසීයයි. මේ ප්‍රමාණය අවුරුදු හතකින් රුපියල් කෝටි පන්ලක්ෂ හතළිස් එක්දහස් අටසීයකට වැඩි වුණා. මේ වැඩි වීමේ බර දරන්නේ අපේ අහිංසක බදු ගෙවන ජනතාව සහ සමස්ත ශ්‍රී ලංකා ජනතාවයි. ඔබතුමා කියන විධියට ණය ගැනීමේ කිසි ප්‍රශ්නයක් නැහැ. මතක තියා ගන්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ රටින් පැන්නුවේ ඔබතුමන්ලා. ඊට පස්සේ හෝදලා, පාවඩ දමලා ආපහු ගෙනාවා. අපි තමයි කිව්වේ, චීනයෙන් ණය ගන්න එපා කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය ඒකද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි කිව්වා, HSBC එකෙන් ණය ගන්න එපා කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය ඒකද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි කිව්වා, සියයට නවයේ පොලියට ණය ගන්නේ නැතුව, සියයට එකේ පොලියට ණය ගන්න කියලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, මෙපමණ ආවේගශීලීව කථා කිරීම වටින්නේ නැහැ. ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ තනතුරක් දරන, වග කීමක් දරන කෙනෙක්. ඒ හින්දා කථා කරන භාෂාව ටිකක් හදා ගන්න. අපි දන්නේ නැහැ, සමහර විට අනාගතයේ මුදල් අංශයට යන්න බලාපොරොත්තුව තියෙන අය, වෙළෙඳ අංශයට යන්න බලාපොරොත්තුව තියෙන අය, නායකත්වයට යන්න බලාපොරොත්තුව තියෙන අය, කථා කරන භාෂාව ටිකක් - [බාධා කිරීම්] දැන් තමුන්නාන්සේ "පැනලා ගියා", "එලවා ගත්තා", "තල්ලු කළා" වාගේ වචන පාවිච්චි කළා. මේවා නිකම් ආවේගශීලි වචන. අපිට විශ්වවිද්‍යාලයේදී මේවා විග්‍රහ කරන්න උගන්වලා තිබෙනවා. දැන් කවුද ගිහිල්ලා තල්ලු කළේ IMF එක? අපි ගිහිල්ලා ඒ නිලධාරියාව තල්ලු කළාද? නැහැ. ඔබතුමන්ලා දන්නවා IMF එකේ programmes තිබෙනවා කියා. සමහර කාලයට programme එකක් තියෙන කොට-[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වෙලා අහ ගෙන ඉන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ ගොල්ලෝ ශක්තිමත් වෙනවා. ඒ ගොල්ලන්ගේ කාර්යාල ඇති කරනවා. ගරු මන්ත්‍රීතුමා, දැන් අපේ IMF bailout programme එක අවසන් වේ ගෙන එනවා. එතකොට අපිට අර තරම්ම සම්බන්ධීකරණයක් අවශ්‍ය නැහැ. ඒක ස්වාභාවික දෙයක්. සමහර රටවල්වල එහෙම වෙනවා. වැඩි වෙනවා; අඩු වෙනවා. ඒ හින්දා ඒවා අවස්ථාවට විතරක් අරගෙන ඇවිල්ලා මේ ගරු සභාවේ කථා කරලා ඒවා රූපවාහිනියෙන් පෙන්වන එක රට මුළා කිරීමේ මාර්ගයක්. අපේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපට ණය ගන්න අමාරුවක් නැහැ.

අනෙක් කාරණය, දැන් අපේ ව්‍යාපෘති ක්‍රියාත්මක වන යුගයකට ඇවිල්ලා තිබෙනවා කියන එකයි. මම තමුන්නාන්සේට එකක් කියන්නම්. අපේ ගල් අඟුරු බලාගාරය නැත්නම් අද මේ තෙල් අර්බුදය නිසා මීට වඩා විශාල අර්බුදයකට අපිට මුහුණ පාන්න සිද්ධ වෙනවා. ඒ නිසා - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලයිට් බිලත් සියයට 50කින් වැඩි කරලා තව වැඩි කරන්න හදනවාද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපේ ජල විදුලි ව්‍යාපාරයේ තත්ත්වය මේ දවස්වල දේශගුණය නිසා වෙනස්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් line එක වෙන පැත්තකට ගිහිල්ලා. තුන්වන අතුරු ප්‍රශ්නයත් ඇහුවා අතර මඟදී.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මෙතුමාට මේ ප්‍රශ්නයට රූපවාහිනී සාකච්ඡාවේදී විතරක් නොවෙයි මෙතැනදීත් අපිට උත්තර දෙන්න වෙලා තිබෙනවා නේ. රූපවාහිනී සාකච්ඡාවට ගිහිල්ලාත් පල් වුණා. මෙතැනට ඇවිල්ලාත් පල් වෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම හිතුවා අතර මඟ අහන ඒවාත් අතුරු ප්‍රශ්න කියලා. ගරු මන්ත්‍රීතුමා - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙතුමන්ලාට ණය බර උහුලා ගන්න පුළුවන් වුණාට රටේ ජනතාවට මේවා උහුලා ගන්න බැරි වෙනවා. ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතර මඟ ප්‍රශ්න අහන්න බැහැ. මම හිතන්නේ ඒවාත් අතුරු ප්‍රශ්න කියලායි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, මම ගරු කථානායකතුමාගේ ආසනය ගැන ප්‍රශ්නයක් අහන්නම් කෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහන්න, අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

රට මෙච්චර ණයබරතාවක තිබෙන අවස්ථාවක හම්බන්තොට වරායක් ඉදි කරලා තිබෙනවා. ඒ සඳහා වූ ප්‍රාග්ධන ණය සහ පොලිය වශයෙන් අවුරුද්දකට රුපියල් මිලියන 5,488ක් ගෙවනවා. පොලිය සියයට 8 ගණනේ ණය අරගෙන තිබෙනවා. මාස 18කට මේ වරායට ඇවිල්ලා තිබෙන්නේ නැව් 05යි. කොයි ආකාරයෙන්ද මේ රටේ ජනතාව මේ වාගේ බොරුවලට ගෙවන්න අවශ්‍ය වෙන්නේ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මේ ගැන කියන්නත් කනගාටුයි. එක හොඳක් තිබෙන්නේ මේවා ඔක්කොම සටහන් වෙන එකයි. යුද්ධය ගැන කරපු කථා කල් යාමේදී වැරදි බවට පත් වුණා. දැන් මේ කථාවත් - [බාධා කිරීමක්] බලන්න ගරු කථානායකතුමනි, මේ ව්‍යාපෘතිය තවම සම්පූර්ණයෙන් ආරම්භ කරලාත් නැහැ. දැනට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙගෙන යනවා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, ගරු ඇමතිතුමා දෙන පිළිතුර අහගෙන ඉන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට මේ කාරණයට උත්තරයක් දෙන්න ඕනෑ. අපේ සම්පූර්ණ විශ්වාසයක් තිබෙනවා මේ ගැන. මේක අපේ රජය කරපු ඉතාම හොඳ ආයෝජනයක්ය කියන එක ගැන අපට කිසිම සැකයක් නැහැ. [බාධා කිරීමක්] ඕවාද කතා? ඕවා කිය කියා තමයි ඉන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, කල් අරගෙන හරි සම්පූර්ණ උත්තරයක් දෙන එක හොඳයි.

## බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව : ආදායම් සහ වියදම්
## போப்பே -போத்தல பிரதேச சபை: வருமான, செலவினம்
## BOPE-PODDALA PRADESHIYA SABHA : REVENUE AND EXPENDITURE

1776/'11

4. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க-மாண்புமிகு அஜித் குமார சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ajith Kumara)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පරිහරණය කරනු ලබන නිල කැබ් රථය සඳහා 2006 වර්ෂයේ සිට මේ දක්වා වැය වූ,

(i) ඉන්ධන වියදම;

(ii) නඩත්තු වියදම;

(iii) රියදුරු වැටුප් හා දීමනා සඳහා වැය වූ මුදල;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය සභාවට අයත් 'මහජන පොළ' සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් මහජන පොළ වෙතින් 2006 වර්ෂයේ සිට මේ දක්වා ලැබූ වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) ප්‍රාදේශීය සභා අරමුදලින් එම පෙර පාසල් වෙනුවෙන් 2006 වර්ෂයේ සිට මේ

දක්වා වාර්ෂිකව වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ප්‍රදේශීය සභාවට අයත් පුස්තකාල සංඛ්‍යාව කොපමණද;

(v) ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) போப்பே -போத்தல பிரதேச சபைத் தலைவர் பயன்படுத்துகின்ற உத்தியோகபூர்வ வாகனத்திற்காக 2006 ஆம் ஆண்டு முதல் இற்றைவரை செலவிடப் பட்டுள்ள,

(i) எரிபொருள் செலவினம்;

(ii) பராமரிப்புச் செலவினம்;

(iii) சாரதிகளுக்கான சம்பளம் மற்றும் கொடுப்பனவுகளுக்காக செலவிடப்பட்ட பணத் தொகை வருடாந்தம் வெவ்வேறாக எவ்வள வென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி பிரதேச சபைக்கு சொந்தமான "பொதுச் சந்தைகளின்" எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) இந்த ஒவ்வொரு மக்கள் சந்தையிலிருந்தும் 2006 ஆம் ஆண்டு முதல் இற்றைவரை கிடைத்த வருடாந்த வருமானம் வெவ்வேறாக எவ்வளவு என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பிரதேச சபைக்கு சொந்தமான முன்பள்ளிகளின் எண்ணிக்கை யாதென்ப தையும்;

(ii) அவை யாவையென்பதையும்;

[ගරු ජෝන් අමරතුංග මහතා]

(iii) பிரதேச சபை நிதியத்திலிருந்து மேற்படி முன்பள்ளிகளுக்காக 2006 ஆம் ஆண்டு முதல் இற்றைவரை வருடாந்தம் செலவிடப்பட்ட பணத்தொகை வெவ்வேறாக யாதென்பதையும்;

(iv) மேற்படி பிரதேச சபைக்கு சொந்தமான நூலகங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(v) அவை யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he state separately, the amount of money incurred on -

(i) fuel allowance ;

(ii) maintenance cost ; and

(iii) driver's salary and allowances ;

(iv) for the official vehicle of the Chairman of the Bope-Poddala Pradeshiya Sabha, annually from the year 2006 up to now?

(b) Will he state-

(i) the number of "public fairs" belonging to the aforesaid Pradeshiya Sabha ;

(ii) their names ; and

(iii) separately, the annual income received from each of the aforesaid "public fairs" from the year 2006 up to now?

(c) Will he inform this House-

(i) of the number of pre-schools belonging to the aforesaid Pradeshiya Sabha ;

(ii) of their names ;

(iii) separately of the amount of money spent annually from the year 2006 up to now for the aforesaid pre-schools from the Pradeshiya Sabha Fund ; and

(iv) the number of libraries belonging to the aforesaid Pradeshiya Sabha; and of their names?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

ප්‍රශ්න අංක 1776/11 (බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව)

(අ) (1) ඉන්ධන වියදම්

| 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| රු.159,418.20 | රු.143,763.60 | රු.395,245.34 | රු.301,520.12 | රු.301,177.00 | රු.139,397.80 |

(11) නඩත්තු වියදම්

| 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| රු.170,687.15 | රු.223,718.00 | රු.410,656.25 | රු.433,765.61 | රු.117,748.00 | රු.32,220.64 |

(111) රියදුරු වැටුප් හා දීමනා

| 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| රු.184,716.65 | රු.220,291.49 | රු.223,196.94 | රු.263,271.55 | රු.273,222.66 | රු.245,697.02 |

(ආ) (1) මහජන පොළ 01 යි.

(11) කලේගාන මහජන පොළ

(111) වාර්ෂික ආදායම

| 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| රු.68,313.82 | රු.124,468.34 | රු.363,835.54 | රු.568,840.00 | රු.586,415.00 | රු.539,590.00 |

(ඇ) (1) පෙර පාසල් සංඛ්‍යාව 02 යි.

(11) කලේගාන පෙර පාසල
හිරිඹුර පෙර පාසල

(111) වාර්ෂිකව වැය කර ඇති මුදල

| 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| රු.66,000.00 | රු.72,000.00 | රු.129,667.50 | රු.219,199.81 | රු.158,446.10 | රු.348,617.80 |

(1v) පුස්තකාල සංඛ්‍යාව 02 යි.

(v) බෝපෙ මහජන පුස්තකාලය

පෝද්දල මහජන පුස්තකාලය

(ඈ) අදාළ නොවේ.

## රජයේ තනතුරු දෙකක් එක වර දැරීම : නිමල් පුංචිහේවා මහතා
## சம காலத்தில் இரு அரச பதவிகளை வகித்தல்: திரு. நிமல் புஞ்சிஹேவா
## HOLDING OF TWO POSTS SIMULTANEOUSLY IN PUBLIC SECTOR : MR. NIMAL PUNCHIHEWA

1998/'11

5. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) නිමල් පුංචිහේවා නමැති අයෙකු,

(i) ඉඩම් ප්‍රතිසංස්කරණකොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරමින් වැටුපක් ලබන බවත්;

(ii) ඊට අමතරව ඔහු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අතිරේක ලේකම් (නීති) ලෙස කටයුතු කරමින්ද වැටුපක් ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිමල් පුංචිහේවා යන අයගේ වයස අවුරුදු 60 ඉක්මවා තිබේද;

(ii) රජයේ තනතුරු 2ක් එක වර දැරීම සඳහා නිමල් පුංචිහේවා යන අයට කැබිනට් මණ්ඩල අනුමතියක් ලැබී තිබේද;

(iii) නොඑසේ නම්, එම තැනැත්තා සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) நிமல் புஞ்சிஹேவா என்பவர்,

(i) காணி சீர்திருத்த ஆணைக்குழுவின் தலைவ ராகப் பணிபுரிந்து சம்பளம் பெறுகிறார் என்பதையும்;

(ii) இதற்கு மேலதிகமாக இவர், இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் மேலதிக செயலாளர் (சட்டம்) ஆகவும் பணிபுரிந்து சம்பளம் பெறுகிறார் என்பதையும் அவர் அறிவாரா?

(ஆ) (i) நிமல் புஞ்சிஹேவா என்பவரின் வயது 60 ஐத் தாண்டியுள்ளதா;

(ii) அரசாங்கப் பதவிகள் இரண்டை ஒரே தடவை யில் வகிப்பதற்கு நிமல் புஞ்சிஹேவா என்ப வருக்கு அமைச்சரவை அங்கீகாரம் கிடைத் துள்ளதா;

(iii) இன்றேல், மேற்படி நபர் தொடர்பில் எடுக்கப் படும் நடவடிக்கைகள் யாவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that a person by the name of Nimal Punchihewa-

(i) earns a salary by working as the Chairman of the Land Reforms Commission ; and

(ii) also earns a salary by working as the Additional Secretary (Legal) of the Human Rights Commission of Sri Lanka ; in addition to the salary mentioned in (a) (i) above?

(b) Will he state-

(i) whether the person by the name of Nimal Punchihewa is over 60 years of age ;

(ii) whether the Cabinet approval has been given to Nimal Punchihewa to hold two posts in the public sector simultaneously ; and

(iii) if not, the steps taken with regard to the aforesaid person?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න අංක 5ත්, ප්‍රශ්න අංක 10ත් එකම ප්‍රශ්නයක්. වචන විතරයි පොඩ්ඩක් වෙනස් වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා පොඩ්ඩක් ඉන්නකෝ. මම ඔබතුමාට උත්තරය දෙන්නම්. ගරු කථානායකතුමා මට නියෝග කරනවා නම් මම උත්තරය දෙන්නම්. පෙරේදා මම මේ ප්‍රශ්නයටම උත්තර දුන්නා. මේ අනුව ප්‍රශ්න සකස් කරන අංශයෙන් ලොකු අඩු පාඩුවක් සිදු කරලා තිබෙනවාය කියා මම කියන්න කැමැතියි. මේ විධියට එකම ප්‍රශ්නය අහන්න බැහැ. පෙරේදා මම මේ ප්‍රශ්නයට පිළිතුර සභාගත කළා. නිමල් පුංචිහේවා සම්බන්ධයෙන් අසා තිබුණු ප්‍රශ්නයට පිළිතුර සභාගත කළා. අද 5 වන ප්‍රශ්නයෙනුත්, 10 වන ප්‍රශ්නයෙනුත් අසා තිබෙන්නේ ඒකමයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මාත් ඒක notice කළා. ඒක එහෙම කරපු එක වැරදියි. මෙතැනදී මේ ප්‍රශ්න ඇතුළත් කරන කොට ටිකක් මේවා ගැන බලන්න ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එකම පුද්ගලයා ගැන අහන්නේ. ඔහු දරපු තනතුරු, ඔහුගේ වේතනය ආදී වශයෙන් එකම ප්‍රශ්නය තමයි අසා තිබෙන්නේ. වචන පමණක් වෙනස්. ගරු මන්ත්‍රීතුමනි, මම දුන්නු පිළිතුර ඔබතුමා කියෙව්වාද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම පිටපත ගත්තා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ වාගේ ප්‍රශ්නවලට අපට පැටලෙන්න බැහැ. ඒ සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයෙන් විමසන්න කියන එකයි මගේ ඉල්ලීම. [බාධා කිරීමක්] කාර්ය මණ්ඩලයෙන් විමසන්න කියලායි මම කිව්වේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට පිළිතුර දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඕනෑ නම් මා පිළිතුර සභාගත කරන්නම්. මේ ප්‍රශ්නයට පිළිතුර තුන්වන වතාවටයි සභාගත කරන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
තුන්වන වතාවට නොවෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පෙරේදාත් මා සභාගත කළා නේ. ඔබතුමා සිටියේ නැහැ.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

හොඳයි. පිළිතුර අහගන්න. ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙන්නම්.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) තනතුරුවල ස්වභාවය අනුව එවැන්නක් අවශ්‍ය නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ තරම් සුදුසුකම් ලත් පුද්ගලයන් ඉන්න රටේ එකම පුද්ගලයකුට රටේ ප්‍රධාන තනතුරු දෙකක් දීලා තිබෙනවා. මානව හිමිකම් කොමිසමේ නියෝග දැන් බල ගැන්වෙන්නේ නැහැ. මානව හිමිකම් කොමිසමෙන් දෙන තීරණ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේ නැති තත්ත්වයක් තිබෙනවා. ඒකට හේතුව මේ වාගේ අකාර්යක්ෂම පුද්ගලයන් දීර්ඝ කාලයක් එක වර තනතුරු කිහිපයක් දරමින් සිටීමද කියා මා අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කෙටියෙන් දිය යුතු උත්තරය 'නැත' කියන එකයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ ඊළඟ ප්‍රශ්නය -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කොමිසම පරීක්ෂා කර දී තිබෙන තීන්දුවක් ක්‍රියාත්මක කරන්න අදාළ බලධාරීන් කටයුතු නොකරන එකට සභාපතිවරයාට දෝෂාරෝපණය කරන්න එපා. එතැන නීතියේ තිබෙන ප්‍රමාණයට අනුව පමණයි වැඩ කරන්න පුළුවන්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය මේකයි. මානව හිමිකම් කොමිසම විසින් දෙනු ලබන නියෝග ක්‍රියාත්මක වන්නේ නැහැ. මානව හිමිකම් කොමිසමේ අතිරේක ලේකම් (නීති) හැටියට පත් කර තිබෙන පුද්ගලයා වෙනත් ප්‍රධාන ආයතනයක සභාපතිකම දරමින් මානව හිමිකම් කොමිසමේ part-time වැඩ කරන කෙනෙක්. ඒ වාගේම එතුමා වයසට ගිය අකාර්යක්ෂම පුද්ගලයෙක්. ඒකට උත්තරයක් දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටි ප්‍රශ්න අහන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වෙනත් පුද්ගලයෙක් නැද්ද කියලාද ඇහුවේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔව්. ඊට වඩා සුදුසුකම් තිබෙන කෙනෙක් නැද්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අපේ පැත්තට එන්නේ නැහැ නේ. ආවා නම් ඔබතුමා තමයි පත් කරන්නේ. [බාධා කිරීමක්] හෙට අනිද්දා එයිද දන්නෙත් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ. එහෙම අවශ්‍ය නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කියපු කාරණාව පිළිබඳව සලකා බලා දැනුම් දෙන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මානව හිමිකම් කොමිසමේ නියෝග ක්‍රියාත්මක නොවීමේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේක ආණ්ඩුවටත් හොඳ නැහැ. රටටත් හොඳ නැහැ. ඒ ගැන පොඩ්ඩක් සොයා බලන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒ ගැන සොයා බලන්න.

## නිමල් පුංචිහේවා මහතා : වැටුප් හා දීමනා
## திரு.நிமல் புஞ்சிஹேவா: சம்பளம் மற்றும் கொடுப்பனவுகள்
## MR. NIMAL PUNCHIHEWA : SALARIES AND ALLOWANCES

1999/'11

10. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කරන නිමල් පුංචිහේවා නමැති අය මාසිකව ලබන වැටුප සහ අනෙකුත් දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔහු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලබා දුන් නිල රථයක් භාවිත කරන්නේද;

(iii) එම තැනැත්තා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කිරීමට අමතරව වෙනත් රජයේ රැකියාවකද යෙදෙන බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත හෙළිදරවු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම තැනැත්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කිරීම වෙනුවෙන් රුපියල් අසූදහසක (රු. 80,000/-) වැටුපක් ලබන බවත්;

(ii) එම තැනැත්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ රථයක්ද නිල රථයක් ලෙස භාවිත කරන බවත්; එතුමා දන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) காணி சீர்திருத்த ஆணைக்குழுவில் சேவை யாற்றுகின்ற நிமல் புஞ்சிஹேவா என்பவர் மாதாந்தம் பெறும் சம்பளம் மற்றும் கொடுப் பனவுகள் தனித்தனியே எவ்வளவென்பதையும்;

(ii) இவர் காணி சீர்திருத்த ஆணைக்குழுவினால் வழங்கப்பட்ட உத்தியோகபூர்வ வாகன மொன்றை பயன்படுத்துகின்றா என்பதையும்;

(iii) மேற்படி நபர் காணி சீர்திருத்த ஆணைக்குழுவில் சேவையாற்றுவதற்கு மேலதிகமாக வேறொரு அரச தொழிலிலும் ஈடுபட்டுள்ளாரென்பது காணி சீர்திருத்த ஆணைக்குழுவிற்கு வெளிப்படுத்தி யுள்ளாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நபர் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவில் சேவையாற்றுதல் சார்பில் ரூபா எண்பதாயிரம் (ரூ.80,000/-) சம்பளத்தை பெறுகின்றாரென்பதையும்;

(ii) மேற்படி நபர் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் வாகனம் ஒன்றையும் உத்தி யோகபூர்வ வாகனமாக பயன்படுத்து கின்றாரென்பதையும் அவர் அறிவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) separately, the monthly salary and other allowances received by the person by the name of Nimal Punchihewa, who works in the Land Reforms Commission;

(ii) whether he uses an official vehicle provided by the Land Reforms Commission; and

(iii) whether the aforesaid person has revealed to the Land Reforms Commission that he is doing another public sector job in addition to working in the Land Reforms Commission?

(b) Is he aware that-

(a) the aforesaid person receives a salary of Rs. 80,000/= for working in the Human Rights Commission of Sri Lanka; and

(b) the aforesaid person is also using a vehicle, which belongs to the Human Rights Commission of Sri Lanka, as an official vehicle?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයටත් ඒ පිළිතුරමයි තිබෙන්නේ. අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැත්තේ මොකද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, දැන් බලන්න -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමාත් -මූලාසනයෙනුත්- දැන් කිව්වා මේ ප්‍රශ්න දෙකම එක හා සමානයි කියලා.

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර <u>සභාගත</u>* කරනවා. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රු.30,000

(ii) රාජකාරි කටයුතු සඳහා නිල රථය භාවිතා කරයි.

(iii) ඔව්.

(ආ) (i) අදාළ නොවේ.

(ii) තනතුරට අදාළ රාජකාරි කටයුතු සඳහා එම නිල රථය භාවිතා කරනු ලබන බව දනී.

(ඇ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නය. ගරු ජෝන් අමරතුංග මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ මේ කාරණය ඔබතුමාගේ අවධානයට ගෙනෙන්න කැමැතියි. එක්සත් ජාතික පක්ෂයේ නායකයා පක්ෂයේ ප්‍රධාන නිලය දැරිය යුතුයි කියා එක්සත් ජාතික පක්ෂයේ ව්‍යවස්ථාවේ වගන්තියක් තිබෙනවා. ඒ අනුව ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පක්ෂ නායකයා හැටියට විපක්ෂ නායකකම දරනවා. ඊළඟට ව්‍යවස්ථාව අනුව ඉන්නේ නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මහතා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා රටින් බැහැරව ඉන්නකොට, එක්සත් ජාතික පක්ෂයේ ව්‍යවස්ථාව අනුව වෙන කෙනෙක් ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නය අහන්නේ කොහොමද කියන එක ප්‍රශ්නයක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒකේ ගැටලුවක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාටයි එතුමාටයි ගැටලුවක් නැතුව ඇති. අපි අහන්නේ පක්ෂයේ ව්‍යවස්ථාව අනුව. මම ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට ගරු කරනවා. ඒක නොවෙයි ප්‍රශ්නය. ප්‍රශ්නය -මේ උභතෝකෝටික පැනය- අපි නිරාකරණය කර ගන්න ඕනෑ. යූඑන්පී ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නේ ඇයි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂ නායකතුමා විදේශ ගත වන වෙලාවේ අපට - පාර්ලිමේන්තුවට- දැනුම් දී තිබෙන්නේ, ඒ කටයුතු ගරු ජෝන් අමරතුංග මහතා ඉටු කරනවාය කියායි. ඒ නිසා එතුමාට අවස්ථාව තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හා! එතුමා තමයි නියෝජ්‍ය නායකයා. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකයා. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
බොහොම ස්තුතියි. ඒක අපි දෙදෙනා බේරා ගන්නම්.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

### පීඩිත ජනතාවට සහන
பாதிப்புற்ற மக்களுக்கு நிவாரணம்
RELIEF FOR SUFFERING MASSES

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ අසනු ලබන ප්‍රශ්නය මෙසේයි.

ගරු කථානායකතුමනි, මේ වන විට අප රටේ ආදායම් අතින් පහත් මට්ටමක සිටින අය, මධ්‍යම පාන්තිකයින් ඇතුළු සියලු ජන කොටස්වලට රටේ බඩු මිල දරා ගත නොහැකිව ජීවන බරින් මිරිකී සිටී.

මේ රජය බලයට පැමිණියේ ලෝක බැංකුවේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ අනෙකුත් විදේශ ආයතනවල ජ්ලග් ගලවා ජනතාවට සහන දෙන බව පවසමිනි. ඊට අමතරව ප්‍රකාශ කළේ අරාබිකරයේ මිත්‍ර රටවලින් ඉතා පහසු මිල ගණන්වලට තෙල් ආනයනය කර මේ රටේ ජනතාවට තිබෙන මිලටත් වඩා අඩු මිලට ඉන්ධන ලබා දෙන බවය. එහෙත් මේ වන තුරු මේ කිසිවක් සිදු නොවූ අතර, සිදු වූයේ තිබුණු ප්‍රමාණයටත් වඩා රුපියල් සිය දහස් ගණනින් භාණ්ඩ හා සේවාවන්ගේ මිල වැඩි කිරීමයි. මැතිවරණයක් ළඟා වෙද්දී රජයේ මාධ්‍ය මඟින් ප්‍රකාශ කළේ මන්නාරම් ද්‍රෝණියේ තෙල් සම්පත් සහ ගෑස් සම්පත් නිධි සොයා ගත් බවත්, ඒවායේ ප්‍රතිලාභ ඉතා ඉක්මනින් ජනතාවට ලබා දෙන බවත් ය.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඉක්මනින් දෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔය අස්වර් මන්ත්‍රීතුමා කිව්ව ඒවා තමයි.

මැතිවරණ අවසන් වූ පසු මේ පිළිබඳව කිසිම කථාවක් නොමැත. ජනතාව නොමඟ යවමින් තව කොපමණ කලක් රජයට මේ බොරු, වංචා කළ හැකි දැයි අප ප්‍රශ්න කර සිටිමු. පසු ගිය මාස දෙකකට ආසන්න කාලය තුළ පමණක් පෙට්‍රල්, භූමි තෙල්, ඩීසල් තෙල් යන මේ සියලුම දේ රුපියල් සිය ගණනකින් වැඩි කළා. මේ රටේ කිසිදු දවසක මේ ආකාරයෙන් ඉන්ධන මිල මෙපමණ ප්‍රමාණයකින් වැඩි කර නැහැ. මේ ප්‍රථම අවස්ථාවයි. ඉන්ධන මිලට සාපේක්ෂව පොදු ප්‍රවාහන සේවයේද මිල ගණන් ඉහළ ගිය අතර සැම සියලු භාණ්ඩයකම මිල බලා සිටියදීම වාගේ වැඩි වෙන්නට පටන් ගත්තා. එමෙන්ම පසු ගිය සති කිහිපය තුළ වාහන බද්ද වැඩි කළේ පීඩිත ජනතාවට මරු පහරක් එල්ල කරමිනුයි. ඇත්ත වශයෙන්ම මෙහිදී සිදු වුණේ කුඩා වාහනවල බද්ද ඉතා වැඩි ප්‍රමාණයකින් ඉහළ නැංවීමත්, සුඛෝපභෝගී වාහනවල බදු ප්‍රතිශතය ඉතා සුළු ප්‍රමාණයකින් ඉහළ දැමීමත්ය. අද වෙළෙඳ පොළේ එළවලු සහ ඊට සාපේක්ෂව සහල් යනාදියේද මිල වැඩි වී ඇත. අත්‍යවශ්‍ය දේවලට ජනතාව සතු ඉතා සීමිත වූ මුදල්

ප්‍රමාණය වියදම් කිරීමෙන් පසු අනෙකුත් භාණ්ඩ මිලදී ගැනීමට ඔවුනට හැකියාවක් නොමැත.

රුපියලේ අගය අඩු වීමත්, ඩොලරයේ වටිනාකම වැඩි වීමත්, හේතු කොටගෙන රටට ගෙනෙන සියලු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ භාණ්ඩවල මිල අසීමිතව වැඩි වී ඇත. එසේම විදුලි බිල අධික ලෙස වැඩිවීම සහ ගෑස් මිල වැඩිවීමද ජනතාවට දරාගත නොහැකි තත්ත්වයකට අද පත්ව ඇත.

එමෙන්ම රජයේ රෝහල් 58ක පළාත් සභා යටතේ පාලනය වන දිසා, මූලික, පර්යන්ත රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා 500කට අත්‍යවශ්‍ය බෙහෙත් සහ ඖෂධ, උපකරණවල හිඟයක් පවතින බව වෛද්‍යවරු සහ සෞඛ්‍ය බලධාරිහු ප්‍රකාශ කරති. එවැනි හිඟයක් පවතින විට අහිංසක දුප්පත් ජනතාවට බෙහෙත් පිටස්තර වෙළෙඳ සැල්වලින් මිලදී ගැනීමට සිදු වීමෙන් අතිරේක වියදමක් දැරීමට සිදු වේ. මේ සියල්ල සිදු වන්නේ මේ රටේ දුක් විඳින, අසරණ පීඩිත ජනතාවට බවද මම දැනුම් දෙන්නට කැමැත්තෙමි.

අප රජයෙන් ඉල්ලා සිටින්නේ බලාපොරොත්තු වූ පරිදි ජනතාවගේ බලය ලබා ගත් අකාරයට මේ සියලු වැඩි වූ භාණ්ඩවල බදු ඉවත් කොට ජනතාවට සහන සලසා දෙන ලෙසය. එමෙන්ම මෙම බර දරා ගැනීමට නොහැකිව එක වේලක් කමින් ජීවත් වෙන ජනතාවට යම් කිසි මූල්‍යමය සහනාධාරයක් හෝ ලබා දෙන ලෙසය. එමෙන්ම රජයේ සේවකයින් හට ජීවත් වීමට සරිලන මට්ටමේ සහන සහ පඩි වැඩි කිරීම් ලබා දෙන ලෙසය. මා ඉදිරිපත් කළ මේ ප්‍රශ්නයට පිළිතුරු ලැබේ යැයි මා බලාපොරොත්තු වෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

අපේ මිත්‍ර එක්සත් ජාතික පක්ෂයේ නිල නොලත් නියෝජ්‍ය නායකතුමාට අපි සුබ පතනවා. ඒ ප්‍රකාශය පිළිබඳ පිළිතුර මෙයයි.

ගරු කථානායකතුමනි, අපේ රජයේ ප්‍රතිපත්ති රාමුව යටතේ ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම මඟින් ආහාර සුරක්ෂිත භාවය ළඟා කර ගැනීම සඳහාය. කෘෂිකාර්මික අංශය මුහුණ දී තිබෙන අභියෝගවලට විසඳුම් ලෙස ප්‍රධාන කෘෂි නිෂ්පාදන සඳහා සහතික මිලක් නියම කිරීම, අවශ්‍ය ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම, සියලුම භෝග සඳහා පොහොර සහනාධාරය ලබා දීම වැනි ක්‍රියා මාර්ග අපේ රජය හඳුන්වා දී තිබෙනවා. ඒ අතරම කෘෂි කාර්මික ආදායම මත ආදායම් බදු අය කිරීම සියයට 12ක සහනදායී ප්‍රතිශතයක් යටතේ පවත්වා ගෙන යනු ලබන අතර, යන්ත්‍රෝපකරණ හා උපාංග ආනයනයේදී තීරු බදු, වැට් බදු හා අනෙකුත් බදුවලින් නිදහස් කර ඇත. එසේම ආනයනයේදී දේශීය භාණ්ඩ ආරක්ෂා කිරීමට බදු ව්‍යුහය සකස් කර ඇත. පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ සහභාගිත්වය ඇතිව නිෂ්පාදන අතිරික්තයක් උත්පාදනය කිරීම හා ආහාර සුරක්ෂිත භාවය ඇති කිරීම අරමුණු කොට ගෙන පර්යේෂණ පාදක කර ගත් නිෂ්පාදන සඳහා බදු සහන ලබා දීමටද, සැලකිය යුතු රාජ්‍ය ආයෝජනයක් යෙදවීමටද පියවර ගෙන ඇත. කෘෂි කාර්මික නිෂ්පාදන මධ්‍යස්ථානවලට වඩා ග්‍රාමීය ආර්ථිකයේ වර්ධන කේන්ද්‍ර වශයෙන් ගම්මාන හඳුනා ගෙන ගමට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම තුළින් ග්‍රාමීය ආර්ථිකයේ ජීවනෝපාය අවස්ථාවන් විවිධත්වයට පත් කර ඇත.

"දිවි නැඟුම" මඟින් විශාල පරාසයක ගෘහ ආර්ථික කටයුතු දිරිමත් කිරීම සඳහා ලක්ෂ 25ක ගෙවතු වගා වැඩසටහනක් රජය දියත් කර තිබෙනවා. මේ තුළින් අද වන විට ජනතාව විශාල පිරිසක් තමනට අවශ්‍ය එළවලු, පළතුරු නිපදවා ගන්නවා මෙන්ම, කුකුළු පාලනය, මිරිදිය මත්ස්‍ය වගාව හා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලටත් යොමු වෙමින් සිටිනවා. රජය කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා අනුගමනය කළ මෙම ක්‍රියා තුළින් රටෙහි ආහාර සුරක්ෂිතභාවයක් ඇති වී තිබෙනවා. ඒ වාගේම හාල්, එළවලු, බිත්තර, පළතුරු වැනි එදිනෙදා ආහාර වේලට ඇතුළත් වන ද්‍රව්‍යවල මිල ස්ථාවර වී තිබෙනවා. අවුරුදු ගණනාවකට පසු උද්ධමනය තනි ඉලක්කමේ අගයකට පත් වී තිබීම අපේ රජයේ කෘෂි කාර්මික ප්‍රතිපත්තිවල සාර්ථකභාවය ඔප්පු කිරීමක් වෙනවා. ආහාර සුරක්ෂිතභාවය ඇති කරන ගමන්ම, තෝරා ගත් පාසල්වල ළමුන් සඳහා පෝෂ්‍යදායී ආහාර සැපයීමේ වැඩසටහන්, අඩු ආදායම්ලාභී පවුල්වලට සහනාධාර ලෙස ත්‍රිපෝෂ වැඩසටහන්, කිරි දෙන සහ ගැබිනි මව්වරුන්, සමෘද්ධිලාභීන් වැනි සමාජයේ විවිධ කොටස්වලට සහන සපයන වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා.

රජයේ සේවකයන් ගැන විපක්ෂය කථා කිරීමත් එක්තරා දෛවෝපගත සිද්ධියක්. රජයේ සේවකයන් ලක්ෂ 6ට අඩු කිරීමට කථා කරපු, විශ්‍රාම වැටුප් අහෝසි කිරීමට කථා කරපු පක්ෂ අද රජයේ සේවකයන් ගැන කථා කිරීම විහිළුවක් යැයි අපි කල්පනා කරනවා. 2005දී අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වූ දා සිටම රජයේ සේවකයන්ට සෑම වසරකම වැටුප් වැඩි වීම් ලබා දීමටත්, විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් වැඩි කිරීමටත් මේ රජය කටයුතු කර තිබෙනවා. රජයේ සේවකයෙකුගේ අවම වැටුප රුපියල් 7,900 සිට රුපියල් 11,730 දක්වා වැඩි කළේ මේ රජය බව විපක්ෂයට මතක් කර දිය යුතුව තිබෙනවා. ඒ අතරට අද වන විට රජයේ සෑම සේවකයෙකුටම මසකට රුපියල් 5,850ක ජීවන වියදම් දීමනාවක් ලබා දෙනවා. රජයේ සේවකයන්ට පසු ගිය අය වැය මඟින් සියයට 15ක් දක්වා විශේෂ දීමනාවක් ලබා දීමට සහ වැටුප් විෂමතා ඉවත් කිරීමට අපේ රජය කටයුතු කර තිබෙනවා.

ලෝක ආර්ථික තත්ත්වයන් වෙනස් වීම් මෙන්ම ජාත්‍යන්තර තෙල් මිල ගණන් ශීඝ්‍රව වැඩි වීම තුළ දේශීයව තෙල් මිල ගණන් වෙනස් කළ යුතු වෙනවා. 2003දී ඇමෙරිකානු ඩොලර් 28ට හෝ 29ට තිබූ බොර තෙල් බැරලයක මිල අද වන විට ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබෙනවා. ඊට අනුරූපව රජය දේශීයව මිළ ගණන් වෙනස් කළේ සෑහෙන කාලයකට පසුවයි. ඊට අනුරූපව විදුලිය හා ගෑස් මිල ගණන් වෙනස් වුණා. මෙය හුදෙක්ම ජාත්‍යත්ර මිල ගණන්වල විචලනයන්ට අනුරූපව සිදු වූවක්.

රටේ මිල ගණන් ස්ථාවරව තබා ගනිමින්, සහනාධාර ලැබිය යුතු දිළිඳු ජන කොටස්වලට සහාය වෙමින් රජයේ සේවකයන්ට වටිනාකමක් ලබා දෙමින් අපේ රජය කටයුතු කර තිබෙනවා. බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

## පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1, 2, 3 සහ 4 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7හි විධිවිධානවල සහ 2011.04.07 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ.භා. 1.30 සිට අ.භා.7.30 දක්වා විය යුතුය. අ.භා. 4.00ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශෝක ප්‍රකාශය: ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
அனுதாபத் தீர்மானம் : மாண்புமிகு அநுருத்த ரத்வத்தே
VOTE OF CONDOLENCE : HON. GENERAL ANURUDHA RATWATTE

[අ.භා. 2.44]

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - சமூக நலன்புரி அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Social Welfare)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ අභාවය ශ්‍රී ලාංකිකයන් හැටියට අපටත්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් ඉතාම ශෝක ජනක දෙයක් හැටියටයි මා දකින්නේ. විශේෂයෙන්ම 1994 දී අපේ පක්ෂය ජයග්‍රහණය කරවන්න, මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් බිහි කරන්න මූලික වෙච්ච ශ්‍රේෂ්ඨ පුද්ගලයකු හැටියට අපට එතුමාව හඳුන්වන්නට පුළුවන්. මම එහෙම කියන්නට හේතුව මේකයි. අපි ඒ හැම මැතිවරණයකදීම පරාජය වන්න එක හේතුවක් තමයි, දෙතුන් පොළක ලියා පදිංචි වීමෙන් වැඩිපුර ඡන්ද 5000ක් විතර එක්සත් ජාතික පක්ෂය පාවිච්චි කිරීම. අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා තමයි ඒ කාර්යය නතර කිරීමට අවශ්‍ය කරන උපදෙස් හැම සංවිධායකයකුටම ලබා දීලා, තමන්ගේ මැතිවරණ කොට්ඨාසයේ වැඩිපුර ඡන්ද ලියා පදිංචි වීම වළක්වන්න කටයුතු කළේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

එක්සත් ජාතික පක්ෂය ඒක පිළිගන්නේ නැහැ. අපි එහෙම එකක් කළේ නැහැ.

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)

කොහොම වුණත් එය හැම මැතිවරණයකදීම සිදු වුණ දෙයක්. නමුත් අද ඒක සිදු වන්නේ නැහැ. අද ඡන්දය දමනකොට හැඳුනුම්පත පාවිච්චි කරන්න පුළුවන්. එදා එහෙම හැඳුනුම්පත පාවිච්චි කරන්න අවශ්‍ය වුණේ නැහැ. මාත් හිටපු එක්සත් ජාතික පාක්ෂිකයෙක්. 1977 මැතිවරණය කළේ කොහොමද කියලා අපි දන්නවා. අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාට මගේ ගරු කිරීම තිබෙන්නේ මේකයි. විශේෂයෙන්ම 1994 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ එතුමා එවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කරපු නිසායි. ඒ නිසා පක්ෂය වෙනුවෙන් අපි එතුමාට ගෞරව කළ යුතුයි කියන එකයි මගේ ලොකුම හැඟීම.

මා නියෝජනය කරන වෙන්නප්පුව ආසනය ජනපද විශාල සංඛ්‍යාවක් තිබෙන ආසනයක්. ඒ සියලුම ජනපදවලට විදුලිය ලබා දෙන්න පුළුවන්කම ලැබුණේ අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා එදා විදුලිබල ඇමතිවරයා හැටියට ක්‍රියාත්මක කළ හැම විදුලි යෝජනා ක්‍රමයකින්ම අපටත් විදුලිය ලබා දුන්න නිසායි. මම හිතන හැටියට වෙන්නප්පුව ආසනයේ පමණක් නොවෙයි, පුත්තලම දිස්ත්‍රික්කයේත් ඇති කළ විදුලි යෝජනා ක්‍රම නිසා අපට ඒ දේ කර ගන්න පුළුවන් වුණා. අද වන විට ඒ පළාතේ තවත් ස්ථාන කිහිපයක් පමණයි විදුලිය ලබා දෙන්න ඉතුරු වෙලා තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම අපි ඒ සම්බන්ධයෙන් කථා කළ යුතුයි.

පසු ගිය යුද්ධය ජයග්‍රහණය කරන්න මූලික වුණු යාපනය ජයග්‍රහණය කරන්න රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා හැටියට එතුමාට එදා පුළුවන්කම ලැබුණා.

විශේෂයෙන්ම එතුමා මට කවදාවත් අමතක නොවන පුද්ගලයකු හැටියට සඳහන් කරන්න පුළුවන්. එතුමා මාව දකිද්දී මට පොඩි විහිළුවක් කරනවා, මගේ "ෆනැන්ඩු" කියන වාසගම නිසා. එතුමා ගෝවට ගිය වෙලාවේ දුටු විධියට ෆනැන්ඩුලා ගොඩක් ඉන්නවාලු ගෝවේ. එතකොට එතුමා සමඟ ගිය ආරක්ෂක නිලධාරියකුගෙන් හෝ එතුමා සමඟ ගිය කවුරු හෝ කෙනෙකුගෙන් අනුරුද්ධ රත්වත්තේ ඇමතිතුමා අහලා තිබෙනවා, "මොකද මේ?" කියලා. එතකොට ඒ පුද්ගලයා කියලා තිබෙනවා, "සර්, මේ ෆනැන්ඩු කියන නම ලැබුණේ කොහොමද කියලා දන්නවාද?" කියලා. මේක පොඩි විහිළු කථාවක් වුණත් මම කියන්නම්. එදා පෘතුගීසි යුගයේදී සිංහල අය පෝලිම් කරලා නම අහද්දී එක් කෙනෙක් කියලා තිබෙනවා, "පලයන් ඩෝ" කියලා. පෘතුගීසීන් ඒක "ෆනැන්ඩු" හැටියට කිව්වා. ඒ අනුව එතුමාත් මාව දකිද්දී, "ආ! පලයන් ඩෝ" කියලා තමයි මට ආමන්ත්‍රණය කරන්නේ. ඒ නිසා එතුමා අද අප අතරින් වෙන්ව ගියත්, මගේ වාසගම තිබෙන තාක් කල් කිසි දවසක මට එතුමා අමතක නොවන පුද්ගලයෙක්.

අවසාන වශයෙන්, එතුමාගේ ආගමේ හැටියට එතුමාට නිවන් සුව අත් වේවා! යි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

[අ.භා. 2.50]

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා මා දීර්ඝ කාලයක සිට දන්නා කියන කෙනෙක්. අපට බලයක් නොමැති යුගයේදී පක්ෂ ප්‍රතිසංවිධාන කටයුතුවලදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාලක ලේකම්වරයා විධියට එතුමා දීර්ඝ කාලයක් ලංකාව පුරාම ගමින් ගමට, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට, කලාපයෙන් කලාපයට ගිහිල්ලා අතිවිශාල කාර්ය භාරයක් සිද්ධ කළා. මම ශ්‍රී ලංකා නිදහස්

පක්ෂයේ තරුණ සංවිධානයේ නියෝජ්‍ය සභාපතිවරයා වශයෙන් කටයුතු කරද්දී මම දැක්කා, එතුමා පාලක ලේකම්වරයා විධියට වැඩ මුළු, දේශන, සම්මන්ත්‍රණ සංවිධානය කිරීමට අපිත් එක්ක අතිවිශාල කැපවීමක් පක්ෂය වෙනුවෙන් නිරන්තරයෙන්ම කළ බව.

1971දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අග්‍රාමාත්‍යවරිය විධියට සිටිද්දී ඇති වූ අප්‍රේල් කැරැල්ලේදී ඒ තරුණයන්ගේ ස්වභාවය තේරුම් අරගෙන එම කැරැල්ල මැඩ පවත්වන්න කටයුතු කළා මෙන්ම, ඒ තරුණයන් පුනරුත්ථාපනය කිරීම සඳහාත්, ඔවුන් යහ මඟට යොමු කිරීම සඳහාත් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා විශේෂයෙන් කරන ලද කාර්ය භාරය අතිවිශාලයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම පසු ගිය එල්ටීටීඊ සටන් සමයේදී "හෙණ පහර", "සත්ජය", "ජය සිකුරු", "රණඝොෂ", "රිවිරැස" වාගේ මෙහෙයුම්වල නායකත්වය දරමින් නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා විධියට ත්‍රිවිධ හමුදාවත්, පොලීසියත්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයත් මෙහෙයවපු ආකාරය අපි දැක්කා. එතුමා බිය නොමැති, ඍජු නායකයකු විධියට උතුරු නැඟෙනහිර ප්‍රදේශවලට ගිහිල්ලා හමුදාව ධෛර්යවත් කරමින්, ඒ ප්‍රදේශයේ සිවිල් පුරවැසියන් සහ රාජ්‍ය නිලධාරින් දැනුවත් කරමින් අතිවිශාල කැපවීමකින් වැඩ කරපු ජාති හිතෛෂී නායකයෙක්.

එතුමා පළමුව මහනුවර දිස්ත්‍රික්කයේ සෙංකඩගල මැතිවරණ කොට්ඨාසයත්, ඊට පස්සේ ඉතා දුෂ්කර මැතිවරණ කොට්ඨාස කීපයකත් කටයුතු කළා. එක් මැතිවරණයකදී එතුමා මහනුවර ජනතාවගේ ප්‍රසාදය ලබා ගනිමින් එක්ලක්ෂයකට වඩා වැඩි මනාප ප්‍රමාණයක් ලබා ගත්තා. එසේ වුවත්, එතුමා 89 දී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් වුණා.

ඊළඟට 1994දී එතුමා වැඩි ඡන්ද ප්‍රමාණයකින් මහනුවර දිස්ත්‍රික්කයේ මහ ජන නියෝජිතයෙක් විධියට පාර්ලිමේන්තුවට පත් වුණා. විශේෂයෙන් වාරිමාර්ග, ඒ වාගේම විදුලිබල හා බලශක්ති, ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය ධුර දරමින් එතුමා ලංකාව පුරාම ගියා. අපට මතකයි, අපේ මැතිවරණ කොට්ඨාසවල විශේෂයෙන් විදුලිය ලබා දීම සඳහා එතුමා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා. ගමින් ගමට ගිහිල්ලා, සිනාමුසු මුහුණින් ඒ වාගේම ප්‍රීතිය උපදවන විවිධ කථා කියමින් තමයි හැම අවස්ථාවකදීම එතුමා නිලධාරින් සමඟ, අප සමඟ ඒ කටයුතු ක්‍රියාත්මක කළේ. එතුමා මැතිවරණ කාර්යයන් ක්‍රියාත්මක කරන්න මට වරක් පාතදුම්බර මැතිවරණ කොට්ඨාසය භාර දුන්නා. ඒ සඳහා එතුමා මට පූර්ණ නිදහස ලබා දුන්නා. ඒ කාර්යයන් සඳහා ශක්තිය ලබා දීමට එතුමා නිරන්තරයෙන් මට එන්න කිව්වා. මම ඒ මැතිවරණ කොට්ඨාසය ඡන්ද හයදහස් ගණනකින් ජයග්‍රහණය කරලා දුන්නා.

මට මතකයි, එතුමාගේ පුත්‍ර රත්නයක් වන ලොහාන් රත්වත්තේ මහතාට පළමු වතාවට නාම යෝජනා ලැබිලා ජනාධිපති ලේකම් කාර්යාලයේ සිටින අවස්ථාවේදී එහි වටේම සිටි පිරිසගේ මුහුණු දිහා බලා, ගරු අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා ලොහාන් රත්වත්තේ මහතාට ඉතාමත් සෙනෙහසින් කිව්වා, "ටී.බී. ඒකනායක ඇමතිතුමා ඉන්නවා. ඉස්සෙල්ලාම ගිහිල්ලා ඔහුට කථා කරන්න." කියලා. ඉතින් ලොහාන් රත්වත්තේ මහතා ඇවිල්ලා මට කථා කළා.

ගරු අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා 1938 ජූලි මාසයේ 13 වෙනිදා උපන් කෙනෙක් විධියට විශේෂයෙන් දළ දා මාළිගාවේ ගිහි නායකයා විධියට -දියවඩන නිලමේ විධියට- පියාගෙන් පසුව වැඩ බලන කාලය තුළ ඉතාමත් ලොකු පරිපාලන වෙනසක් ඇති කරමින් සියම් මහනිකායේ මල්වතු පාර්ශ්වයේ සහ අස්ගිරි පාර්ශ්වයේ රාජකාරි සඳහා තිබුණු ගැටලු රාශියක් විසඳුවා. මේ කාර්යයේදී අපට මතකයි, විශේෂයෙන් නාථ දේවාලයේ බස්නායක නිලමේ විධියටත්, විෂ්ණු දේවාලයේ බස්නායක නිලමේ විධියටත් පරම්පරා ගණනාවක කාර්ය සාධනයේදී එතුමා කටයුතු කාරණා කීපයක් ක්‍රියාත්මක කළ බව.

එතුමා යුද හමුදාවේ ස්වේච්ඡා බලසේනාවේ වසර 14ක් කර්නල්වරයෙක් විධියට විවිධ ප්‍රදේශවල කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, විශේෂයෙන් 1994දී අවුරුදු 17කට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පොදු ජන එක්සත් පෙරමුණ බලයට පත් කර ගැනීම සඳහා අතිවිශාල කැපවීමක් කරපු, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රැක ගැනීම සඳහා විශාල මහන්සියක් ගත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති, පංච මහා බලවේග ක්‍රියාත්මක කරමින් කටයුතු කරන්නට ශක්තියක් ලබා දුන් ජන හිතකාමී නායකයෙක් විධියටත් එතුමාව හඳුන්වන්න පුළුවන්. මහනුවර ප්‍රදේශයේ 1918 ජනතා නැඟිටීමට, 1948 ජනතා නැඟිටීමට සම්බන්ධ පරම්පරා ගණනාවක පුරුකක් විධියට, දේශ ප්‍රේමී ජාතික අරගළවලට සම්බන්ධ වෙච්ච පරම්පරාවක ජාති හිතෛෂී නායකයෙක් විධියටත් එතුමාව මම දකිනවා.

මම හිතන හැටියට දේශපාලන වශයෙන් එක්සත් ජාතික පක්ෂය විශාල වශයෙන් එතුමාගෙන් පළි ගත්තා. එතුමා බන්ධනාගාරයේ සිටියදී, එතුමාව උසාවියට ගෙනෙන විටදී අවස්ථා ගණනාවකට අපි ගියා. දරු තිදෙනාත් එක්ක ඒ කටයුතු කරද්දිත් එතුමා බොහොම මිත්‍රශීලීව සිනා සෙමින් තමයි ඒ කටයුතු කාරණා ක්‍රියාත්මක කළේ. එතුමාට දඬුවම් දුන්නත්, ඇමතිවරයෙක් විධියට, පක්ෂයේ නායකයෙක් විධියට, සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේ, ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ සමීපතම ඥාතිවරයෙක් විධියට ඒවා ඔළුවට ගන්නේ නැතිව බොහොම නිහතමානීව දේශපාලන ක්‍රමයට සම්බන්ධ වෙච්ච කෙනෙක් ගරු අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා. අපි කිව්ව හැම අවස්ථාවකදීම -වාරි මාර්ග, විදුලිබල, රාජ්‍ය ආරක්ෂක ඒ කටයුතු හැම එකේදීම- එතුමා අපට ශක්තිය ලබා දුන්නා.

මගේ නගරයේ -මහව- පොලීසිය කඩා වැටිලා තිබුණු මොහොතක ඒක ඉදි කරන්න මම ඉල්ලීමක් කළාම එතුමා සම්පූර්ණයෙන් ඒකට අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා දීලා දැවැන්ත ඉදි කිරීම් ක්‍රියාත්මක කරන්න අපට සහාය ලබා දුන්නා. ඒ විධියට ගමට ගිහිල්ලා, ගමේ ප්‍රශ්නය සැබෑ විධියට දැකලා වැඩ කරන්න පුළුවන් නායකයෙක් විධියටත් එතුමාව හඳුන්වන්න පුළුවන්.

විශේෂයෙන් එතුමාගේ පුතෙකු වන ලොහාන් රත්වත්තේ මැතිතුමා පියාගේ ඒ දේශපාලන ව්‍යාපාරය ඉදිරියට ගෙන යමින් අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට කටයුතු කරනවා. ඒ වාගේම තවත් පුතෙකු වන මහේන්ද්‍ර රත්වත්තේ මැතිතුමා මහනුවර නගරාධිපතිවරයා වශයෙන්, දීර්ඝ කාලයකින් පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නතු වෙච්ච නගර සභාවක් බවට මහනුවර නගර සභාව පත් කර ලොකු වෙනසකට ලක් කරමින් එහි කටයුතු කරනවා. ඊළඟ පුත්‍රයා ව්‍යාපාර කළමනාකරණයේ යෙදෙමින් කටයුතු කරනවා. ඒ පුතුන් තිදෙනාම ඉතාමත් හොඳ මිත්‍රයින් වාගේ ඉතාමත් සමීපව කටයුතු කරන අවස්ථා ගණනාවකට අපි සම්බන්ධ වෙලා තිබෙනවා. අපි නොහිතපු අවස්ථාවක එතුමා අපව හැරදා ගියත් එතුමාගේ ගුණ සුවඳ සදා කල් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළත් ඒ වාගේම පොදුජන එක්සත් පෙරමුණ තුළත්, රට පුරාත් පවතිනවා. එතුමාගේ කාර්ය සාධන කටයුතුවල ස්වභාවය, කළමනාකරණ කටයුතුවල ස්වභාවය, හමුදා ජීවිතයේ ස්වභාවය, දේශපාලන ජීවිතයේ ස්වභාවය, ඒ වාගේම එතුමා හා මිත්‍රයින් අතර තිබුණු මිත්‍රශීලීභාවයේ, සමාජශීලීභාවයේ ස්වභාවය, ඉතිහාසය පුරා අපි දැක්ක ඒ ගුණ සුවඳ කොතෙක්ද කියලා අපට ප්‍රකාශ කරන්න බැහැ.

ගරු කථානායකතුමනි, ඒ නිසා අවසාන වශයෙන් මා කියන්න කැමැතියි, එතුමාගේ අභාවයෙන් අපට ඇති වුණු ඒ අඩුව පිරිමහන්නට අපට පුළුවන්කමක් නැහැ කියන එක. ශ්‍රී ලංකා

[ගරු ටී. බී. ඒකනායක මහතා]

නිදහස් පක්ෂය තුළ විවිධ අවස්ථාවලදී ඒ කාරණය ගැන අප අදත් සිහිපත් කරනවා. බෞද්ධයන් විධියට එතුමාට නිවන් සුව අත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා නියෝජ්‍ය අමාත්‍යතුමා.

[பி. ப. 2.59]

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Child Development and Women's Affairs)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, மறைந்த முன்னாள் அமைச்சர் மாண்புமிகு அநுருத்த ரத்வத்தே அவர்களின் அனுதாபப் பிரேரணைமீது உரையாற்ற எனக்கும் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு நான் மனநிறைவடைகின்றேன். மாண்புமிகு அமைச்சர் அநுருத்த ரத்வத்தே அவர்கள் மிகவும் விரைவாகத் தீர்மானங்களை எடுக்கக்கூடிய, நேர்மையான ஒரு பெரும் அரசியல் தலைவராகச் செயற்பட்டார். இந்த நாட்டில் மிகவும் மோசமான, கொடூரயுத்தம் நடைபெற்ற காலத்திலே, குறிப்பாக கிழக்கு மாகாணத்திலுள்ள முஸ்லிம் மக்களுக்கு எதிராகத் தமிழீழ விடுதலைப் புலிகள் பயங்கரவாதத்தைக் கட்டவிழ்த்துவிட்டபொழுது, முன்னாள் பிரதிப் பாதுகாப்பு அமைச்சரான மாண்புமிகு அநுருத்த ரத்வத்தே அவர்கள் முஸ்லிம்களைப் பாதுகாப்பதிலும் முஸ்லிம் கிராமங்களைப் பாதுகாப்பதிலும் அவர்களின் பொருளாதாரத்தைப் பாதுகாப்பதிலும் முன்னின்று செயற்பட்டார். அவர் மறைந்த எமது முன்னாள் தலைவர் கௌரவ எம்.எச்.எம் அஷ்ரஃப் அவர்களுடன் மிகவும் நெருங்கிய நண்பராகச் செயற்பட்டார். 1994ஆம் ஆண்டு தொடக்கம் 2000ஆம் ஆண்டு வரையிலான ஆறு வருட காலப்பகுதியில் எமது பிரதேசத்தில் நாளாந்தம் முஸ்லிம்களுக்கெதிரான தாக்குதல்கள், பாதுகாப்புப் பிரச்சினைகள் போன்ற ஒவ்வொரு பிரச்சினையின்பொழுதும் நாங்கள் எந்த நேரத்தில் அவருடன் தொடர்புகொண்டாலும் அவர் மிகவும் நிதானமாக எமக்கு ஏற்பட்ட பிரச்சினைகளைக் கேட்டறிந்து, உடனுக்குடன் நடவடிக்கை எடுத்து எமது பிரச்சினைகளுக்குத் தீர்வு கண்டிருக்கிறார். அவருடைய பதவிக்காலத்திலே நாங்கள் எமது பல்வேறுபட்ட பிரச்சினைகளுக்குத் தீர்வுகண்டோம். பயங்கரவாதப் புலிகளால் 1990ஆம் ஆண்டில் கிழக்கு மாகாணத்தின் பல்வேறு கிராமங்களிலிருந்தும் விரட்டியடிக்கப்பட்ட முஸ்லிம் மக்களை முன்னாள் அமைச்சர் மாண்புமிகு அநுருத்த ரத்வத்தே அவர்களுடைய பணிப்புரையின் பேரில் மீண்டும் அக்கிராமங்களில் மீளக்குடியமர்த்தினோம். கிழக்கு மாகாண முஸ்லிம் மக்களுடைய பாதுகாப்பை உறுதிப்படுத்துவதற்காக எங்களுடன் மிகவும் நெருக்கமாகச் செயற்பட்டார். அடிக்கடி கிழக்கு மாகாணத்திலுள்ள இராணுவ முகாம்களுக்கு விஜயம்செய்து, உரிய ஆலோசனைகளை வழங்கி, அந்தப் பிரதேசங்களைப் பாதுகாப்பதற்காக அவர் ஆற்றிய பங்களிப்பை நாங்கள் ஒருபொழுதும் மறக்க முடியாது.

அதேபோன்று அவர் நீர்ப்பாசன அமைச்சராகக் கடமையாற்றிய காலத்தில் கிழக்கு மாகாணத்திலுள்ள முஸ்லிம் கிராமங்களிலிருந்து விடுதலைப் புலிகளால் விரட்டியடிக்கப்பட்ட முஸ்லிம் மக்களுக்கு மகாவலி அமைச்சின்மூலம் றிதிதன்ன, ஜயந்தியாய போன்ற பிரதேசங்களில் காணிகளை வழங்கி அம்மக்கள் நிம்மதியாக வாழ்வதற்குரிய சூழ்நிலைகளை உருவாக்கினார். அவராலேயே ஜயந்தியாய என்னும் கிராமம் உருவாக்கப்பட்டது. அதுமட்டுமன்றி அவர் மின்சக்தி எரிபொருள் அமைச்சராக இருந்த காலத்திலே எமது பிரதேசத்திலுள்ள பல கிராமங்களுக்கு மின்சாரத்தை வழங்கினார். தமிழீழ விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டுப் பிரதேசங்களிலும்கூட சாதாரண பொதுமக்களின் அடிப்படைத் தேவையைப் பூர்த்திசெய்யும்பொருட்டு மனிதாபிமான அடிப்படையில் மின்சாரத்தை விநியோகித்தார். அந்தக் காலங்களில் விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டுப் பிரதேசங்களுக்கு மின்சாரம் வழங்கக்கூடாதென இராணுவத்தினர் தெரிவித்திருந்தபொழுதிலும் அப்பிரதேசத்திலுள்ள சாதாரண பொதுமக்கள் கஷ்டப்படக்கூடாதென்ற நோக்கத்துடன் மின்சாரத்தை விநியோகித்த மனிதாபிமானமுள்ள தலைமைத்துவத்தை இன்று நாங்கள் இழந்து நிற்கின்றோம். மறைந்த அமைச்சர் மாண்புமிகு அநுருத்த ரத்வத்தே அவர்கள் அப்பிரதேசத்திலுள்ள மக்களுக்கு நீர்ப்பாசனம், மின்சாரம் ஆகியவற்றை வழங்கி அபிவிருத்தி நடவடிக்கைகளுக்கு உதவியது மட்டுமன்றி, அம்மக்களின் பாதுகாப்பை உறுதிப்படுத்துவதிலும் அவர் ஆற்றிய பங்களிப்பை நாம் ஒருபொழுதும் மறக்க முடியாது.

உயர்ந்த, நல்ல பண்புகளைக்கொண்ட ஒரு மனிதராகத் திகழ்ந்த அவரோடு நாங்கள் மிக நெருக்கமாகப் பழகியிருக்கிறோம். அவர் அமைச்சரவை அந்தஸ்துள்ள அமைச்சராக இருந்தவேளையில் அவருடைய அமைச்சு சார்பாக நாங்கள் எந்தவொரு விடயத்தைக் கொண்டுசென்றாலும் ஒருபோதும் அதற்கு மறுப்புத் தெரிவிக்காமல் அவர் அந்தப் பணிகளை எங்களுக்குச் செய்து தருவார். குறிப்பாக, பாதுகாப்பு விடயங்களிலே மிகக்கூடிய அக்கறையோடு அவர் செயற்பட்டார். அன்னாருடைய மறைவு, குறிப்பாக கிழக்கு மாகாணத்து முஸ்லிம்கள் மத்தியில் கவலையை ஏற்படுத்தியிருக்கிறது. அவர் ஆற்றிய பணிகளை நாங்கள் என்றென்றும் நினைவுகூருகின்றோம். அவருடைய இழப்பால் கவலையுறுகின்ற அவருடைய மகனான கௌரவ உறுப்பினர் லொஹான் ரத்வத்தே அவர்களுக்கும் அவருடைய சகோதரரும் கண்டி மாநகர முதல்வருமான மஹேந்திர ரத்வத்தே உட்பட அவருடைய குடும்பத்தவர்கள் அனைவருக்கும் எங்களுடைய மக்கள் சார்பிலே ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக்கொள்கின்றேன். நன்றி.

[3.04 p.m.]

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர் )
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)

Mr. Speaker, I rise with great respect to pay tribute to my Friend and one time Cabinet Colleague, the late Hon. General Anurudha Ratwatte.

I am very thankful for giving me this opportunity to recall the memory of a highly-cultured gentleman politician who had been one of those rare men with great qualities. He was both a politician as well as a military man. His services to the people of Sri Lanka, particularly to the people of the Kandy District, have been unique. I had the privilege of serving as one of his Cabinet Colleagues and I was proud of his association.

He was one of the most modest and lovable personalities who walked with men of all shades. He transcended the boundaries of race, religion, caste and creed and embraced all people alike. Sir, he had been a person who was in the forefront in social, sports, cultural and economic activities pertaining to the people of the Kandy District. He was a social worker with an objective vision. He was quite an unassuming personality with very fine human qualities.

The Hon. Anurudha Ratwatte served as a Deputy Minister of Defence and showed extraordinary valour in the battlefield directing many successful military operations including the "Jayasikuru" operation in which the Sri Lanka Army regained the Jaffna Peninsula from the deathly terrorists. As the Cabinet Minister for Irrigation, Power and Energy, he rendered an excellent service.

As a man, he fostered fellowship among the different ethnic communities and he was an ardent believer in multiculturalism and ethnic harmony. Although he began his political career as an UNPer, he joined the progressive forces and worked hard to create a sense of political awakening among the people. He always looked at the problems of the people with great understanding and an open mind. His approach to the various issues had been unique in respect of each issue. He particularly took care not to offend anyone.

The people of Sri Lanka including the Armed Forces will remember him forever for the leadership and the significant contribution he made in the eradication of terrorism towards the reunification of the country. Men of his calibre are very rare.

Sir, I join the Members of this House in paying my highest tribute to him and conveying my deepest condolences to the members of his family.

Thank you.

[අ.භා. 3.08]

**ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පමණක් නොවෙයි, මුළු මහත් ශ්‍රී ලංකාවටම අමරණීය සේවයක් ඉටු කළ හිටපු අමාත්‍ය ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා පිළිබඳව වචන කීපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන රජයක් තුළින් ලාංකීය දේශපාලනයේ නව මාවතක් බිහි කිරීමේ සටනට එතුමා දීපු දායකත්වය මට මේ මොහොතේ මතක් වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රතිසංවිධානය වෙනුවෙන් එදා නීති ශිෂ්‍යයන් හැටියට සිටි අපට ආරාධනා කරලා පක්ෂයට සක්‍රියව එකතු වන මඟ පෙන්වා දුන්නේ කර්නල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමායි. එදා අප ශිෂ්‍යයන් හැටියට ගොනු කරලා, ප්‍රතිසංවිධාන කටයුතු වෙනුවෙන් ගමින් ගමට යොමු කළේත් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමායි. එතුමාගෙන් අප ඉගෙන ගත්ත ඒ සංවිධාන හැකියාව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිබඳ විවිධ වූ අත් දැකීම් අද මේ පාර්ලිමේන්තුවේ නියෝජිතයෙක් හැටියට මම සිහිපත් කරන්නේ ඉතාම කෘතවේදීවයි.

ගරු කථානායකතුමනි, මට මතක් වෙනවා, 1993-1994 යුගයේ දකුණු පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතු කිරීමේ වගකීම එතුමා දරපු ආකාරය. එදා පක්ෂයේ නායකත්වයත්, දකුණේ ප්‍රධානීන් අතරත් තිබුණු විවිධ මත ගැටුම් නිරාකරණය කරන්න එතුමා ගරු අමරසිරි දොඩන්ගොඩ හිටපු ඇමතිතුමාත් පක්ෂ නායිකාවත් අතර අතරමැදියකු හැටියට කටයුතු කරලා ඒ ප්‍රශ්න සමනය කරපු ආකාරය මට අදත් සිහිපත් වෙනවා. ඒ සටන ජයග්‍රහණය කරවන්න එතුමා අභියෝග මැද්දේ, විවිධ බලපෑම් මැද්දේ සම්බන්ධ වෙලා කරන ලද ඒ කැප කිරීම්වල ප්‍රතිඵල අද මේ රට, අප භුක්ති විඳිනවා.

දේශපාලන කටයුතුවල ප්‍රතිඵලයක් හැටියට එතුමා සිරගත වෙච්ච අවස්ථාව අපට කිසි දා අමතක කරන්න පුළුවන් කාරණයක් නොවෙයි. කොළඹ මහාධිකරණය අපේ මිත්‍ර ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාත්, ගරු අනුරුද්ධ රත්වත්තේ ඇමතිතුමාත් හදිසියේම රිමාන්ඩ් භාරයට පත් කරපු මොහොතේ එතුමා වෙනුවෙන් පක්ෂයේ කියලා කිසි කෙනෙක් හිටියේ නැහැ. වර්තමාන ජනාධිපතිතුමාට මේ බව දුරකථනයෙන් දැනුම් දුන් වහාම එතුමා ගමේ යමින් හිටිය ඒ ගමන අතරමඟ නවත්වලා ආපසු හරවලා ඇවිත් ගරු අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා විසින් පක්ෂයට කරන ලද කටයුතු වෙනුවෙන් එතුමා එක්ක රැඳී සිටියා. ඉන් අනතුරුව අතිගරු ජනාධිපතිතුමා හැම විටම ඒ කටයුතු වෙනුවෙන් කෘතවේදීත්වය දක්වපු ආකාරය අපට අදත් සිහිපත් වෙනවා.

මේ මොහොතේ ගරු අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා අප අතර නොමැති වුණත්, අපට සතුටු වෙන්න පුළුවන් කාරණයක් තිබෙනවා. එය තමයි, එතුමා අප අතරින් වෙන් වන විට මහනුවර දිස්ත්‍රික්කය වෙනුවෙන්, මහනුවර ජනතාව වෙනුවෙන්, රටේ ජනතාව වෙනුවෙන් එතුමා ඉටු කළ කාර්ය භාරය ඉදිරියට ගෙන යන්න ශක්තිය තිබෙන අපේ ගරු ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට එකතු කිරීම, ජනතා සේවයට එකතු කිරීම.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මගේ දීර්ඝ කාලීන මිත්‍රයෙකු වූ මහේන්ද්‍ර රත්වත්තේ මැතිතුමාට ඉතිහාසයේ ප්‍රථම වතාවට මහනුවර මහ නගර සභාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙතට කැඳවා ගන්නට, ජයග්‍රහණය කරවා ගන්නට -ඒ සියලු දේට- ශක්තිය වුණේ ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමායි.

එතුමාට අප සියලු දෙනාම කෘතවේදී වෙනවා. ත්‍රස්තවාදය නැති කිරීමේදී, විශේෂයෙන්ම යාපනය කොටුව ජයග්‍රහණය කිරීමේදී, උතුරුකරයේ කරන ලද මෙහෙයුම්වලදී එතුමා ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට ඉටු කළ කාර්ය භාරය පිළිබඳවත්, විශේෂයෙන් වාරිමාර්ග අමාත්‍යවරයා හැටියට සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා හැටියට එතුමා ඉටු කළ

[ගරු චන්දිම වීරක්කොඩි මහතා]

කාර්ය භාරය පිළිබඳවත් විවිධ කථිකයන් දිගින් දිගටම මේ ගරු සභාවේ ආවර්ජනය කරන්නට යෙදුණු නිසා එම කරුණු නැවත නැවත ප්‍රකාශ කිරීම අනවශ්‍යයි කියා මා හිතනවා.

එදා ගාලු දිස්ත්‍රික්කයේ බද්දේගම, හිනිදුම වැනි ආසනවල එතුමා දැවැන්ත විදුලි ව්‍යාපෘති ආරම්භ කර විවෘත කරන්නට යෙදුණා. එතුමාගේ විදුලිබල අමාත්‍යවරයා හැටියට කටයුතු කළ කාල පරිච්ඡේදය අවසන් වන විට එදා විදුලිය අමුතු දෙයක්, ඉතාම දුර්ලභ දෙයක් හැටියට දැකපු ගාලු දිස්ත්‍රික්කයේ බද්දේගම, හිනිදුම වැනි ආසනවල ජනතාව තමන්ගේ ගෙවල්වලට -සියයට 75කට එහා පැත්තේ- විදුලිය ලබා ගන්නට වාසනාවන්ත වුණා.

අප අතරින් වෙන් වූ ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාට බෞද්ධයකු හැටියට සසර කෙළවර අමා මහ නිවන් සම්පත් ප්‍රාර්ථනා කරමින් එතුමාගේ සඳාදරණීය මැතිනිය, ඒ වාගේම විශේෂයෙන්ම මගේ මිත්‍ර ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමා, මහේන්ද්‍ර රත්වත්තේ නගරාධිපතිතුමා ඇතුළු පවුලේ සියලු දෙනාට අපගේ ශෝකය පුද කරනවා. අනුරුද්ධ රත්වත්තේ මැතිතුමන් විසින් ඉටු කරන ලද නොනිම් මෙහෙවර ඊටත් වඩා ශක්තිමත්ව මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවට වාගේම මුළුමහත් රටේම ජනතාවට ඉටු කරන්නට ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාටත්, මහේන්ද්‍ර රත්වත්තේ මැතිතුමාටත් හැකි වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මී ළඟට ගරු ජයරත්න හේරත් මහතා. එතුමා කථා කරන්න ප්‍රථමයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 3.16]

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අප මේ උත්තරීතර සභාවේදී ශෝකය ප්‍රකාශ කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අනුපමේය සේවයක් කරපු, ඒ වාගේම මේ රට ත්‍රස්තවාදයෙන් මුදා ගැනීම සඳහා තම දිවි නොදෙවැනි කොට සටන් කරපු ඉතාම ධෛර්ය සම්පන්න, අභීත නායකයකුගේ අභාවය පිළිබඳවයි. ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා කන්ද උඩ රට සම්මානනීය රදළ පවුලක ඉපදිලා සාමාන්‍ය මිනිසුන් වෙනුවෙන් සේවය කරන්නට තරම් නිහතමානී හිතක් පපුවක් ඇතිව මහජන සේවයට බොහොම වැදගත් විධියට අවතීර්ණ වෙච්ච නායකයෙක්. එතුමාගේ පියා ශ්‍රී දළ දා වහන්සේගේ ගිහි භාරකාරයා විධියට දියවඩන නිලමේ තනතුර හෙබවූවා. එතුමාගේ ඇවෑමෙන් මේ දියවඩන නිලමේ තනතුර අපේ ජනරාල් රත්වත්තේ මැතිතුමා හොබවමින් හැබෑ බෞද්ධ නායකයෙක් විධියට ඒ බෞද්ධකම මූර්තිමත් කරමින් කටයුතු කළා.

එතුමා හමුදා සේවයේ වර්ෂ 14ක කාලයක් සේවය කරලා දේශපාලනයට පිවිසුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එතුමා මැදිහත් වන්නේ එම පක්ෂය ඉතාම අභාග්‍ය සම්පන්න තත්ත්වයකට පත් වී තිබුණු කාලයකයි. ඒ නිසයි එතුමාගේ සේවය අපට වටින්නේ. 1970 වර්ෂයේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජයේ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා විධියට එතුමාගේ මැදිහත් වීම, උපදේශකවරයා විධියට එතුමාගේ උපදෙස් 1971 කැරැල්ල මැඩ පැවැත්වීමටත්, ඒ නොමග ගිය තරුණ පිරිස පුනරුත්ථාපනය කිරීමටත් ඉතාම වැදගත් වුණා. 1977 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය බලයෙන් පහ වී වර්ෂයක් යන්නට මත්තෙන් බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්නට එවකට පැවැති රජය මේ පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කළා. පසු ගිය දවස්වල අධිකරණමය තීන්දු, තීරණ අරගෙන රටේ අධිකරණයට එකහව ගත් යම් යම් තීන්දු යම් යම් උදවිය අභියෝගයට ලක් කළා. එදා ඉතාම නින්දිත විධියට, දේශපාලන පළිගැනීමක් විධියට බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කර, එතුමියගේ අතපය බැඳලා මුල්ලකට දාලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය බරපතළ විධියේ අභියෝගයකට ලක් කරන කොට මැතිනියගේ සෙවනැල්ල වාගේ එදා කටයුතු කළේ ජනරාල් රත්වත්තේ මැතිතුමායි.

මැතිනියගේ ප්‍රජා අයිතිය නැති වුණාට පසුව, සකියා නැති ගෙදර සම්පූර්ණයෙන්ම නන්නත්තාර වෙනවා වාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නන්නත්තාර වුණා. පළමු වටයේ අනුර - මෛත්‍රී පිල කැඩිලා බණ්ඩාරනායක මැතිනියගේ සහජාත පුත්‍රයා අපේ පක්ෂයෙන් ඉවත් වුණා. දෙවනුව, චන්ද්‍රිකා - විජය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් වෙන් වීම හේතුවෙන් එතුමියගේ සහජාත දියණිය පක්ෂයෙන් ඉවත් වෙනවා. ප්‍රජා අයිතිය අහිමි වෙච්ච බණ්ඩාරනායක මැතිනිය ඉතාම ධෛර්ය සම්පන්න කාන්තාවක් විධියට මේ පක්ෂයට නායකත්වය දෙන්නට ඒ පක්ෂය මෙහෙයවන වෙලාවේ එතුමියගේ සෙවනැල්ල විධියට හිටි එකම ඥාතිවරයා, හිතවතා, සහෘදයා, දේශපාලන ආධාරකරුවා ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාය කියන එක අද එතුමා ජීවතුන් අතර නොසිටියත් එතුමාට ගෞරවයක් විධියට මේ උත්තරීතර සභාවේදී අප මතක් කරන්නට ඕනෑ. මේ තිබුණු කලබැගෑනියත් එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලයට එන්නට තිබුණු ඉඩ ප්‍රස්ථා දිගින් දිගටම ඇහිරුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇතුළේ තිබුණු මේ ගාලගෝට්ටියත් එක්ක, පක්ෂයේ අභ්‍යන්තර ගැටුමත් එක්ක අප ඉදිරිපත් වෙච්ච සියලුම මැතිවරණ පැරදුණා. ඒ වෙලාවේ ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා අපේ පක්ෂය ප්‍රතිසංවිධානය කිරීමේ වැඩ පිළිවෙළ හා හා පුරා කියා පක්ෂයට හඳුන්වා දීලා මැතිවරණ කොට්ඨාසයක් නෑර ගිහින්, ගමක් ගමක් නෑර ගිහින් මේ රටේ ඉතිරි පැතිරී සිටිය ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට අනාගතයක් තිබෙනවාය කියන අලුත් අදහසක්, අලුත් මතයක් ඇති කරන්නට පුරෝගාමීව කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතකයි ඒ වකවානුව. එතුමා ශ්‍රාවස්තියේ විපක්ෂ නායක කාර්යාලයට වෙලා, ඒ කාර්යාලයේ හුදකලාව, නිසංසලේ, අර සිල්වා කියන රියැදුරු මහත්මයාත් එක්ක බොහොම සැලසුම් සහගතව කටයුතු කළා.

කිසිම සවි ශක්තියක් ඒ වෙලාවේ තිබුණේ නැහැ. එතුමාගේ ආත්ම ශක්තිය විතරයි තිබුණේ. පක්ෂය හොඳට සංවිධානය කරලා 1994 වර්ෂයේදී අපට ආණ්ඩුවක් පිහිටු වන්නට පුළුවන් වන විධියට දේශපාලන ගමන් මග එළිපෙහෙළි කළේ ජනරාල් අනුරුද්ධ රත්වත්වත්තේ මැතිතුමාය කියන එක මේ සභාවේදී අප මතක් කරන්නට ඕනෑ. එතුමා අපේ ආණ්ඩුව පිහිටෙව්වාට පස්සේ විවිධ අමාත්‍යාංශ භාර ගත්තා. විශේෂයෙන් විදුලිබල අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය භාර ගත්තා. ඒ වාගේම යුද්ධමය තත්ත්වයත් එක්ක ආරක්ෂක නියෝජ්‍ය ඇමති ධුරය භාර ගත්තා. මේ සියලු විෂය පථයන් තුළ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනරාල් රත්වත්තේ මැතිතුමා, එතුමාගේ භූමිකාව මොකක් ද කියා කල්පනා කර බලා ඉතාම හොඳ වැඩ පිළිවෙළවල් හඳුන්වා දීලා ඒ භූමිකාව හරියට ඉටු කළාය කියන එක අප මේ අවස්ථාවේදී විශේෂයෙන් සිහිපත් කරන්නට ඕනෑ.

එතුමා විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වශයෙන් පත්වනකොට අපේ ගම්වලට විදුලි බලය ලැබිලා තිබුණේ බොහොම අඩු ප්‍රතිශතයකුයි. විදේශ ආධාර ලබාගෙන විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර බොහොම කෙටි කාල සීමාවක් තුළ මේ රටේ ඈත එපිට පිටිසරබද ප්‍රදේශවල ගෙවල් විදුලියෙන් ආලෝකවත් කරන්නට විශාල දායකත්වයක් දෙන්නට තරම් ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා කෘතවේදී වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම වාර්මාර්ග ක්ෂේත්‍රයේ දියුණුවට, ඇළ වේලි පිළිසකර කරන්නට, වැව් අමුණු පිළිසකර කරන්නට, වාරි මාර්ග ක්ෂේත්‍රයේ ඉතාම ඉහළ සේවයක් ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා විසින් ලබා දුන්නා.

1994 දී අපි ආණ්ඩුව ගත්තේ යුද්ධයත් එක්කයි. දැවැන්ත දරුණු ත්‍රස්තවාදයත් එක්කයි මේ ආණ්ඩුව ගත්තේ. ඒ වෙලාවේ දී ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට එතුමා එයට පූර්ණ දායකත්වයක් දුන්නාය කියලා මා හිතනවා. ත්‍රිවිධ හමුදාව මනාව කළමනාකරණය කරමින් යුද්ධයට ඇවැසි දේවල් එතුමා සම්පූර්ණ කරලා දුන්නා. ඒ අනුව එතුමා මේ රට නිදහස් කිරීමේ වගකීම වෙනුවෙනුත් විශාල වැඩ පිළිවෙළක් සකස් කරපු නිසාම අපේ රටේ සමස්ත ජනතාවගේ උත්තමාචාරයත් එතුමාට හිමි වනවා.

අවසාන වශයෙන් ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා මිය පරලොව ගියත්, එතුමා ඉටු කළ මහජන සේවය ඉදිරියටත් කර ගෙන යන්නට මහනුවර නගරාධිපති මහේන්ද්‍ර රත්වත්තේ මැතිතුමාත්, ඒ වාගේම ලොහාන් රත්වත්තේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් මහජන සේවයට හඳුන්වා දෙමින් එතුමා කරපු ඒ අපිරිමිත සේවය වෙනුවෙන් අපේ ගෞරව ආචාරය පිරිනමනවා. එතුමාට නිවන් සුව අත්වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. ස්තූතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට, ගරු අබ්දුල් කාදර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඉතාම කෙටියෙන් ශෝක ප්‍රකාශය කරනවා නම් හොඳයි.

[අ.භා. 3.25]

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர் - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. A.R.M. Abdul Cader - Deputy Minister of Environment)
මා මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන නිසා මට කථා කරන්නට ටිකක් වැඩිපුර වෙලාවක් ඕනෑ නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවංගත ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා ගැන කථා කරනවා නම් මට පැය 24ක කාලයක්වත් අවශ්‍ය වෙනවා. නමුත් තමුන්නාන්සේ මා කථා කරන්නට ඉස්සරවෙලා තහංචියක් දැම්මා. කමක් නැහැ.

ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා කියන්නේ, ඒ ප්‍රදේශයේ රජ්ජුරුවෝ. එතුමා මහනුවර දිස්ත්‍රික්කයේ හිටපු රජ කෙනෙක් කියලා කිව්වත් ප්‍රශ්නයක් නැහැ. මා වෙනත් පක්ෂයක සිටිද්දී වුණත් එතුමා මට හුඟාක් උදවු කර තිබෙනවා. එතුමා කෙනෙකුගේ පක්ෂය මොකක්ද කියලා බැලුවේ නැහැ; ජාතිය මොකක්ද කියලා බැලුවේ නැහැ. දෙමළද, සිංහලද, මුස්ලිම්ද කියලා ජාතියක් ගැන බැලුවේ නැහැ. නිතරම සිනහ වෙලා ඉන්න ලස්සන මුහුණක් එතුමාට තිබුණා. කවුරු එතුමා මුණගැසෙන්න ගියත් සිනහ වෙලා තමයි එතුමා කථා කළේ. ආපසු එන්න ඉස්සර මොකක් හරි විහිළුවක් කරනවා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් බොහොම මහන්සි වුණා. නමුත් අපි විරුද්ධ පක්ෂයේ සිටියා වුණත්, එතුමා අපටත් හුඟාක් උදවු කරලා තිබෙනවා.

එතුමා කරපු හොඳ වැඩවලින් සමහරක් මා කියන්නම්. මහනුවර දිස්ත්‍රික්කයේ රැකියා නැතිව සිටි සෑහෙන පිරිසකට එතුමා රක්ෂාවල් ලබා දීලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට කවදාවත් හිතා ගන්නවත් බැරි විධියට එතුමා රක්ෂාවල් ලබා දීලා තිබෙනවා. රක්ෂා දහස් ගණනක් ලබා දුන් කෙනෙක් තමයි ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා. එතුමාට පුතුන් තුන් දෙනෙක් සිටිනවා. ඒ පුතුන් තුන්දෙනාම බොහොම හොඳයි. එතුමා ඒ දරුවන්වත් ඒ විධියට හදලා තිබෙනවා. එතුමා වාගේම යහපත් විධියට ඒ දරුවනුත් හදලා තිබෙනවා.

අද බලන්න, එතුමාගේ එක පුතෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා කළ වැඩ කොටස එම පුත්‍රයා කරගෙන යයි කියලා මා බලාපොරොත්තු වනවා. මා දන්නා කාලයක සිටම අවුරුදු ගණනක් තිස්සේ එක්සත් ජාතික පක්ෂයට තිබුණු මහනුවර නගර සභාව එතුමාගේ දෙවැනි පුත්‍රයා විසින් මෙවර දිනාගනු ලැබුවා. ඒක එතුමාගේ දක්ෂකමක්. එතුමාගේ දක්ෂතාව මිනිසුන් එක්ක හොඳින් කටයුතු කිරීමට ඇති හැකියාවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දවස් තුනක් තිස්සේ එතුමාගේ අවමංගල්‍ය නිවසේ ගත කළා. ඒ දවස් තුන තුළ මා දැක්කා, එතුමාගේ දේහය දැක බලා ගන්නට ජනතාව පෝලිමේ එන ආකාරය. මගේ ජීවිතයේ වයස අවුරුදු 75ක් ගත වන තුරු මා දැකලා තිබුණේ නැහැ, මහනුවර ප්‍රදේශයේ සිංහල ගෙදරක අවමංගල්‍යයක් සඳහා ඔය තරම් ජනතාවක් පැමිණි අවස්ථාවක්. මගේ නිවසත් ඒ ළඟම තිබුණු නිසා මා එම අවමංගල්‍ය නිවසේ දවස් තුනම ගත කළා. ඒ තරමට මිනිස්සු එනවා, අඬනවා, යනවා, එනවා. එතුමා ඒ තරම් හොඳ වැඩ කළ නිසා තමයි ඒ තරම් ජනතාවක් ආවේ. එතුමාගේ පුතාත් එතුමා වාගේ කටයුතු කරගෙන යයි කියලා මා හිතනවා.

මා තව එක කාරණයක් කියන්නට ඕනෑ, මා රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින කාලයේ එතුමා මා බලන්නට ආවා. මා කිසි වරදක් කරලා නොවෙයි රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටියේ. එතුමා දෙවරක් විතර මා බලන්නට ආවා. මා වරදක් නොකර රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටියා වාගේ එතුමාත් රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටියේ වරදක් කරලා නොවෙයි කියලා තමුන්නාන්සේලාට, එතුමාගේ පුත්‍රයන්ට මා කියන්නට ඕනෑ. මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව දැනගන්නට ඕනෑ, කොහේ හරි ඇති වුණු සිද්ධියක් -රණ්ඩුවක්- පිළිබඳව එතුමාගෙන් පළි ගන්නට, එතුමාගේ නම කැත කරන්නට තමයි එදා එතුමාගේ නම එයට සම්බන්ධ කරලා එතුමාව රිමාන්ඩ් කළේ කියලා. ඒවා කරපු මිනිසුන්ට හරියන්නේ නැහැ.

[ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා]

ඒවා කරපු මිනිස්සු පැත්තක ඉන්නවා. එතුමා වාගේ කෙනෙක් නැවත අපේ පළාතේ උපදින්නේ නැහැ කියන එකත් මට කියන්නට පුළුවන්. එතුමා ගැන කථා කරන්න තව මන්ත්‍රීවරුන් ඉන්න නිසා මම මීට වැඩිය කථා කරන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට කොච්චර ශක්තියක් තිබෙන්න ඇතිද, කොච්චර සන්තෝෂයක් තිබෙන්න ඇතිද කියා හිතන්න. කොටි ග්‍රහණයෙන් යාපනය මුදා ගෙන ඔක්කෝටම කලින් ගිහිල්ලා ඒ ප්‍රදේශයේ සිංහ කොඩියක් එසෙව්වා. එතුමාට අපේ රට ගැන කොච්චර කැක්කුමක් තිබෙන්න ඇතිද? ඉස්සර වෙලාම යාපනයේ කොඩියක් එසෙව්වේ කවුද? ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා කියන එක මේ ගරු සභාවේ ඉන්න කවුරුත් දන්නවා; මේ රටේ සියලු දෙනාමත් දන්නවා. අපි එතුමාගේ ඉතිහාසය දැන ගෙන, ඒ වාගේ මේ පළාතට, මහනුවර දිස්ත්‍රික්කයට හා පුත්තලම දිස්ත්‍රික්කය ඇතුළු මේ රටට එතුමාගේ පුතාලත් එක්ක එකතු වෙලා සේවය කරමු.

එතුමාගේ එක් පුතෙක් මහනුවර පුරපති. තව පුතෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. අනෙක් පුතා හොඳ ව්‍යාපාරිකයෙක්. එතුමා ඒ වාගේ හොඳ ළමයින් හදලා තිබෙනවා. හොඳ වැදගත් විධියට ළමයින් හදලා තිබෙනවා. කාටවත් දොස් කියන්න බැරි විධියට එතුමා ළමයින් හදලා තිබෙනවා. එතුමා කරපු තව හොඳ වැඩ කියන්න මට කාල වේලාව නැහැ. ඒ නිසා මුස්ලිම් ජනතාව වෙනුවෙන් පමණක් නොවෙයි, මහනුවර දිස්ත්‍රික්කයේ සියලුම ජනතාව වෙනුවෙන් එතුමාගේ අභාවය ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සැප ලැබේවා කියා කියමින් මම නිහඬ වෙනවා ස්තුතියි.

[අ.භා. 3.30]

**ගරු කමලා රණතුංග මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)
(The Hon. (Ms.) Kamala Ranathunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා පිළිබඳව මේ උත්තරීතර සභාවේදී කළගුණ සැලකීමක් වශයෙන් මටත් කථා කරන්නට අවස්ථාව ලැබීම වාසනාවක් කොට සලකනවා.

ඇත්තටම මට මේ අවස්ථාව හිමි වුණේ, තම පක්ෂය පරාජයට පත් වෙච්ච අවස්ථාවල, දුර්වල වෙච්ච අවස්ථාවල, පක්ෂය අත නොහැර හිටපු, පැරණි පාක්ෂිකයන්ට සලකන, කළගුණ දන්නා, අතීතය අමතක නොකරන, රාජ්‍ය පාලකයෙක් අද අපිට සිටින නිසායි. ඒ නිසා මගේ යුතුකමක් වශයෙන් අතිගරු ජනාධිපතිතුමාට මගේ ගෞරවාන්විත ආචාරය මා පළමු කොටම පුද කරනවා. එතුමා කොච්චර කෘතවේදී නායකයෙක්ද කියනවා නම් කොයි තරම් වැඩ තිබුණත් ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ ගුණ කථන පවත්වන අවස්ථාවේදී මේ සභා ගර්භය ඇතුළට එන්න අමතක කළේ නැහැ; පැමිණියා. එපමණක් නොවෙයි, ඒ ඥාතීන් හමු වෙලා කථා කළා; ඒ උදවියට සංග්‍රහ කළා. ඒක තමයි කෘතවේදී අපේ ශ්‍රේෂ්ඨ නායකයාණන්ගේ ගතිය කියන එක මේ ගරු සභාවේදී මා ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා උපත ලැබුවේ සෙංකඩගල පුරවරයේ ඓතිහාසික කන්ද උඩරට රදල පරම්පරාවක. මම එතුමාව පළමු වරට දැන හැඳින ගත්තේ 1960 දශකයේ මැද භාගයේදී. ඒ මැතිවරණ සමය. එදා මහනුවර දිස්ත්‍රික්කයේ රැස්වීම්වල කථා කරලා, රාත්‍රියේ නවාතැන් ගන්න මැතිනිය මාව යැව්වේ, -මැතිනිය කොළඹ හිටියේ- මහයාය රත්වත්තේ නිවසට. හැබැයි පොඩි අකරතැබ්බයක් වුණා. මොකද, මහනුවර රත්වත්තේ පවුල් දෙකක් තිබුණා. මැතිනිය මට යන කොටත් කිව්වා, මෙන්න මෙය. එක පවුලක් එක්සත් ජාතික පක්ෂයේ. අනෙක් පවුල මැතිනියගේ පක්ෂයේ. මම ගියේ එක්සත් ජාතික පක්ෂයේ රත්වත්තේ මහත්තයලාගේ ගෙදරට. නමුත් ඒ උදවිය ඉතාම ආදරයෙන් මට කථා කරලා, අනෙක් ගෙදරට යන්න පාර පෙන්නුවා. එදා තමයි මම රත්වත්තේ මැතිතුමා දැන හැඳින ගත්තේ. එතුමාගේ සහෝදරියක් වන, මංගලිකා රත්වත්තේ මැතිනියව මට එදා හඳුනා ගන්න අවස්ථාව ලැබුණා. එතුමිය එදා වාගේම අදත් අපිත් එක්ක ඉතාම සහෝදරත්වයෙන්, ආදරයෙන් කටයුතු කරනවා.

ජය පරාජය දෙකම හොඳට හුරු පුරුදු අපට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී ආසන සංඛ්‍යාව අටට බැහැලා තිබෙද්දී, මැර බලයෙන්, පීඩාකාරි මර්දනයෙන් රට තුළ මහත් භීෂණ යුගයක් පැවැති ඒ දුෂ්කර කාල පරිච්ඡේදය නිමා කර පක්ෂය බලයට ගෙන ඒම සඳහා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට යෝධ ශක්තියක් වාගේම, ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට නොසැලෙන ශක්තියක් ලබා දුන්නු ශ්‍රේෂ්ඨ නායකයෙක් විධියටයි ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාව මා හඳුන්වන්නේ.

රොස්මිඩ් පෙදෙසේ මැතිනියගේ නිවසේ තරප්පු පේළිය ළඟ වම් පැත්තේ තිබෙන කාමරයේ නවාතැන් අරගෙන, බණ්ඩාරනායක පවුල කැඩිලා වෙන් වෙලා තිබිච්ච වෙලාවේ ඒ පවුල එකමුතු කරන්න වාගේම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැටිලා තිබිච්ච වෙලාවේ පක්ෂය ශක්තිමත් කරන්න පාක්ෂිකයින් පෙළ ගැස්වූ ආකාරය මට නම් කිසි දාක අමතක කරන්න බැහැ. දාහත් වසරක් පුරා තාඩන පීඩනවලට ලක් වෙමින් හිටපු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට අයෝමය ශක්තියක්, බලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජාතික සංවිධායක වශයෙන් එතුමා ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ගම් මට්ටමින්, ආසන මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් සංවිධායකවරු කැඳෙව්වා. ඒ වාගේම ශාඛා සංවිධානවල නිලධාරින් කැඳෙව්වා. ඒ අය සමඟ විටින් විට සාකච්ඡා කරලා ඒ අයට ලොකු ශක්තියක් ලබා දුන්නා. ඒ දුන්නු උපදෙස් දැනුත් මගේ මතකයට නැගෙනවා. එතුමා එක හඬින්ම කියා සිටියේ ප්‍රශ්න කරන්න එපා, කථා කරන්න එපා වැඩට බහින්න කියලායි. එතුමා ළඟ කවදාවත් "බැහැ" කියන වචනය තිබුණේ නැහැ. එතුමාට ස්ථිරසාර අධිෂ්ඨාන ශක්තියක් තිබුණා. ඒ ප්‍රතාපවත් හඬින් ලබා දුන්නු උපදෙස් 1994 අපේ ජයග්‍රහණයට යකඩ පාලමක් වුණා.

කෙටි පාරෙන් ඉතා ඉක්මනින් බලය ඇල්ලීමට, නොමඟ ගිය අපේ සහෝදරයන් දියත් කළ කැරැල්ල මැඩලීම සඳහා අපේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට, අනුරුද්ධ රත්වත්තේ නමැති එතුමියගේ ඥාති සහෝදරයාගෙන් ලැබුණු පිටුවහල අතිවිශිෂ්ටයි. මට මෙතැනදී ෆීලික්ස් ඩයස් බණ්ඩාරනාක මැතිතුමාත් මතක් වෙනවා. මම මුලින් කිව්වා වාගේ අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තනි නොකර රොස්මිඩ් පෙදෙසේ එතුමියගේ නිවසේම රැඳිලා ඉඳ ගෙන උරුමයෙන් ලද නිර්භීතකම සහ තීක්ෂණ බුද්ධිය උපයෝගි කර ගෙන ඒ කැරැල්ල මැඩලීම සඳහා ක්‍රියා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම රටට පිළිලයක් වූ ත්‍රස්තවාදය තුරන් කර ලීම සඳහා එතුමා නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයා හැටියට අමරණීය මෙහෙයක් ඉටු කළා. හමුදා සේවයෙන් ලද පුහුණුව හා අත් දැකීම් උපයෝගි කර ගනිමින්, හමුදා ඇඳුමෙන් සැරසී බංකර ඇතුළට ගොස් ඒ හට පිරිස්වල කෑම බීම කොහොමද කියලා සොයා බැලුවා. එතුමා රණ විරුවන් තනි කළේ නැහැ. වර්තමාන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් රණ විරුවන්ට ශක්තියක් වෙන්නට එදා බංකරයක් ගානේ ගිහින් රණ විරුවන්ගේ දුක සැප සොයා බැලුවා. මේවා කවදා හෝ අපේ ඉතිහාස පොතේ සටහන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාට යම් කිසි ඉලක්කයක් තිබුණා. මම මුලින් කිව්වා වාගේ ආත්ම ශක්තියක් සහිත ස්ථිරසාර අධිෂ්ඨාන ශක්තියක් තිබුණා. "බැහැ" කියන වචනය එතුමාගේ ශබ්ද කෝෂයෙන් කපා දමා තිබුණා. ඒක පාක්ෂිකයන්ටත් කා වැද්දුවා; ඔවුන් උනන්දු කළා. අපේ පක්ෂයේ මන්ත්‍රී ආසන සංඛ්‍යාව අටකට බැහැලා තියෙද්දී ආණ්ඩු බලය අල්ලන්න ලැබුණු ඒ ශක්තිය, ඒ අධිෂ්ඨානය අපට මහත් ශක්තියක් වුණා. ඒ වාගේම රණ විරුවන්ටත් ඒ ශක්තිය ලබා දුන්නා. මුළු රටම රණ විරුවන් සමඟය කියන අදහස රණ විරුවන්ගේ හදවත් තුළට ඇතුළු කරන්නට එතුමා යම් යම් උපක්‍රමශීලී වැඩ පිළිවෙළ යෙදුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යාපනය මුදා ගෙන සිංහ කොඩිය ඔසවපු දවස අපට මතකයි. අපට ඒක කවදාවත්ම අමතක කරන්න බැහැ. ඩෙන්සිල් කොබ්බෑකඩුව, විජය විමලරත්න වැනි ඒ උදාර රණ විරු නායකයන් යුද බිමේ දිවි පුදද්දී, ඒ සටන තමන්ගේ කරට අරගෙන එතුමා උදාර සේවාවක් කළා, අපේ මව්බිම රැක ගැනීම වෙනුවෙන්. මට වෙලාව නැති නිසා දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ.

එතුමා වාරිමාර්ග, විදුලිබල හා බලශක්ති ඇමතිතුමා වශයෙන් සිටියදී මා අවිස්සාවේල්ල ආසනයේ සංවිධායකවරිය වශයෙන් සිටියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොයෙකුත් බලපෑම්, කලබැගැනි මැද්දේ අවිස්සාවේල්ල ආසනයේ සංවිධාන කටයුතු කරනකොට පඤ්ඤාගල, දුම්කොළහේන, දඹෝර වාගේ දුෂ්කර ගම්මානවල මිනිස්සු හුළු අතු පත්තු කරගෙන තමයි රාත්‍රී කාලයේ අපේ රැස්වීම්වලට ආවේ. ඒ හුළු අත්ත නිවා දමලා, ඒ කුප්පි ලාම්පුව නිවා දමලා, ඒ ගම්මාන එළිය කරන්න අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා විදුලිබල ඇමතිතුමා හැටියට මට විශාල මුදලක් වෙන් කර දුන්නා. ඒ වෙනුවෙන් මගේ ගෞරවාන්විත කෘතඥතාව මේ අවස්ථාවේදී මා එතුමාට පුද කරනවා. භාර දුන්නු වැඩේ හරියට කරන්න, භාර ගත්තු වැඩේ හරියට කරන්න එතුමා තුළ විශාල ශක්තියක් තිබුණා. අපි මැතිනියත් එක්ක මහනුවරට ගිය අවස්ථාවල හැම දාම නැවතුණේ අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ ගෙදරයි.

"වනිතා රත්නයක් ලද හැම පිරිමියම - ඉහළම තැනට පත් වෙනවා නිසැකවම." ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම කියන්න ඕනෑ, කාමන් රත්වත්තේ මැතිනිය ගැන. එතුමියගේ දෑතින්ම කෑම හදලා මැතිනියට කන්න දුන්නා. මෙතුමාගේ දේශපාලන ජීවිතයට, ගමන් මඟට එතුමියගේ ඉවසිලිවන්තකම විශාල ශක්තියක් වුණා. එතුමා හොඳ පුතුන් තිදෙනෙක් දැයට දායාද කර තිබෙනවා. මේ ගරු සභාවේ කවුරුත් කිව්වා වාගේ ගරු ලොහාන් රත්වත්තේ ගරු මන්ත්‍රීතුමා, අපේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට වාගේම, ඔබතුමන්ලා වැනි තරුණ මන්ත්‍රීතුමන්ලාට විශාල ශක්තියක් වෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

කාලයක් තිස්සේ එක්සත් ජාතික පක්ෂය බලය නතු කර ගෙන තිබුණු ඓතිහාසික මහනුවර නගර සභාවේ බලය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලබා ගැනීම සඳහා එතුමාගේ ශක්තිය, අනුග්‍රහය ලබා දීලා, එතුමාගේ අනික් පුත්‍ර රත්නය එහි නගරාධිපති හැටියට පත් කරන්නත් පුළුවන්කම ලැබුණා. අපට ඒවා අමතක කරන්න බැහැ.

මා මීට වඩා දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර ඇමතිතුමා කිව්වා වාගේ මා දැක්ක හැම වෙලාවකම වටේ ඉන්න අය එක්ක මොකක් හෝ විහිළුවක් කියලා එතුමා බොහොම සතුටට පත් වුණා. මම හුඟක් වෙලාවට එතුමා ඉන්න තැනට ඇතින් යනවා. එතකොට අනික් අයත් එක්ක මොකක් හෝ විහිළුවක් කියනවා. විහිළුවෙන්, විනෝදයෙන්, සිනහවෙන් කාගේත් සිත් දිනා ගත් අභීත සෙන්පතියෙක් සදහටම දෙනෙත් පියා ගත්තා. අපි කවුරුත් සිතුවේ නැති වෙලාවක, බලාපොරොත්තු නැති විධියකට එතුමා වියෝ වුණත් එතුමාගේ නම කවදාවත්ම නැති වන්නේ නැහැ; එතුමා කළ වැඩ අමතක වන්නේ නැහැ.

අපේ අතිගරු ජනාධිපතිතුමා ජනාධිපතිවරණයට තරග කරද්දී කිසියම්ම බලවේගයකට යට වුණේ නැහැ. ජනාධිපතිතුමා ජයග්‍රහණය කරවන්න එතුමා විශාල කැප කිරීමක් කළා. කවදත් කවියට, කලාවට ආදරය කරපු එතුමාට කෘතවේදිත්වය දැක්වීම සඳහා මට මේ පැදි පෙළ සභාව ඉදිරියේ තබන්න විනාඩියක් අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

හැම බිම් අඟලක්ම කොටි අණසක        රැඳුණු
මුදවා ගන්න යුද හමුදාවට        බැඳුණු
දරුවන් සමඟ ඒ සටනට පණ        පෙවුණු
කර්නල් අපේ වාගෙයි රජු දුටු        ගැමුණු

එතුමගෙ වියෝවෙන් තෙමසක් පිරුණු        තැන
දරු මුනුබුරන් සිහි කර එතුමගේ        ගුණ
කොතෙකුත් දානමය පින්කම් කෙරුම        ගැන
විස්තර කරන්නට කාලය නැත        මෙතැන

තෙරුවන් බෙලෙන් කවුරුත් සුවපත්        වේවා
නොමැතිව දුකක් දිගු කල් ජීවත්        වේවා
කළ පින් සියලු එතුමට අත් පත්        වේවා
අජරාමර නිවන් සුවයම අත්        වේවා

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු තිස්ස විතාරණ ඇමතිතුමා.

[3.41 p.m.]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) Tissa Vitarana - Minister of Scientific Affairs)

Hon. Deputy Speaker, it is with a deep sense of sadness that I say a few words on the occasion when the House is taking up the Vote of Condolence on the late Anurudha Ratwatte, both General and former Minister. On behalf of the LSSP, I would like to offer my deepest sympathies to the members of his family and say on this occasion that I have the fondest memories of my association with the Hon. Anurudha Ratwatte.

He was junior to me at Trinity College and my younger brother was a colleague. I had occasion to interact with him from that young age and got to know him well and appreciated his many good qualities. We were able to maintain this association, on and off, right throughout to the end. In a way we had certain similarities in our lives. After his education at Trinity College - we know his father, who was steeped in politics, was a strong leader of the UNP in the Kegalle District and also in Parliament - he carried this political training and started his political career as a Member of the UNP and was in the Kandy Municipal Council.

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

Thereafter, I am happy that he turned to progressive politics and joined the SLFP, first as a Municipal Councillor in Kandy and then as the chief organizer for the Senkadagala Electorate. He established himself as a political leader in the Kandy District for the Progressive Movement. Thereafter, though he was not successful in the 1970 and 1977 General Elections, he entered Parliament in February 1989 as a Member of the National List and then in 1994, he was elected comfortably to Parliament from the Kandy District. He became not only one of the political leaders of the SLFP in the Kandy District, as we well know, but also as the Cabinet Minister of Power and Energy.

He was very active throughout the country as the Deputy Minister of Defence. His background in the army was invaluable. He was able, as the Deputy Minister of Defence, to assist President Kumaratunga at that time and did a yeoman service in the operation "Riviresa" and that is something, which I think will not be forgotten because the liberation of the Jaffna Peninsula from the grasp of the LTTE was achieved  by him during that period.

I remember interacting with him when he was the Minister of Power and Energy. I gratefully acknowledge the help that he gave to the area I represented in the Kegalle District during that period in that capacity of Minister. So, he held very valuable and important portfolios successfully and was able to be an inspiring leader on the military front as well as in the important area of the Ministry of Power and Energy.

On behalf of the LSSP, I take this opportunity to state that as part of the Progressive Movement, he was always supportive to us in the politics that we had to do, though there were differences. He did not hold it against us and his friendliness and general desire to be helpful were characteristic of him, which we will never forget.

So, I am very glad that his children, two of them - in particular, the Hon. Lohan Ratwatte is now in Parliament with us and Mr. Mahendra Ratwatte as the Mayor of Kandy, - are in active politics following the footsteps of the their father and taking the political message and the political service which the Hon. Anurudha Ratwatte started for the people of that area.

So, I would like, once again, to express my condolences to the family on this occasion and wish that his journey through *Samsara*  will be a happy and pleasant one.

Thank you.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 2ක කාලයක් තමයි තිබෙන්නේ. ගරු ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාට විනාඩි 5ක් තිබෙනවා. තවත් කථිකයන් තුන් දෙනෙක් ඉන්නවා.

[අ.භා. 3.49]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
හොඳමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම පැය ගණනක් කථා කළ යුතු මාතෘකාවක්. මට කලින් කථා කරපු ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් නියෝජ්‍ය අමාත්‍යතුමා වචනයක් කිව්වා, මේ සියලුම කථාවල සාරාංශය අඩංගු වන ආකාරයට. එතුමා කිව්වා, අනුරුද්ධ රත්වත්තේ කියන්නේ සෙන්පතියෙක්වත් පුද්ගලයෙක්වත් නොවෙයි උඩරට හිටපු රජ කෙනෙක් කියා. මම අන්න ඒ වචනය නැවතත් කියනවා. අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා රජ කෙනෙක් හැටියට ලංකාවට සේවයක් කරලා අන්තිම හුස්ම හෙළුවා. එතුමා මිය යෑමට ටික කාලයකට -මාසයකට දෙකකට- ඉස්සෙල්ලා තමයි මට හමු වුණේ. එතුමා මා සමඟ පැයක් විතර පක්ෂය ගැන, රට ගැන, අපේ අනාගතය ගැන හුඟක් දේවල් කථා කළා. කථා කරලා යම් යම් දේවල් කිව්වා. ඒ වාගේම එතුමා කිව්වා, "ජනාධිපතිතුමාට මේ ටික කියන්න. වෙන කාටවත් කියන්න එපා" කියා. ඒ වාගේම එතුමා කියපු දේ මම ගිහින් ජනාධිපතිතුමාට පෞද්ගලිකව කිව්වා. අද මම කනගාටු වනවා, මෙපමණ ඉක්මනට එතුමා අප අතරින් වියෝ වීම ගැන. නමුත් මම සන්තෝෂ වෙනවා, එතුමා අන්තිම හුස්ම හෙළන්න ඉස්සෙල්ලා තිස් අවුරුද්දක ලංකා යුද්ධය අවසාන වෙලා, සැහැල්ලු හදවතකින් එතුමාට මිය යන්නට අවස්ථාව උදා වීම ගැන.

උඩරට රාජධානිය, රත්වත්තේ පරම්පරාව අවුරුදු 350ක් පරණ පරම්පරාවක්. ඊටත් වැඩි කාලයක් ශිෂ්ටාචාරයේ හිටියා. නමුත් පසු ගිය අවුරුදු 50 ඇතුළතදී ලංකා රාජ්‍යයේ අපට ලොකු සේවයක් කරපු රත්වත්තේ නාමය දරපු දෙදෙනෙක් හිටියා. එක් කෙනෙක් සිරිමාවෝ රත්වත්තේ මැතිනිය. අනෙක් කෙනා සෙන්පති අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා. මේ දෙදෙනා තමයි නූතන ලංකා ඉතිහාසය හැඩ ගහන්න පිටු පස ඉඳගෙන මෙහෙයවූ චරිත දෙක වන්නේ. මැතිනිය මා සමඟ වතාවක් කිව්වා, "මට අර්බුදයක් ආපුවාම මට ඉන්න අයෝමය ශක්තිය තමයි අනුරුද්ධ." කියා. එතුමා විශ්වාසවන්තවන්තයි. එතුමා තුළ හිතවත්භාවය තිබෙනවා. ඒ වාගේම එඩිතරයි; දක්ෂයි. තමුන්නාන්සේලා සියලු දෙනාම කියපු උතුම් අදහස් මම අනුමත කරනවා. අපට මෙවැනි චරිතයක් හම්බ වන්නේ නැහැ. එතුමා තමයි උඩරට, the last of the Barons. අපට උඩරටින් මෙවැනි චරිතයක්  හම්බ වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මම නැවත වතාවක් එතුමාගේ දරුවන්ගෙන්  ඉල්ලීමක් කරනවා. ලොකු වගකීමක් තමයි එතුමා දරුවන්ට පවරා තිබෙන්නේ. එතුමා මිය ගිය යන්නට කලින් අන්තිම මාස දෙක තුනේ මැතිවරණ කටයුතුවලට මම නුවර ගියා. එතුමාගේ හදවතේ තිබුණු බලාපොරොත්තු හා බර මා සමඟ කිව්වා. ඒ වාගේම දරුවෝ එක්තරා ඉදිරි මඟකට යොමු කර ඇස් දෙක පියා ගන්න පුළුවන් වීම සතුටක් ලොකු සැනසීමක් කියන එකයි එතුමාගේ හදවතේ තිබුණේ. ඒ නිසා මම එතුමාගේ දරුවන්ගෙන් ඉල්ලීමක් කරනවා. තාත්තා නතර කරපු තැන ඉඳලා උඩරට ජනතාවට, සිංහල රාජධානියට, අපේ සංස්කෘතියට, ලංකාවේ පොදු ජනතාවට අලුත් සේවයක් කරන්න ඇප කැප වන හැටියටත්, තාත්තාගේ නාමයෙන්  ඒ කාර්යය  භාර ගන්නා හැටියටත් මා එතුමාගේ දරුවන්ගෙන්  ඉල්ලා සිටිනවා.  අනුරුද්ධ රත්වත්තේ  මැතිතුමා -මගේ මිත්‍රයා- මාව එක්ක ගෙන ගිහින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට හඳුන්වා දී  මාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට  බැන්දෙව්වා. එදා ඉඳලා අවුරුදු 35ක මිත්‍රත්වයක් අප අතර තිබුණා. අද අප සියලු දෙනාම මේ පක්ෂය  අලුත් පක්ෂයක් හැටියට ආපසු හදන්න ඕනෑ. ඒ හදන පක්ෂයේ දෙවන පරම්පරාවක් අපි හදා ගෙන යනවා. ඒ පරම්පරාව හැදීමේදී අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ දරුවන්ගෙන් මා ඉල්ලීමක්

කරනවා, "මේ පක්ෂය ගොඩ ගන්න පරම්පරා හතරක්, පහක් මහන්සි වුණා. ඒ වගකීම බරපතළ ලෙස සලකා කටයුතු කරන්න"යි කියලා. එසේ ඉල්ලමින් මා මිත්‍ර සෙන්පති අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාට නිවන් සැප ලැබේවා!යි ප්‍රාර්ථනා කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට ගරු අර්ල් ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට හරියටම විනාඩි දෙකයි තිබෙන්නේ.

[අ.භා. 3.54]

**ගරු අර්ල් ගුණසේකර මහතා (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர - பெருந்தோட்டக் கைத்தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Earl Gunasekara - Deputy Minister of Plantation Industries)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවරෙකු හෝ මන්ත්‍රීවරයකු වශයෙන් මේ ගරු සභාවට එන්න වරමක් ලැබුණාම එතුමාගේ අභාවයෙන් පස්සේ මේ වාගේ ගුණ කථනයකට යොමු කරනවා. දේශපාලන ගමන් මඟේ ඉතිහාසය වෙනස් කරන්න නායකත්වය දුන්නු, පක්ෂයක් නඟා සිටු වන්න කටයුතු කරපු සුවිශේෂ චරිතයක් ගැනයි අපි අද කථා කරන්නේ. ඒ වෙන කවුරුවත් නොවෙයි, ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ පරම්පරාව ගැන කියනවා නම් මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියකට අවුරුදු 500කට ආසන්න ඉතිහාසයක් තිබෙන බව 1739 දී රජ කළ ශ්‍රී විජය රාජසිංහ මැතිතුමාගේ සන්නසින්ම පෙනෙනවා. ඊළඟට දේශපාලන පැත්තෙන් ගත්තත් රත්වත්තේ පවුල අවුරුදු 80ක විතර ඉතිහාසයක් තිබෙන පවුලක්. 1931 දී ජේ.සී. රත්වත්තේ අධිකාරම්තුමා බලංගොඩ ආසනයෙන් තේරී පත් වුණා.

ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම ජනරාල්වරයෙක්. මෙන්න ජනරාල්වරු. මොකද, ජනරාල්වරයකු විධියට දේශපාලනය කළත්, තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන් කවදාවත් රටේ ආරක්ෂාව පාවා නොදුන්නු එතුමා සැබෑ ජනරාල්වරයෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ අතින්ම තමයි යාපනයට ගිහිල්ලා කොඩිය දැම්මේ. යාපනය අල්ලා ගෙන කොඩිය දාන වෙලාවේ කොහේවත් රටකට පැනලා ගිහිල්ලා හිටියේ නැහැ. ඒ වාගේම පහළ නිලයන්, තමුන්ගේ සගයන් කවදාවත් ජාත්‍යන්තරයට පාවා නොදුන්න සැබෑ ශ්‍රේෂ්ඨ ජනරාල්වරයෙකු හැටියට එතුමාව මට හඳුන්වන්න පුළුවන්. මම, එතුමාව හඳුනා ගත්තේ 1990 වසරේයි. නමුත් එතුමා 1994 පාර්ලිමේන්තුවට ආවාට පස්සේ දවසක් පණිවුඩකරුවෙකු අතේ මට පණිවුඩයක් එවලා තිබුණා, "කාමරයට එන්න" කියලා. මම ගිහිල්ලා කථා කරපුවාම මගෙන් ඇහුවා, "නුවර හෝටලයක් හදලා ඇයි ඒක නවත්වලා දාලා තිබෙන්නේ" කියලා. මම කිව්වා, "සර්, මම එක්සත් ජාතික පක්ෂයේ -විපක්ෂයේ- ඉන්න නිසයි" කියලා. එතුමා කිව්වා, "කිසිම ප්‍රශ්නයක් නැහැ, පක්ෂ භේදයකින් තොරව ඒකට සම්පූර්ණ සහයෝගය දෙනවා, ඒ වැඩ කටයුතු කරගෙන යන්න" කියලා. මගේ ස්ථානය විතරක් නොවෙයි, කන්ද උඩ රට සුදෝ සුදින් බබළවන්න සියලු දෙනාටම පුදුම බලාපොරොත්තුවක් තිබුණා. ඒ බලාපොරොත්තුව ඉදිරියට ගෙන යන්න මහේන්ද්‍ර රත්වත්තේ මැතිතුමාට නගරයත්, ලොහාන් රත්වත්තේ මැතිතුමාට පාර්ලිමේන්තුවත් භාර දීලා තිබෙනවා. ඒ නිසා එතුමා බලාපොරොත්තු වෙච්ච ඒ කටයුතු ඉදිරියට කරගෙන යන්න ඒ අයට අවස්ථාව ලැබෙනවා.

මම දීර්ඝව කථා කරන්න හිටියත් මට කථා කරන්න වෙලා නැති නිසා අවසාන වශයෙන් එතුමාට අපේ ආගමේ හැටියට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. යම් කිසි විධියකින් සංසාරයේ නිවන් දකින්නට පිං මදි වුණා නම්, නැවත අපි සමඟම ඉපදිලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ මෙවන් නායකත්වයක් ලබා දී අපේ රට ආරක්ෂා කරන්න එතුමාට වරම් ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ අවස්ථාවේ ගරු වික්ටර් ඇන්තනී මන්ත්‍රීතුමාත්, එස්.ඒ මුතුකුමාරණ මන්ත්‍රීතුමාත් කථා කිරීමට රැඳී සිටියත් කාල වේලාව මදි බැවින් මේ අවස්ථාවේ ගරු ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ ලබා දෙනවා.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
බොහොම කනගාටුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අස්වර් මන්ත්‍රීතුමාත් කථා කිරීම සඳහා ඉල්ලා සිටියා. නමුත් වෙලාවේ ප්‍රශ්නයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙම ශෝක ප්‍රකාශ යෝජනාවේ දෙවැනි දිනයේ අන්තිම කථාව සිදු කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මගේ ස්තුතිය තමුන්නාන්සේට පුද කරනවා. විනාඩි පහකින් මට සියල්ල කථා කර අවසන් කරන්න බැරි වෙයි. මේ අවස්ථාවේදී මේ දින දෙක වෙන් කරලා මගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරපු ගරු නිමල් සිරිපාල ද සිල්වා සභානායකතුමාටත්, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාටත්, ගරු චමල් රාජපක්ෂ කථානායකතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මගේ පියා ලෙඩ වූ මොහොතේ පටන් මේ දක්වා මෙම සභාවට පැමිණිලා එතුමාට ගෞරව කරපු සහ කවදත් අපේ පවුලේ සැප දුක බලා උදවු පදවු කරන අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඇතුළු ඒ පවුලේ සියලු දෙනාටමත් අප පවුලේ ස්තුතිය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. කියන්න සන්තෝෂයි, මගේ මවත්, මගේ ඥාති පිරිසකුත් ගරු කථානායකතුමාගේ ගැලරියේ සිට මේ ගරු සභාව හා එක් වීම ගැන. එතුමියත් සමඟ අපේ පවුලේ ස්තුතිය අතිගරු ජනාධිපතිතුමාට පුද කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම මේ ගැනත් මතක් කර නොසිටියොත් වැරදියි. මගේ පියා අසනීප වූ මොහොතේ පටන් එතුමාට ප්‍රතිකාර කළ මහනුවර මහ රෝහලේ ස්නායු අංශයේ හිටපු ඒ සියලුම දොස්තර මහත්වරුන්ටත්, ඒ වාගේම හොඳින් සත්කාර කරමින් එතුමාව බලා ගත්තු මහනුවර මහ රෝහලේ ඒ සියලුම සේවක මහතුන්ටත් අප පවුලේ සියලු දෙනාගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

[ගරු ලොහාන් රත්වත්තේ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම එතුමා අභාවප්‍රාප්ත වූ මොහොතේ පටන් එතුමාගේ භූමදාන කටයුතු කරන මොහොත දක්වා අපට උදව් උපකාර කළ, අපේ නිවසට පැමිණ අපට ශක්තියක් වුණ අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා, ගරු අමාත්‍යවරු, ගරු නියෝජ්‍ය අමාත්‍යවරු, ගරු මන්ත්‍රීවරු, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන් ඇතුළු තමුන්නාන්සේලා සියලුම දෙනාටමත් අප පවුලේ ස්තුතිය ප්‍රකාශ කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම ජනරාල්වරයකු වූ මගේ පියාට හමුදා ගරු බුහුමන් දක්වමින්-ජනරාල්වරයකුට ලැබෙන්න තිබෙන ගරු බුහුමන් දක්වමින්-බෝගම්බර පිටියේදී එම අවසන් කටයුතු කරන්න අවස්ථාව ලබා දුන් අතිගරු ජනාධිපතිතුමාටත්, ආරක්ෂක ලේකම්තුමා, හමුදාපතිතුමා ඇතුළු එයට සම්බන්ධ වුණු සියලුම හමුදා නිලධාරිවරුන්ටත් අප පවුලේ ස්තුතිය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මැයි 10 වැනිදාත්, අද දිනත් ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා මෙම ගරු සභාවට මෙම ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කළ මොහොතේ පටන් ශෝකය ප්‍රකාශ කරමින් කථා කළ විරුද්ධ පාර්ශ්වයේ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත්, අප එක්සත් ජනතා සන්ධානයේ සියලුම පක්ෂවල නායකවරුන්ටත්, ගරු අමාත්‍යවරුන්ටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ටත්, ගරු මන්ත්‍රීවරුන්ටත් මේ අවස්ථාවේදී මා ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන් මමවත් දැන ගෙන හිටියේ නැති කරුණු මේ අවස්ථාවේ මට දැන ගන්න ලැබුණා. ඒ පිළිබඳව මම ඉතාම සන්තෝෂ වෙනවා. මගේ මවත්, සහෝදරයන් දෙදෙනාත් ඇතුළු පවුලේ සියලු දෙනා වෙනුවෙනුත් අපේ ගෞරවය, ස්තුතිය ඒ සියලු දෙනාටම මම ඉතාම සන්තෝෂයෙන් පුද කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ හිතවත් ගරු සූරියප්පෙරුම මැතිතුමාත්, තවත් ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනකුත් කියූ ආකාරයට ඒ වාගේ පියෙකුගේ පුතුන් තිදෙනෙකු වෙන්න අපි ඉතාමත් වාසනාවන්ත වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපි එතුමා ඒ ගිය පාරේ ගමන් කරමින්, එතුමාගේ කීර්ති නාමයට හානියක් නොවන පරිදි දේශපාලන කටයුතු සහ අනෙකුත් කටයුතු කරගෙන යන බවට ඔබතුමාටත් මේ ගරු සභාවටත් පොරොන්දු වෙමින් අවසාන වශයෙන් එතුමා ඒ තත්ත්වයට ගෙනෙන්න අපට උදව් කරපු පාතදුම්බර ආසනය ප්‍රධාන කොටගත් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව ඇතුළු ශ්‍රී ලංකාවාසී සියලුම ජනතාවට මාගේ ස්තුතිය පුද කරමින් මගේ පියාණන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි.

ගරු කථානායකතුමා නියෝජනය කරන තිස්සමහාරාම කොට්ඨාසයේ ජනතාව එතුමාගෙන් ඉල්ලා සිටි ගොවිතැන් කටයුතු හා වාරිමාර්ග කටයුතු සකස් කිරීම වෙනුවෙන් එතුමා විසින් කරන ලද යෝජනා අනුව විශේෂයෙන්ම මව්ආර හරස් කර ජලාශයක් ඉදි කර මොනරාගල දිස්ත්‍රික්කයේ මීගහජඳුර - බඳගිරිය දක්වා ජලාශ 35කට ජලය ලබා දීමට උනන්දුවෙන් කටයුතු කිරීම, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමියගේද ආශිර්වාදය ඇතිව වලව වම් ඉවුර සම්පූර්ණ කොට වෙහෙරගල ජලාශය ඉදි කිරීම, ලුණුගම්වෙහෙර ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා කැකිරිඔය ජලාශය ඉදි කිරීම, මාගම තාක්ෂණ මධ්‍යස්ථානය ඉදි කිරීමට සහයෝගය ලබා දීම, ඒ වාගේම කොළඹ විශ්වවිද්‍යාලයෙන් ගොවීන් හට ඩිප්ලෝමා සහතික ලබා දීමට හැකියාව ඇති කර දීම වැනි කටයුතු මිත්‍රශීලී ජනතා නායකයෙකු ලෙස රත්වත්තේ මැතිතුමා විසින් ඉටු කරන ලද බව ගරු කථානායකතුමා වෙනුවෙන් මතක් කිරීමට කැමැතියි.

මෙම රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් ගරු ලොහාන් රත්වත්තේ මහතා ප්‍රධාන පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම විධාන කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண )
(The Hon. (Prof.) Tissa Vitarana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## පුරාවස්තු සහ නිධන් වස්තු කොල්ල කෑම
## தொல்பொருள் மற்றும் புதைபொருட் கொள்ளை
## LOOTING OF ARTEFACTS AND TREASURE HUNTING

[අ.භා. 4.05]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තැබීමේ අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2012 වර්ෂයේ පසු ගිය මාස කිහිපය තුළ පමණක් මේ රටේ පුරාවස්තු කොල්ල කෑම, විහාරස්ථානවල පෞරාණික බුදු පිළිම වහන්සේලාගේ ශීර්ෂ කඩා ගෙන යෑම ඇතුළු නොයෙකුත් ආකාරයේ විනාශ කිරීම් රැල්ලක් සේ පැතිර යමින් පවතී. 2012 මාර්තු මාසයේ සිදු වූ ජාතික කෞතුකාගාරයේ පුරාවස්තු කොල්ල කෑම පිළිබඳව මේ වන තුරු කිසිදු තොරතුරක් ලැබී නොමැත. එම පුරාවස්තු කොල්ල කෑම පිටුපස දේශපාලන හස්තයන් මෙන්ම ඉහළ පොලිස් නිලධාරින්ගේ ද සහාය තිබෙන බව ජනතාවගේ මතයයි. 2012 මැයි මස 09 වන දින විලච්චියේ සිදු වූ විශේෂ කාර්ය බලකායේ මෙහෙයුම් සහිත පුරා වස්තු කොල්ල කෑම වැළකී ගියේ ගම් වාසීන්ගේ තිබූ විපරම හේතුවෙනි. මේ දක්වා එම සිද්ධියටද කිසිම පුද්ගලයකුට විරුද්ධව නීතියට අනුව කටයුතු කර නොමැත.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් පවසන්නේ මෙම නිධන් කොල්ලයට විරුද්ධව තමා නිලධාරින් සමඟ විදි බසින බවය. මේ සම්බන්ධයෙන් ජනතාව අතර පවතින මතය නම් දුටුගැමුණු රජතුමාගේ කඩුව සෙවීම සඳහා ඉහළ හස්තයකින් එල්ල වන බලපෑම මත ආරක්ෂක අංශවලද සහාය ඇතිව මෙම දේවල් සිදු වන බවය.

එමෙන්ම නිධන් හෑරීම සඳහාම වන අධි තාක්ෂණික උපකරණ මෙරටට ගෙන්වා ඒවා මඟින් නිධන් වස්තු ඇති තැන් නිශ්චිතවම තීරණය කර එයින් පසුව නිධන් හෑරීමේ කටයුතු කරනු ලැබේ. මෙම අධි තාක්ෂණික යන්ත්‍ර මෙරටට ගෙන්වීම පිටුපස සිටින පුද්ගලයින් කවුරුන්ද යන්න මෙම සභාවට හෙළි කළ යුතුය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. Jagath Balasuriya - Minister of National Heritage)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, you can continue with your speech.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

Thank you.

අස්ගිරි මල්වතු මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා නිධන් හෑරීම සම්බන්ධයෙන් තම විරුද්ධත්වය මේ වන විටත් ජනමාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු කළ යුතුව ඇත. ඊට අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශවල පුරාවස්තු, නිධන් කොල්ල කෑම් විශාල වශයෙන් සිදු වී ඇති අතර ඒවා පිළිබඳව පොලීසිය සහ ආරක්ෂක අංශ විසින් දක්වන උනන්දුව සතුටුදායක තත්ත්වයක නොමැත.

එබැවින් පහත ප්‍රශ්න සඳහා රජය විසින් පිළිතුරු ලබා දීම අපේක්ෂා කරමි.

1. එම නිධන් වස්තු කොල්ල කෑම් පිටුපස කිසියම් දේශපාලන හස්තයක් හෝ රජයේ ඉහළ නිලධාරින්ගේ සම්බන්ධයක් තිබේද?
2. මෙම නිධන් වස්තු කොල්ල කෑම් සම්බන්ධව නීතිය නිසියාකාරව ක්‍රියාත්මක නොවන්නේ කිසියම් දේශපාලන අදෘශ්‍යමාන හස්තයක බලපෑම නිසාද?
3. එම සිද්ධි සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන ඇති සිද්ධීන් කොපමණ ප්‍රමාණයක් මේ වන විට වාර්තා වී තිබේද?
4. 2012 වර්ෂයේ පමණක් පුරාවස්තු කොල්ල කෑම් පිළිබඳව සිද්ධීන් කොපමණ ප්‍රමාණයක් වාර්තා වී ඇද්ද? එම ප්‍රදේශ මොනවාද යන්නත්, ඒ සම්බන්ධයෙන් කොපමණ පිරිසක් මේ වන විට නීතියේ රැහැනට හසුවී ඇද්ද යන්න පිළිබඳවත් මෙම සභාවට දන්වන්නේද?

මේ සම්බන්ධයෙන් එම නිධන් කොල්ලකෑම නවතාලීම සඳහා රජය විසින් ඉදිරියේදී ගනු ලැබීමට නියමිත ක්‍රියා මාර්ගයන් කවරේද යන්නත් මෙම ගරු සභාවට වාර්තා කරන මෙන් ඉල්ලා සිටිමි."

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද ලංකාව පුරාම මේ කථාව -මේ කථිකාව- අතිවිශාල වශයෙන් ගොඩනැඟී තිබෙනවා. මූලික වශයෙන්ම ශ්‍රී ලංකාව කියන්නේ වසර 2550ක ප්‍රෞඪ ඉතිහාසයක් ඇති, ඉතාමත්ම වටිනා, වැදගත් පුරාවස්තු සහිත සම්පත්වලින් පෝෂණය වෙච්ච රටක් බව අප සියලු දෙනාම දන්නා කරුණක්. උදෑසන පත්තරයක් ගත්තොත්, රූපවාහිනිය නැරඹුවොත් හැමදාම ඒ ප්‍රවෘත්ති තුළ නිධානයක් හෑරීමක්, පුරාවස්තු සම්බන්ධයෙන් වංචාවක්, කොල්ලකෑමක් පිළිබඳව අපට වාර්තා වෙනවා. විපක්ෂය හැටියට අපි හැමදාම මේවා දිහා බලා ගෙන සිටීම විපක්ෂයේ කාර්ය භාරය නොවන බව අප දරන මතයයි.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ අසාධාරණකම, මේ අයුක්තිය උදෙසා රට හදන තැන යම්කිසි කථිකාවක් ගොඩ නැඟිය යුතු යයි අප විශ්වාස කරනවා. ඒ වාගේම මේ වන කොට ලංකාව තුළ පුරාවිද්‍යා වටිනාකමකින් යුත් ස්ථාන 2,75,000ක් තිබෙනවාය කියා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහත්මයා කියා තිබෙනවා අප දැක්කා. එතුමාගේ ප්‍රකාශය අනුව මේ 2,75,000න් එක ස්ථානයක් හැරෙන්නට අනෙක් හැම තැනකටම බලපෑම් එල්ල වෙලා. බලපෑම් එල්ල වෙලා නැත්තේ අනුරපුර, දැදිගම ප්‍රදේශයේ පිහිටි පරාක්‍රමබාහු ඉදි කළ ස්මාරකයට පමණයි කියලා එතුමා ප්‍රකාශ කර තිබෙනවා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේක දැවැන්ත ප්‍රශ්නයක්. අපි පොලිස් වාර්තා අර ගෙන බැලුවොත් 2008 දී විතරක් අනවසර කැණීම් 208ක් තිබෙනවා. 2009දී අනවසර කැණීම් 235ක් තිබෙනවා. 2010 දී අනවසර කැණීම් 295ක් තිබෙනවා. 2011 දී අනවසර කැණීම් 220ක් තිබෙනවා. 2012 මේ මාස පහ ඇතුළත විතරක් අනවසර කැණීම් 110ක් තිබෙනවා. ඒක බරපතළ ප්‍රශ්නයක්. මේ පිළිබඳව නිහඬව සිටීම, ආණ්ඩුව මේ පිළිබඳව උත්තරයක් නොදීම කිසිසේත්ම සාධාරණ නැහැයි කියන එකයි අපේ විශ්වාසය මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි. රටේ අතිවිශාල ජීවන අර්බුදයකුත් හට ගෙන තිබෙන අවස්ථාවක ජනතාව ඉතා ඉක්මනින් ධනවත් වෙන්න මේ කාලයේ නිධන් හාරනවාද කියලා පුංචි ප්‍රශ්නයකුත් අප තුළ තිබෙනවා. මොකද, ජීවත් වීම ඒ තරමටම අමාරුයි. හොඳ මිනිසෙකුටවත් රක්ෂාවක් කරලා ජීවත් වෙන්න අමාරුයි. මේක රුපියල් 2,500කින් කන්න පුළුවන් ආර්ථිකයක් තිබෙන රටක්. රුපියල් 2,500කින් තමයි මිනිස්සු කාලා බීලා මාසයක් ජීවත් වන්නේ.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් එක දෙයක් මතක තියා ගන්න ඕනෑ. මේ රටේ තිබෙන මිථ්‍යා විශ්වාස අනුව නිධන් හාරලා ඉතා ඉක්මනින් සුර සතුට විඳ ගන්න පුළුවන් කියලා ජනතාව හිතනවා. නමුත් මේවායේ ඵල විපාක ගැන පැරණි සෙල් ලිපිවල ලියැවිලා තිබෙනවා. සමහර තැන්වල ලියලා තිබෙනවා, "සඟ සතු දේපොළවලට වින කටින වුන් මතු භවයේ බල්ලන්, කපුටන් වෙලා ඉපදේවා" කියලා. තවත් සමහර තැන්වල ලියලා තිබෙනවා, "බුදුන් වහන්සේ ඉපදෙන කාලයේදී මොවුන් නොඉපදේවා. ඉපදුනත් ගේ අසලින් බුදුන් වහන්සේ වඩින අවස්ථාවේ වඳින්න අත් නොඑසවේවා, කථා කරන්නට කට නොඇරේවා" කියලා. "මෙලොව, පරලොව දෙකේදීම සාප වේවා" කියා ලියැවිලා තිබෙන බවත් අපි අහලා තිබෙනවා. බලය සහ තේජස් බල පරාක්‍රමය පරපුරෙන් පරපුරට ගෙන යාම සඳහා පැරණි රන් කඩු, ජය කුන්තය, රන් කෙණ්ඩිය ලබා ගැනීමට මිනිස්සු පොළඹවන අවස්ථා තමයි අද අපි දකින්නේ. රන් කඩුව තියා ගත්තා නම් පරපුරෙන් පරපුරට රාජ්‍ය බලය, රටේ බලය තබා ගන්න පුළුවන්ය, සදාකාලිකව රටේ රජ වෙන්න පුළුවන්ය කියන කථාව අපි අහලා තිබෙනවා. එවැනි අවධියක තමයි අපි දැන් ජීවත් වන්නේ. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, කට්ටඩියන් ලවා පූජා පවත්වලා මේ නිධන් ගන්න පුළුවන්ය කියලා රට පුරා කට කථා තිබුණා.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

මේ රන් කඩුව, රන් කෙණ්ඩිය ලබා ගැනීමෙන් තේජස, බලය, ජනප්‍රසාදය ලබා ගත හැකියි කියලා සිතීම අපි නම් දකින්නේ මිථ්‍යාවක් ලෙසයි. මොකද, රටක බල පරාක්‍රමය ලබා ගන්න ඕනෑ නම්, තේජස, ජනප්‍රසාදය ලබා ගන්න ඕනෑ නම් ඒක කරන්න ඕනෑ, මේ ජාතික උරුමයන් සූරා කාලා එහෙමත් නැත්නම් සොරකම් කරලා නොවෙයි. තමන්ගේ තේජස, ඒ ජනප්‍රසාදය ලබා ගන්න පුළුවන් වන්නේ තමන් කරන ක්‍රියාවලින් - කටයුතුවලින්- කියන එකයි අප තුළ තිබෙන විශ්වාසය. මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රජයෙන් ඉල්ලා සිටින්නේ දැන්වත් මේ මිථ්‍යා විශ්වාසවලින් මිදිලා මේ පෞරාණික සිද්ධස්ථාන ආරක්ෂා කර දෙන ලෙසයි.

අද බලන්න, බුදු පිළිමවල හිසට කුළු ගෙඩිවලින් ගහන අවධියකුයි තිබෙන්නේ මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි. අපි නොයෙකුත් සිද්ධීන් අහලා තිබෙනවා. නිධන් හාරන්න, නිධන් සොයන්න කුළු ගෙඩිවලින් බුදු පිළිම වහන්සේලාගේ හිසට පහර දී තිබෙන අවස්ථා අපි දැකලා තිබෙනවා.

පසු ගිය දවස්වල සිදුවීමක් පිළිබඳව මෙහෙම විග්‍රහයක් කරලා තිබෙනවා මම දැක්කා. මේ සිදු වීම් තුළ ආණ්ඩුවත්, මහනායක හිමිවරුනුත් කට පියා ගෙන සිටිනවා. නමුත් සිංහල ජාතියත්, බෞද්ධ උරුමයනුත් ආරක්ෂා කරන දේශපාලනය කරන්නා වූ පිරිසිදු බෞද්ධ පුත්‍රයන් එසේ කට පියා ගෙන නොසිටිය යුතුයි කියලා ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ බෞද්ධ ශාසන භික්ෂු සංවිධානයේ ප්‍රධානී කිරම විමලජෝති හිමියෝ පසු ගිය දවසකදී ප්‍රකාශයක් කරලා තිබුණා. ආණ්ඩුවයි, මේ සම්බන්ධයෙන් වග කිය යුත්තෝයි සම්පූර්ණයෙන්ම නිහඬව ඉන්නවා කියලා උන් වහන්සේ ප්‍රකාශ කරලා තිබුණා.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, පුරා විද්‍යා ස්මාරකයකින් ඇත්ත වශයෙන්ම හෙළි වන්නේ ඒ රටේ තිබෙන අභිමානවත් ඉතිහාසයයි. අපේ රටට ප්‍රෞඪ ඉතිහාසයක් තිබෙනවා. එකල විසූ අපේ නායකයන්ගේ, මුතුන් මිත්තන්ගේ තිබුණු ජීවන රටාවයි අපට ඒවායින් පෙන්නුම් කරන්නේ. මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, සීගිරියට යන වෙලාවට අපට තේරෙනවා අපේ මුතුන් මිත්තන්ගේ තිබුණ කලා කුසලතාවන් ගැන. ඒ තිබුණ නිර්මාණාත්මක හැකියාව අනුව, ඒ තිබුණ අදහස් සියුම්ව, ලස්සනට නිර්මාණය කිරීම ගැන අපට අතිවිශාල ගෞරවයක් ගෙන දෙනවා.

අවුකන පිළිමය දෙස බලන විට අපට පෙනෙනවා, ඒ යෝධ ප්‍රතිමාව පිටුපස තිබෙන්නේ ජාතියේ සශ්‍රීකත්වයයි, ජාතියේ ශක්තිමත්භාවයයි කියන එක. අපේ මුතුන් මිත්තන් මේ විධියට වැඩ කටයුතු කළා නම්, එවැනි ලස්සන නිමැවුම් කලාත්මකව කළා නම්, එලෙස කිරීමට හේතු සාධක වුණේ එතුමන්ලාට තිබුණු නිදහස් මනසත්, ඒ තිබුණු ස්වභාවයත්, එවකට රටේ තිබුණු පරිසරයත් බවත් අපි කවදාවත් අමතක කරන්න හොඳ නැහැයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුරය, පොළොන්නරුව, යාපහුව වැනි ප්‍රදේශවල පමණක් නොවෙයි, වවුනියාව, මඩකළපුව, යාපනය, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවලත් බුදු පිළිම වහන්සේලාගේ සිරස කඩලා, පපු ප්‍රදේශ පුපුරුවා හැරලා ඒවා ඇතුළේ නිදන් තිබෙනවාද කියලා බලන්න උත්සාහ කර තිබෙන සිදුවීම් ගණනාවක් අපට වාර්තා වෙලා තිබෙනවා. මේ සිදුවීම් අද ඊයේ සිද්ධ වෙච්ච දේවලුත් නොවෙයි. එල්ලාවල මේධානන්ද හාමුදුරුවෝත් කියලා තිබෙනවා මම දැක්කා, "මේවා අද ඊයේ වුණු සිදුවීම් නොවෙයි" කියලා. ඒක ඇත්ත. අනුරාධපුර යුගය අවසන් වන කාලයේ එහි රජ කළ පස්වන මිහිඳු රජුන්ගේ කාලයේ චෝලයනුත් ඇවිල්ලා කළේ මෙවැනිම සිදුවීම් තමයි. ඒ විතරක් නොවෙයි, ඒ චෝලයන් කරපු සම්පූර්ණ විනාශය අපට අදටත් රජරට සැරිසරද්දී දකින්නට තිබෙන නිදසුනක් කියලා අපි විශ්වාස කරනවා. ඒ විතරක් නොවෙයි, පොළොන්නරුව රාජධානියේ අවසන් පාලකයා වුණ නිශ්ශංක මල්ලව රජුගෙන් පසු කාලිංග මාඝයන්ගෙන් එල්ල වෙච්ච දරුණු ප්‍රහාරයෙනුත් අපට අනිවාර්යයෙන්ම ඉතිහාසයේ මේ දේවල් වුණා කියන සිදුවීම් තිබෙනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, එදා මේවා සිද්ධ වුණේ සංක්‍රමණිකයන්ගෙන්, ආක්‍රමණිකයන්ගෙන්. - පිටින් ආපු මිනිසුන්ගෙන්- අද මේ දේ වෙන්නේ මේ රටේ ඉන්න, මේ රටේ ජීවත් වන, මේ රටෙන් කන බොන, මේ රටේ මිනිසුන්ගෙන් වීම ඉතාමත්ම බරපතළ තත්ත්වයක් හැටියටයි අපි දකින්නේ.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ තමන්ගේ උරුමයන් කියා ගන්නා හිත්පිත් නැති අධමයන් විසින් තමයි මෙවැනි විනාශයන් කරන්නේ කියන එක අපේ විශ්වාසයයි. පසු ගිය කාලයේ සිදු වුණ විනාශයන් දෙස බලන විට දුටුගැමුණු රජතුමාගේ කඩුවත්, රන් කෙණ්ඩියත්, දුටුගැමුණු රජ නිදා ගත් යහනත් සොයා ගෙන යන බව අපට පැහැදිලි වෙලා තිබෙනවා. මේවා අවශ්‍ය වන්නේ කාටද? දුටුගැමුණු රජතුමාට ආදරය කරන කට්ටිය නම් ගොඩක් ඉන්නවා. චිත්‍රපටවල දුටුගැමුණු චරිතය රඟපාන්නත් අපේ සමහර දේශපාලනඥයෝ දැන් පෙළඹිලා ඉන්නවා. හැබැයි දැන් දුටුගැමුණු රජතුමාගේ කඩුවත් සොයනවාලු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
කවුද කියන එක තමයි අපට දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය. මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ පිටුපස අදෘශ්‍යමාන දේශපාලන හස්තයක් ක්‍රියාත්මක වන බව ඕනෑම පුංචි දරුවකුට වුවත් තේරෙන ප්‍රශ්නයක්. නිධන් හැරීමේ අලුත්ම සෙල්ලම පෙන්නුම් කරන කාරණයක් තමයි මේ ඊයේ පෙරේදා සෙට්ටිකුලම ප්‍රදේශයේ, උලක්කුලම, වීරපුරන්වෙහෙර ප්‍රදේශයේ තැනක් පුපුරුවා නිධන් හැරීම පිළිබඳ විස්තරය. මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී ඩබල් කැබ් රථ තුනක්, බැකෝ යන්ත්‍රයක්, සුඛෝපභෝගී වාහන, පුපුරන ද්‍රව්‍ය, ඩෙටනේටර්, වෙඩි නූල් සහ පූජා භාණ්ඩ අත් අඩංගුවට ගත්තා. මේ දේවල් අස්සේ පූජා භාණ්ඩත් තිබුණා. මේ වැඩේ කර ගෙන ගියේ ගල් කොරියක් කරන විධියටයි; ගල් කොරියක් කඩන විධියට තමයි මේ වැඩේ පටන් ගත්තේ. නමුත් මේක පිටුපස සම්පූර්ණ වශයෙන් පැහැදිලිව නිධන් හැරීමේ උත්සාහයක් තිබුණා. අපි අද සතුටු වනවා, දේශපාලනීකරණයට ලක් වෙච්ච අවධියක ලංකාවේ ඉන්න පොලිස් නිලධාරින් ඉතාමත්ම සාර්ථක අන්දමට කටයුතු කිරීම ගැන. ලංකාවේ පොලිස් නිලධාරින් සියලු දේශපාලන බලපෑම් තුළ තමන්ගේ කටයුතු හරියට ක්‍රියාත්මක කළා. මේකේ දේශපාලන හස්තයක් තිබෙනවා කියලා අපි අද කියන්නේ ඇයි? පොලීසිය විසින්ම කියනවා, "දේශපාලනඥයෝ බලපෑම් කළා" කියලා. අද අපි රජයෙන් ඉල්ලීමක් කරනවා. එහෙම බලපෑම් කරපු දේශපාලනඥයෝ ඉන්නවා නම් ඇයි ඒ දේශපාලනඥයන්ව ඉදිරියට දමන්න බැරි? මෙවැනි දෙයක් කළා කියලා කියනවා නම්, ඒකට අනුබල දුන්නා නම්, හොරකම් කරන්න යන මිනිස්සුන්ව බේරා ගන්න දේශපාලනඥයෝ උත්සාහ කළා නම්, ඇයි ඒ දේශපාලනඥයන්ගේ නම් මේ සභාවට කියන්න බැරි?

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, නිධන් කොල්ලකෑමේ සිද්ධීන් ගණනාවක් මේ රටේ වාර්තා වනවා. මිනිස් බිලි, සත්ව බිලි

ආදී සියලු සිද්ධීන් ගැන වාර්තා වනවා. තිස්සමහාරාමයේ, යටාල ප්‍රදේශයේ, යටාලතිස්ස රජු දවසේ පිහිටි පුරාවිද්‍යා කෞතුකාගාරයක් තිබෙනවා. පසු ගිය දවසක එහි ආරක්ෂක නිලධාරියාව ගැට ගහලා එතැන තිබුණු අතිවිශාල පිළිරුවක් ගෙනියලා මඩ වගුරක හංගලා, විදේශිකයෙකුට විකුණන්න ලැහැස්ති කරලා තියෙන කොට ඒක අහු වුණා. මේ මාධ්‍යවල පළ වෙච්ච වාර්තා. ඒ විතරක් නොවෙයි, ඒ නාඳුනන පිරිස මේ බුද්ධ ප්‍රතිමාව විදේශිකයන්ට විකිණීමට සම්පූර්ණ වැඩසටහනකුත් හදලා, ඒ විදේශිකයන් ලංකාවට ගෙන්වා ගෙන තිබුණු බවටත් අපට වාර්තා වනවා.

කඹුරුපිටිය, හක්මණ ප්‍රදේශයේ ඇල්ලේවෙල සන කැලෑවක කුඩා චෛත්‍යයක් කඩා දමලා නිධන් සොයා ගන්න උත්සාහ කරලා තිබුණු බවත් අපට වාර්තා වනවා, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි.

සූරියවැව, 10 කණුවේ නිවසක තිබිලා අඟල් 17ක් උස, අඟල් 12ක් පළල තඹ පැහැති කිලෝග්‍රෑම් 18ක පිත්තල බුද්ධ ප්‍රතිමාවක් කෝටි එක හමාරකට විකුණන්න යනකොට, ඒ විකුණන්න ගිය මිනිස්සුත් එක්ක පොලීසිය අල්ලා ගත්තා. අපට ඒ සිදුවීම වාර්තා වෙලා තිබෙනවා, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි.

පොළොන්නරුවේ, ශිව දේවාලයේ විශාල වළක් කපලා ඒකේ ඇතුළෙත් නිධන් හෑරීමේ සිද්ධියක් තිබුණු බවට අපට සම්පූර්ණ වශයෙන් වාර්තා වනවා, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි. දිනෙන් දින, වරුවෙන් වරුව අපට අහන්න තිබෙන්නේත් මේ නිධන් හෑරීම ගැනයි. රට හදන තැන අපි කථා කරන මේ මොහොතේදීත් ස්ථාන රාශියක මේ නිධන් හෑරීම සිදු වන බව අප සියලු දෙනාම පිළිගන්නා කරුණක් කියලා මට විශ්වාසයි.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, භයානකත්වය මේක නොවෙයි. වාලච්චේන ප්‍රදේශයේ මුස්ලිම් ගම්මානයක අවුරුදු 14ක සිසු දැරියක් බිලිදීමක් සඳහා පැහැර ගෙන ගිහිල්ලා තිබුණා. මෙන්න භයානකත්වය. මෙන්න රට යන තැන. මේ කියන ආසියාවේ ආශ්චර්යයට යන්නේ නිධන් හාරලා දරුවෝ බිලි පූජා කරලාද? අද රට යන අවධිය මේ නිධන් සමඟ ජීවත්වීම කියලායි අපට පෙනෙන්න තිබෙන්නේ. අන්න ඒකයි මේකේ තිබෙන භයානකත්වය. මෙතෙක් කල් අපි කතා කර කර හිටියේ ග්‍රීස් යක්කු ගැනයි. දැන් ග්‍රීස් යක්කු පැත්තකට ගියා. නිධන් හොරු සහ මං කොල්ලකාරයෝ මෙන්න මේ ගමනේ ඉදිරියට ඇවිල්ලා තිබෙනවා, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මම ගරු කරන අපේ එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේත් කියලා තිබෙනවා, "නිධන් වස්තු කියලා දෙයක් නැහැ" කියලා. ඒ වාගේම ඒකට බලධාරිනුත් කියලා තිබෙනවා, "නිධන් වස්තු කියලා දෙයක් නැහැ, එහෙමයි, අපේ ස්වාමීන් වහන්සේ කියපු දේ හරි" කියලා. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, "නිධන් වස්තු තිබුණත්, එය ජනතාවට අයිති නැහැ"යි කියලාත් අපේ ස්වාමීන් වහන්සේ දවසක් ප්‍රකාශ කළා. නිධන් වස්තු නැහැ කියනවා. ඊට පස්සේ නිධන් වස්තු තිබුණත් ඒක ජනතාවට අයිති නැහැ කියලාත් කියලා තිබෙනවා. ඒත් මම හිතන්නේ අසීමිත ආශාවල් තිබෙන දැස් නිලංකාරයෙන් අධම වෙච්ච පුද්ගලයන්ට මේවා ප්‍රශ්නයක් නොවෙයි කියලායි. මේ නිධන් තිබෙනවා නම්, මේ මොනවා කිව්වත්, ජාතියේ හිස ගසා දමලා හරි තමන්ගේ බඩ රැක ගන්න පුළුවන් නම් එහෙමත් උනන්දු වෙච්ච පිරිසක් ඉන්නවා, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි. හැබැයි එක දෙයක් මතක තබා ගන්න. මේ නිධන් හොරු කවුද? මේ නිධන් හොරු කවදාවත් ගමේ ඉන්න පුංචි මිනිහා නොවෙයි. ඔය නිධානවලට අතවත් තියන්නේ ගමේ ඉන්න අහිංසක, දුප්පත්, අසරණ මිනිහා නොවෙයි, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි.

මේවාට මූලික වශයෙන් උනන්දු වෙන්නේ, මේවාට අත තියන්නේ සංවිධානාත්මක වෙච්ච, ඉතාම දූෂිත වංචා දූෂණවලට හසු වෙච්ච දේශපාලනයට සම්බන්ධ හෙංචයියලායි. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, එහෙනම් ප්‍රශ්නයක් තිබෙනවානේ, මේවාට දේශපාලන රැකවරණයක් නැද්ද කියන එක පිළිබඳව. උළක්කුලම ප්‍රදේශයේ සිදු වීම තමයි මෙයට හොඳම නිදසුන. බලන්න, ඒ සිදු වීමේදී මොකක්ද වුණේ කියන එක.

ඒ විතරක් නොවෙයි. අපි කථා කරමු කොළඹ අධිආරක්ෂිත කලාපයේ පිහිටි කෞතුකාගාරයේ තිබුණු පුරා වස්තු ටික නැති වීම පිළිබඳව. ඒ සිදු වීම වෙලා අදට මාස තුනකුත් ගත වෙලා තිබෙනවා. අද වන තුරු බැරි වෙලා තිබෙනවා අදාළ පුද්ගලයන්ව හොයා ගන්න. ප්‍රභාකරන් හිටපු තැන හරියට හොයා ගත්ත, ප්‍රභාකරන්ව අල්ලා ගත්ත, ප්‍රභාකරන්ව මරපු -ඒ සියලු දේ කරපු- රජයට බැරි වෙලා තිබෙනවා කෞතුකාගාරයේ තිබුණු කඩුව ගත්තේ කවුද කියලා හොයා ගන්න. දැන් සියලුම සැප දෙන කේ.පී.ව අල්ලා ගත්ත, ඒ මේ සියලු දේ කරපු කට්ටියට මාස තුනක් ගිහිල්ලාත් පුළුවන්කමක් නැති වුණා මේ කඩුවට මොකක්ද වුණේ කියලා කිසිදු විස්තරයක් හොයා ගන්න. ඉතින් මේ ගැන එක අතකින් අපි විමතියට පත් වෙනවා වාගේම ශ්‍රී ලාංකාවේ පුරවැසියන් හැටියට ලජ්ජා වෙනවා, අපේ ජාතික කෞතුකාගාරයේ තිබුණු කඩුව ආරක්ෂා කර ගන්න බැරි ආණ්ඩුවක් තිබෙන කාලයකද අපි මේ ජීවත් වෙන්නේ කියලා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, කෞතුකාගාරයේ සියලු ආරක්ෂාව තියෙද්දී ඒක ඇතුළේ තිබෙන ඒවා හොරකම් කරනවා නම්, සන කැලෑ ඇතුළේ තිබෙන නිධන් බැකෝ දමලා හාරන එක අහන්නත් දෙයක්ද? කොළඹ මැද පිහිටා තිබෙන ජාතික කෞතුකාගාරයේ කැමරා තිබියදීත්, එහි තිබෙන දේවල් ආරක්ෂිතව තිබියදීත්, තාප්පයකුත් නැතිව සියලු දෙනාටම පෙනෙන්න පරිශ්‍රය ඇරලා තිබියදීත් -හොඳට පෙනෙනවා හොරෙක් එනවා නම්- එහෙම තැනකත් හොරකම් කරනවා නම් සන කැලෑ ඇතුළේ තිබෙන ඒවා ගැන මොන කථාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාල වේලාව අවසානයි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
I have been given 25 minutes.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You have been given 25 minutes but five minutes have already been taken out of that.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
No, he started at 4.10 p.m.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, at 4.10 p.m. Ten minutes has been taken for the Vote of Condolence. So, we have to deduct two or three minutes from each Member. Hon. Amaratunga, you know that. Normally you adjust the lost time by reducing two or three minutes from each Member. Do not take his time. Hon. Fernando, you can conclude.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මම මේ යෝජනාව ගෙනාපු නිසා මට තව විනාඩියක කාලයක් දෙන්න.

අද මේ කෞතුකාගාරයට සම්බන්ධ සිදු වීමට කෙළින්ම ආණ්ඩුවට චෝදනා එල්ල වෙලා තිබියදීත්, නොයෙකුත් දේශපාලනඥයන්ට, නොයෙකුත් පුද්ගලයන්ට චෝදනා එල්ල වෙලා තිබියදීත්, ආණ්ඩුව තවම උත්සාහයක් ගන්නේ නැහැ ඒ වරද නිවැරදි කරන්න; නැති වුණ ඒවා හොයා දෙන්න. මේක මහා විමතියට කරුණක්. විලච්චිය ප්‍රදේශයේ වෙච්ච සිදු වීමේදීත් කෙළින්ම චෝදනා එල්ල වුණේ ආරක්ෂක අංශවලටයි. ගම්මු එකතු වෙලා ආරක්ෂක අංශයට එළවා එළවා පහර දුන්නා. මේක මේ රටට හොඳද? මේක රටේ ආරක්ෂාවට හොඳද? මේක මේ රටේ ඉදිරි ගමනට හොඳද? මේ තුළින් පුංචි දරුවාට දෙන ආදර්ශය හොඳද? අම්මලා තාත්තලා පොලීසියට, STF එකට පොලු අරගෙන ගහලා එළවන විධිය පුංචි දරුවෙකුට පෙන්වීම හොඳද? මේ සම්බන්ධයෙන් දුක් වෙන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ ආණ්ඩුවයි; අපි නොවෙයි. මොකද, මේක මේ රටේ ආරක්ෂාව පිළිබඳව අතිවිශාල ප්‍රශ්නයක් නිසා. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. එනම්, ආරක්ෂක අංශයත් මේ පිටුපස ඉන්න බව අපට පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගරු එල්ලාවල මේධානන්ද හාමුදුරුවෝ පසු ගිය දවසක කියාපු කථාවක් නිසා මම පොඩ්ඩක් කලබලයට පත් වුණා. ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ ඒ කරපු කථාව තුළින් මං කොල්ලකාරයින්ට තවත් උඩ ගෙඩි දීමක් සිදු වුණා කියලා මගේ පුංචි විශ්වාසයක් තිබෙනවා. ඔබ වහන්සේ ප්‍රකාශ කර තිබුණා, "මේවා ඒ කාලයේ සිටම සිදු වුණා" කියලා. ඒ වාගේම "මාධ්‍යවලින් වාර්තා කරන නිසා තමයි මේවා මෙච්චර ලොකුවට පිම්බිලා තියෙන්නේ" කියලාත් ඔබ වහන්සේ ප්‍රකාශ කර තිබුණා. උතුරු නැඟෙනහිර ප්‍රදේශ ගණනාවක ඔබ වහන්සේ සංචාරය කළ බවත්, පෞරාණික වශයෙන් වටිනාකම් තිබුණු තැන් සම්පූර්ණයෙන්ම ඒ කාලයේ කොල්ල කාලා තිබුණු බවත් ඔබ වහන්සේ පත්තරේට කියලා තිබුණා. රජයට මඩ ගහන්න උත්සාහ කරන පිරිසක් තමයි මේ කටයුත්ත කරන්නේ කියලා ඔබ වහන්සේ,- [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, දැන් අවසන් කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් විනාඩි දෙකක් ගන්න පුළුවන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙම නම් අනෙක් අයගේ වෙලාවෙන් අඩු වෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කර තිබුණා, දේශපාලන වශයෙන් මඩ ගහන්න නොයෙකුත් දෙනාගේ නම් පටලවා තිබෙනවා කියලා. නැහැ, ඒක වැරැදියි. කාගේවත් නම් පටලවන්න අපට අවශ්‍යතාවක් නැහැ ගරු ස්වාමීන් වහන්ස. අපි කියන්නේ මේක රටේ තිබෙන ප්‍රශ්නයක් බවයි. දේශපාලනයක් කරන්න නොවෙයි අපි මේ කරුණු කථා කරන්නේ. මේ රටේ පුරා වස්තුවලට ආදරය කරන ඔබ වැනි ස්වාමීන් වහන්සේ නමක් කරන මේ විධියේ ප්‍රකාශවලින් මේ රටේ මං කොල්ලකෑම් කරන, වංචා කරන දූෂිතයන්ට උඩ ගෙඩි දීමක් සිදු වන බවයි අප දකින්නේ. ඒ නිසා මේ පුරා වස්තු ආරක්ෂා කර දෙන්න කියන එකයි අපි ඉල්ලන්නේ. ඒ වාගේම ඔබ වහන්සේ කියලා තිබුණා, පුරා වස්තුවලට නිධන් අයිති නැහැ කියලා.

පොළොව යට තිබෙන දේ, රත්තරන්, මැණික් පුරාවස්තුවලට අයිති වන්නේ නැහැ, මේවා අයිති වන්න ඕනෑ රජයේ ආදායමටයි කියලා උන්වහන්සේ ප්‍රකාශ කර තිබුණා. බුදු දෙයියනේ! එහෙම කිව්වාම ඉතින් මේවා අනිවාර්යයෙන්ම හාරනවා නේ, මල්ල කරේ කියලා. ඒක තමයි බැකෝ යන්ත්‍ර දමලා නිධන් හාරන්නේ. එහෙම ප්‍රකාශයක් කිරීම අතිශයින්ම භයංකාරයි, ඒ වාගේම ශෝචනීයයි කියන එකයි අපේ විශ්වාසය. ඒ නිසා මේ දේවල් පිටුපස දේශපාලන හස්තයක් ක්‍රියාත්මක වීම අනිවාර්යයි කියන එක මම අවසාන වශයෙන් මතක් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව විනාඩියකින් අවසන් කරනවා.

එදා මේ නිධන් හෑරීම් කළේ පුංචි මට්ටමින්. එදා කට්ටඩියායි, ගල් කටුවයි, මල් බුලත් තට්ටුවයි, මීටියයි තමයි ඒ සඳහා අරගෙන ගියේ. නමුත් අද එහෙම නොවෙයි කරන්නේ. ස්කෑනර් යන්ත්‍ර ගෙනැල්ලා, ජෙනරේටර් දමලා, බැකෝ යන්ත්‍ර දමලා, ඩයිනමයිට් ගහලා කඩලා එළි පිට නිදන් හෑරීමේ තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. දුක තිබෙන්නේ මෙතැනයි මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි.

ඊ ළඟට මේක තමයි නියම කථාව. යූඑන්පී ආණ්ඩුව කාලයේ සීගිරිය විකුණන්න හදනවා, සිංහරාජය විකුණන්න හදනවා කියලා කෑ ගහලා මොර දීපු මිනිස්සුන්ගේ කටවල අද මුකවාඩම් බැඳලා. එදා එක්සත් ජාතික පක්ෂය සීගිරිය විකුණනවා, සිංහරාජය විකුණනවා කියපු මිනිස්සු, අද මේ තරම් ජාතික වංචාවක් වෙන කොට, මේ තරම් දූෂණයක් වෙන කොට ඒවා ගැන කථා කරන්නේ නැහැ. දේශප්‍රේමීත්වයේ ලේබලය බෙල්ලේ දමාගෙන ඉන්න මේ අය කරන හොරකම් ගැන කථා කරන්නේ නැහැ. ඒකයි අපි කියන්නේ, අනිවාර්යයෙන්ම දේශපාලන සම්බන්ධතාවක් මේ සඳහා තිබෙනවා කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මම අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි අහලා තිබුණේ ඉස්සර කාලයේ සූර සරදියෙල්ලා නිධන් හාරලා, එහෙමත් නැත්නම් මොනවා හරි වස්තුවක් තිබුණා නම් අරගෙන, ඒවා දුප්පත් මිනිසුන්ට බෙදලා දුන්නා කියලායි. අද කාලයේ ඉන්න සූර සරදියෙල්ලා එහෙම නොවෙයි. අද කාලයේ ඉන්නේ අමුතු සරදියෙල්ලා. ඒ ගොල්ලෝ මේවා හොරකම් කරලා දරු මුනුපුරෝ එක්ක එකතු වෙලා තමන්ගේ දේශපාලන වට පිටාව හදා ගන්න කටයුතු කරන විධියක් තමයි අද තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. "රෝහණ ජන රංජනයෙන්" පිදුම් ලබා සිටින, "සම්බුද්ධත්ව ජයන්තියට පිළිවෙතින් පෙළ ගැසෙමු" කියන මේ අය රටේ පුරාවස්තු විනාශ කරන බවක් මා හිතනවා.

රජ රට පුරා වස්තු ටික විනාශ කරන කොට, ශිව දේවාලය කඩා විනාශ කරන කොට, අධිආරක්ෂක කලාපයේ පිහිටි ජාතික කෞතුකාගාරයේ වටිනා පුරා වස්තු සොරකම් කරන කොට, මේ "ජන රංජනලා", මේ "පිළිවෙතින් පෙළ ගැසෙන" කට්ටිය නිහඬයි. මෙයයි අපට තිබෙන ප්‍රශ්නය.

මම අවසාන වශයෙන් ඉල්ලා සිටින්නේ මේකයි. මේවා අපේ ජාතික උරුම; මේවා අපේ අනාගත පරපුරට අයත් විය යුතු උරුම. ඒ නිසා අපි විපක්ෂය හැටියට ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, දැන්වත් කරුණාකරලා මේවාට වග කිව යුත්තන්ගේ නම් ඉදිරිපත් කරන්න, මේ හොරකම්, වංචා කරන දේශපාලනඥයෝ නීතියේ රැහැනට ගෙන දෙන්න කියලා. එහෙම නැත්නම් මේ රටේ ජනතාව එදා විලච්චියේදී උගන්වපු පාඩම වාගේ පාඩමක් මේ ආණ්ඩුවටත් උගන්වයි කියන එක ප්‍රකාශ කරමින්, ඒ අභියෝගය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ වෙලාවක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට මිනිත්තු නවයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මිනිත්තු නවයයිද තිබෙන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්. මිනිත්තුවක් අඩුවෙන් කථාව අවසන් කරන්න. වෙන කවුරු හරි ගරු මන්ත්‍රීතුමෙක් ඔබතුමාට වෙලාව දෙනවා නම් කමක් නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට කථා කරන්න වෙලාව දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member).
කොපමණ වෙලාවක්ද ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි? හොඳයි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරගෙන යන්නකෝ. එතකොට බලමු.

[අ.භා. 4.31]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ සිද්ධ වන පුරාවස්තු කොල්ල කෑම් සහ කඩා බිඳ දැමීම් පිළිබඳවයි මේ විවාදය අද මේ පාර්ලිමේන්තුවේ පවත්වන්නේ. අපේ රටේ පුරාවස්තු කියලා කියන්නේ වර්තමානයේ ජීවත් වන පරපුරකට හෝ පුද්ගලයකුට හෝ අයිති දේ නොවෙයි. ඒවා අපේ රටේ ඉතිහාසයේ ගොඩ නැංවීම පිළිබඳව, ඉතිහාසයේ ගමන් මඟ පිළිබඳව වර්තමානයටත්, අනාගතයටත් පෙන්නුම් කරන පිළිබිඹුවේ දර්ශක. අපි කියනවා අපට අවුරුදු 2,500ක ප්‍රෞඪ ඉතිහාසයක් තිබෙනවා කියලා. ඒ ඉතිහාසය කවර ආකාරයේ ඉතිහාසයක්ද කියන එක පිළිබඳව වර්තමාන සමාජයට පෙන්නුම් කරන දර්ශකයක් බවට පත් වන්නේ ඒ ඉතිහාසයේ තිබෙන පුරාවස්තුයි. එදා අපේ තාක්ෂණය කවර ආකාරයෙන් වර්ධනය වී තිබුණාද, අපේ විද්‍යාවේ සොයා ගැනීම් කවර ස්ථානයක තිබුණාද, අපේ කලා නිර්මාණ කවර ස්ථානයක තිබුණාද, ඒ සමාජය කවර ආකාරයේ සමාජ ගති පැවතුම්වලින් සමන්විත සමාජයක් වුණාද, ඒ අය මැටි වළඳේ ඉව්වාද, ඒ අය ඇලුමිනියම් වළඳේ ඉව්වාද, ඒ අය කැලෑවේ ජීවත් වුණාද, ඒ අය ගල් ගුහාවේ ජීවත් වුණාද කියන මේ කවර ආකාරයේ දෙයක් වුවත්, අපේ ඉතිහාසයේ සමාජ ස්වභාවය පෙන්නුම් කරන ඉතාම වැදගත් දර්ශක තමයි පුරාවස්තු.

දැනට අපේ රටේ පුරාවස්තු සහිත ස්ථාන 2,75,000ක් පමණ තිබෙනවාය කියලා වාර්තා වී තිබෙනවා. ලොව පුරාවස්තු තිබෙන ප්‍රධාන රටවල් දහය අතරින් එකක් බවට අපේ රට පත් වී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වර්ග කිලෝමීටරයක් ඇතුළත පුරාවස්තු සහිත ස්ථාන හයක් තිබෙනවාය කියලා වාර්තා වී තිබෙනවා.

අපේ ඉතිහාසය ගොඩ නැංවීමේදී ඒ ඓතිහාසික තත්ත්වයන් මැනවින් නිරූපණය කරන අවස්ථාවන් තමයි මේ තිබෙන්නේ. එය රැක බලා ගැනීම, එය සංරක්ෂණය කිරීම, එය අනාගත පරම්පරාවට ආරක්ෂා කර තැබීම වර්තමාන අපේ වගකීමයි. නමුත් අද සිද්ධ වෙමින් තිබෙන්නේ කුමක්ද? ඉතාමත් අහිතකර පන්නයේ, ඉතාමත් ඛේදනීය ඉරණමකට මේ අවස්ථාවේ අප මුහුණ දී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝ අවස්ථාවන්වල නිදන් හෑරීම සිදු වී තිබෙනවා. හැබැයි ප්‍රධාන කරුණ බවට පත් වෙන්නේ අද මූලික ලෙස රාජ්‍ය මැදිහත් වී රාජ්‍ය අනුග්‍රහය, රාජ්‍ය රැකවරණය, රාජ්‍ය වුවමනාවන් මත ඒ කටයුත්ත සිදු කිරීමයි. ඒ තමයි මෙහි බරපතළම කරුණ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහේ හරි නිධානයක් සාමාන්‍ය පිරිසක් කඩා දැමීමට වඩා අද බරපතළ වී තිබෙන්නේ රජයේ ප්‍රධාන ස්ථානයන්ගෙන් මෙහෙය වන ක්‍රියාවලියක් බවට මේ තත්ත්වය පත් වී තිබීමයි. එයට පළ වී තිබෙන්නේ මිථ්‍යා මතයි. දුටුගැමුණු රජ්ජුරුවන්ගේ කඩුව ලබා ගැනීමෙන් ජීවිතාන්තය දක්වා රජකමේ ඉන්න පුළුවන්, ඔහුගේ ඔටුන්න සොයා ගැනීම තමන්ට මහඟු ඵල ලබා දෙනවාය කියන මිථ්‍යා මතයි. ඒ මිථ්‍යා මත පිළිගන්නා ප්‍රධානියෙක් අපේ රටේ ඉන්න කොට සිදු වී තිබෙන විනාශයේ තරම තමයි මේ. ඒ නිසා ශාස්ත්‍රකාරයන් මත යැපෙන, රටේ තිබෙන ස්වභාවයන් පිළිබඳව තේරුම් ගන්නවාට වඩා ග්‍රහ වස්තු කැරකෙන විධිය, රාහු පිහිටන විධිය ගැන කල්පනා කරමින් තීන්දු තීරණ ගන්න අය පාලකයන් බවට පත් වුණාම තමයි මේ ඉරණමට මුහුණ දීලා තිබෙන්නේ.

අද මොකක්ද සිද්ධ වෙමින් තිබෙන්නේ? එක පැත්තකින් ප්‍රාදේශීය වශයෙන් මේ කොල්ලකෑම සිද්ධ වනවා. එයට ප්‍රාදේශීය වශයෙන් ඉන්න පොලිස් නිලධාරින් හවුල් වී තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

ප්‍රාදේශීය වශයෙන් සිටින දේශපාලකයින් හවුල් වී සිටිනවා. ඔවුන් සමහර විට අත් අඩංගුවට පත් වෙලා තිබෙනවා. සමහර විට විධිමත් පරීක්ෂණ සිදු කෙරෙමින් තිබෙනවා. එය එක වර්ගයක කොල්ලකෑමක්. තව කොල්ලකෑමක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පැහැදිලි ලෙසම ආණ්ඩුව සෘජුව මැදිහත් වී, ඔවුන් ආරක්ෂා කරමින් ඒ සඳහා රැකවරණය ලබා දෙමින් කටයුතු කරන මෙහෙයුමක් තිබෙනවා. ඒ මෙහෙයුම තමයි විලච්චියේදී හෙළිදරව් වුණේ. දැන් මේ පාර්ලිමේන්තුවේදී ඒවා පැහැදිලි කරන්න. විලච්චියේදී STF හට කණ්ඩායමක් බැකෝ යන්ත්‍ර රැගෙන රජයෙන් තමන්ට ලබා දී තිබෙන ගිනි අවි රැගෙන, රජයෙන් තමන්ට ලබා දී තිබෙන වාහන රැගෙන -ඒ සියල්ල රැගෙන- ඔවුන් ඒ බිම කරා යනවා. ඒ ගමමුන් ඔවුන් අත් අඩංගුවට ගන්නවා. ඒ නිසා පොලීසියට සැබැවින්ම ඒ කොල්ලකරුවන් ගැන සෙවීමට පරීක්ෂණයක් කිරීමේ වුවමනාවක් තිබුණා නම් - බැකෝ යන්ත්‍රය තිබුණා. මල් වඩම් තිබුණා. අනිකුත් බලිතොවිල්වලට ගන්න උපකරණ තිබුණා. ඒ වාගේම STF නිලධාරින් හිටියා. ගමමු අතට අල්ලා ගෙන තිබුණා.- පරීක්ෂණයක් කළ යුතුව තිබුණා. හැබැයි ඒ පරීක්ෂණ මුළුමනින්ම යට ගැහුවා. යට ගහලා පොලීසිය මැදිහත් වුණේ ඒ නිදන් කොල්ලකෑමට හවුල් වුණු නිලධාරින් අත් අඩංගුවට ගැනීමේ දිශාවෙන් නොවෙයි, ඔවුන් මුදවා ගැනීමේ දිශාවෙනුයි.

අනුරාධපුර සහකාර පොලිස් අධිකාරවරයාගේ සිට සියලු දෙනාම මැදිහත් වුණේ ඒ මහා නිදන් කොල්ලකරුවන් අත් අඩංගුවට ගැනීමේ දිශාවෙන් නොවෙයි, ඔවුන් මුදවා ගැනීමේ දිශාවෙන්. එහෙම වෙන්නේ කොහොමද? තමන්ගේ ඇස් පනා පිට භාණ්ඩ සහිතව, සාක්ෂි සහිතව එළිදරව් වෙලා තිබෙන කොට, පොලීසියේ ප්‍රධාන නිලධාරින් මැදිහත් වුණේ ඔවුන් නිදහස් කිරීමේ අරමුණින් නම්; ඔවුන් මුදවා ගැනීමේ අරමුණින් නම් එයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි. මේ සඳහා රාජ්‍ය මැදිහත්වීමක් තිබෙනවාය කියන එකයි. ඒක තමයි මේකේ තිබෙන බරපතළම තත්ත්වය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ විතරක් නොවෙයි, පසුව මෙය යට ගැසීමට දරපු ප්‍රයත්නය මොකක්ද? පොලිස්පතිවරයාව මේ සඳහා උපයෝගී කර ගත්තා. පොලිස්පතිවරයා නිවේදනයක් නිකුත් කරලා කියනවා, ඔහු තමයි නියෝගය දුන්නේ කියලා. පොලිස් මූලස්ථානයට පැමිණිල්ලක් ආවා; ඒ පැමිණිල්ල අනුව නියෝගයක් දුන්නා; ඒ නියෝගය අනුව STF නිලධාරින් එතැනට ගියාය කියලා. මෙය පිළි ගන්න කියලාද මේ පාර්ලිමේන්තුවට කියන්නේ? තමුන්නාන්සේලා කියන්නේ පොලිස්පතිවරයා කියපු ප්‍රකාශය මේ පාර්ලිමේන්තුව පිළිගන්න කියලාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා මෙය පාර්ලිමේන්තුවට එළිදරව් කරන්න. පොලිස් මූලස්ථානයට පැමිණිල්ල ඉදිරිපත් කළේ කවුද, කොයි වෙලාවේද, සටහන් කර ගත්ත පුද්ගලයා කවරෙක්ද කියලා පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන්න. නියෝගය ලබා දුන්නේ කවුද, පොලිස්පතිවරයා විසින් නියෝගය ලබා දුන්නේ කවර නිලධාරියාටද, ඔහු මෙහෙයුමට නියෝගය ලබා දුන්නේ කවුරු වෙනුවෙන්ද කියලා පැහැදිලි කරන්න. මෙය පොලිස් මූලස්ථානයට ආපු නිර්නාමික පැමිණිල්ලක්ලු. ඒ පැමිණිල්ලට අනුව පොලිස්පතිවරයා නියෝග දුන්නාලු. ඒ නියෝගය STF එක හරහා ක්‍රියාත්මක කළාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකටද අනුරාධපුර පොලීසියක්? මොකටද විලච්චියේ පොලීසියක්? පොලිස්පතිවරයාට තමන්ගේ විලච්චිය පොලීසිය සැකද? පොලිස්පතිවරයාට තමන්ගේ අනුරාධපුරයේ පොලීසිය සැකද? පොලිස්පතිවරයාට තිබුණේ තමන් සතුව තිබුණු STF නිලධාරින් විතරක් යොදවන්න. කවුද මේ පැමිණිල්ල ඉදිරිපත් කළේ? මහා දවල් නිදන් කොල්ලකෑමකට එළිදරව් වුණු තමන්ගේ ගජ මිතුරන් වසා ගැනීම සඳහා තමයි පොලිස්පතිවරයාට ඒ නිවේදනය නිකුත් කරන්න සිද්ධ වුණේ. ඒ නිසා අද තමුන්නාන්සේලා මේ විලච්චියේ මහා නිදන් කොල්ලය වසා ගැනීම සඳහා පොලිස්පතිවරයා උපයෝගී කර ගන්නවා.

ඒක කරන්නට පුළුවන්ද, සාමාන්‍ය පුරවැසියෙකුට? ඒක කරන්නට පුළුවන්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට? ඒක කරන්නට පුළුවන් ද, සාමාන්‍ය ඇමතිවරයෙකුට? රටේ සිද්ධ වෙච්ච මහා නිදන් කොල්ලයක් වසා ගැනීම සඳහා පොලිස්පතිවරයා නිවේදන නිකුත් කරන තැනට පත් කරන්ට පුළුවන් වන්නේ කාටද? එය කරන්නට පුළුවන් වන්නේ ආරක්ෂක ඇමතිවරයෙකුට විතරයි. වෙන කිසිදු අමාත්‍යවරයෙකුට ඒක කරන්නට බැහැ. වෙන කිසිදු නිලධාරියෙකුට ඒක කරන්නට බැහැ. එම නිසා හරි පැහැදිලියි. මෙය පොලිස්පතිවරයා හරහා ඒ නිදන් කොල්ලය වසා ගැනීම සඳහා කළ නග්න උත්සාහයක්. නිරුවත් උත්සාහයක්. එම උත්සාහයෙන් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි. මෙම නිදන් කොල්ලය පිටුපස රාජ්‍ය හස්තය තිබෙන බවයි. ඒක නොවෙයි ද? එම නිසා මොකක්ද අද සිදු වී තිබෙන ඛේදවාචකය? රටේ මහා පෞරාණික උරුමයන් බවට පත් වූ අපේ අනාගතයට ආරක්ෂා කර රැකබලා දිය යුතු බුදු පිළිම වහන්සේලා විශාල ලෙස විනාශයට පත් කරමින් තිබෙනවා. දාගැබ් පුපුරවමින් තිබෙනවා. ඒ වාගේම ඓතිහාසික ස්ථාන ගල් බෝර දමා පුපුරවමින් තිබෙනවා. මෙවැනි ඛේදවාචකයකින් අපේ ඓතිහාසික උරුමයන් විනාශයට පත් කරමින් තිබෙනවා. එම විනාශයේ මෙහෙයුම බවට රාජ්‍යය ප්‍රධාන හස්තය බවට පත් වී තිබෙනවා. මේක ඛේදවාචකයක් නොවෙයි ද? මා දන්නේ නැහැ, මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඇමතිවරුන්ට මේ පිළිබඳව පිළිතුරක් ලබා දිය හැකිද කියා; ඇත්තටම ඔවුන්ගේ හෘදය සාක්ෂියට එකඟව. තමුන්නාන්සේලාගේ ඇත්ත හෘද සාක්ෂියට එකඟව කියන්න. විලච්චියේ STF නිලධාරින් මෙහෙය වූයේ කවුද? ඒ සඳහා අණ දුන්නේ කවුද? ඔවුන් කුමක් සොයමින්ද එහාට ගියේ? කඩුව සොයා ගෙන ගියාද ඔටුන්න සොයා ගෙන ගියාද කියා මේ පාර්ලිමේන්තුවට කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අද ඇති වී තිබෙන ඛේදවාචකය ගැන බලන විට, සාමාන්‍යයෙන් අපේ ගම්වල සාකච්ඡා යනවා, මේ පිටුපස ආණ්ඩුව ඇති කියා. දැන් බලනකොට ඒවා ඇත්ත. ඒවා පළමුවෙන් තිබුණේ කට කතා විධියටයි. රජය මේ පිටුපස ඉඳගෙන යමක් කරනවා ඇතැයි කියා කට කතා තිබුණා. හැබැයි අද සිදුවීම්වලින් පෙන්නුම් කරන්නේ මොකක්ද? සුදු වෑන් පිළිබඳ කට කතාවක් තිබුණා, මේවා ආණ්ඩුව මැදිහත් වීමෙන් හමුදා කණ්ඩ යොදා ගනිමින් මෙහෙයවනවා ඇති කියලා. ඒක කොළොන්නාවේදී එළිදරව් වුණා. ඒ වාගේම සාමාන්‍ය ජනතාව අතර කතාබහක් තිබුණා, මේ නිදන් හෑරීම පිළිබඳව රාජ්‍ය හස්තය තිබෙනවාය කියා; රජය මැදිහත් වෙනවාය කියා; ඔටුනු හොයනවාය කියා; කඩු හොයනවාය කියා. විලච්චියේ සිද්ධියේදී ඒක පැහැදිලි වුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිටුපස මුළුමනින්ම රාජ්‍ය මැදිහත් වීම, පෞරාණික උරුමයන් සහිත, වටිනාකම් සහිත පුරාවස්තු විනාශ කරමින් ඒවා කඩා බිඳ දමමින් තමන්ගේ බලය ලබා ගැනීමේ, බලය පවත්වා ගැනීමේ, බලය ආරක්ෂා කර ගැනීමේ මහා නග්න වුවමනාවන් වෙනුවෙන් පෙනී සිටින බව. එය ඔප්පු වී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ජාතික කෞතුකාගාරයෙන් පෙන්නුම් කළේ කුමක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ යමක් ආරක්ෂා කර ගන්නට ඕනෑ නම් නිතැතින්ම ආපු ජනවහර තමයි කටු ගෙයි තැබුවා නම් එය රැක ගන්න පුළුවන්ය කියන එක; කටු ගෙයි තිබෙන දෙයක් බලා ගන්න පුළුවන්ය කියන එක.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසාන වෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා අවසන් කරන්නම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, give him five more minutes.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Then, we will have to reduce time from other speakers.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
It is okay.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Anura Dissanayake was originally given 10 minutes.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ජාතික කෞතුකාගාරය තමයි, අපේ රටේ යමක් ආරක්ෂා කර ගැනීම පිළිබඳව රට තුළ ජන වහරේ ප්‍රකාශයට පත් වෙලා තිබුණු ඉතාමත් වැදගත් ස්ථානය. ඒ නිසා තමයි යමක් ආරක්ෂා කර ගැනීම සඳහා කටු ගෙයි තිබ්බොත් හොඳයි කියා කියන්නේ. යමක් බලා ගන්න නම් කටු ගෙයි තිබ්බොත් හොඳයි කියා කියන්නේ. යමක ඓතිහාසික වටිනාකමක් තිබෙනවා නම් ඒක කටු ගෙයි තැබුවා නම් හොඳයි කියා කියන්නේ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මොකක් ද සිද්ධ වෙලා තිබෙන්නේ? කටු ගෙයි තුළ තිබුණු කඩු කිහිපයක් සහ මුදු කිහිපයක් ඇතුළු වටිනා පෞරාණික උරුමයන් විනාශ වී තිබෙනවා. මා දන්නේ නැහැ, දැන් ඒ මුද්ද තිබෙන්නේ කොයි ඇඟිල්ලේද කියා. ඒක මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. අප අයාචනයක් කරනවා. කටු ගෙයින් අර ගෙන ගිය කඩුවලින් අවශ්‍ය කඩුව තබා ගෙන අඩුම තරමින් ඉතිරි කඩු ටිකවත් ගෙනැල්ලා තියන්න. මේ එක කඩුවක් හොයන්න රටේ කටු ගෙයත් විනාශ කරනවා. රටේ පුරාවස්තුත් විනාශ කරනවා. රටේ පෞරාණික ස්ථානත් විනාශ කරනවා. අඩුම තරමින් අවශ්‍ය කඩුව හම්බ වුණා නම් ඒ කඩුව තබා ගෙන ඉතිරි කඩු ටික කටු ගෙයට එවන්න. ඒක අඩුම තරමින් අනාගත පරම්පරාව වෙනුවෙන් කළ යුතු කාර්ය භාරයක්.

දැන් මොකක් ද සිද්ධ වෙලා තිබෙන්නේ? ජාතික කෞතුකාගාරයේ කැමරා පද්ධතියක් තිබෙනවා. ඒක පැය 24ම ක්‍රියාත්මක කරන කැමරා පද්ධතියක්. ඒ අදාළ දින දෙකේ පමණක් එම කැමරා පද්ධතිය අක්‍රීය බවට පත් වෙනවා. කොහොමද එහෙම වන්නේ? ඒ කැමරා පද්ධතිය අක්‍රිය වන්නේ කොහොමද? දැන් කියනවා, ඒකට පොලිස් ආරක්ෂාව තිබුණේ නැහැ කියා. හැබැයි තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ ආරක්ෂක සේවයක් තිබුණා. ඔවුන් ඒක දිවා රාත්‍රී මුර කරමින් තිබුණා. හැබැයි ස්ථානය සොයා ගත්තේ කොහොමද? මෙතැනම බඩු තිබෙන බව දන්නේ කොහොමද? එතැනම කඩු තිබෙන බව දන්නේ කොහොම ද? එතැනටත් පැනලා අර ගෙන යන්නේ කොහොම ද? මේවා නිකම් වන්නට පුළුවන්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේවා ඇලඩින්ගේ පුදුම පහන හම්බ වුණා වාගේ කාට හරි ගිහින් උඩින් බැහැලා; වහලෙන් බැහැලා නින්ජාවරුන් පනින්නා වාගේ කරන්නට පුළුවන් වැඩ නොවෙයි. මේවා කෞතුකාගාරයේ තිබෙන ස්ථාන හොයා ගෙන අදාළ පඩි පෙළෙන් නැඟලා, අදාළ ස්ථානයට ගිහින්, ඒ කඩු ටික තෝරා ගෙන, ඒ කඩු ටික තමන්ගේ පෙට්ටියේ හෝ තමන් ගෙන ගිය බෑග් එකේ අහුරා ගෙන, නැවත ගෙනැල්ලා වාහනයක නැගලා යන්නට පුළුවන් වන්නේ කොහොමද? මොකක්ද තමුන්නාන්සේලාගේ ජාතික කෞතුකාගාරයට දී තිබුණු ආරක්ෂාව? එතැන ආරක්ෂාව මදිකමද තිබෙන්නේ? ආරක්ෂාව මදිකම නොවෙයි එතැන තිබෙන්නේ. ආරක්ෂාවට වඩා ඉහළින් යන බලයක් ක්‍රියාත්මක වුණා එතැනට.

ඒ බලය විසින් තමයි මේ සියල්ල කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ ඇති වී තිබෙන්නේ මහා ව්‍යසනයක්. එක පැත්තකින් ප්‍රාදේශීය වශයෙන් සිදු වන නිධන් කොල්ලකෑම් තිබෙනවා. ඒකට පොලීසියේ මහත්වරුන් ක්‍රියාත්මක වෙන අවස්ථාත් තිබෙනවා. ඒක වෙනම ප්‍රශ්නයක්. හැබැයි අද වැදගත්කම තිබෙන්නේ ඒක නොවෙයි. එල්ලාවල හාමුදුරුවෝ සමහරවිට කියන්නට ඇත්තේ ඔය තැනින් තැන සිදු වුණු කොල්ලකෑම්, කඩා වැටීම් ගැන වෙන්න ඇති. ඒක නොවෙයි ප්‍රශ්නය. ඒවාත් ප්‍රශ්න තමයි. නමුත් ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? අද රුදුරුතම රාජ්‍ය හස්තය මේවාට මැදිහත් වනවා. රජ කඩු පිපාසයෙන්, රජ ඔටුනු පිපාසයෙන්, රජ සිහසුනු පිපාසයෙන්, මුළු රටක ඓතිහාසික උරුමය විනාශ කරමින්, වනසමින් ඉදිරියට යනවා. මේක අපේ මේ පාර්ලිමේන්තුවට අනුමත කළ හැකිද? මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ අණ පනත් සම්මත කිරීමට පමණක්ම නොවෙයි. අප රටේ ඓතිහාසික උරුමයන් පිළිබඳව ඇගැයීම් කරන්නට, ඓතිහාසික උරුමයන් ආරක්ෂා කර ගැනීම පිළිබඳ වග කීමක්, ඒ ඓතිහාසික උරුමයන්ගේ තිබෙන ඉතාමත්ම වටිනාකම් අපේ අනාගත පරම්පරාවට රැක බලා දීමේ වගකීමක් මේ පාර්ලිමේන්තුවට තිබෙනවා. හැබැයි, මේ පාර්ලිමේන්තුව තුළ ඇස්පනාපිටම අප කාටත් ඔප්පු වෙමින් යනවා, මේ කඩු සොයා ගෙන යන පිපාසය, සිහසුන් සොයා ගෙන යන පිපාසය, ඔටුනු සොයා ගෙන යන පිපාසය පිළිබඳව. අපේ රටේ මුළු මහත් ප්‍රෞඪ ඉතිහාසයක් විනාශ කරමින්, අපේ රටේ නීති සම්ප්‍රදායන් උල්ලංඝනය කරමින්, අපේ රටේ පොලීසිය ඒ සඳහා යොදා ගනිමින්, පොලිස්පතිවරයා හරහා නග්න ලෙස - නිරුවත් ලෙස - ඒවා අරක්ෂා කර ගැනීමට දරන ප්‍රයත්නයන් තුළින් මොකක්ද පෙන්නුම් කරලා තිබෙන්නේ?

එක පැත්තකින් අපේ රටේ ඓතිහාසික උරුමයන් විනාශ වනවා. අනෙක් පැත්තෙන් STF එකට යම් ගරුත්වයක් තිබුණා නම්, ඒ ගරුත්වය විනාශ වෙනවා. අනෙක් පැත්තෙන් පොලිස්පතිවරයා වෙත යම් ගරුත්වයක් තිබුණා නම්, ඒ ගරුත්වය විනාශ වනවා, මේ එක පුද්ගලයකු, දෙදෙනෙකුගේ තිබෙන බල තණ්හාව, තමන්ට තිබෙන වුවමනාව, තමන්ට බලය පිළිබඳ තිබෙන ගිජුකම, බලයේ සිටීම සඳහා තිබෙන කෑදරකම නිසා. ඒක සාස්තරකරුවෙක් කළාද, ග්‍රහලෝක තාරකාවක් විසින් කළාද, ඒක ඇත ඓතිහාසික උරුමයක් විසින් කළාද, කවර දෙයක් විසින් කළා හරි කමක් නැහැ, තමන්ගේ බලයෙන් වැජඹීමට තිබෙන කෑදරකම තමයි මේ විනාශය අත්පත් කරලා දීලා තිබෙන්නේ. ඒ නිසා අද අපි පාර්ලිමේන්තුව ලෙසත් මේ විනාශයට විරුද්ධ විය යුතුයි.

[ගරු අනුර දිසානායක මහතා]

මේවා මිථ්‍යා මත. අපි ඒවා පිළිගන්නේ නැහැ. ඒවා පිළිගත යුතු දේවල් නොවෙයි. ඔටුන්න ලැබුණාට රජකමේ ඉන්න බැහැ. කඩුව ලැබුණාට රජකමේ ඉන්න බැහැ. ඒ කඩුව හමු වීමෙන්; ඔටුන්න හමු වීමෙන් තමන්ගේ රජකම ආරක්ෂා කර ගන්නට පුළුවන් කියලා කියනවා නම්, ඒවා මිථ්‍යා මත. හැබැයි, මිථ්‍යා මත විශ්වාස කරන පාලකයන් රටේ නායකයන් වුණාම රටකට සිදු වන අනිසි විපාක තමයි අපි අත්විඳිමින් සිටින්නේ. ඒ නිසා මේ තත්ත්වයට එරෙහිව පාර්ලිමේන්තුව හඬ නැඟිය යුතුයි. මේ රටේ ජනතාවගේ ඓතිහාසික උරුමයයි මේ විනාශ කරමින් තිබෙන්නේ. මේ රටේ ජනතාවට තමන්ගේ පෞරාණික උරුමයයි මේ විනාශ කරමින් තිබෙන්නේ. අපේ රටේ ඈත අතීතය කවර ආකාරයකින්ද තිබුණේ? ඒ සමාජ ගොඩ නැංවීම කවර ආකාරයකින්ද තිබුණේ? එහි තාක්ෂණය කුමක්ද? එහි විද්‍යාව කුමක්ද? එහි කලා රසය කුමක්ද? එහි සංස්කෘතිය කුමක්ද? එය ගොඩනැඟුණේ කවර ආකාරයකින්ද කියනවා නම්, අපේ ලංකාවේ මිනිස් ශිෂ්ටාචාරය ගොඩනැඟුණු පදනම මත අපි පය තබා ගත් මිනිස්සු. ඒ පදනම මත කෙලින් හිටගත් මිනිස්සු. ඒ මිනිසුන් හැටියට අපට වගකීමක් තිබෙනවා ඒ අයිතිය ආරක්ෂා කරන්න; ඒ වගකීම ආරක්ෂා කරන්න. ඒ වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව හඬ නැඟිය යුතුයි. ඒ වෙනුවෙන් මේ රටේ ජනතාව හඬ නැඟිය යුතුයි. ඒ සඳහා සියලු දෙනාට ආරාධනා කරමින් මා නතර වනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ. භා. 4.46]

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විශේෂයෙන් මේ කල්තැබීමේ යෝජනාව පිළිබඳ විවාදය අවස්ථාවේ දී සාකච්ඡාවට භාජනය වන මේ නිධන් හෑරීම සහ නිධන් කොල්ලය පිළිබඳව විවිධ අර්ථ කථනයන් විපක්ෂය විසින් ඉදිරිපත් කරනවා මා දැක්කා. ඒ වාගේම ජන මාධ්‍යවල විවිධ ලෙස මේ කොල්ලකෑම් පිළිබඳව සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා මේ යුගයේ විශේෂයෙන්ම මේ පිළිබඳ විවිධ යෝජනාවන්, ඒ වාගේම සාකච්ඡා සභාවන්, විවිධ අදහස් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේක රට පුරාම එක කණ්ඩායමක් විසින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්ත වශයෙන්ම මෙය මිථ්‍යාවක්.

මේ නිධන් පිළිබඳව මහනුවර යුගයේ ලියැවුණු එක වාර්තාවක් තමයි, මේ නිධන් වදුල. ඒක මහනුවර යුගයේ සාහිත්‍ය කෘත්‍යයක් ලෙස විවිධ අර්ථ දැක්වීම් සහිතව ලියලා තිබෙන එකක්. එහි දක්වා තිබෙන අර්ථ කථනයන්වල කිසිම ඇත්ත තත්ත්වයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා, නොමඟ යැවීමට විවිධ අර්ථ දැක්වීම් සඳහා යොදා තිබෙන දේවල්. ඇතෙක් බරට වස්තුව ගැන, එහෙම නැත්නම් වෙනත් මේ මේ ප්‍රමාණයේ දේවල් තිබෙනවා කියලා එහි සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම අනුරාධපුර යුගයේ ඉඳලා මහනුවර යුගය දක්වා රාජ්‍ය යුගයන්වල රජවරුන් තමන්ගේ සේවාවන් කරපු අයට, ප්‍රභූවරුන්ට, සේනා විධායක නායකයින්ට විවිධ ගම්වර ලබා දුන්නා. ඒ ගම්වර ලබා දීමේ දී ඒ පිළිබඳ විවිධ සංකේත යොදා ගත්තා. ඒ සංකේතය සමහර විට සතෙකුගේ සංකේතයක් වන්නට පුළුවන්, එහෙම නැත්නම් ඉර හඳ පිළිබඳ සංකේතයක්, එහෙම නැත්නම් ඊතලයක සංකේතයක්, හඳේ සංකේතයක්, දිසාව නම් කිරීම පිළිබඳ සංකේතයක් වන්නට පුළුවන්. ගම්වර ලෙස ලබා දෙන්නට ඒ සංකේත කොටලා පාවිච්චි කළාම, මේ නිධන් වදුලේ අභවල් සංකේතයෙන් දක්වන්නේ අභවල් දෙයක්ය කියන එක අර්ථ දක්වමින් අපේ ප්‍රදේශවල විශාල වශයෙන් ඒ සලකුණු තිබෙන තැන් කඩලා තිබෙනවා. ඒ ලකුණු මත ගිනි මැළ ගහලා ඒ ලකුණු පුපුරවා හැර තිබෙනවා. ඒ තුළින් පුරා විද්‍යාත්මක සාධක විශාල වශයෙන් විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා මේ වන කොට ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය පාසල් දරුවාගේ ඉඳලා මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් යොදලා තිබීම පිළිබඳව අපි විශේෂයෙන් ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා විතරක් නොවෙයි, ඇත්ත වශයෙන්ම පුරා විද්‍යා ආඥා පනත යළි සංශෝධනය විය යුතුයි කියලා ප්‍රකාශ කරනවා. පුරා විද්‍යා වටිනාකමක් ඇති දේවල් විනාශ කරන අයට දඬුවම් ලබා දීම සඳහා පුරා විද්‍යා පනතේ තිබෙන යම් යම් කාරණා ප්‍රබල මදි. ඒ නිසා පාර්ලිමේන්තුවට වග කීමක් තිබෙනවා ඒ පනත සංශෝධනය කරන්න අවශ්‍ය කටයුතු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුරා විද්‍යාව ගැන කථා කරපු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් මම අහන්න කැමැතියි, එතුමන්ලා පුරා විද්‍යාව රැකීම පසු ගිය කාලයේ කරලා තිබෙනවාද කියලා. එතුමන්ලාගේ සිරිකොත කාර්යාලය -වෘත්තීය සමිති කාර්යාලය- හදලා තිබෙන්නේ කෝට්ටේ රාජධානියේ පාදම් මත. කෝට්ටේ රාජධානියේ පාදම් මත එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිති සම්මේලනය හදන කොට ප්‍රශ්නයක් නැහැ, පුරා විද්‍යාව රැකීම පිළිබඳ අනන්‍යතාව එතැන තිබෙනවා. අපි බැලුවා, කෝට්ටේ රාජධානියට අදාළ ඒ ලිපි ගොනුව. ඒකත් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අද නැහැ. ඒ ලිපි ගොනුව පවා පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් අස්ථාන ගත කරලා තිබෙනවා. අපිට ඒකෙන් පෙනෙනවා, එතුමන්ලාට පුරා විද්‍යාව ගැන කොච්චර හැඟීමක් තිබෙනවාද කියලා. එක්සත් ජාතික පක්ෂ යුගයේ තමයි කටුගෙයි තිබුණු ශ්‍රී වික්‍රම රාජසිංහ රජ්ජුරුවන්ගේ සිංහාසනය හොරකම් කළේ; ඔටුන්න හොරකම් කළේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ චෝදනා පිළිගන්නේ නැහැ. අසත්‍යයි.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ඔබතුමා කොහොමද කියන්නේ ඒ චෝදනා අසත්‍යයි කියලා. ඒ වාර්තා අපි ළඟ තිබෙනවා. අපි ඔබතුමාට කියන්නම් දින වකවානුත් එක්ක. [බාධා කිරීම්] රන් ආලේපිත සිංහාසනය, මැණික් ඔබ්බවපු ඔටුන්න හොරකම් කළා. දැන් කඩුවක් නැති වුණාම කෑ ගහනවා. සිංහාසනය කියන්නේ ඊට වඩා දැවැන්ත දෙයක්. [බාධා කිරීම්] ඉංග්‍රීසි ආණ්ඩුව කාලයේ අපේ ශිල්පීන් විසින් හදපු එකක්. ඒක රන් ආලේපිත, මැණික් ඔබ්බවපු සිංහාසනයක්. වටිනාකම කොච්චරද කියලා කියන්න බැහැ. [බාධා කිරීම්] ඒකේ ආර්ථික වටිනාකම නොවෙයි, පුරාවිද්‍යාත්මක වටිනාකම කොච්චරද කියලා කියන්න බැහැ. නමුත් ඒවා ගැන කථා කරන්නේ නැහැ. දැන් කඩුවක් ගැන කථා කරනවා. [බාධා කිරීම්] මගේ කාලය අවශ්‍යයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ චෝදනා හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න ඕනෑ.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

දැන් කඩුවක් ගැන කථා කර ගෙන යනවා. දැන් මේ කඩුව පිළිබඳ ප්‍රශ්නයේදී- [බාධා කිරීම්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, I rise to a point of Order.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ලංකා ඉතිහාසයේ දුටු ගැමුණු රජ්ජුරුවන්ගේ කඩුව ජය කොන්තයේ තියලා තමයි-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
He is making false statements, which should be expunged from Hansard.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! - [*Interruption.*]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
That is a very serious allegation. So, you have to expunge it from Hansard.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
If it is against the Standing Orders, yes. I thought he is only adducing an argument.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
අපි මේ සත්‍යය පිළිබඳව- [බාධා කිරීම්] ඉතිහාසය- [බාධා කිරීම්] අපි අරන් පෙන්වන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක්සත් ජාතික පක්ෂය පසු ගිය ජනාධිපතිවරණයේදිත් මේක කළා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොකක්ද කළේ?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ජනාධිපතිතුමාට සහ එතුමාගේ සහෝදරවරුන්ට කිව්වා, අහවල් ලොකුම වත්ත තිබෙන්නේ අහවලාටය. නගරයේ ලොකු ගෙයක් තිබුණා නම් ප්‍රචාරය කළා අහවලාට තමයි ඒ ගේ අයිතිය තිබෙන්නේ කියලා. ඉඩම් ගණනාවක් තිබුණා නම් අහවලාට තමයි ඒවායේ අයිතිය තිබෙන්නේ කියලා. ඒකට වෙනම කණ්ඩායමක් කට පාඩම් කරවලා බස් රථවල, කෝච්චිවල, පාරේ- [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාට අපහාස කරනවා.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
-පොළවල්වල යන හැම තැනම මේ කට කථා පැතිරවීමේ කුමන්ත්‍රණය ක්‍රියාත්මක කළා, එක්සත් ජාතික පක්ෂය ඇතුළු සමහර සංවිධාන.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා මේ මොනවාද කියන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
- [*Interruption.*] It must be understood properly.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාට මඩ ගැහීමේ ව්‍යාපාර කළා. සමීක්ෂණ තුළින් ආසියාවේ වැඩිම ජන ප්‍රසාදය තිබෙන නායකයා බවට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පත් වුණාම මේ අයට ප්‍රශ්නයක් තිබෙනවා. එතුමාට මේ රටේ ජනතාව හොඳම කඩුව භාර දීලා ඉවරයි. ඒ තමයි මේ රටේ රාජ්‍ය නායකත්වය. මේ රටේ විධායකය තමයි හොඳම කඩුව. ඒ කඩුව ලක්ෂ සංඛ්‍යාත ඡන්ද ප්‍රමාණයෙන් ජනතාව එතුමාට භාර දීලා තිබෙනවා. එතුමාට කඩුවක් අරගෙන තියා ගන්න ඕනෑකමක් නැහැ. මෙතුමන්ලා ව්‍යංගයෙන් කියන්නේ ඒක.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කවුද කිව්වේ?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
තමුන්නාන්සේලා විපක්ෂය හදා ගන්න. මේ දේශපාලන ව්‍යාපාරයේ ශක්තිමත් විපක්ෂයක් විධියට පවතින්න වැඩ කරන්න. නැත්නම් කඩුවක් පෙන්වලා, එහෙමත් නැත්නම් තවත් එකක් පෙන්වලා දේශපාලන මඩ ගැහීම නොවෙයි ජනතාවට යථාර්ථය පසක් කර දීමයි කළ යුත්තේ. ලෝකයේ සමීක්ෂණ කරන කණ්ඩායම්වල දත්ත අනුව වැඩිම ජන ප්‍රසාදයක් තිබෙන රාජ්‍ය නායකයා බවට ජනාධිපතිතුමා පත් වුණාම, දැන් මෙතුමන්ලාගේ අලුත්ම කතන්දරය තමයි දුටු ගැමුණු රජ්ජුරුවන්ගේ කඩුවක් හොයනවයි කියන එක. දුටු ගැමුණු රජ්ජුරුවන්ගේ කඩුව හොයනවයි කියලා තමුන්නාසේලා කියන දේ අපිට තේරෙනවා. දොරේ සද්දෙයි අනෙක් සද්දෙයි අපි හොඳට දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයේදී අපිට කියන්න තිබෙන්නේ, රාජ්‍ය නායකයා විධියට එතුමාට මඩ ගැහීමත්, එතුමාගේ පවුලේ සහෝදරයන්ට මඩ ගැහීමත් ක්‍රියාත්මක කිරීමේදී මේ වාගේ බාල තීන්දු අරගෙන, බාල කතන්දර පාවිච්චි කරන්න එපා කියන එකයි.

[ගරු ටී. බී. ඒකනායක මහතා]

ලෝකයේ වැඩිම පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන තිබෙන රට විධියට ලංකාව සැලකෙනවා. අනුරාධපුර යුගයේ ඉඳලා මේ දක්වාත්, ඉතිහාසය පුරාමත් චෛත්‍යයක් හැදූ හැම අවස්ථාවකදීම, බුදු මැදුරක් හැදූ හැම අවස්ථාවකදීම ගම්වල සිටින අපේ බෞද්ධ ජනතාව ගෙදර තිබුණු වටිනා දේවල් පරිත්‍යාග කළා. අදත් චෛත්‍යයක් හදන කොට අපි ගිහිල්ලා පුංචි කාසියක් දෙනවා, එහෙම නැත්නම් කරේ තිබෙන මාලය දෙනවා, එහෙම නැත්නම් වළල්ලක් දෙනවා, එහෙම නැත්නම් පුංචි කරඬුවක් දෙනවා ඒවායේ නිදන් කරන්න. ඒ කාලයේ සිටි ජනීජනයා තමන්ට පුළුවන් ආකාරයට ඒ කටයුතු කළා.

මේ වන විට අභයගිරිය චෛත්‍යයේ වැඩ ගොඩක් අවසන් කර තිබෙනවා. අභයගිරිය චෛත්‍ය ප්‍රතිසංස්කරණය කිරීමේදී එහි නිදන් කර තිබී අපට ඒ වාගේ වටිනා දේවල් විශාල ප්‍රමාණයක් හම්බ වුණා. අද අපි ඒවා ජනීජනයාට බලා ගැනීම සඳහා අභයගිරිය කෞතුකාගාරයේ තැන්පත් කර තිබෙනවා. මේ පරිත්‍යාගශීලිභාවයත් එක්ක අද යුගයේත් ඒක ක්‍රියාත්මක වෙනවා. චෛත්‍යයක් හදන්න ගියත්, වෙනත් පූජනීය ස්ථානයක් හදන්න ගියත් එහෙමයි.

"වෛජයන්ත තන්ත්‍රය" කියන පොතේ කඩු ගැන සම්පූර්ණ වශයෙන් පරිච්ඡේද 3ක් තිබෙනවා. කඩු ගැන දැන ගන්න අවශ්‍ය නම් තමුන්නාන්සේලාට ඒක කියවන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම කඩු ගැන ලිපියක් ලියලා තිබෙනවා. එම ලිපිය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම පිණිස **සභාගත*** කරනවා.

කඩු ගැන ඉගෙන ගැනීම සඳහායි මේ ලිපියත් හැන්සාඩ් එකට ඇතුළත් කරන්නේ. මොකද, කඩු පිළිබඳව මානසික ප්‍රශ්නයක් මේ දවස්වල තිබෙනවා. අර කඩුවයි, මේ කඩුවයි, සියලු කඩු ගැන අවබෝධයක් ලබා ගැනීම සඳහායි මම මේ කාරණය කියන්නේ.

මම උදාහරණයක් කියන්න කැමැතියි, නිධන් හාරන්න ගිහින් ගල්ගමුවේ පොලිස් ස්ථානාධිපතිතුමා අත් අඩංගුවට පත් වුණු බව. අද ඔහු මැගසින් බන්ධනාගාරයේ ඉන්නවා. ඒ වාගේ හමුදාවේ සමහර අය අහු වුණා; සමහර නිලධාරීන් අහු වුණා. ඒ අයට විරුද්ධව අද නීතිය ක්‍රියාත්මක කර තිබෙනවා. මම කියන්නේ මේ තිබෙන නීතිරීති මදියි කියලායි. පුරාවිද්‍යා ආඥාපනත සංශෝධනය කරමින් දඬුවම් ලබා දීම සඳහා අදාළ විධිවිධාන ක්‍රියාත්මක කරන්නත්, පාසල් දරුවාගේ සිට අනෙක් සියලු දෙනා මේ පිළිබඳව දැනුවත් කරන්නත් අපි කටයුතු කළ යුතුයි. ඒ වාගේම ආරක්ෂක අංශවල අය සමහර ඒවා පිළිබඳව, ඉතිහාසය පිළිබඳව, පුරාවිද්‍යාව පිළිබඳව හරියට දන්නේ නැහැ. දැන් මාධ්‍ය පාවිච්චි කරන විලාසය බලන්න. මාධ්‍යයේ ප්‍රවෘත්තියක් පළ වෙනවා, "ඝන රන් පිළිමයක් හමු විය" කියලා. ලංකාවේ ඝන රන් පිළිම තිබුණේ නැහැ. ලංකාවේ පිළිමයක් තිබුණා නම්, ඒක රන් ආලේපිත පිළිමයක් මිසක් ඝන රන් පිළිමයක් වන්නේ නැහැ. ඝන රන් පිළිම ලංකාවේ තිබුණේ නැහැ. නමුත් මාධ්‍යය කියනවා, මිල කළ නොහැකි ඝන රන් පිළිමයක්, මිල කළ නොහැකි භාණ්ඩ හමු වුණා කියලා. ඒවාට කෙළ හලන සමහරු ඉන්නවා. පොලිස් වාර්තාවලට අනුව එකම කණ්ඩායමක් තමයි ලංකාව පුරාම මෙම කොල්ල කෑම් සිදු කරන්නේ. අනුරාධපුරයට යන්නේත්, පොළොන්නරුවට යන්නේත්, දකුණට යන්නේත් එකම කණ්ඩායමක්.

ඉතිහාසයේ ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාටත් නිධන් කොල්ල කෑවා කියලා මඩ ප්‍රහාර එල්ල කළා. හැම රාජ්‍ය නායකයකුටම ඒ විධියට චෝදනා කළා. මේ අවස්ථාවේදී අපි කියන්න කැමැතියි, රාජ්‍ය නායකයින්ට, රටේ ප්‍රධානීන්ට නිධන් කොල්ල කෑම් පිළිබඳව විවිධ ප්‍රශ්න පසු ගිය ඉතිහාසයේ එල්ල වුණු බව.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
විලච්චිය සිද්ධිය පිළිබඳව මොකක්ද කියන්නේ?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
විලච්චිය සිද්ධිය පිළිබඳව දැන් පොලිස් පරීක්ෂණ පවත්වා ගෙන යනවා. [බාධා කිරීමක්] ඒ සිද්ධිය වාර්තා වුණු ගමන් ඒ පිළිබඳව සොයන්න පොලිස්පතිතුමා කෙළින්ම කණ්ඩායමක් යැව්වා. එහෙම කණ්ඩායමක් යැව්වාම ගමේ අය දැන ගත්තා එතැන මොකක් හරි තිබෙන්නට ඇති කියලා. ඒ නිසා තමයි ඒ ගැටුම ඇති වුණේ. ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ගෙන යනවා. ඒ පරීක්ෂණ පිළිබඳව ඇමතිතුමා පසු කාලීනව තමුන්නාන්සේලා සහ පාර්ලිමේන්තුව දැනුවත් කරයි. විපක්ෂයට වෙන මාතෘකාවක් නැති නිසා, ආණ්ඩුවට කියන්න වෙන දෙයක් නැති නිසා එක කාරණයක්, සිද්ධි වාචකයක් අල්ලා ගෙන දැන් සම්පූර්ණ මාතෘකාව විධියට පුවත් පත්වල, රූපවාහිනීවල නිධාන සහ කඩු ගැන ප්‍රචාරය කිරීමේ මහා සංග්‍රාමයක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. එහිදී මම කියන්න කැමැතියි, මේ වාගේ බාල ක්‍රියාවන් මේ වාගේ තේරුමක් නැති ක්‍රියාවන් සුදුසු නැහැ කියා.

අපි හැම තිස්සේම කියන එකක් තමයි, ලංකාව පුරාවිද්‍යා ක්ෂේම භූමියක්ය කියන එක. ලංකාවේ හැම ස්ථානයකම තිබෙන පුරාවස්තූන් පිළිබඳව, පුරාවිද්‍යා වටිනාකමක් තිබෙන දේවල් පිළිබඳව ගත්තාම, ඒවායේ මිල නොවෙයි වැදගත් වන්නේ. ඒවායේ තිබෙන පුරාවිද්‍යාත්මක වටිනාකම තමයි වැදගත් වන්නේ. පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් කිරි ගරුඬ ප්‍රතිමා හම්බ වෙනවා. ඒවා මිල කිරීම පිළිබඳව ලංකාවේ සංකේතයන් නැහැ. ඒ නිසා මේ මිථ්‍යාවට අහු වෙන්නේ නැතුව, මේ මායාවට අහු වෙන්නේ නැතුව යථාර්ථවාදීව ලංකා ඉතිහාසයේ අපේ උරුමය, අපේ ජන ජීවිතයේ උරුමය රැක ගත යුතු වෙනවා. අපි දන්නවා, ඉතිහාසයේ අපි ළඟ තිබුණු පුස් කොළ පොත් අති විශාල ප්‍රමාණයක් විදේශ රටවලට අරගෙන ගිය බව.

එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ දකුණු මුහුදු තීරුවේ ඉඩම් සුද්දන්ට මිල දී ගන්න අවසර ලබා දුන්නා. [බාධා කිරීමක්] දැන් තිබෙන්නේ ව්‍යාපෘති එක්ක ක්‍රියාත්මක වන වැඩසටහන්. ගාලු කොටුවෙන් දීලා තිබෙන ප්‍රමාණය දිහා බැලුවාම අපට තේරෙනවා, ගාලු කොටුව සම්පූර්ණයෙන්ම වෙනස් වුණාය, ගාලු උරුමය වෙනස් වුණාය කියා. ඉතිහාසයේ ලබා දුන් සියලු ඉඩකඩම් පිළිබඳ වාර්තා අපි ළඟ තිබෙනවා. ශ්‍රී ලංකා එකට, යූඑන්පී එකට, ජේවීපී එකට කියලා නැහැ, පුරාවිද්‍යාත්මක දේවල් අපි හැමෝටම උරුම දේවල්. ඒ නිසා ඒ උරුමය ආරක්ෂා කිරීම අපි හැම දෙනාගේම යුතුකමක්. ඒ නිසා මේ මිථ්‍යාවට යට වෙලා ඉන්න ජනතාව මිථ්‍යාවෙන් ගොඩ අරගෙන, මේ කියන විධියේ දෙයක් නැහැ, ඒක බොරුවක්ය කියන කාරණය පැහැදිලි කරමින් මේ රටේ පුරා වස්තු අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. එසේ ආරක්ෂා කිරීම සඳහා රජයක් විධියට අපට වගකීමක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ඒ වගකීම අනුව මේ සියලු දෙනාම දැනුවත් කිරීම සඳහාත්, නීතියේ තිබෙන අඩු පාඩුකම් හදා ගනිමින් නීතිය තවත් ශක්තිමත් කිරීම සඳහාත් අවශ්‍ය විධිවිධාන සකස් කළ යුතුව තිබෙනවා.

මේ දිනවල අපේ රටට අති විශාල සංචාරකයින් ප්‍රමාණයක් එනවා. ලංකාවට සංචාරකයින් තුන් දෙනෙක් ආවොත් එයින් දෙදෙනෙක් අපේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ මධ්‍යස්ථානවලට එන්නේ අපේ රටේ පුරා විද්‍යාත්මක වටිනාකම නිසායි. සීගිරිය, පොළොන්නරුව, අනුරාධපුර, මහනුවර, දඹුල්ල, රම්බා විහාරය ආදී මේ හැම තැනකටම ඒ සංචාරකයන් යන්නේ ඒ නිසායි. ඒ උරුමය තවත් ශක්තිමත් කිරීම සඳහා මේ වනකොට අපි ඒ

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

මධ්‍යස්ථාන තවත් දියුණු කරනවා. පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව ඒ මධ්‍යස්ථානවල සටහන් කර තිබෙනවා. අපේ රටේ තිබෙන පුරාවිද්‍යාත්මක නටබුන්වල වටිනාකම, අපේ සාහිත්‍යයේ, භාෂාවේ ගුණාත්මක අගය පිළිබඳව දැනුවත් කිරීමට අපි කටයුතු කරගෙන යනවා.

මේ දිනවල අපේ රටේ තිබෙන පුස්කොළ පොත් පිළිබඳ සමීක්ෂණයක් කරගෙන යනවා. ඒ වාගේම අපට මේ ළඟදී මාතලේ දිස්ත්‍රික්කයෙන් අතිවිශාල පුස්කොළ පොත් ප්‍රමාණයක් හම්බ වුණා. වයඹ පළාතෙනුත් අතිවිශාල පුස්කොළ පොත් ප්‍රමාණයක් හම්බ වුණා. ඒ අතර මහාවංශය, ජාතක කථා සංග්‍රහය චිත්‍රයට නගා ඇති පුස්කොළ පොත් පවා අපට හම්බ වුණා. අකුරු කියවන්න බැරි, අකුරු පිළිබඳ අවබෝධයක් නැති අයට චිත්‍රානුසාරයෙන් ජාතක කථා සංග්‍රහය පිළිබඳව අවබෝධයක් ලැබෙන විධියට, ඉතාමත්ම ගැඹුරු අර්ථ සරල ලෙස ජනතාවට කියා දෙන ක්‍රමවේදයක් ඒ තුළ ගැබ් වෙලා තිබුණා. ඒ වාගේම ඉතිහාසයේ අපේ පුස්කොළ පොත් සුද්දන්ට විකුණා තිබෙනවා. එංගලන්තයේ කෞතුකාගාරවල මේ වනකොටත් අපේ සම්පත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අන්තර්ජාතික සංස්කෘතික හුවමාරු වැඩසටහන් යටතේ ඒවා නැවත ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න මේ වනකොටත් අපි සාකච්ඡා කරගෙන යනවා. සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විධියට මම විශේෂයෙන් කියන්න කැමැතියි, මේ පිළිබඳව අපි හැමෝටම වගකීමක් තිබෙන බව. මේ පිළිබඳව ජනතාව තුළ තිබෙන අනවබෝධය වෙනස් කරමින්, මේ නිධාන පිළිබඳ කාරණය, කෞතුක වස්තු පිළිබඳ කාරණය, පුරා විද්‍යා සංරක්ෂණය පිළිබඳ කාරණය පැහැදිලි කරමින්, එහි යථාර්ථය ජනතාවට පැහැදිලි කරමින් අපේ උරුමය ආරක්ෂා කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න රජයක් විධියට අපි වගකීමෙන් කටයුතු කරනවාය කියන එක මම කියන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**** සභාමේසය මත තබන ලද ලිපිය:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Letter tabled:*

**කඩුව**

ටී.බී. ඒකනායක (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය)

මෙම දිනවල කඩු ගැන හැම තැන බොහෝ සෙයින් කතා බහ කරනු අසන්නට ලැබේ. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පසු ගිය දිනක කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබූ කඩු කිහිපයක් තවත් පුරාවස්තු ද සමඟ සොරා ගෙන තිබීම ය. පුරාතන හා මධ්‍යතන ලෝකයේ බොහෝ රටවල සටන් සඳහා යොදා ගත් ප්‍රධාන ආයුධවලින් එකක් වූ කඩුව, කඩුවෙන් සටන් කරන කාලය ඉවත් වී ගිය ද රජවරුන් හමුදා නායකයින් විශේෂ උත්සවවලදී පළඳින ආභරණයක් බවට පත් ව ඇත. පුරාණ දේ එකතු කරන්නන් විසින් කෞතුක භාණ්ඩවලට ඇති ලැදිකම නිසා කඩු එකතු කරන පිරිස් ද ලෝකයේ දක්නට ලැබේ. කඩුව ද එක් අතකින් අපේ සංස්කෘතික උරුමයක් වේ. අපේ වංශ කථාවල සඳහන් වන පරිදි අපටම ආවේණික සිංහල කඩු නමින් කඩු විශේෂයක් තිබූ බව මහා වංශයේ සඳහන් වන පොළොන්නරු යුගයේ මහ පැරකුම්බා රජු පිළිබඳ විස්තරයේ සඳහන් වේ.

පුරාණයේ මෙරට අවශ්‍යතා කිහිපයක් අනුව කඩු නිෂ්පාදනය වී ඇත. සටන් සඳහා යොදා ගත් කඩු මුවහත ඇතිව වානේවලින් නිපදවා ගත් අතර, පුරාණයේ ගැමියන් විසින් ද කඩු භාවිත කළ බව මහ පැරකුම්බා කුමරු දක්ඛිණ දේශයේ සිට රජ රටට පලා යන අවස්ථාවේ අලුයම කිසියම් ගැමියන් පිරිසක් කිසියම් කටයුත්තක් සඳහා කඩු අතැතිව ගමන් කරනු දක්නා ලද බව සඳහන් වීමෙන් පෙනේ. එසේම වංශ කථාවල සඳහන් වන මුහුණට මුහුණලා කෙරුණු සටන්වලදී වැඩි වශයෙන් සඳහන් වන්නේ කඩු සටන්ය. ක්‍රිස්තු වර්ෂ 10වන සියවසට අයත් සේ සැලකෙන අනුරාධපුර පුරාවිද්‍යා කටුගෙයි ප්‍රදර්ශනය වන වෙලනදමන වීරගල යැයි දැක්වෙන විශාල ශිලාමය කැටයමක යෝධයකු හා සතුරු භටයන් කඩු සටනක යෙදී සිටින අයුරු දැක්වෙන අතර, එහි භටයින් ආරක්ෂාව සඳහා පලිහ යොදා ගෙන ඇති බව දැක්වේ. මහනුවර යුගයේදී කඩු හරඹ පුහුණු කිරීම අංගම්පොර පිටියේදී සිදු වී ඇති බවට සාක්ෂි තිබේ.

රාජාභරණවල එක් අංගයක් වශයෙන්ද, ප්‍රභූන්ගේ නිල තත්ත්වය දැක්වීමටද ආභරණයක් වශයෙන් විශේෂ කඩු භාවිත විය. මේවායේ මිට රන් රිදියෙන් විවිධ කැටයම් නෙළා සකස් කර ඇති අතර, එවැනි සමහර කඩු කොපුද එසේ රන් රිදී කැටයමින් සමන්විත වී තිබේ. ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ දී මෙරටට මෞර්ය අභිෂේක ක්‍රමය හඳුන්වා දීමේ දී අශෝක අධිරාජයන් විසින් දෙවන පෑ තිස් රජුට එවූ භාණ්ඩ අතර කඩුව ද සඳහන් වීමෙන් එතැන් පටන් රාජාභරණවලට එයද ඇතුළත් වන්නට ඇත. මහනුවර යුගයේදී රජුන්ට කඩු සාදනු ලැබුයේ රන් ආයුධ පට්ටලයෙනි. රජුන් ඇතුළු ප්‍රභූන්ට කඩු සෑදීමත්, පන්නරය තැබීමේදීත් ශුභ නැකත් වේලාවල් යොදා ගන්නා ලදී. විශේෂයෙන්ම ලෝහ වැඩ ආදිය සම්බන්ධව මෙරට භාවිත වූ ග්‍රන්ථයක් වන වෛජයන්ත තන්ත්‍රයේ එක් කොටසක්ම කඩු හා ඒවා සෑදීම පිළිබඳ උපදෙස්වලින් යුක්තය. අපේ පැරණි සංස්කෘතියට මූලික වූයේ උත්තර භාරතීය සංස්කෘතිය වන අතර, ඉන්දියාවට කඩු උරුම කර දෙනු ලැබූයේ ආර්යයන් විසින් බව සැලකේ. ආර්යයන්ට පෙර සිටි ඉන්දු නිම්න ශිෂ්ටාචාර වැසියන් විසින් කඩු භාවිත කළ බවට සාක්ෂි හමු වී නැත. ලංකාවෙන් හමු වී ඇති ආදි කාලීන කඩු අතරින් ක්‍රිස්තු වර්ෂ 5වන සියවසට අයත් යැයි සැලකෙන සීගිරියෙන් හමු වී ඇති කඩු හා 12වන සියවසට අයත් පොළොන්නරුවෙන් හමු වී ඇති කඩු ප්‍රධාන වේ. භාරතයේ මෙන්ම ශ්‍රී ලංකාවේත් තාක්ෂණය දියුණු වන විට ඔක්සිහරණය කළ වානේවලින් කඩු නිපදවීම සිදු වී ඇත. 12වන සියවස වන විට ඉන්දියාවේ කඩුවලට වඩා ලංකාවේ කඩු ගුණාත්මක බවින් වැඩි බව මහා වංශයේ සඳහනකින් තහවුරු වේ. එනම්, මහ පැරකුම්බා රජතුමා තම සේවකයෙකුගෙන් කඩුවක් ඉල්ලූ විට ජම්බුද්වීපයේ පාටව නම් කඩුවක් ගෙනැවිත් දුන් බවත්, රජතුමා "මේ කඩුව සිංහල පටුත්වය ඇත්තක් නොවේ, මහා සිංහල පටුත්වය ඇති කඩුවක් ගෙනෙවැයි" නියෝග කිරීම නිදසුනකි.

ජාතක පොතේ ඇති අසි ලක්ඛණ ජාතකය අනුව කඩුවක් සිඹ බැලීමෙන් ඒවායේ යහපත් ලක්ෂණ කීමේ ශාස්ත්‍රයක් පැවැති බව පෙනේ. වෛජයන්ත තන්ත්‍රයේද කඩුවල සළකුණු කළ යුතු මංගල ලක්ෂණ සඳහන් ය.

රජුන්, ප්‍රභූන් විසින් මෙන්ම ගහලයින් විසින්ද කඩු භාවිත කොට ඇත. ගහලයන් විසින් දඬුවම් ලැබූවන්ගේ හිස ගසා දැමීමටත් අඟ පසඟ කපා දැමීමටත් වධක කඩුව යොදා ගෙන ඇත. ඇහැලේපොල නිලමෙගේ දරුවන්ගේ හිස ගසා දැමීමට වධකයා යොදා ගත්තේ එවැනි කඩුය. එසේම ඉංග්‍රීසීන් විසින් කැප්පෙටිපොල නිලමෙතුමාගේ හිස ගසා දැම්මේද වධකයාගේ කඩුවෙන් වූ අතර, එම අවසාන වධකයාගේ කඩුව මහනුවර කෞතුකාගාරයේ ප්‍රදර්ශනය වේ. එය නේපාලයට අයත් කෝරා වර්ගයේ කඩුවක් බව කියැවේ.

ලංකාවේ භාවිත වූ කඩු ගැන දීර්ඝ විස්තරයක් දඹදෙණි අස්නේ සඳහන් වේ. බොහෝ දුරට වර්ණනාත්මකව ලියා ඇති මෙහි දැක්වෙන කඩු සමහරක් සත්‍ය වශයෙන්ම භාවිත නොවූ ඒවා යැයි සිතිය හැකිය. එහි දැක්වෙන කඩු අතර රන්, මිණි, සත්රුවන්, ඇරා, ගුර්ජර, පාඬි, වඩුග ජීන, මලය, මදුර, තෙළිඟු, ජාව, වංග අයෝධ්‍ය, දැත්, මූණ, දාර, සිරිවැල්, දිලෙන, විසි, ධවල, දික් හා ලුහුඬු යනුවෙන් දක්වා තිබේ. ජාතක අටුවා ගැටපදයේ එකතොධාරා අසි, උභතොධාරා අසි යනුවෙන් කඩු වර්ග දෙකක් සඳහන් ය. එනම්, එක් පැත්තක් මුවහත ඇති කඩු හා දෙපැත්තම මුවහත ඇති කඩු යනුවෙනි. දඹදෙණි අස්නේ විෂ පෙවූ කඩු ගැනද සඳහන් ය.

පුරාණයේ කඩු සම්බන්ධව සිටි නිලධාරින් ගැනද සඳහන් ය. අසිග්ගාහක යනුවෙන් සඳහන් වන නිලයේ කාර්යය වූයේ රජුට කඩුව පිළිගැන්වීම බව සැලකේ. තවද, ශ්‍රී මහා බෝධිය රැකීමේ කටයුත්තේ යෙදී සිටි නිලධාරියා කඩුපසඟනා නම් විය. එච්.සී.පී. බෙල් මහතා කෑගලු වාර්තාවේ සඳහන් කර ඇති අයුරු, මහවාසල අණින් කඩු හරඹයේ යෙදුණු මරුවල්ලියේ නායකයෙකු සුධලියේ නායකයෙකුගේ පහරින් මිය ගියෙන්, මිය ගිය හරඹකරුගේ දියණිය ඉන්දියාවට ගොස් කඩු ශිල්පය නිපුණ වී පිරිමියෙකු ලෙස වෙස් වලාගෙන පැමිණ අභියෝග කොට තම පියා මැරූ තැනැත්තා කඩු සටනින් පරදවා මරා දමා ඇත. රජතුමා ඇය හැඳින සතර කෝරළයේ දිසාපතිකම දී ඒදඬුවාවේ විසීමට අවසර දී ඇත.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
**(The Presiding Member)**
ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
**(மாண்புமிகு தயாசிறி ஜயசேகர)**
**(The Hon. Dayasiri Jayasekara)**
මට විනාඩි කීයක් තිබෙනවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
**(The Presiding Member)**
ඔබතුමාට විනාඩි 11ක් තිබෙනවා. [බාධා කිරීමක්] DNA කට තිබෙන්නේ මිනිත්තු 10යි. TNA එකට විනාඩි 20යි. TNAඑක ඒ වෙලාව අරගෙන ඉවරයි.

[අ. භා. 5.02]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම කියන්න කැමැතියි, මේ කාරණයේදී අපි කවුරුවත් ජනාධිපතිතුමාට ඇඟිල්ල දික් කළේ නැහැ කියා. අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කළේත් මේකට බලවත් හස්තයක් සම්බන්ධයි කියායි. මම දන්නේ නැහැ, සංස්කෘතික හා කලා කටයුතු ඇමතිතුමා, ජනාධිපතිතුමාව මේකට අල්ලා ගන්නේ ඇයිද කියලා. මේ එන චෝදනා ප්‍රමාණය අනුව තමයි එතුමන්ලා එතැනට තල්ලු වෙලා තිබෙන්නේ. අපට මේ කාරණා කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? පහු ගිය මාස පහට නිදන් වදුළු 110ක් හාරලා තිබෙනවා. බුදු පිළිමවල උදරය පලා, ඇස් ගලවලා, බෙලි කපලා තිබෙනවා. හාමුදුරුවරුන් දෙදෙනෙක් ඝාතනය කරලා තිබෙනවා. දින 150ක් තුළ මෙවැනි දැවැන්ත ක්‍රියා ගණනාවක් සිද්ධ වෙලා තිබෙනවා. පැහැර ගැනීම්, අනවසරයෙන් ලබා ගැනීම් ඔක්කොම 110ක් සිද්ධ වෙලා තිබෙනවා.

ඉතින් මේක දැවැන්ත නිධන් කොල්ලයක් බවට තමයි පත් වන්නේ. අද පුරා විද්‍යා කොමසාරිස්තුමා කියා තිබෙන විධියට තවම තර්ජනයට ලක් නොවී, බේරිලා, ඉතුරු වෙලා තිබෙන එකම ස්ථානය අනුරාධපුරයේ දැදිගම ප්‍රදේශයේ පරාක්‍රමබාහු රජ ඉදි කළ ස්මාරකය විතරයි. අනික් ඒවා සියල්ලම නිදන් හොරුන්ගේ ග්‍රහණයට අහු වෙලා තිබෙන තත්ත්වයක් තිබෙන්නේ.

අපි දන්නවා, පුරා විද්‍යා කෞතුක ස්ථාන විධියට හඳුනා ගත් ස්ථාන 2,75,000ක් විතර තිබෙන බව. මා කියන්නේ නැහැ, මේවා හැම දාම රකින්න පුළුවන් වෙයි කියලා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, ඉතාම කෙටි කාලයක් ඇතුළත මේවා දිගින් දිගටම කඩා බිඳ දමන්න සහ හාරන්න තිබෙන අවශ්‍යතාව මොකක්ද කියන එකයි. උදාහරණයක් විධියට 2008 දී ස්ථාන 210ක්, 2009 දී ස්ථාන 235ක්, 2010 දී ස්ථාන 295ක්, 2011 දී ස්ථාන 220ක්, 2012 මැයි මාසය වන විට ස්ථාන 110ක් හාරා තිබෙනවා. මේවා දවස ගණනේ දැවැන්ත විධියට කොල්ලකන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි අහන්නේ, ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව ගත් ක්‍රියා මාර්ගය මොකක්ද කියලායි. උදාහරණයක් විධියට ගත්තාම, විශේෂයෙන් කටු ගෙය කඩා දැමීම සම්බන්ධයෙන් ආණ්ඩුව ගත්ත ක්‍රියා මාර්ග මොනවාද කියලායි අපි අහන්නේ. එතැන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඊට දවස් දෙකකට කලින් ස්වයංක්‍රිය උපකරණ ක්‍රියා විරහිත වුණේ ඇයි? ඒකට කලින් ගියේ කවුද? පස්සේ ඒකට කුඩ්ඩකුගේ නමක් දමා ඔහු එතැන සිගරට් බිබී සිටියාය කියලා සම්පූර්ණ ක්‍රියාදාමය අනික් පැත්තට කැරකුවේ කවුද? අපි අහනවා, මේ කඩු අරගෙන යෑම පිළිබඳව මේ වන විට ගෙන තිබෙන පියවර මොකක්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, මේ කාරණයත් එක්කම තමයි අනික් කාරණා දිගටම පෙළ ගැසෙන්නේ කියලා. හැම තැනකම බලන්න. විලච්චිය සිද්ධිය ගත්තොත් සිවලාපිටියේ නිධන් හාරා ගෙන ගියා. විලච්චිය පොලීසිය ඉන්නවා. අනුරාධපුර පොලීසිය ඉන්නවා. අනුරාධපුරය DIG මහත්මයෙක් ඉන්නවා. දවස් 10කට පස්සේ පොලිස්පතිවරයාට සිද්ධ වෙලා තිබෙනවා, සිරිසඟබෝ වෙන්න. ඔහු මොකද කරන්නේ? ඔහු ලිපියක් යවනවා, "මම තමයි මේ කණ්ඩායම යැව්වේ" කියලා. මා අහනවා, ඒ කණ්ඩායමත් එක්ක බැකෝ එක යැව්වේ කවුද, මල් බුලත් තටුව යැව්වේ කවුද, ඒ සඳහා කට්ටඩියා එක්ක ගෙන ගියේ කවුද කියලා. මේ රටේ ගෞරවයක් තිබුණු විශේෂ කාර්ය බල කාය - STF එක - හමුදාවේ ඇඳුම් ඇඳ ගෙන කිසියම් විධියකට මේ නිධන් හාරන වැඩ පිළිවෙළට සම්බන්ධ වනවා.

ටී.බී. ඒකනායක මැතිතුමා කිව්වා, කරන්න තිබෙන පරීක්ෂණ මොනවාද කියලා එයට අවශ්‍ය කරන පොලිස් වාර්තා දෙයි කියලා. මොනවත් පරීක්ෂණයක් නැහැ. පොලිස්පතිතුමාම කියනවා, "මම යැව්වේ. එම නිසා කථා කරන්න දෙයක් නැහැ"යි කියලා. කොහේවත් පරීක්ෂණයක් නැහැ. මා දන්නවා, අපේ ජගත් බාලසූරිය ඇමතිතුමාට ඒකට උත්තරයක් දෙන්න බැහැයි කියලා. සිවලාපිටිය සිද්ධිය සම්බන්ධයෙන් එතුමාට උත්තරයක් දෙන්න විධියක් නැහැ. මොකද, පරීක්ෂණයක් කරන්නත් කලින් දින 10කට පස්සේ පොලිස්පතිතුමාම ඒක කියලා ඉවරයි. එහෙම නම් එතුමා පසුව දා උදේ කියන්න එපායැ, "මමයි යැව්වේ. වෙනත් කවුරුවත් නොවෙයි" කියලා. එයට උත්තරයක් දෙන්න කවුරුවත් නැහැ. DIG මහත්මයාත් දන්නේ නැහැ, මොකක්ද කියලා. විශේෂ කාර්ය බල කායේ ප්‍රධානියා දන්නෙත් නැහැ. අපි දැක්කා, ඒ ගොල්ලනුත් රූපවාහිනී මාධ්‍යවලට ගිහින්, "පොඩ්ඩක් ඉන්න. මේක මා දන්නා කාරණයක් නොවෙයි" කියලා යන්න ගියා. දවස් 10කට පස්සේ තමයි රටේ පොලිස්පතිතුමාට සිරි සඟ බෝ වෙන්න සිද්ධ වුණේ. එතුමා එතුමාගේ බෙල්ල කපා ගන්න තැනකට පත් වෙලා තිබෙනවා, මේ ක්‍රියාදාමයත් එක්ක. අපි අහන්නේ, මේවා කරන්නේ කවුද කියලායි. එහෙම නම් බලවත් හස්තයක් මෙතැන තිබෙනවා. පොලිස්පතිතුමා මැදිහත් වෙලා පණිවුඩයක් යවන්න තරම් තැනට මේ කාරණය ගෙනෙන්න නිවේදනයක් නිකුත් කරන්න එතුමාට සිද්ධ වුණා නම්, අපි කියනවා, පොලිස්පතිතුමාට උඩින් ඉන්න කවුරුන් හෝ මෙතැන ඉන්නවාය කියලා.

ඒ විතරක් නොවෙයි. නිධන් හාරන්න ලේසර් අවි 16ක් ගෙනැවිත් තිබෙනවා. මේවා ගෙනෙන්න අනුමැතිය දුන්නේ කවුද? මෙහි තිබෙනවා, නිධන් හාරන ලේසර් machines 16ක්. මේවා අත් අඩංගුවට ගත්තා. ඉරාන ජාතික ආයුධ ව්‍යාපාරිකයෙක්, මේජර්වරයකු ප්‍රමුඛ විශේෂ බල ඇණියක් මේකට සම්බන්ධ වෙලා තිබුණේ. දැන් මේ මේජර්වරයා විදේශගත වෙලායි ඉන්නේ. සෙබළුන්ට සිද්ධ වුණු දෙයක් නැහැ. නිධන් හෑරීමට ලේසර් කිරණ භාවිත කරන්නේ කවුද? ඒ ගැන කථා කරන කොට මට මතක් වුණේ පුරාවිද්‍යාඥ ජෝර්ජ් කිටෝ මහත්මයායි. එතුමා කියා තිබෙනවා, එතුමා මෙච්චර කාලයක් හෙමින් හෙමින් තමයි මේ පුරා විද්‍යා වස්තු මතු කර ගත්තේ, දැන් බැකෝ යන්ත්‍ර දමා කරන්න එතුමාට සිද්ධ වෙලා තිබෙනවාය කියලා. ඇයි? ඊට කලින් හොරු ඇවිල්ලා පුරා වස්තුවලට අත ගහනවා, නිධන් සොයා ගෙන. බාමියන් බුද්ධ ප්‍රතිමා ගැන මහා දැවැන්ත සටනක් ගෙන ගිය රටක් මේ. 2005 දී තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවේ සිංහල බෞද්ධකම ඉස්සරහට දමා ගෙන, දේශප්‍රේමය ඉස්සරහට දමා ගෙන, දේශප්‍රේමී ආණ්ඩුවක් විධියට නැති වී ගිය සියලු දේවල් නැවත ස්ථාපිත කරන්න, රටේ උරුමය ආරක්ෂා කරන්න කියලායි. ජාතික උරුමයන් අමාත්‍යාංශය කියලා එකක් හදලා තිබෙනවා.

අපේ ආණ්ඩුවේම ඉන්න අය මේවා ගැන අද මොනවාද කියන්නේ? බලන්න, නිදන් කොල්ලය පිටුපස තියෙන කථා. ජාතික හෙළ උරුමයේ නායක පූජ්‍ය ඕමල්පේ සෝභිත නායක හාමුදුරුවෝ මොනවාද කියන්නේ? රට පුරා සිදු වන කොල්ලකෑම්, නිදන් හෑරීම සහ ජාතික කෞතුකාගාරයේ භාණ්ඩ හොරකම් කිරීම පිටු පස පොලීසියටත් වඩා බලගතු හස්තයක් ක්‍රියාත්මක වන බවයි උන් වහන්සේ කියන්නේ. මේ කියන්නේ පූජ්‍ය ඕමල්පේ සෝභිත නායක හාමුදුරුවෝ. උන් වහන්සේ මොකක්ද කියන්නේ? "පැහැර ගෙන ගිය කාන්තාව සහ මුදල් තොගය පැය 47ක් ඇතුළත සොයා ගැනීමට තරම් දක්ෂ පොලීසිය මාස දෙකක කාලයක් ගත වූ පසුත් කෞතුකාගාරයෙන් පැහැර ගත් පුරා වස්තු සොයා ගැනීමට අපොහොසත් වී ඇති බැවින් පොලිස්පතිවරයාත් විෂය භාර අමාත්‍යවරයාත් තනතුරුවල විළිලජ්ජා නැතුව තවදුරටත් රැඳී සිටීම සදාචාරාත්මක නොවන බව උන් වහන්සේ පැවසීය" කියා පුවත් පත්වල සඳහන් වෙනවා. මෙහෙම කියන්නේ අපේ පූජ්‍ය ඕමල්පේ සෝභිත ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

අප ගෞරව කරන අපේ එල්ලාවල මේධානන්ද නායක හාමුදුරුවෝ ඒ සම්බන්ධව මොනවාද කියන්නේ? උන්වහන්සේට චක්‍රවර්ති නාමයත් දීලා තිබෙන්නේ. පුරා වස්තු පිළිබඳව උන්වහන්සේට විශාල අවබෝධයක් තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්. චක්‍රවර්තිලා දෙදෙනායි ඉන්නේ. එක් කෙනෙක් බයිලා චක්‍රවර්ති. අපේ ගෞරවනීය නායක හාමුදුරුවෝ පුරාවිද්‍යා චක්‍රවර්ති. පුරාවිද්‍යා චක්‍රවර්ති අපේ ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේ මොනවාද කියන්නේ? උන් වහන්සේ මා බොහොම ආදරය කරන, ගරු කරන සහ මම කවදාවත් වචනයක් කියන්නේ නැති නායක හාමුදුරු කෙනෙක්. මා උන් වහන්සේට බොහොම ආදරය කරනවා. උන් වහන්සේම තමයි කිව්වේ, ජනාධිපති මන්දිරයේ ඉඳලා හිටලා මත්පැන් ටිකක් භාවිතා කළාට කමක් නැහැයි කියා.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

Sir, I rise to a point of Order. ගරු මන්ත්‍රීතුමනි, ඒ කථාව ඉල්ලා අස් කර ගන්න. ඒක සම්පූර්ණ අසත්‍ය කථාවක්. මාධ්‍ය සාකච්ඡාවක් කරන අවස්ථාවේදී මාධ්‍යවේදියෙක් මගෙන් අහපු ප්‍රශ්නයට මම නොවෙයි පිළිතුරු දුන්නේ, චම්පික රණවක ඇමතිතුමායි. මම කථා කරපු නැති -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සමාවන්න. මම ඒක ඉල්ලා අස් කර ගන්නවා. පත්තරේ තිබුණු නිසා, ඒ පත්තරේ අරගෙන මම කිව්වේ.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

පත්තරවල දමන හැම දෙයක්ම නිවැරදි නැහැ මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

දෙවන කාරණය මම අහනවා. "නිදන් රාජ්‍ය සතු එකක්. රජය මේක හාරන්න ඕනෑ" කියා අපේ ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේ කියා තිබෙනවා. ඔක්කොම පත්තරවල තිබෙනවා. පත්තරවල විතරක් නොවෙයි. හැම තැනම තිබෙනවා. ඔබ වහන්සේගේ ෆොටෝ එකත් දමා තිබෙනවා. ඒකත් අසත්‍යයක්ද කියලා මම අහනවා. අපේ ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේ කියනවා, "මේක හරියට තෙල් වාගේ ඉක්මනින් නැති වන දෙයක්. ඒ නිසා වහාම මේවා හාරලා ආණ්ඩුව ගන්න ඕනෑ" කියා. එතකොට කවුද, මේවා හාරලා ගන්නේ? කාටද, මේක හාරන්න අයිතිය තිබෙන්නේ? පුරා විද්‍යා කොමසාරිස් කියනවා, මගෙන් අහන්නේ නැතුව, අපෙන් කිසි අවසරයක් නැතුව නිධානයක් ගන්න තියා කාටවත් ඒ පැත්ත පළාතටවත් යන්න බැහැ කියා. අපේ ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේ කියනවා, මේක ආණ්ඩුව හාරන්න ඕනෑ කියා. එතකොට ආණ්ඩුවේ කාටද ඒ බලය තිබෙන්නේ?

ආණ්ඩුව කියන්නේ කවුද? ආණ්ඩුව කියන්නේ දෙදෙනෙක් තුන් දෙනෙක්. අපි ඉස්සර හිතේ තියා ගෙන හිටියා, මේ රට අපේ කියා. පොඩි කාලයේ අපට ඉගැන්වූවේ මේක අපේ රට කියායි. දැන් මේක අපේ රට නොවෙයි; දෙතුන් දෙනෙකුගේ රටක්. ඒ දෙතුන් දෙනාගේ බලය තමයි දැන් මේ තිබෙන්නේ. ගෞරවනීය නායක හාමුදුරුවන්ගේ කකුල් දෙක අල්ලලා මම වඳින්න කැමැතියි. කරුණාකර, මේ වාගේ ප්‍රකාශ කරන්න එපා. මේවායෙන් හොරුන්ට තවත් උඩ ගෙඩි දෙනවා. නිදන් හාරන්න අවශ්‍ය කරන වාතාවරණය හදලා දෙනවා. මෙන්න මේකයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. නිදන් රජය සතු දේපොළක් බව පුරා විද්‍යා චක්‍රවර්ති පාර්ලිමේන්තු මන්ත්‍රී පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමියන් පවසා තිබෙනවා. කෙසේ වුවද නිදන් වස්තු කොල්ලය පිළිබඳව පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් සෙනරත් දිසානායක මහත්මයා මොකක්ද කියන්නේ? තවමත් නිදන් කොල්ලකරුවන්ගේ ග්‍රහණයට හසු නොවූ තැන් එකයි තිබෙන්නේ. අන්න ඒක විතරක් ආරක්ෂා කරන්න ඒ ගොල්ලන්ට පුළුවන් කියා ඉන්නවා. දෙවියනේ! ඔබ වහන්සේලාම කියනවා නම් නිදන් හැරීම ආණ්ඩුව කරන්න ඕනෑ කියා, ආණ්ඩුවෙන් කවුද මේවා හාරන්නේ? අපි අහන්නේ ඒකයි.

විලච්චියේ සිදු වුණු සිද්ධිය වාගේ රටේ තවත් සිදු වුණු සිද්ධි ගණනාවක් තිබෙනවා. උදාහරණයක් විධියට අපි ගත්තොත් දුටුගැමුණු රජ්ජුරුවන්ගේ මිරිසවැටි චෛත්‍ය ඉදි කරන කාලයේ තමයි කුන්තායුධය ඒකේ තැන්පත් කරලා තිබුණේ. දැන් කුන්තායුධය හොයන්න මිරිසවැටියත් හාරන්න කියලාද කියන්නේ? අපේ රටට මේ ටික ඉතුරු වෙලා තිබෙනවා. ඒ ටික ඉතුරු වෙලා තිබුණාම දෙවියනේ කියලා කවදාවත් අපි මේවාට අත තිබ්බේ නැහැ. අහිංසක දුප්පත් මිනිස්සු ගිහින් පොළොව හාරද්දී හිටපු ගමන් මොකක් හරි එකක් මතු වුණාම ඒක අරගෙන යනවා. දැන් මේක ඊට එහා පැත්තටත් ගිහින් තිබෙන්නේ. ඒකයි අපි කියන්නේ.

මේකට ආණ්ඩුවේ බලවතුන් සම්බන්ධ වෙලා තිබෙනවා. දැන් කථාවක් තිබෙනවා, අපේ ජනාධිපතිතුමා වශී බෝලයක් පාවිච්චි කරනවා කියලා. ඒක අතේ තියා ගෙන පාවිච්චි කරනවාය කියනවා. මම නම් කියන්නේ ඒවා මිථ්‍යා මත. පේරුස් මුද්ද පැළඳ ගෙන, මඟුල් කඩුව - ඒ කියන්නේ යුද්ධයට ගෙනිච්ච කඩුව නොවෙයි. යුද්ධයට ගිය කඩුව හොයා ගත්තා නම් ඒ කඩුවට වැඳලා වැඩක් නැහැ. ඒකයි කඩු දහසයක් විතර අරගෙන ගියේ, මඟුල් කඩුව හොයා ගන්න - අරගෙන තුන්වරුවක් -උදේට, දවල්ට, රාත්‍රියට- කිරිවලින් නාවලා ඒක සිප ගත්තාම විරාත් කාලයක් රජ වෙන්න පුළුවන් කියලා මිත්‍යා මතයක් තියෙනවා. ඒවා මිථ්‍යා මත. ඒ අදහස් තමයි රජවරුන්ගේ ඔළුවලට දාන්නේ. ඉතිහාසයේත් මේවා වුණා. අපි කියන්නේ, ඒක ආපහු සිද්ධ වෙන්න දෙන්න එපා කියලායි. මතයක් විධියට ඒ කරුණු තිබෙන නිසා රට ඇතුළේ තිබෙන කඩු ටික අරගෙන යනවා. ඒකයි අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වේ වුවමනා කඩුව අරගෙන ඉතුරු කඩු ටික ආපහු ගෙනැල්ලා දෙන්න කියලා. එතකොට මඟුල් කඩුව නැතුව අනෙක් කඩු ටික හරි අපට ඉතුරු කර ගන්න පුළුවන්. අඩුම තරමින් එතකොට වෙන කඩු ටිකක් හරි අපි ළඟ තිබෙනවානේ. නමුත් දැන් ඒ කඩුවලටත් වෙච්ච දෙයක් නැහැ. ඊට පස්සේ, අවශ්‍ය කඩුව හම්බ වුණේ නැති තැන තමයි ගියේ කෝට්ටේ රජ මහා විහාරයට. කෝට්ටේ රජ මහා විහාරයට ගිහිල්ලා, සපුමල් බණ්ඩාර කුමාරයාගේ කඩුව හෙව්වා. දැන් ඒ කඩුවත් නැහැ කියලා තමයි කියන්නේ. බලන්න, අඩු තරමින් අද අපේ ගෞරවණීය ස්වාමීන් වහන්සේ කෙනෙකුට පන්සලක් ඇතුළේ රාත්‍රී කාලයේ සැතපෙන්න බැරි වෙලා තිබෙනවා. ඇයි මේ? කට්ටිය උදේ ඉඳන් රෑ වෙන කල් කඩු හොය හොයා ඇවිදින නිසා. ඒ අය පන්සලට එන්නේ වෙන වැඩක් කියා ගෙන. අර නිලමේ ඇවිල්ලා තිබුණේත් වෙන වැඩකටනේ. රාත්‍රී කාලයේ කඩුව ගන්න ඇවිල්ලා අහු වෙච්ච නිසා තමයි අපේ ගෞරවණීය ස්වාමීන් වහන්සේලා දෙන්නව ඝාතනය කරලා දැම්මේ.

ඒ ගැන අපේ බෙල්ලන්විල නායක හාමුදුරුවෝ මොකක්ද කිව්වේ? උන් වහන්සේ කිව්වා, "රටේ දේශපාලනඥයන් අත ගහන්නේ නැත්නම් පොලීසිය හරියට වැඩ කටයුතු කරනවා. ඒ නිසා තමයි කෝට්ටේ රජ මහා විහාරේ සිද්ධියට අදාළ සැකකරුවන් පහු වැනි දා හොයා ගත්තේ" කියලා. මම අහනවා, විලච්චියේ සොරකම කෙරුවේ කවුද කියලා මේ වන විට හොයලා තිබෙනවාද කියලා. ඔබතුමන්ලා ඒ ගැන කථා කරලා තිබෙනවාද? ඒ සිද්ධිය සම්බන්ධව පොලිස්පතිතුමා කියලා තිබෙන්නේ එතැන විශාල වස්තුවක් තිබෙනවා කියලා එතුමාට දැන ගන්න ලැබුණා කියලායි. මම අහනවා, මොකක්ද තිබුණ වස්තුව කියලා. වටිනා

[ගරු දයාසිරි ජයසේකර මහතා]

වස්තුවක් ලු. ඒ වටිනා වස්තුව මොකක්ද? පොලිස්පතිතුමා ඒක දන්නවා නම්, කවුද පොලිස්පතිතුමාට කිව්වේ එතැන වටිනා වස්තුවක් තිබෙනවා කියලා. ඇත්ත වශයෙන්ම STF එක මේ බිම හැරුවාද, එතැන තිබුණු දෙයක් එළියට ගත්තාද? එහෙම නම් යම් දෙයක් අතට අහුවෙන්න එපා යැ, දෙයියනේ. කොහේ හරි බිමක තිබෙන දෙයක් වටිනා වස්තුවක් කියලා කියන්න අතට අහු වෙන කල් ඉන්න එපා යැ. අතට අරගෙන බැලුවාට පස්සේ තමයි ඒක වටිනා වස්තුවක් කියලා තේරෙන්නේ. ඉතින් එහෙම වුණාද? ඒක තමයි තිබෙන ප්‍රශ්නය. රට ඇතුළේ මේ වාගේ සොරකම් සිදු වන විට පොලිස්පතිතුමා ඒ සම්බන්ධව ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද? විලච්චියේ ඇති වුණ සිද්ධිය සම්බන්ධව අඩුම තරමින් අද වනතුරු පොලිස් පරීක්ෂණයක් කරලා, වාර්තාවක් ඉදිරිපත් කරලා, මෙන්න මේ ගොල්ලන් තමයි නිධන් හැරුවේ කියලා තොරතුරු හොයා ගත්ත වැඩ පිළිවෙළක් තිබෙනවාද? එහෙම දෙයක් නැහැ. එහෙම නැති නිසා තමයි අර වාගේ මිථ්‍යා කථා කියන්නේ. පේරුස් මුද්ද හොයා ගෙන, මඟුල් කඩුව හොයා ගෙන ඒවාට වන්දනාමාන කළාම විරාත් කාලයක් රජකම් කරන්න පුළුවන් කියන මිථ්‍යා කථා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ගැන කවුද කථා කරන්නේ? ජගත් බාලසූරිය මැතිතුමා පුළුවන් තරම් උත්සාහ කරනවා මේවා රැක ගන්න. නමුත් එතුමාට ඉහළින් ඉන්න කට්ටිය තමයි මේවා කරන්නේ. ඉතින් එතුමා මොනවා කරන්නද? එතුමා ඇවිල්ලා ප්‍රකාශයක් කරනවා, "අපි මොනවා හරි කරන්න බලාපොරොත්තු වෙනවා" කියලා. මම අහනවා, කටුගේ කඩන්න දවස් දෙක, තුනකට කලින් රාත්‍රියේ කවුද එතැනට ආවේ කියලා ඔබතුමන්ලා පරීක්ෂා කෙරුවාද කියලා. ඒ ගැන තවමත් පරීක්ෂණ නැහැ. එතැන මුර කරන්න ඉන්න පුද්ගලයා අත් අඩංගුවට ගත්තා. ඒ අභිංසකයා නිදා ගන්නවා, රෑ 11, 12 වෙන කොට. අද එක්කෙනකුගේ, දෙන්නෙකුගේ පමණක් වැඩ තහනම් කරලා තිබෙනවා. "පහත් තැනින් යයි ගලා ජලේ." නමුත් හොරකම් කරපු මිනිසුන් ගැනයි හොයන්න තිබුණේ. ඒවා මොකවත් කළේ නැහැ. ඒ නිසා දැන්වත් මේ නිධන් කොල්ලය නතර කරන්නේ නැති වුණොත්, ජනතාව පාරට බැහැලා කියයි, කවුරුවත් නොවෙයි මේ හොරකම් කරන්නේ මේ ගොල්ලන්ය කියලා.

පසු ගිය කාලයේ කැබ් රථවලින් ඇවිල්ලා සෙට්ටිකුලමේ මේ වාගේම නිධානයක් කැඩුවා. ඒ වාහනවල නොම්මර ඔක්කෝම තිබෙනවා. පැහැදිලිව මේ සිදු වීම පිටු පස දේශපාලනඥයෝ ඉන්නවා. පොලීසියේ OIC මාරු කරනවා කියලා තර්ජනය කරපු නිසා OIC ගිහින් මේ මිනිස්සු අල්ලලා ඇතුළට දා ගෙන යම්තම් බේරා ගත්තා. ඒ වාගේ සිද්ධි එකක් දෙකක් නොවෙයි කීපයක්ම තිබෙනවා. තිස්සමහාරාමයේ, මාතර, හක්මන කියන මේ හැම තැනකම මිනිස්සු නිධන් හාරනවා. මම ඒකයි කියන්නේ. ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, අලුත් වැඩ පිළිවෙළක් ගෙනෙනවා, අලුත් නීති ක්‍රමවේදයක් ගෙනෙනවා කියලා තිබෙන නිසා.

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)
සෙට්ටිකුලමේ වෙච්ච සිද්ධිය පිළිබඳව පැහැදිලි කිරීමක්-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ කථාවේදී කියන්න.

ඔබතුමා අලුත් නීතියක් ගෙනෙන්න හදනවා කියලා කියනවා. ඔබතුමන්ලා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සති දෙකක් ඇතුළත වහාම ගෙනාවා කාගෙන්වත් අහන්නේ නැතිව; අපෙන් අහන්නේත් නැතිව. ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් තිබෙන නිසා ලබන සතියේ ඒ නීති ගෙනෙමු. ගෙනැල්ලා වහාම සම්මත කරමු. ඒ විතරක් නොවෙයි. මේවා පිටුපස්සේ ඉන්න දේශපාලනඥයෝ කවුද කියලා අපි හොඳට හඳුනා ගන්න ඕනෑ. මේවාට අදාළ පොලිස් පරීක්ෂණ යට යනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වාර්තා ගන්න ගියාම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ආපහු එන වාර්තාව වෙනස් වෙලා එන්නේ එතැන නිධානයක් නැහැ කියලා. එතකොට බඩු අරගෙන ඉවරයි. එතැන මොකුත් පුරාවිද්‍යා වටිනාකමක් තිබෙන වස්තුවක් නැහැයි කියනවා. හැම තැනකම ඒකයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, පසු ගිය දවස්වල පොළොන්නරුවේ ශිව දේවාලයත් හාරලා. මේ ආණ්ඩුවේ අයට දැන් තිබෙන්නේ රුවන්වැලි සෑය හාරන්න විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේට අපි ගෞරව කරනවා. මගේ ආදරණීය, ගෞරවණීය නායක හාමුදුරුවන් වහන්සේට මම මේ කාරණය කියනවා. ඔබ වහන්සේ මේ ගැන ප්‍රකාශයක් කරලා තිබුණා. ඔබ වහන්සේ වාගේ නායක ස්වාමීන් වහන්සේ නමක් මේ ආණ්ඩුවේ ඉඳ ගෙන ඒ වාගේ ප්‍රකාශ කරන එක අපට ලොකු වේදනාවක්. ඒ නිසායි මම ඒ කාරණය මතක් කළේ. හෙට අනිද්දා ඔබ වහන්සේ කිව්වොත් තවත් දේවල් කරන්න පුළුවන් කියලා? එතකොට අපට කල්පනා කරන්න වෙනවා, දෙවියනේ අපේ නායක හාමුදුරුවන්ට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා තමයි මම ආදරයෙන් ඔබවහන්සේගෙන් ඉල්ලන්නේ, කරුණාකරලා ඒ වාගේ ප්‍රකාශ කරන්න එපා කියලා. මොකද, මේ සිද්ධි පිටුපස්සේ තිබෙන ඇත්ත කථාවට අවශ්‍ය කරන සහයෝගය දෙනවා වාගේ දෙයක් තමයි සිද්ධ වන්නේ මේ විධියට කථා කරපුවාම.

විලච්චියේ ඇති වුණ සිද්ධිය බලන්න. සිවලාපිටියේ වැව හාරලා ඒ වැවේ තිබුණ බඩු අරගෙන ගියාට පස්සේ ඔබවහන්සේ කියනවා ඒවා ආණ්ඩුවට අයිති ඒවා කියලා. එහෙම නම් ආණ්ඩුවේ කවුද ඒවා හාරා ගෙන ගියේ කියලා අපට අහන්න වෙනවා. ඒකයි ප්‍රශ්නය. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලනවා වහාම මේ ප්‍රසිද්ධ සිද්ධි දෙක ගැන සොයන්න කියලා. ඒවා පැහැදිලිව හොයා ගන්න පුළුවන්, මුළු රටේම මිනිස්සු ඇඟිල්ල දික් කරපු කාරණා. සිවලාපිටිය වැවේ සිද්ධ වුණේ මොකක්ද? ඒකට ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? නිකම් ලියුමක් යවලා ඒක වහලා දාන්න පොලිස්පතිතුමාට පුළුවන්ද? ඒකට ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම ජගත් බාලසූරිය මැතිතුමාගෙන් අහන්න කැමැතියි. පොලිස්පතිතුමා යවපු ලිපියෙන් මේ සියල්ල අවසන් වෙනවාද? මොකක්ද ඊට පස්සේ පොලීසිය ගත්ත තීන්දුව, ක්‍රියාමාර්ගය? මේ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාට "B" Report එකක් දාලා ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවාද? විශේෂ කාර්ය බලකායෙන් ඊට පසුව ගත්ත පියවර මොකක්ද? කරුණාකරලා ඔබතුමා මේ ගැන කරුණු දක්වන්න කියලා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කටු ගේ ඇතුළේ වුණ සිද්ධිය සම්බන්ධව පොලිස් පරීක්ෂණවල ප්‍රතිඵලය මොකක්ද? ඊට සම්බන්ධ කවුරු හෝ අත් අඩංගුවට අරගෙන තිබෙනවාද? ඒ කඩු අරගෙන ගියේ කොහේටද? ඒ වාගේ කාරණා පිළිබඳව අපට කරුණාකරලා කරුණු ඉදිරිපත් කරන්න කියලා ඉල්ලීමක් කරමින්, මේ රටේ ඉතිරි වෙලා තිබෙන පුරාවස්තු ටිකත් මේ අයට ගෙන යන්න අවශ්‍ය කරන කටයුතු ටික නොකරන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 5.50 ]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ගැන බොහෝම වර්ණනා

කරමින් කථා කළ අප හිතවත් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්නට ලැබුණ එක ගැන මම සතුටු වෙනවා. එතුමා මගෙන් ඉල්ලීමක් කළා, රජයට නිධන් හාරන්න අයිතිය තිබෙනවා කියලා මීට පස්සේ ප්‍රකාශ කරන්න එපා කියලා. එතුමා කිව්වා අනුරාධපුර දැදිගම ප්‍රදේශයේ පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගේ මොනවාද තිබුණාය කියලා. දැදිගම තිබෙන්නේ කොහේද කියලාවත් දන්නේ නැතිව ඔබතුමා පුරාවස්තු ගැන කථා කරන්න මෙතැනට පැමිණීම ගැන මම කනගාටු වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පුරාවිද්‍යා කොමසාරිස්තුමා කියලා තිබෙන්නේ.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
කොමසාරිස්තුමා කියලා තිබුණාට, අනුරාධපුර ප්‍රදේශයේ නොවෙයි දැදිගම තිබෙන්නේ කෑගලු දිස්ත්‍රික්කයේ. [බාධා කිරීම්] අනුරාධපුර දිසාවේ කියලා ඔය වාර්තාවේ තිබෙනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පත්‍රයේ තිබෙනවා.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
හරි. [බාධා කිරීමක්] ඒ වුණාට කවුරුවත් කිව්ව පලියටවත්, කවුරුවත් ලිව්ව පලියටවත් ඔබතුමා වැනි නීතිඥයෙක් මේ විධියට කටයුතු කරන එක වැරදියි. [බාධා කිරීමක්] මගේ කාලය ගත වෙනවා. ඔබතුමා මට බොහොම අභියෝග කළා. හොඳ අනාගතයක් ඇති තරුණ මන්ත්‍රීවරයකු වශයෙන් මම ඔබතුමාට ගරු කරනවා. හැබැයි, මෙන්න මේ කාරණයත් මතක තියා ගන්න ඕනෑ. ඔය කථා සියල්ලටම ඇහුම්කන් දුන්නාම මට පෙනී ගිය එක කරුණක් තිබෙනවා. මේ හැම කරුණකින්ම කාට හරි ඇනුම් පදයක් ඉදිරිපත් කරලා ඒකෙන් ලොකු සතුටක් ලබනවා.

කාලිදාස ලියාපු "වික්‍රමෝර්වාසියම්" කියන නාට්‍යයේ මෙහෙම කියමනක් තිබෙනවා. "මහදහි පරදුක්ඛං - සීතලං සමාගාහු"

ඒ කියන්නේ කාට හරි වේදනාවක් ඇති කරන එක, කාගේ හරි වේදනාවක් තිබෙනවා දකින එක තමන්ට හරි සීතලක් කියලා. මේ කාට හරි ඇනුම් පදයක් කියලා - රජයට හරි, ජනාධිපතිතුමාට හරි, මැති ඇමති කෙනකුට හරි, අපි කාට හරි ඇනුම් පදයක් කියලා -, අසත්‍යයක් කියලා ඔබතුමන්ලා පහත් සතුටක් විඳිනවාද කියලා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම අහනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කථාවෙන් මට පැහැදිලි වුණු එක කරුණක් තමයි ඒක.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. නැහැ.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
ඊළඟට මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, නිධන් නැහැයි කියලා මම කිව්වාය කියලා. ඒක සම්පූර්ණ අසත්‍ය කථාවක්. මම එහෙම කිසි තැනක කියලා නැහැ. එදා කියලාත් නැහැ. අද කියන්නේත් නැහැ. මතුවට කියන්නේත් නැහැ. නිධන් කියලා ජාතියක් තිබෙනවා. මම එය පැහැදිලි කර දෙන්න ඕනෑ. නිධන් හෑරීම පිළිබඳව, රජය නිධන් හැරුවාට කමක් නැහැයි කියන කථාවක් මම කිව්වාය කියන එක මාධ්‍ය සාකච්ඡාවකදී දාලා තිබුණ මාතෘකාවක්. මම ඒ පිළිබඳව කරුණු පැහැදිලි කර දෙන්නට ඕනෑ. ඔය හැම දෙනාම කථා කරන මාධ්‍යවලත්, ඒ වාගේම මේ ගරු සභාවේ කළ කථාවලත් බොහෝ දෙනා පටලවා ගෙන කථා කළේ පුරාවස්තු සහ නිධන් වස්තු කියන එක දෙකක් හැටියට නොව එකක් හැටියටයි. මෙන්න මෙතැන තමයි මේ කාරණය වැරදිලා තිබෙන්නේ. යම් කිසි ශාස්ත්‍රීය කරුණක් පිළිබඳව කථා කරන විට ඒ පිළිබඳව තිබෙන නිවැරදි ශාස්ත්‍රීය අර්ථකථන තේරුම් අර ගෙන කථා කරන්න ඕනෑ. පුරාවස්තු කියන්නේ එකක්. නිධන් වස්තු කියන්නේ තවත් එකක්.

මම ඒක පැහැදිලි කර දෙන්න ඉස්සර වෙලා, එක කරුණක් කියන්න කැමැතියි. තමන්ගේ ජීවිතය පරදුවට තබලා තමන්ගේ අඹු දරුවන් පවා නොතකා මේ රට ආරක්ෂා කරපු ආරක්ෂක අංශවලට මේ නිධන් හෑරීම පිළිබඳව එල්ල කරන ලද චෝදනාව නම් සම්පූර්ණයෙන්ම අයුක්ති සහගතයි. ඒක අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන කරුණක්. පුද්ගලයෙක්, දෙන්නෙක් යම් වරදක් කරන්නට ඇති. නමුත් සමස්තයක් වශයෙන් ඒ චෝදනාව සම්පූර්ණයෙන් වැරදියි. එහෙම අවශ්‍යතාවක් තිබුණා නම්, [බාධා කිරීමක්] ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේ දී කියන්න. ආරක්ෂක අංශවලට එහෙම අවශ්‍යතාවක් තිබුණා නම් [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Do not disturb him.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
ආරක්ෂක අංශවලට එහෙම අවශ්‍යතාවක් තිබුණා නම්, උතුරු පළාතේ හෝ නැඟෙනහිර පළාතේ සිටි ඒ අයට කිසිම ප්‍රශ්නයක් නැතිව ඒ තිබුණ සියලු නිධන් හාරලා ගන්න තිබුණා. නමුත් එක ස්ථානයකටවත් අත තියලා තිබුණේ නැහැ. ආරක්ෂක අංශ ඒවා පණ වාගේ ආරක්ෂා කළා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පුරා වස්තු සහ නිධන් වස්තු කියන දෙක අතර වෙනස පැහැදිලි කරන්න.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
ඒක මම කියන්නම්. මගේ කථාවට ඔබතුමා උපදෙස් දෙන්න ඕනෑ නැහැ. මම උපදෙස් අර ගෙන තමයි කථා කරන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, හොඳයි. ගරු ස්වාමීන් වහන්සේට සවන් දෙන්න.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මගේ කථාව මම කරන්නම්. ඊට කලින් මෙන්න මේ කරුණු

[ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි]

ටික කියන්න ඕනෑ කියලා මම කිව්වා නේ. ආරක්ෂක අංශවලට අවශ්‍යතාවක් තිබුණා නම්, උතුරු නැඟෙනහිර පළාත්වල ඝන වනාන්තරවල පවා තිබුණ පුරාවස්තු, නිධන් වස්තු හාරලා ගන්න මේ වාගේ අවස්ථාවක් එන තෙක් බලා ගෙන ඉන්න ඕනෑ නැහැ. ඒ ගොල්ලන් ඒ ප්‍රදේශවලමයි වාසය කළේ. ඕනෑ නම් ඒ ගොල්ලන්ට ඒවා හාරලා ගන්න තිබුණා. නමුත් අදත් පණ වාගේ පුරා වස්තු ආරක්ෂා කරන ආරක්ෂක අංශවලට එල්ල කරන ඒ චෝදනාව සම්පූර්ණයෙන් අසාධාරණ චෝදනාවක් බව මේ ගරු සභාව තුළ මම පැහැදිලිව කියන්න ඕනෑ.

තමුන්නාන්සේලා පුරාවස්තු හාරලා තිබෙන ස්ථාන කීයක් බලන්න ගිහිල්ලා තිබෙනවාද? කොහේද, පුරා වස්තු තිබෙන්නේ? ලංකාවේ පුරා වස්තු තිබෙන ස්ථාන 2,50,000ක් තිබෙනවා කියා දැන් මෙතැන කියැවුණා. ඇත්ත. පුරා වස්තු තිබෙන ස්ථාන 2,50,000කට වැඩිය ලංකාවේ තිබෙනවා.

මම කියන්නම්. පුරා වස්තු කියලා කියන්නේ යම් මානව නිර්මාණයක්. ඒ මානව නිර්මාණය අවුරුදු සියයක් හෝ සියයකට වඩා පැරණි නම් හෝ අන්න ඒක පුරාවස්තුවක් හැටියට සලකනවා. එතකොට අපේ රටේ තිබෙන වෙහෙර විහාර ආදිය, වැව් අමුණු ආදිය, පැරණි ගම් ආදිය පුරා වස්තු හැටියට අපි සලකනවා. ඒවාට අනුබද්ධව තිබෙන සඳකඩ පහණක්, පඩි ගලක්, කොරවක් ගලක්, ගඩොල් කැටයක් වාගේ දෙයක් වුණත්, එවකට මිනිසුන් භාවිත කරපු කාසියක් වුණත් ඒ හැම දෙයක්ම අපි පුරා වස්තුන් හැටියට සලකනවා. පුරා වස්තුවක් කියන එක අර්ථකථනය කරලා තිබෙන්නේ එහෙමයි. අපේ සම්මතයේ හැටියට අවුරුදු සියයක් හෝ සියයකට වඩා පැරණි හෝ යම් මානව නිර්මාණයක් තමයි පුරාවස්තුවක් හැටියට සලකන්නේ. ඒක නිධානයක් නොවෙයි. ඒක පුරාවස්තුවක්.

නිධාන වර්ග දෙකක් තිබෙනවා. එක් වර්ගයක් තමයි, මේ මහ පොළොව හට ගන්න කොට මහ පොළොව තුළ ස්වාභාවිකව ඇති වුණු නිධි. පොළොවේ මැණික් තිබෙනවා. පොළොවේ රත්තරන් තිබෙනවා. පොළොවේ මිනිරන් තිබෙනවා. පොළොවේ වැලි තිබෙනවා. පොළොවේ රිදී තිබෙනවා. තවත් ජාති මේ පොළොව තුළ නිධි වශයෙන් තැන්පත් වෙලා තිබෙනවා. මේවා නිධාන. යම් පුද්ගලයෙක්, රජෙක් හෝ වේවා, මැති ඇමති කෙනෙක් හෝ වේවා, සාමාන්‍ය පුද්ගලයෙක් හෝ වේවා තමා ළඟ තිබෙන ධනය මතු ආරක්ෂාවට සඟවලා තියනවා. ඒකත් එක නිධානයක්. එතකොට ඒවා අපි සලකන්නේ නිධාන හැටියට. මගේ කථාවේදී මම පැහැදිලි කරලා දුන්නා, මේ නිධාන ගැන. පුරාවස්තු මෙන්ම නිධානත් රජය සතුයි. මම පැහැදිලි කරලා දුන්නේ මේ නිධාන, නිධි රජය අරගෙන, භාණ්ඩාගාරයට අරගෙන, රටේ ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා පරිහරණය කිරීමට ගන්න ඕනෑ කියලායි. ඒක වැරදිද? පොළොවේ තිබෙන මැණික් කණින එක වැරදිද? පේසාලයේ තෙල් නිධි කණින එක වැරදිද? කැලණි ගඟේ දැන් රත්තරන් හම්බ වෙනවා කියලා කියනවා. ඒවා ගරලා ගන්න එක වැරදිද? වැලි ගොඩ දාලා, මනම්පිටිය දිහා සිට වැලි ගෙනෙන එක වැරදිද? ඒවාත් ධන නිධි. ඒවා රජය සතුයි. රජයෙන් අවසර අරගෙන ඒවා පරිහරණය කරන්න, ඒවා එක්කහු කරන්න සාමාන්‍ය ජනතාවටත්, ව්‍යාපාරිකයන්ටත් පුළුවන්කම තිබෙනවා. ඒක වැරදි නැහැ නේ. මේක අල්ලාගෙන මාධ්‍යයෙන් පළ කළේ වැරදි විධියට. සර්පයා අල්ලා ගත යුත්තේ බෙල්ලෙන් මිස වල්ගයෙන් නොවේ. මගේ කථාව අල්ලා ගත්තේත් වල්ගයෙන්.

අලගද්දූපම සූත්‍රයේදී, සර්ප උපමාවෙන් බුදුරජාණන් වහන්සේත් දේශනා කර තිබෙනවා, "මගේ ධර්මය වැරදි ලෙස අල්ලා ගන්න එපා." කියලා. වැරදි ලෙස අල්ලා ගත්තොත් එයින් තමාටම විපතක් වන බව බුදු රජාණන් වහන්සේ පෙන්වා දෙනවා. ඒ නිසා මේ කථාවෙන් නිකරුණේ අහක ඉන්න අපට මඩ ගහලා හැම දෙනාම පාප කර්මයක් සිද්ධ කර ගත්තා. අපි කියාපු එක වැරදි විධියට අල්ලා ගෙන. ඒ නිසා මේ පුරාවස්තු සහ මේ නිධාන සියල්ලේ අයිතිය තිබෙන්නේ රජයට. රජය කියන්නේ මහ ජනතාව පත් කර ගත් බලයට.

අපි පුරාවස්තු ගනිමු. පුරාවස්තු, ජංගම පුරාවස්තු සහ ස්ථාවර පුරාවස්තු කියලා දෙවර්ගයක් තිබෙනවා. ස්ථාවර පුරාවස්තු කියන්නේ ගෙනියන්න බැරි තැන්පත් වෙලා තිබෙන ඒවා. ජංගම පුරාවස්තු කියන්නේ ගෙනියන්න පුළුවන් ඒවා. අපි හිතමු, සඳකඩ පහණක් ගැන. සඳකඩ පහණක් ගෙනියන්න බැහැ. එතැනම තිබෙන එකක්. චෛත්‍යයක් ගත්තොත් ගෙනියන්න බැහැ. එතැනම තිබෙන එකක්. ගල් කණුවලින් හදපු ගොඩනැඟිල්ලක් තිබෙනවා නම් ඒක එතැනම තිබෙන එකක්. නමුත් එම ස්ථානවල පොඩි කාසි, පොඩි කරඬු ආදී දේවල් තිබෙනවා නම්, ඒවා ජංගම පුරාවස්තු.

මේ පුරාවස්තු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පිළිවෙළක් තිබෙනවා. රජය අනුගමනය කළ යුතු පිළිවෙළ තමයි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවලා ක්‍රියාත්මක කරන්නේ. මේවා කණින්න ඕනෑ. මේ කැණීම්වලින් ලබා ගන්නා දේ කෞතුකාගාරවල තැන්පත් කරලා තියන්න ඕනෑ. කණින ලද ස්ථාවර පුරාවස්තු සංරක්ෂණය කරලා ආරක්ෂා කරලා ජාතික උරුමයක් හැටියට, ජාතික ධනයක් හැටියට, ජාතික සම්පතක් හැටියට ජාතියේ දායාද හැටියට තියන්න ඕනෑ. ඒක මම පැහැදිලි කරලා දුන්නා. නමුත් ඒක වෙනත් පැත්තකට හරවා ගෙන. පුරාවස්තුවත්, නිධානයත් දෙක එකට කලවම් කර ගෙන, පුරාවස්තු කැණීමට, ඒවා හාරලා ගැනීමට රජයට පක්ෂව මම කථා කළාය කියලා අසත්‍ය චෝදනාවක් ඉදිරිපත් කළා.

ඒක පැහැදිලි කර ගන්න ඕනෑ. මේ අවස්ථාවේදී ඒ ගැන කරුණු පැහැදිලි කර දෙන්න ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. පුරාවස්තු පිළිබඳව ගනු ලබන ප්‍රතිපත්තිය ඒකයි. හැබැයි, ශාස්ත්‍රීය වශයෙන් අපි තේරුම් ගන්න ඕනෑ දෙයක් තිබෙනවා. එනම් මේ පුරාවස්තු විනාශය කිසි කෙනෙකුට නවත්වන්න බැහැ. ස්වභාවිකව පුරාවස්තු විනාශ වෙනවා. අනිත් එක තමයි, පුරාවස්තු කැනීමත් පුරාවස්තු විනාශ වීමක්.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න පුළුවන්ද?

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මොකක්ද කියන්නේ?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබවහන්සේ ප්‍රකාශ කළ විධියට ජංගම පුරාවස්තුත්, ඒ වාගේම ස්ථාවර පුරාවස්තුත් තිබෙනවා. දැනට රජය විසින් කර ගෙන යන්නේ, ස්ථාවර පුරාවස්තු අරගෙන ඒවා ජංගම පුරාවස්තු බවට පරිවර්තනය කිරීමේ මෙහෙයුමක්ද?

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
තමුන්නාන්සේ මේ කොහේද යන්නේ? තමුන්නාන්සේට වැරදීමක්. තමුන්නාන්සේ හලාවත ඉඳලා මොනවා හෝ අනුභව කරලා ඇවිල්ලා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ නේ එහෙම දේවල් වැල්ලව පොලීසියේ ඉන්න කාලයේ කරන්න ගිහිල්ලා

අමාරුවේ වැටුණේ. කරුණාකරලා මගේ කාලය කන්න එපා. කරුණාකරලා ඔබතුමා වාඩි වෙලා මගේ වටිනා කථාවට ඇහුම් කන් දෙන්න. ඔබතුමා පස්සේ කථා කරන්න. ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ස්වාමීන් වහන්සේගේ දේශනයට ඉඩ දෙන්න.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මේ පුරාවස්තු කැණීමත් එක්තරා විධියක පුරාවස්තු විනාශයක්. විශිෂ්ට පුරාවිද්‍යාඥයකු වූ සර් මෝටිමර් වීලර් ඔහුගේ පරීක්ෂණවලදී ඔහු ඉදිරිපත් කරලා තිබෙන අදහසක් තමයි, "සෑම පුරාවස්තු කැණීමක්ම පුරාවස්තු විනාශයක්" කියන එක. නමුත්, පුරාවස්තු විනාශයක් සිද්ධ වෙනවා කියලා අපට පුරාවස්තු කැණීම් නොකර බැහැ. පුරාවස්තු කැණීම් කරලා, එහි තත්ත්වය මතු කරලා, එයින් දෙන සංස්කෘතිය, එයින් දෙන ජාතියේ ඉතිහාසය, ජාතියේ ප්‍රෞඪත්වය නිරූපණය කරන්න පුරාවිද්‍යාත්මක කැණීම් කරන්නට ඕනෑ. තමුන්නාන්සේලා චෝදනා කරනවා, පුරාවස්තු කැනීමට අරක්ෂක අංශවල සම්බන්ධයක් තිබුණාය කියලා. මම ඒක මුලදී සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. මම කියන්න කැමැතියි, මේ රටේ පුරාවස්තු ලක්ෂ දෙකහමාරක් පමණ තිබෙන බව සඳහන් වෙනවා. ඔය කථා කරන කවුරුවත් ඒවායින් භාගයක්වත් නරඹලා නැහැ. නමුත්, මට පැහැදිලිවම කියන්න පුළුවන් එයින් එක්ලක්ෂ පනස්දාහක්වත් මම නරඹලා තිබෙනවා කියලා. ඔබතුමන්ලා ගිහිල්ලා යාල අභය භූමිය පුරාම තිබෙන පුරාවස්තු බලන්න. එකම එක ස්ථානයක්වත් ආරක්ෂා වෙලා තිබෙනවාද කියලා බලන්න. ඒවා අද ඊයේ හාරලා නොවෙයි. 1960 ගණන්වල, 1950 ගණන්වල මම ඒ ප්‍රදේශවල කැළෑ පීරා ගෙන ඇවිදින කාලයේ, විල්පත්තු අභය භූමිවල කැළෑ පීරා ගෙන ඇවිදින කාලයේ, මාදුරුඔය වනාන්තරය පීරා ගෙන ඇවිදින කාලයේ මේ කියන පුරාවස්තු විනාශ කරලා තිබෙන ආකාරය මම මගේ ඇසින් දුටුවා. එතකොට ඒ ලක්ෂ ගණනක් වන පුරාවස්තු තිබෙන ස්ථාන අද ඊයේ නොවෙයි හාරලා විනාශ කරලා තිබෙන්නේ. පෘතුගීසීන් ලංකාවේ තිබුණු පුරාවස්තු විනාශ කළා.

ඊයේ ගරු අස්වර් මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ කථා කරන කොට ජයවර්ධනපුරය ගැන සැලළිහිණි සන්දේශයෙන් ලස්සන කවියක් කිව්වා. ජයවර්ධනපුරයේ තිබෙන පුරාවස්තු කොහේද තිබෙන්නේ කියලා මට පෙන්වන්න. "මනකල් ඉසුරු කෝවිල ලගිනේ ලක ළ" කියලා ජයවර්ධනපුරයේ ඉසුරු කෝවිලක් ගැන කියා තිබෙනවා. කෝ ඒ ඉසුරු කෝවිල. "පෙනේ දකුණ මහසෙන් දෙව් රද පා ය" කියලා මහසෙන් දෙවියන්ගේ, එහෙම නැත්නම් කතරගම දෙවියන්ගේ මහා ප්‍රාසාදයක් -දේවාලයක්- ගැන සැලළිහිණි සන්දේශයේ කියා තිබෙනවා. කෝ ඒක? "වඳු දළදා හිමි තෙමහල් පහය ර දි" කියලා දළදා වහන්සේ වැඩ සිටිය තුන් මහල් ප්‍රාසාදයක් ගැන සැලළිහිණි සන්දේශයේ සඳහන් වෙනවා. අද තිබෙනවාද ඒක? මේ ලංකාවේ අවසාන අගනුවර හැටියට සැලකුව රාජධානියේ අද මොනවාද ඉතිරි වෙලා තිබෙන පුරාවස්තු? කවුද ඒ පුරාවස්තු නැති කළේ? ඒ සියල්ලම නැති කළේ යුරෝපා ජාතීන්, පෘතුගීසීන්, ලන්දේසීන් සහ ඉංග්‍රීසීන්. ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ අනුරාධපුරයේ පාලනය කරපු අයිවර් කියන ඒජන්තවරයා ජේතවනාරාම දා ගැබේ ධාතු ගර්භය හොයන්න අඩි 162ක් හරහට හෑරුවා.

මේවා විනාශ කළා. මේවා කළේ කවුද? මේ කියන නිධන් වස්තු; මේ කියන පුරාවස්තුවල ඔය කියන සම්පත් කවදාවත් දකින්න ලැබෙන්නේ නැහැ. දැන් මෙතැන කියැවුණා, එක කාරණයක්. මොකක්ද? දුටුගැමුණු රජ්ජුරුවන්ගේ කඩුව හොයනවා ලු. මොකටද? මේ කඩුව ගත්තාම ඔහු අපරාජිත වෙනවා කියලා. අනේ දෙවියනේ! මට පුදුම හිතෙනවා, මේ විධියේ මොට්ට -මෝඩ- කථාවල් මේ සමාජයේ මනුෂ්‍යයෝ කියනවා නේ. තමුන්නාන්සේලාට මම කියන්නම්. දුටුගැමුණු රජ්ජුරුවෝ රුවන්වැලි මහ සෑය හදන්න මහා මහන්සියක් ගත්තා. ඒක නිමා කර ගන්න බැරිව අතර මහ පුළිල මලුවේ නිදා ගෙන සිටින විට දුටුගැමුණු රජ්ජුරුවෝ මරණයට පත් වුණා. එතකොට ඔය කඩුව රජ්ජුරුවෝ ළඟ තිබුණා නම්, රජ්ජුරුවන්ට අපරාජිත වෙන්න බැරි වුණේ මොකද? ඒ කඩුව හදපු; ඒ කඩුව පාවිච්චි කරපු; ඒ කඩුවේ හිමිකරුවා වූ දුටුගැමුණු රජ්ජුරුවොත් අර මහා චෛත්‍ය හදලා ඉවර වෙන්න ඉස්සෙල්ලා මරණයට පත් වුණා. මේ කඩුව ළඟ තිබුණු මනුෂ්‍යයාට මරණයට පත් නොවී අපරාජිත වෙන්න බැරි වුණේ ඇයි? ඉතින් ඒ විධියේ වෙච්ච කඩුවක් අරගෙන වර්තමාන යුගයේ කෙනෙකුට අපරාජිත වෙන්න පුළුවන් කියනවා නම් ඒක තරම් පට්ටපල් කෙප්පයක් තවත් තිබෙනවාද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපිත් කියන්නේ ඒක තමයි.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මේ වාගේ පව කථාවල් -මේ වාගේ බොරු කථාවල්- අනන්ත අප්‍රමාණ අපට ඇහෙනවා. දැන් ඔය නිධන් හාරන තැන්, හාරපු තැන් ගැන අපි හොයලා බැලුවා. මම අවුරුදු 44ක් මේ රටේ ජාතික පුරාවස්තූන් පිළිබඳව, ජාතික උරුමය පිළිබඳව සොයා බලන්නේ කිසි කෙනෙකුගෙන් ශත පහක උදව්වක් ඇතිව නොවෙයි. මේවා කරන්නේ මගේ අතින් වියදම් කරලා අපෙන් ජාතියට දායාද කරලා දෙන්න තිබෙන සේවයක් හැටියට සලකා ගෙනයි. මම ඔය හැම තැනම ගිහිල්ලා බැලුවා, මේ හාරලා තිබෙන නිධන් වස්තු මොනවාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමූලික, පට්ට පල් බොරු. ඔය කියන එක තැනකවත් තිබිලා යමක් හම්බ වෙලා නැහැ.

දැන් මම නිදර්ශනයක් කියන්නම්. කෙනෙකුට මේ ගැන හිතන්න මම කරුණු කියන්නම්. කනිට්ඨ තිස්ස රජ්ජුරුවෝ කරවපු ධාතු නිධාන තුනක් ලංකාවේ හම්බ වෙලා තිබෙනවා. එකක් දීඝවාපී චෛත්‍ය අම්පාරේ. අනෙක් එක කන්දන්කාරු, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වෙල්ගම්වෙහෙරට උතුරින් කොටිකැලේ තිබිලා හම්බ වුණා. මේ ස්ථාන දෙකේ තිබුණු රත්තරන් පත් ඉරුවක ලියා තිබුණා, කනිට්ඨ තිස්ස රජ්ජුරුවෝ ධාතු නිධානයක් කරපු බව. එහිදී පොඩි කරඬු දෙකක් හමු වුණා. මේ කරඬුවක් අඟල් දෙක හමාරක් තරම් පුංචියි. එතකොට මේ රට සශ්‍රීකවත්ව පැවැති කාලයේ රට පාලනය කරපු කනිට්ඨ තිස්ස රජ්ජුරුවෝ මේ චෛත්‍යයේ නිධන් කරපු රත්තරන් කරඬුව අඟල් දෙකකටත් වඩා පුංචි නම්, ඒ වාගේම දීඝවාපිය වාගේ චෛත්‍යයක නිධන් කරපු කරඬුව ඒ වාගේ පුංචි නම්, ඔය තරම් කියන අඩි ගණන් උස විශාල රත්තරන් කරඬු මේවායේ තිබෙයි කියලා තර්ක කරන්න, විශ්වාස කරන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවාද? අලි බොරු.

මම තව කාරණයක් කියන්න කැමැතියි. අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දැන් මෙතැන නැහැ. එතුමා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පාළු හංගමුව කියන පන්සලේ බෝධීන් වහන්සේට ප්‍රාකාරයක් හදන්න පොළොව කපන කොට ප්‍රතිමාවක් හම්බ වුණා. එය ප්‍රසිද්ධ කළා, පත්තරවල දිගට හරහට

[ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි]

විස්තර පළ වුණා, අඩි මෙච්චර ගණනාවක් උස දඹ රන් ප්‍රතිමාවක් හම්බ වුණා කියලා. දඹ රන් දේව ප්‍රතිමාවක්. කොහේද ඔය දඹ රන් තිබෙන්නේ? මේ මනස්ගාත. මේවා නැති කරන්න ඕනෑ. මේ දුර්මත නැති කරන්න ඕනෑ. දඹ රන් කියන දේ කොහේද තිබෙන්නේ? දඹ රන් කියන එක පිළිබඳව කෞටිල්‍යාගේ අර්ථ ශාස්ත්‍රයේ අර්ථ කථනයක් තිබෙනවා. ඉන්දියාවේ හිමාලය වනයේ තිබෙනවා, දඹ කියලා ගෙඩි ජාතියක්. ඒ දඹ කියන ගෙඩි ජාතිය ඉදුණාම ඇතුළත කහ පාටයි. මේ දඹ ගෙඩි යමුනා ගඟට වැටෙනවා. යමුනා ගඟට වැටිලා, යමුනා ගඟෙන් ගලා ගෙන ඇවිල්ලා ගංගා ගඟට වැටෙනවා. ඒ දඹ ගෙඩි හැපිලා දඹ ගෙඩිවල තිබෙන යුෂය ගඟේ ඉවුරේ පස්වලට හැපෙනවා. පස්වල හැපිලා, පස්වලට උරා ගෙන කාලාන්තරයක් තිස්සේ ඒ විධියට සර්ෂණය වීම නිසා රත්තරන් හැදෙනවා. අන්න ඒකට තමයි "දඹ රන්" කියන්නේ කියලා කෞටිල්‍යා අර්ථ ශාස්ත්‍රයේ මේකට අර්ථ කථනයක් තිබෙනවා.

අපේ රටේ තිබෙනවාද එහෙම දඹ රන්? අනික, ඔය දඹ ගෙඩියක් ඇවිල්ලා රත්තරන් ටොන් ගණනක් හැදෙනවාද? රත්තරන් කැල්ලක් හැදෙන්න කොච්චර කාලාන්තරයක් යනවාද? ඒ නිසා මේ දඹ රන් කථාව සම්පූර්ණ අසත්‍යයක්. විහාරස්ථානවල ඉන්න ඇතැම් අය ඒ ස්ථානවල ගෞරවය සඳහා මේ වාගේ වටිනා වස්තු තිබෙනවා කියලා ප්‍රචාරය කරනවා. මෙන්න මේ වාගේ අසත්‍ය ප්‍රචාර මේ ස්ථානවල තිබෙන පුරා වස්තු විනාශ වීමට හේතු වෙනවා. මම ගියා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඔය පාළු හංගමුව ස්ථානයේ පිළිමය බලන්න. මට කිව්වා එතැන ඉන්න අය, "අනේ හාමුදුරුවනේ, සමා වෙන්න. අපට ටිකක් සම්මාදන් කර ගන්න මේ ප්‍රතිමා වහන්සේ දඹ රන් කියලා කියන්න" කියලා. මම කිව්වා, "මට අසත්‍යයක් කියන්න බැහැ, මම ඇත්ත කියන්නම්" කියලා. මට මයික් එක දුන්නා. මම කිව්වා, "පිංවතුනි, මේ පිළිමය දඹ රන් නොවෙයි, පස් ලෝවලින් හදාපු ප්‍රතිමාවක්" කියලා. ඒ මිනිස්සු මා එක්ක තරහා වුණා ඒක කිව්වා කියලා. තත්ත්වය ඕකයි. ඒක නිසා මේ ගෙන යන ප්‍රචාර සම්පූර්ණ අසත්‍යයි. මෙහෙම නිදන් වස්තු නැහැ. ඔය චෛත්‍ය තිබෙන ස්ථාන, බෝධීන් වහන්සේ වැඩ සිටින ස්ථාන, බුදු පිළිම වහන්සේ වැඩ සිටින ස්ථාන හාරන්නේ අසත්‍ය ප්‍රචාර නිසයි. ඒ නිසා මේ රටේ මේ පූජනීය ස්ථානවල ඔහොම නිදන් වස්තු නැහැ කියන එක අපි පැහැදිලි කරලා දෙන්න ඕනෑ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් කරන ලද කැණීම්වලදී හම්බ වෙලා තිබෙන සියල්ල එකතු කළත් මූල්‍යමය වශයෙන් වටිනාකම තිබෙන්නේ ඉතාම සුළු ප්‍රමාණයක්. හැබැයි ඒවා පුරාවස්තු වශයෙන් වටිනවා. ඒ නිසා මේ වැරදි මත අපි සමාජය තුළින් නැති කරන්නට ඕනෑ.

ඒ වාගේම මුස්ලිම් දරුවකු බිලි දීමකට ගෙනාවා කියලා කිව්වා. කොයි දරුවා වුණත් බිලි දීමට ගෙනාවොත් ඒක වැරදියි. මීට පෙරාතුවත් වාර්තා වුණා මේ වාගේ බිලි දීම් පිළිබඳව. මේ සියල්ලම කරන්නේ කවුද? මේවා කට්ටඩිකාරයෝ, ජේන කාරයෝ තමන්ගේ මඩිය තර කර ගන්න කරන ප්‍රයෝග.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

ඒ වාගේම මා තව කාරණයක් ගැන කියන්න කැමැතියි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක්තරා පන්සලකට කණ්ඩායමක් ගිහිල්ලා ඒ පන්සලේ ස්වාමීන් වහන්සේට කියා තිබෙනවා, "හාමුදුරුවනේ, මේ විහාරස්ථානයට ඇතුළු වන තැන ඇතෙක් බරට වස්තුව තිබෙනවා, අපි මේක ගනිමු. ඔබ වහන්සේට භාගයක් දෙන්නම්, අපි භාගයක් ගන්නම්" කියලා. පස් දෙනකු ගිහින් තිබෙනවා. "අපි අසවල් අයගේ අයයි" කියලා බොහොම ලොකු සම්බන්ධතාවකුත් පෙන්නුම් කර තිබෙනවා. ඒ ස්වාමීන් වහන්සේ මා එක්ක හිතවත් නිසා එතැනින් ටිකක් ඈතට ගිහිල්ලා මට දුරකථනයෙන් කථා කරලා කිව්වා, මෙන්න මෙහෙම දෙයක් සිද්ධ වෙනවා කියලා. මම කිව්වා, දායක සභාවත් එක්ක එකතු වෙලා කථා කරලා තීරණයකට බහිමුය කියලා ඔබ වහන්සේ කියන්න කියලා. එහෙම කථා කරලා දිනයක් ලෑස්ති කර ගත්තා. මම ගොකරැල්ල පොලීසියට කිව්වා, මෙන්න මෙහෙම වැඩක් සිද්ධ වෙනවා, වහාම ගිහිල්ලා ඒ අය අත් අඩංගුවට ගන්නය කියලා. පස් දෙනෙක් අත් අඩංගුවට ගත්තා. බැලුවාම ඒ අය කවුද? විශ්‍රාම ගිය පුරා විද්‍යා නිලධාරියකුත් එතැන සිටියා. බැංකුවක මනුෂ්‍යයකුත් සිටියා. ගිහිල්ලා කිව්වේ කවුරු කියලාද? "අසවල් කෙනාගේ බලය ඇතිව තමයි අපි ආවේ, අපට ඔක්කෝම ඉන්නවා" කියලායි කියා තිබෙන්නේ. මොකක්ද මේ කරන්නේ? මේ හොරකම, තක්කඩිකම කරන්න යන පුද්ගලයින් ගිහිල්ලා තමන්ගේ ශක්තිය පෙන්වන්න, ආරක්ෂාව පෙන්වන්න මේ අහක ඉන්න බලවතුන්ගේ නම් ප්‍රකාශ කරලා බලය ලබා ගන්නා එකයි කරන්නේ. රවට්ටනවා. අන්න එහෙමයි මේ රජයට චෝදනා කරන්නේ. මට මේ සම්බන්ධව හුඟක් කථා කරන්න පුළුවන්.

දැන් මේ යෝජනාව කරපු ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන ඌව පළාතේ මරගල කඳු වැටිය ගන්න. මරගල කඳු වැටියේ සිරිගල ඉස්පිරිතාලය ළඟින් කන්ද උඩට නඟින විට තිබෙන මයුරා ලෙන රජ මහා විහාරස්ථානයේ එක පැත්තක තිබුණු සුවිසි විවරණය, අනෙක් පැත්තේ තිබුණු ශෛලමය බුද්ධ ප්‍රතිමා වහන්සේලා ඔක්කෝම කුඩු පට්ටම් කර දමලා තිබෙන්නේ 1960 ගණන්වලයි. ඉතින් ඔය අස්සක් මුල්ලක් නැර තිබෙන තොරතුරු අපට මීට වඩා පැහැදිලි කරන්න පුළුවන්. නමුත් කාල වේලාව මදි. අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් දැන් මගේ කථාව කොහොම හරි නවත්වන්න උත්සාහ කරනවා. නමුත් මම කියන්න කැමැතියි, මේ පුරාවස්තු කියන ඒවාත්, නිදන් වස්තු කියන ඒවාත් අපි හැම දෙනාටම අයිති දේවල් බව. මම අර කලින් විස්තර කරපු නිදන් වස්තු කියන ඒවා මේ පොළොවේ තිබෙනවා නම් ඒවා පොළොව යට පස් වෙන්න ඉඩ තියන්නේ නැතිව ඒවා අරගෙන ජනතාවගේ සංවර්ධනය සඳහා යොදවන්න ඕනෑ.

හැබැයි පුරාවස්තු නොවෙයි. පුරාවස්තු කැණීම් කරලා, මහජනතාවට අනාගතයේ තමන්ගේ දායාද හැටියට ලෝකයට පෙන්වන්න පුළුවන් විධියට ඒවා සංරක්ෂණය කරලා තබන්න ඕනෑ. මේ වස්තු, මේ සම්පත් ආණ්ඩු පක්ෂයේ විතරක් නොවෙයි, මේවා විරුද්ධ පක්ෂයේත් සම්පත්. ඒක නිසා එක එක්කෙනාට ඇඟිල්ල දිගු කරන්නේ නැතිව, එක එක්කෙනාට ඉරට කෝටුවකින් හරි ඇනලා පහත් ප්‍රීතියක් ලබන්න උත්සාහ කරන්නේ නැතිව මේ පුරාවස්තු රැක ගන්න, නිදන් වස්තු රැක ගන්න, ඒවායේ නිසි පරිහරණයට සුදුසු පරිදි කටයුතු කරන්න අප හැම දෙනාම අධිෂ්ඨාන කර ගන්න ඕනෑ. අතේ තිබෙන මුදල් වියදම් කරගෙන, ස්වේච්ඡාවෙන් අප මේක කරන්නේ මේවා ජාතියට හිමි කර දිය යුතු වැදගත් දායාද නිසායි; අපේ ජාතික උරුමයන් නිසායි. මේ කාරණය තමුන්නාන්සේලාට මතක් කරනවා.

මෙතෙක් කල් මේ නිදන් වස්තු පිළිබඳව මම කරපු ප්‍රකාශ වැරදි විධියට -සර්පයා වලිගයෙන් අල්ලා ගත්තා වාගේ- අරගෙන ඒ සම්බන්ධයෙන් ඇතැම් අය යම් යම් චෝදනා කළා. ඒවා

සම්පූර්ණයෙන් වැරැදි බව තේරුම් අරගෙන, යම් කිසි දෙයක් නිවැරැදිව ග්‍රහණය කර ගන්න පුරුදු වන්න කියන එකත් මා ඒ අයට මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මේ ගරු සභාව තුළ පහත් ප්‍රීතිය ලැබීම සඳහා මාව වර්ණනා කර කර මට ඇනුම් පද කියපු ඇතැම් මන්ත්‍රීතුමන්ලාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 5.50]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු එල්ලාවල මේධානන්ද නායක ස්වාමීන් වහන්සේ කරපු කථාව මා අහගෙන හිටියා. ඒක මා හිතන්නේ ඉතාම වටිනා කථාවක්. ගරු නායක හාමුදුරුවනේ, නිදන් වස්තු, පුරා වස්තු ගැන ඔබවහන්සේගේ තර්කය හරි වන්න පුළුවන්. නමුත් මේ නිදන් වස්තු, පුරාවස්තු තිබෙන තැන් හාරනවා. අන්න ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මේවායේ වටිනාකමක් තිබෙන්න පුළුවන්, නොතිබෙන්න පුළුවන්. පසු ගිය වකවානුව තුළ මේ වාගේ සිද්ධීන් දහස් ගණනක් වාර්තා වෙලා තිබෙනවා. විවිධ පුද්ගලයන් ගිහින් මේ තැන් හාරන්නේ ඇයි? අන්න ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

මෝඩකම නිසා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මා හිතන්නේ නැහැ මෝඩකම නිසා කියලා. ගෞරවණීය නායක හාමුදුරුවනේ, මා විශ්වාස කරනවා මේ පුරාවස්තුවලට ජාත්‍යන්තර වශයෙන් විශාල වටිනාකමක් තිබෙනවා කියලා. අප දන්නවා මේ කෞතුක වස්තුන්වලට විශාල වටිනාකමක් තිබෙන බව. ඉතින් මේක ජාත්‍යන්තර ව්‍යාපාරයක කොටසක් වන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි ව්‍යවස්ථාව අනුව බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම. ඒක හුඟ දෙනෙකුට අද අමතක වෙලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අප දිවුරුම් දීලා තිබෙනවා මේ ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින් 10 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය."

මෙන්න මේක තමයි අද හුඟ දෙනෙකුට අමතක වෙලා තිබෙන්නේ. මේ සිද්ධස්ථාන, ඒ වාගේම මේ නිදන් වස්තු, පුරාවස්තු ආරක්ෂා කිරීමට රජයේ වග කීමක් තිබෙනවා. රජය ඒ වගකීම පැහැර හැර තිබෙනවා. ඊයේ අපේ ජගත් බාලසූරිය ඇමතිතුමා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට උත්තරයක් දීලා තිබුණා. එතුමා සඳහන් කළා මේ වාගේ සිද්ධීන් 1,500ක් පමණ පසු ගිය වකවානුව තුළ වාර්තා වෙලා තිබෙනවාය කියලා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ මේ වාගේ සිද්ධීන් සම්බන්ධයෙන් රජය අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියලායි. මේ සම්බන්ධයෙන් කී දෙනෙකුට නඩු දමලා තිබෙනවාද? කී දෙනෙක් නීතිය ඉදිරියට ගෙනැල්ලා තිබෙනවාද? කී දෙනෙක් වැරැදිකාරයෝ වෙලා තිබෙනවාද? අන්න ඒකයි අප අහන්නේ.

බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කටු ගෙයි වුණු සිද්ධිය. සමහර පවුල් තමන්ගේ පාරම්පරික වස්තූන්වල ආරක්ෂාව සඳහා ඒවා කටුගෙට පරිත්‍යාග කරනවා. නුගවෙල පරම්පරාවට අයිති කඩු කීපයක්, මුදු කීපයක් ඒ පවුලේ අය විසින් කෞතුකාගාරයට භාර දුන්නා. භාර දුන්නේ ආරක්ෂාවට. මේ භාර දුන්නු කඩු සහ මුදු මහනුවර යුගයේ සිංහල රජ කෙනෙකුගෙන් ඒ පරම්පරාවේ කෙනෙකුට ලැබුණු පරිත්‍යාග. ඒ කියන්නේ නුගවෙල පරම්පරාවේ කෙනෙක් රජතුමාත් එක්ක රට සංචාරය සඳහා යන කොට එක්තරා පුද්ගලයෙක් ඇවිල්ලා ඒ රජතුමාව ඝාතනය කරන්න හැදුවා. ඒ වෙලාවේ මේ නුගවෙල පරම්පරාවේ එක්කෙනා ඉදිරිපත් වෙලා රජතුමාගේ ජීවිතය ආරක්ෂා කළා. එම ක්‍රියාවට කළගුණ සැලකීමක් වශයෙන් කඩු කීපයක් වාගේම මුදු කීපයක් මහනුවර යුගයේ හිටපු සිංහල රජතුමා මේ නුගවෙල පරම්පරාවේ කෙනෙකුට දීලා තිබෙනවා. අවුරුදු සිය ගණනක් ඒ පවුලේ අය මේවා තියා ගෙන ඉඳලා ආරක්ෂාව සඳහා තමයි කෞතුකාගාරයට ලබා දුන්නේ. මේ වාගේ පරිත්‍යාග ගණනාවක් තිබෙනවා. අපේ ඩී.බී. ඒකනායක ඇමතිතුමා කිව්වා, "කටු ගෙයි තිබෙන සිංහාසනයයි, ඔටුන්නයි අතුරුදහන් වුණා" කියලා. මා නම් එහෙම දෙයක් අහලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඒ ගැන අහලා තිබෙනවාද?

මහනුවර රජතුමාගේ සිංහාසනය තවමත් තිබෙනවා. මා දන්නේ නැහැ, අද උදේ කවුරු හරි අරගෙන ගියාද කියලා. එතුමා කිව්වා, මහනුවර රජතුමාගේ සිංහාසනයයි, ඔටුන්නයි එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ කවුද හොරකම් කළාය කියලා. එහෙම දෙයක් නම් අප අහලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහලා තිබෙනවාද? ඒක තවම තිබෙනවා. ඉතින් මේ වාගේ වගකීමෙන් තොර ප්‍රකාශ කිරීම ගැන අපේ කනගාටුව පළ කරනවා. ඒ වාගේම එතුමා කිව්වා, "අලුත් නීති සකස් කරනවා" කියලා. නීති නොවෙයි අවශ්‍ය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැනට මේ රටේ තිබෙන නීතිය ක්‍රියාත්මක කරන්න. ඒක තමයි ඔබතුමා මූලාසනයේ ඉන්න කොට අප පුන පුනා කියන්නේ. අපේ පොලීසියට දේශපාලන ඇඟිලි ගැසීම් නැත්නම් නීතිය ක්‍රියාත්මක වෙනවා. අපේ පොලීසියේ දක්ෂ නිලධාරින් ඉන්නවා; හොඳ නිලධාරින් ඉන්නවා. ඒ අයට ඕනෑම මිනී මැරුමක්, ඕනෑම හොරකමක්, ඕනෑම දූෂණයක් අල්ලන්න පුළුවන්. නමුත් දේශපාලනය ගැවුණාම පොලීසිය අහක බලා ගන්නවා. අන්න ඒකයි අද අපේ රටේ තිබෙන ප්‍රශ්නය. දේශපාලනය ගැවුණාම අහක බලා ගන්නවා. ඒකයි අප මේ පාර්ලිමේන්තුවේ පුන පුනා කියන්නේ, ස්වාධීන පොලිස් කොමිෂන් සභාවක් අපේ රටට අවශ්‍යයි කියලා. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාව නිර්දේශ කරලා තිබෙනවා, වහාම ස්වාධීන පොලිස් කොමිසමක් මේ රටේ ඇති කරන්න කියලා. ඇයි රජය මේක කරන්නේ නැත්තේ? අප කියන තුරු ඉන්න ඕනෑද? එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවේ සඳහන් වෙනවා, "පොලීසිය පමණක් නොවෙයි, සියලු ජාතික ආයතන -පොලීසිය, අධිකරණය, නීතිපති දෙපාර්තමේන්තුව, මැතිවරණ දෙපාර්තමේන්තුව- ස්වාධීන වෙන්න ඕනෑ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රජයට කියනවා, එදා මේ පාර්ලිමේන්තුවේ සිටි සියලු දෙනාම -මන්ත්‍රීවරු 225 දෙනාගෙන් 223ක්- දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන්නාය කියලා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කළා. මේ ජාතික ආයතන අද තිබෙන්නේ විධායකය යටතේයි. එම නිසා විධායක ජනාධිපතිතුමාගේ දේශපාලන හස්තය හරහා මේ සියලු කටයුතු යටපත් වෙනවා. අන්න ඒකයි අප කියන්නේ. දැන් විලච්චියේ සිද්ධිය ගැන බලමු. අපේ ගරු එල්ලාවල මේධානන්ද නායක ස්වාමීන් වහන්සේ ඒ සිද්ධිය ගැන කථා කළේ නැහැ. නමුත් මේ සිද්ධිය සම්පූර්ණයෙන්ම ඇත්ත. මේ විලච්චියේ සිද්ධියෙන්උතුරු නැඟෙනහිර අද ඇති වන තත්ත්වය අපට හිතා ගන්න පුළුවන්. උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ සිදු වන අපරාධ ගැන හිතා ගන්න පුළුවන්.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ සිදු වන අපරාධ ගැන මේ විධියට වාර්තා වන්නේ නැහැ. නමුත් විලච්චියේ මේ සිද්ධිය වාර්තා වී තිබෙනවා. සිංහල ගම්මානවල, සිංහල ගම්මුන් ඒ ආ අය වට කර, ඒ අයට පහර දී ඒ අය තමන්ගේ අත් අඩංගුවට ගත් වෙලාවේ පොලීසිය ගිහින් ඒ අය මුදා ගන්නට කටයුතු කර තිබෙනවා. මා ගරු ඇමතිතුමාගෙන් අහනවා, විලච්චියේ සිද්ධියට කාට ද නඩු දැම්මේ; කවුද අත් අඩංගුවට ගත්තේ කියා. කිසි දෙයක් නැහැ. ඒ වාගේම කෞතුකාගාර සිද්ධියට අත් අඩංගුවට ගත්තේ කවුද? ඒ සිද්ධියට දවස් දෙකකට කළින් CCTV කැමරාව නිෂ්ක්‍රීය කර තිබෙනවා. එතකොට ඉතාමත් පැහැදිලියි, ඒක අභ්‍යන්තර කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බව. එම නිසා විශේෂයෙන්ම මා කියන්නට කැමතියි, අපේ රටේ බහුතරයක් ඉන්නේ බෞද්ධයෝ; එම නිසා ඒ බෞද්ධ උරුමය ආරක්ෂා කිරීම රජයේ වගකීමක් කියා.

විශේෂයෙන් 2600 සම්බුද්ධත්ව ජයන්තිය සමරන අවස්ථාවේදී ඉතිහාසයේ නොතිබුණු ආකාරයට මේ ආගමික සිද්ධස්ථාන මේ විධියට විනාශ වීම අප හෙළා දකිනවා. අප රජයට කියනවා, මේ වැරදි කරන අය අත් අඩංගුවට ගන්න, අධිකරණයට ඉදිරිපත් කරන්න පොලීසියට අවශ්‍ය ස්වාධීනත්වය ලබා දෙන්න කියා. මේ සිද්ධස්ථාන සම්බන්ධයෙන් විතරක් නොවෙයි. මහා අපරාධ සිද්ධ වෙනවා. එයට හොඳම උදාහරණය භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මැතිතුමාගේ ඝාතනය. භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මැතිතුමාගේ ඝාතනයෙන් පස්සේ තිබුණු මරණ පරීක්ෂණයේදී මොකක්ද ඔප්පු වුණේ? ඔප්පු වුණේ භාරත ලක්ෂ්මන් මැතිතුමාට දුමින්ද සිල්වාගේ කණ්ඩායම වෙඩි තිබ්බාය කියායි. වෙන කිසිම සාක්ෂියක් ඉදිරිපත් වුණේ නැහැ. නමුත් මරණ පරීක්ෂණයෙන් පස්සේ මහේස්ත්‍රාත් උසාවියට එනකොට සාක්ෂියක් හැදුවා. භාරත ලක්ෂ්මන් මැතිතුමාගේ පැත්තෙන් දුමින්ද සිල්වාට වෙඩි තිබ්බාය කියා. මේක හදපු සාක්ෂියක්. ඒක ඉතාමත් පැහැදිලියි. අන්තිමට අද මොකක්ද වෙලා තිබෙන්නේ? පැමිණිලිකාරයා, විත්තිකාරයා වෙලා. මේකයි අද රටේ තත්ත්වය. ඒකයි ජාත්‍යන්තර වශයෙන් අද අපට විශාල ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. එම නිසා අප රජයට කියනවා, මේ රටේ නීතිය, යහපාලනය ඇති කරන්න අවශ්‍ය පියවර ගන්න කියා. මා පාර්ලිමේන්තුවේ හැම දාම වාගේ කියන කථාවක් මේක. පොලීසියට දේශපාලනය සම්බන්ධ වුණේ නැත්නම් හොඳට රාජකාරිය කරනවා. නමුත් දේශපාලනය සම්බන්ධ වුණාම ඒ අයගේ රාජකාරි අප බලාපොරොත්තු වන ආකාරයට සිද්ධ වන්නේ නැහැ. එම නිසා නිදන් වස්තු කොල්ලයත් ඒ වාගේ අවස්ථාවක්. එම නිසා මේ නිදන් වස්තු කොල්ලය නවත්වන්නට අවශ්‍ය පියවර ගන්නය කියා රජයට ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 6.02 ]

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගරු සභාවේ සාකච්ඡාවට බඳුන් වෙලා තිබෙන මාතෘකාව මේ පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි. මාධ්‍ය හරහා බොහෝ තැන්වල සාකච්ඡාවට බඳුන් කළ මාතෘකාවක් බවට පත් වී තිබෙනවා. විටින් විට විවිධ මාතෘකා කාලයෙන් කාලයට මතු වීම්, ඒ ඒ කාලානුරූපව පසු ගිය කාලයේ අප දැක්කා. කාලයකදී ග්‍රීස් යකා මතු වෙනවා වාගේ කාලයකදී තවත් කථාවක් මතු කර ඒ හරහා මේ රටේ තැති ගැන්මක් ඇති කර, රටේ ආතතියක් ඇති කර, රටේ ජනතාව කුලප්පු කරන්න, මාධ්‍ය හරහා ප්‍රචාරයක් ලබා ගන්න, තමන්ට ආයුධයක් විධියට ඉස්සරහට ගෙන යන්නට මොකක් හෝ මාතෘකාවක් නැති අවස්ථාවලදී ඒ බංකොළොත්භාවය වසා ගන්න මේ තරම් මේ පිළිබඳව සාකච්ඡා කරනවා ද කියා අපට සැකයක් තිබෙනවා. මොකද පසු ගිය දවසක සරත් ෆොන්සේකා මැතිතුමාගේ බිරිඳ -අනෝමා ෆොන්සේකා මැතිනිය- ප්‍රකාශයක් කළා. “මගේ ස්වාමියා නිදහස් කර ගන්නට මා බොහොම මහන්සි වුණේ, එතුමාව ආයුධයක් කරගෙන, එතුමාව සටන් පාඨයක් බවට පත් කරගෙන, මේ රටේ ඇතැමුන් එතුමාව විකුණ විකුණා ඉස්සරහට ගෙන යන නිසා” කියලා. එතකොට දැන් ඒ මාතෘකාවත් ඉවර වුණා. ඒ මාතෘකාවත් ඉවර වෙනකොට, මේ කාරණය මේ රටේ තවත් මාතෘකාවක් බවට පත් කරගෙන, තවත් "ග්‍රීස් යකෙකුගේ" කථාවක් උලුප්පාගෙන යෑමක් හැටියට අපි මෙය දකිනවා. අපි කොයිම වෙලාවකවත් සඳහන් කරන්නේ නැහැ, මේ රටේ පුරා වස්තු ආරක්ෂා නොකළ යුතුයි කියලා. එහෙම නැත්නම් මේ රටේ නිධන් ආරක්ෂා නොකළ යුතුයි කියලා. අපි මොනම අවස්ථාවකදීවත් එහෙම කියන්නේ නැහැ. මේ රටේ තිබෙන පුරා වස්තු, පුරා විද්‍යාත්මක ස්මාරක වශයෙන් හඳුනාගෙන තිබෙන දෙලක්ෂ හැත්තෑපන් දහසකට අධික ස්ථාන වගකිව යුතු රජයක් විධියට අපි ආරක්ෂා කළ යුතුයි. ඒ සඳහා අපි බැඳී සිටිනවා. ඒ පිළිබඳව තර්කයක් නැහැ; විවාදයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ එල්ලාවල මේධානන්ද හාමුදුරුවෝ බොහොම පැහැදිලිව ප්‍රකාශ කරපු, නිධන් විධියට හඳුනා ගත් සියලුම ස්ථාන ආරක්ෂා කර ගන්නටත් හැකියාවක් නැති වුණත්, එහෙම වුණාය කියලා ඒවා ඕනෑ ඕනෑ විධියට, ඕනෑ ඕනෑ පුද්ගලයන්ට අරගන්නට දීලා, විනාශ වන්නට ඉඩ දීලා, බලාගෙන ඉන්නටත් රජයට හැකියාවක් නැහැ. රජයට යුතුකමක් තිබෙනවා, රජයට වගකීමක් තිබෙනවා, ඒවා ආරක්ෂා කර ගන්න. ඒවා ව්‍යාපාරිකයන්ගේ අතට, එහෙම නැත්නම් කුට පාපතරයින්ගේ අතට යන එක වළක්වන්න රජයට වගකීමක් තිබෙනවා. ඒ වගකීමෙන් රජය බැහැර වෙලා නැහැ කොයිම අවස්ථාවකදීවත්. මේ වාර්තා වෙන සිද්ධි හැම එකක් සම්බන්ධයෙන්ම අවශ්‍ය කරන නියමිත බලය පොලීසියට ලබා දීලා, සියලු පරීක්ෂණ කටයුතු රජය ක්‍රියාත්මක කරමින් පවතිනවා. හැබැයි, මේ පත්තරවල පළ වන, මේ තැන් තැන්වල කථා බහට ලක් වන තරමට, මේ ස්ථානවල පුරා විද්‍යාත්මක වශයෙන් වටිනා කියන දේවල් තිබුණාද, නිධන් වස්තු තිබුණාද කියන එකයි ප්‍රශ්නය. ඒ දවස්වල කථාවක් ආවා, “අතැන ඉන්නවා, ග්‍රීස් යකා. මෙතැන ඉන්නවා, ග්‍රීස් යකා. අතැන ඉන්නවා දැකලා තිබෙනවා” කියලා. ඒ විධියට තැන් තැන්වල කථා කළා. හැබැයි, ඒ විධියට කට කථාවක් විතරයි පැතිරුණේ. අද මේ නිධන් පිළිබඳව කථාවත් එහෙමම තමයි. සමහර තැන්වල කියනවා, “අතැන රත්තරන් පොලු තිබෙනවා, අතැන ධර්ම චක්‍රය තිබෙනවා, අතැන මැණික් පෙට්ටියක් තිබෙනවා, ඒවා ගන්න තමයි මේ කට්ටිය යන්නේ. ඒක ගන්න තමයි මේ කට්ටිය ගියේ” කියලා. එවැනි නොයෙක් කථා කියනවා. මේ එක තැනකින්වත් සොයා ගත්තු දෙයක් පිළිබඳ තොරතුරක් නැහැ. මේවා අරගෙන ගිල්ලාද, මේවා අරගෙන අන්තර්ධාන වුණාද කියන කිසිම දෙයක් පිළිබඳව අදටත් සාක්ෂියක් නැහැ. එහෙම නම්, මවා ගත්ත සිද්ධි සමුදායක් එක්ක, මවා ගත්ත තොරතුරු රාශියක් එක්ක තමයි මේ කට කථා පැතිරෙන්නේ.

අපි දන්නවා, මේ දවස්වල websitesවල අලුත්ම කලාවක් තිබෙනවා, මොකක් හරි ප්‍රවෘත්තියක් හදාගෙන ඒ ප්‍රවෘත්තියත් එක්ක රටේ යම් කිසි රැල්ලක්, මතවාදයක් ඇති කරන. විපක්ෂයේ දේශපාලනඥයනුත් ඒකට හොඳට සහයෝගය දීලා, තල්ලුව දීලා, පාර්ලිමේන්තුවේ ඒ ගැන කථා කරලා පාර්ලිමේන්තුව හරහා නෛතික වටිනාකමක් දීලා, මාධ්‍ය හරහා හොඳ පිම්බිල්ලක් ලබා දීලා, ඒ මන්ත්‍රීවරුන්ටත් මාධ්‍ය හරහා පිම්බෙන්නට හොඳ අවස්ථාවක් ලබා ගන්න මේ වාගේ මාතෘකා පිළිබඳව කථා කරනවා.

අපි මේ සිද්ධි කොනක ඉඳලා විශ්ලේෂණය කරලා බලන්නට ඕනෑ. මා මෙතැනදී රටේ පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන අවතක්සේරුවට ලක් කරනවා නොවෙයි. මේ රටට අයිති, මේ රටේ ඉතිහාසයට අයිති කිසිම දෙයක් යම් කිසිවකු සොරකම් කරලා තිබෙනවා නම් ඒක අවතක්සේරුවට ලක් කරනවා නොවෙයි. හැබැයි, මෙතැනදී සිද්ධියට වඩා දෙයක් මේ අය මතු කරනවා, අර කාක් පිහාටුවේ කථාව වාගේ. පුංචි සිද්ධියක් අරගෙන, කවුරු හරි කණ්ඩායමක් විසින් ඒක පතුරුවා හරිනවා. මේ රටේ ඇතැම් කණ්ඩායම් යම් යම් ස්ථානවලට ගියාම විකුණන්නේ එකිනෙකාගේ නම්. අපේ ගම්වලට ගිහිල්ලා බැලුවොත්, "අහවල් මන්ත්‍රීතුමා තමයි රක්ෂා දෙන්නේ" කියලා කියනවා. මම මේ උදාහරණයක් කියන්නේ. සල්ලිවලට රක්ෂා විකුණන උදවිය ඉන්නවාය කියනවා. සල්ලිවලට රක්ෂා විකුණන අය ඉන්නවාලු. ඔව්, එහෙම විකුණන අය ඉන්නවා. ඒ තමයි දේශපාලන හෙංචයියලාගේ හැටි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ නේ ඉන්නේ.

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
නැහැ, මේ ආණ්ඩුවේ සල්ලිවලට රක්ෂා විකුණන උදවිය කවුරුත් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඇයි නැත්තේ?

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මා පැහැදිලිවම වග කීමෙන් යුතුව කියනවා, එහෙම උදවිය නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඉන්නවා.

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඔය දේශපාලන හෙංචයිලාගේ වැඩ. තමුන්නාන්සේට පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න. එහෙම සිද්ධීන් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔප්පු කරලා පෙන්වන්න පුළුවන්.

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
තමුන්නාන්සේ ඔප්පු කරලා පෙන්වන්න. මේ වාගේ වගකීමක් ඇති සභාවක තමුන්නාන්සේ ඔය වාගේ කථා කියන්න එපා. ඒ වාගේ සිද්ධි නැහැ. හැබැයි, මේ අය තැනකට යනකොට යන්නේ, "මම අහවලාගේ ලේකම්" කියාගෙන නම් විකුණාගෙන. තවත් තැනකට යන්නේ, "මම අහවල් කෙනාගේ සම්බන්ධීකරණ ලේකම්" කියාගෙන. ඒ විධියට මේ රටේ නොයෙක් නොයෙක් තැන්වලට ගිහිල්ලා දූෂිත වැඩ කරන කණ්ඩායමක් ඉන්නවා. එදා බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා, එතුමාගේ ගමේ පන්සලකට නිල ඇඳුම් ඇඳගත් කණ්ඩායමක් ආවා කියලා. ඔව්, වෙන්න පුළුවන්. නිල ඇඳුම් ලා ගත්ත කණ්ඩායම් හිතා මතාම රජය අපහසුතාවට පත් කරන්නට, හිතා මතාම රජයේ ත්‍රිවිධ හමුදාව අපහසුතාවට පත් කරන්න, හිතා මතාම එස්ටීඑෆ් එක අපහසුතාවට පත් කරන්න ඒ වාගේ වැඩ කරන්න පුළුවන්.

ඒ වාගේ කණ්ඩායම්වලට අනවශ්‍ය ප්‍රතිචාරයක් ලබා දීලා, ඒ හරහා කථාවක් ගොඩ නඟන්න පුළුවන්; ඒ හරහා මතවාදයක් ගොඩ නඟන්න පුළුවන්. ඒක තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. ඒවාට අවශ්‍ය කරන ශක්තිය, තල්ලුව මේ මාධ්‍ය හරහා ලබා දෙනවා. ඒවාට අවශ්‍ය කරන ශක්තිය websites හරහා ලබා දෙන කොට, අපේ මන්ත්‍රීතුමන්ලාත් ඒවාට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන කොට ඒවා අවශ්‍ය කරන තැනට එනවා. අතිගරු ජනාධිපතිතුමාට තිබෙන, රජයට තිබෙන ජනතා ප්‍රසාදය කොයි විධියකට හරි පරද්දන්න බැරි වන කොට මේ විධියේ නොයෙක් නොයෙක් උපක්‍රම පාවිච්චි කරනවා. මෙය ඒ වාගේ තවත් එක උපක්‍රමයක්, තවත් අසාර්ථක උපක්‍රමයක් හැටියට තමයි අපි දකින්නේ.

හැබැයි, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට මා ගරු කරනවා, මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන්. මොකක්ද මේ යෝජනාව ගෙන ඒමේ වටිනාකම? මේ යෝජනාව ගෙන ඒම හරහා අපට පුළුවන්කමක් ලැබුණා, මේ රටේ පුරා විද්‍යාත්මක වටිනාකමක් තිබෙන වස්තු පිළිබඳව අවධානය ලක් කරන්න. ඒ වාගේම මේ කාරණය රජයේ සහ සමස්ත රට වැසියන්ගේ අවධානයට ලක් කරන්නත් පුළුවන්කම ලැබුණා. එතුමා කිව්වා වාගේ මේ පුරා විද්‍යාත්මක වටිනාකමක් තිබෙන වස්තු හැම එකක්ම ආරක්ෂා කරන්න, ආරක්ෂා කරලා අනාගත පරම්පරාවට උරුම කර දෙන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපට විශාල වග කීමක් තිබෙනවා. මා විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි, මේ භූමිය සතු වෙලා තිබෙන, අපේ ශ්‍රී ලාංකික ධරණී තලය සතු වෙලා තිබෙන, අපේ ඉතිහාසය විසින් අපට උරුම කරලා දී තිබෙන, මේ ඓතිහාසික වස්තු කාගේ නම විකුණලා හෝ, කාගේ නම පාවිච්චි කරලා හෝ විනාශ කරන්න උත්සාහ කරනවා නම්, ඒවා අරගෙන විකුණා ගන්න උත්සාහ කරනවා නම්, ඒක කවුරු කළත්, ඒක අම්මා අප්පා කළත් වැරැදියි කියලා. ඒක පාපකාරී ක්‍රියාවක්. ඒක සහ ගහන අපරාධයක්. ඒ සෙල් ලිපිවල ලියලා තිබෙන විධියටම අපරාධයක්. ඒක ශාප දෙන ක්‍රියාවක්. ඉතින් ඒ ක්‍රියා සම්බන්ධයෙන් අපි කාගෙන්වත්, අතිගරු ජනාධිපතිතුමාගෙන්වත්, අපේ රජයේ කිසිම කෙනෙකුගෙන්වත් සමාවක් හම්බ වෙන්නේ නැහැ. මේ හැම කෙනෙකුම බලාගෙන ඉන්නේ ඒ වැරැදිකාරයෝ අත් අඩංගුවට ගන්නයි, වැරැදි කරන අය නීතියේ රැහැනට හසු කර ගන්නයි. ඒ නිසා තමයි අද අපි කියන්නේ මේ සම්බන්ධයෙන් දැනුවත් වීම වඩා වැදගත් වනවා කියලා. පුරාවස්තු කියන්නේ මොනවාද, නිධන් කියන්නේ මොනවාද කියන එක ගැන හරියාකාර දැනුවත්වීමක් ඇති වුණාම, ඒ ප්‍රදේශවාසීන් ඇතුළු දැනුවත් විය යුතු උදවිය දැනුවත් කරලා, නීතිය ක්‍රියාත්මක කරන්න පහසුවක්, හැකියාවක් ලැබෙනවා.

හැබැයි, අපි විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට කියන්න කැමැතියි, අපේ ත්‍රිවිධ හමුදාව කියන්නේ ලොකු සේවයක් කරපු, දැවැන්ත සේවාවක් ඉෂ්ට කරපු, තිස් වසරක යුද්ධයකින් පසු මේ රට ජයග්‍රහණය කරා ගෙනි යන්න දැවැන්ත කැපවීමක් කරපු කණ්ඩායමක් බව. සමහර වෙලාවට මේ එන්නේ ඒ කණ්ඩායමේ කීර්ති නාමය කෙළෙසන්න, ඒ අයගේ ධෛර්යය කෙළෙසන්න කුමන්ත්‍රණකාරී විධියට එන එල්ටීටීඊ සංවිධානයේ බලවේගයක් වෙන්න පුළුවන්. ජාත්‍යන්තර බලවේගයක් වෙන්න පුළුවන්. සමහර වෙලාවට ආයුධ අරගෙන නොවෙයි දැන් ඒ අය එන්නේ. දැන් ඒ අය එන්නේ වෙනත් වෙනත් බලවේග හරහා. වෙනත් වෙනත් උපක්‍රම හරහා. මේ එන්නේත් ඒ වාගේ බලවේග

[ගරු මනුෂ නානායක්කාර මහතා]

වෙන්න පුළුවන්. මේ එන්නේත් ඒ වාගේ උපක්‍රම හරහා අපේ හමුදාවට විරුද්ධව කරන වැඩ කටයුතු වෙන්න පුළුවන්. මේ එන්නේත් අපේ රටේ ආණ්ඩුවට එරෙහිව එන අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයක් වෙන්න පුළුවන්. එතැනදී අපි රජයක් විධියට විතරක් නොවෙයි, තමුන්නාන්සේලා හැම කෙනෙකුටමත් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව හැටියට, ශ්‍රී ලාංකිකයෝ හැටියට මේ එක එක වේශයෙන් එන යක්කුන්ගේ ස්වභාවය හරියාකාරව අවබෝධ කර ගන්න යුතුකමක්, වග කීමක් තිබෙනවා.

ඒ වාගේම අවසාන වශයෙනුත් මම කියන්නේ මේකයි. මේ වැරැදි කරන එකෙක් රකින්නවත්, මේ හොරකම් කරන, මේ දූෂණ කරන, මේ නිධන් කොල්ලකන කිසිම පාපතරයෙක් රකින්නවත් නොවෙයි, මේ ගරු සභාවේ මා මේ කථාව කළේ. මා මේ කථාව කළේ, සමස්තයක් වශයෙන් අපි සියලු දෙනා මේ වෙලාවේ එකමුතු විය යුතුයි කියන අදහස පළ කරන්නයි. එය ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මනුෂ නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மனுஷ நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* THE HON. MANUSHA NANAYAKKARA *took the Chair.*

[අ. භා. 6.13 ]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා මීට කලින් මේ විෂයය පිළිබඳව සාකච්ඡා කරමින් කිව්වා, විපක්ෂයට තිබෙන සටන් පාඨ හිඟයක් නිසා මේ ප්‍රශ්න මතු කරනවාය; විපක්ෂයේ මන්ත්‍රීවරුන් තමන්ගේ ප්‍රතිරූප පුම්බා ගැනීමට, ඒවාට නීතිමය වටිනාකමක් දීමට මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්න කථා කරනවාය කියලා. නමුත් එතුමා තේරුම් ගන්න ඕනෑ ප්‍රශ්නය තමයි මේ ව්‍යවස්ථාදායකය රටේ ජනතාවගේ හඬට, ජනමාධ්‍යවල හඬට සංවේදී විය යුතුයි; සවන් දිය යුතුයි; සොයා බැලිය යුතුයි කියන එක. මොකද, පසු ගිය මාස පහක කාලය තුළ පුරා විද්‍යා වටිනාකමක් ඇති ස්ථාන කඩා බිඳ දැමීම්, පුරාවස්තු සොරකම් කිරීමට උත්සාහ කිරීම්, නිධන් හෑරීමට උත්සාහ කිරීම් කියන ගණයට වැටෙන සිදු වීම් 110ක් වාර්තා වෙලා තිබෙනවා. මේක විශේෂ තත්ත්වයක් නොවෙයිද? මේක විශේෂ ප්‍රශ්නයක් නොවෙයිද? මේ ජනමාධ්‍යය බොරුවට මේවා මවනවාද? වෙබ් අඩවි මේ සිද්ධි නිර්මාණය කරනවාද? නැහැ. මේකේ ප්‍රශ්නයක් තිබෙනවා.

අපේ එල්ලාවල මේධානන්ද ගෞරවනීය ස්වාමීන් වහන්සේ සඳහන් කළා, ඒ කියන නිධන්වල වටිනාකමක් නැහැයි කියලා. සමහර විට උන්වහන්සේ අදහස් කළේ රත්‍රන්, මැණික් වාගේ දේවල් නැහැයි කියන එක වෙන්න ඇති. හැබැයි පුරා විද්‍යා වටිනාකමක් ඇති දේ සඳහා රත්‍රන් නම් රත්‍රන් වටිනාකමකුත්, මැණික් නම් මැණික් වටිනාකමකුත් තිබෙනවා. ඒ වාගේම ඒක බුද්ධ ප්‍රතිමාවක් වන්න පුළුවන්, වෙනත් නිර්මාණයක් වන්න පුළුවන්, ඒක නිර්මාණශීලිව සකස් කරපු කළු ගලක් වන්න පුළුවන්. පැරණි වෙන්න, පැරණි වෙන්න ඒ හැම දෙයකම වටිනාකමක් තිබෙනවා. ඉල්ලුම්කරුගේ ස්වභාවය අනුව, අදාළ භාණ්ඩයේ ස්වභාවය අනුව පැරණිකම අනුව වටිනාකමක් තිබෙනවා. ඒ කෞතුක භාණ්ඩ සඳහා තිබෙන වටිනාකමයි. එම නිසා වටිනාකමක් නැහැයි කියන කථාව කීමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මොකද, එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේම තමයි පසු ගිය සති අන්තයේ මේ රටේ වැදගත් ජාතික පුවත් පතකට ප්‍රකාශ කර තිබුණේ, රජය නිධන් හැරුවාට කමක් නැහැයි කියලා. රජය නිධන් හැරුවාට කමක් නැහැයි කියන එකේ අර්ථය මොකක්ද? ඒකේ අර්ථය, "නිධන්වල වටිනා දේ ඇත. එක එක පුද්ගලයන් වෙන වෙනම හාරා අරගෙන යනවා වෙනුවට රජය විසින් හාරා ඒවායේ වටිනාකම ලබා ගැනීම කමක් නැත." කියන එක නේ.

අද උන්වහන්සේ මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ කියපු කථාවයි, ඒ කථාවයි පරස්පරයි. එපමණක් නොවෙයි, උන්වහන්සේගේ ප්‍රකාශය පුවත් පත්වල පළ වෙලා දැන් සතියකටත් වැඩියි. හැබැයි ඒ අදාළ පුවත් පතේ ඒ ප්‍රකාශය නිවැරදි කරන්න කිසිම උත්සාහයක් අරගෙන තිබුණේ නැහැ. අද වුණත් උන්වහන්සේගේ කථාව සමස්ත ලෙස ගත්තාම ඒකේ අර්ථය රජය නිධන් හැරුවාට කමක් නැහැයි කියන අර්ථයම තමයි. එතකොට එහෙම නම්, "නිධන්වල වටිනා දෙයක් ඇත. හාරා රජය ලබා ගත යුතුයි." කියන එකෙන් දැනුවත්ව හෝ නොදැනුවත්ව මේ සමාජයට දෙන පණිවුඩය තමයි, නිධන් හැරුවොත් වටිනා දේ ගත හැකියි කියන එක. උන්වහන්සේ බොහොම දුෂ්කර ජීවිතයක් ගත කරමින් පුරා විද්‍යාවේ දියුණුව වෙනුවෙන් කරන ලද සේවය මා අගය කරනවා. හැබැයි මේ ජරාජීර්ණ දූෂිත ආණ්ඩුවට සක්ක ගහලා, උන්වහන්සේ නියෝජනය කරන ජාතික හෙළ උරුමය පක්ෂයටත් ද්‍රෝහි වෙලා ඒ පක්ෂයේ නායකත්වයෙන් දැන්වීම් නොමැතිව අස් කරන තැනකට පත් වෙච්ච උන්වහන්සේ දේශපාලනිකව කරන මේ කටයුත්ත නම් ඒ නිධන් හොරුන්ට දැනුවත්ව හෝ නොදැනුවත්ව හොරකම් කිරීමට අවශ්‍ය න්‍යාය හදන එක කියලා කනගාටුවෙන් වුණත් කියන්න සිද්ධ වෙනවා. මොකද, නිධන් හොරකමේ යෙදෙන බලධාරින්ට, බලගතු පුද්ගලයන්ට කියන්න පුළුවන්, "බලන්න, එල්ලාවල මේධානන්ද හාමුදුරුවොත් කියලා තිබෙනවා නිධන් හැරුවාට කමක් නැහැයි කියලා. රජය මොකද, රජයේ ඉන්න අපි මොකද?" කියලා. මොකද, මේ ආණ්ඩුවේ ඉන්න සමහරු හිතා ගෙන ඉන්නේ, "එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව කියන්නේ අපියි; අපේ පවුලේ අයයි; අපේ කට්ටියයි; අපේ යාළුවෝ සෙට් එකයි." කියලායි. මේ කරන දේවල් අනුව, මේ රජය මහ ජනතාවගේ බව, මේ රට භාර දීලා තිබෙන්නේ භාරයක් වශයෙන් බව ඒ අය හිතන්නේ නැහැ. ආණ්ඩුව තමන්ගේ පෞද්ගලික බුදලයක් කියා හිතන අය ආණ්ඩුවේ කොටස්වල රජයේ නිලධාරින් ලවා නිධන් හාරවන එක ගැන පුදුම වන්න කාරණයක් නැහැ. අපේ ගෞරවනීය පුරා විද්‍යා චක්‍රවර්ති එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ න්‍යාය හදා දෙන්නේ අන්න ඒ හොර, තක්කඩි රැළටයි. ඒ වාගේම මනුෂ නානායක්කාර -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. ගරුතර එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ මේ සභාවේ ගරු මන්ත්‍රීවරයෙක්. එම නිසා එතුමාට විරුද්ධව එවැනි ප්‍රකාශයක් කිරීම වටින්නේ නැහැ. ස්ථාවර නියෝග අනුව එය ඉල්ලා අස් කර ගන්නට ඕනෑය කියන එක මා පෙන්වා දෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්ථාවර නියෝගවලට පටහැනි යමක් තිබේ නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට නියෝග කරමි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මා කියනවා, මා එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේට හොරා කිව්වේත් නැහැ; තක්කඩියා කිව්වේත් නැහැයි කියලා. එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද තර්කවලින් මේ රජයේ ඉන්න තක්කඩි ආවරණය ලබනවාය; ඔවුන්ගේ වැඩ පිළිවෙළට අවශ්‍ය න්‍යායාත්මක ශක්තිය ලබනවාය කියන කාරණයයි මා කිව්වේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ආරම්භයේදීයි කිව්වේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ආරම්භයේදී කිව්වේත් එහෙමයි. දැන් කියන්නේත් එහෙමයි. උන්වහන්සේට පෞද්ගලිකව අගෞරව කරන්න තරම් මා පහළට වැටිලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඉතාම වැදගත් කාරණයක් තිබෙනවා. එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ අද මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ කළ කථාව තුළ තවත් ඉතාම බරපතළ වරදක් නොදැනුවත්ව කළා. මා නීතිඥවරයෙක්; අපරාධ නීතිය පිළිබඳව පළපුරුද්දක් තිබෙන නීතිඥවරයෙක්. උන්වහන්සේගේ තර්කය ගැන මා විශේෂයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලුවා. මොකක්ද, මේ කියන කථාව? උන්වහන්සේ කියනවා, පුරාවස්තූන් සහ නිධන් වස්තූන් අතර වෙනසක් තිබෙනවාය කියලා. පුරාවස්තූන් හාරන්න බැහැ, අරගෙන යන්න බැහැ, වෙනස් කරන්න බැහැ, හැබැයි නිධන් එහෙම නොවෙයිලු. පැහැදිලි කිරීමක් ඉල්ලූ අවස්ථාවේදී, පුරාවස්තුවක් කියන්නේ අවුරුදු 100කට වැඩි පැරණිකමක් ඇති මානව නිර්මාණයක් කියලා උන්වහන්සේ සඳහන් කළා. එතකොට ඔය නිධන් කියා හාරන දේවල්, ඒ අදාළ ගොඩනැගිලි, ගල් තලාවන් තුළ මනුෂ්‍යයින් විසින් සකස් කර තිබෙන යම් යම් කුහර හෝ වළවල් හෝ ඒ නිධන් තැන්පත් කර ඇති ස්ථාන, ඒ වාගේම ඒවා තුළ ඇති පිළිම, කඩු, ඔටුනු, මැණික්, ස්වර්ණාභරණ හෝ වෙනත් සියලු දේ මානව නිර්මාණයි.

අද ඉඳලා ආපස්සට බලන කොට අවුරුදු 100කට වඩා පැරණි නම් එය කෞතුක වස්තුවක්. එම නිසා ඔය නිධන් ලෙස සලකනු ලබන දේවල්වලින් සියයට 99.9ක්, එහෙම නැත්නම් සියයට 100ක්ම කෞතුක භාණ්ඩ ගණයට වැටෙනවා. එම නිසා කෞතුක භාණ්ඩවලට ලැබිය යුතු නීතිමය රැකවරණය ලැබෙනවා. එම නිසා ආණ්ඩුවටවත් නිධන් හාරන්න බැහැ. ආණ්ඩුවේ නිලධාරියකුට නිධන් හාරන්න බැහැ. කොහොමද, එහෙම කරන්නේ? මේ ගෞරවනීය පාර්ලිමේන්තුව හදන නීතිවලින් මේ ආණ්ඩුවේ මැති ඇමති ධුර දරන අය, රජයේ නිලධාරින්, සාමාන්‍ය සිවිල් පුරවැසියන් ඇතුළු සියලු දෙනාම බැඳිලා ඉන්නවා. ඉතින් උන්වහන්සේ කොහොමද කියන්නේ ආණ්ඩුවට නිධන් හාරන්න පුළුවන් කියලා? එය සම්පූර්ණ වැරැදි තර්කයක්; වැරැදි අදහසක්. ඒක වටිනා දෙයක් වුණත්, වටිනාකමක් නැති දෙයක් වුණත් කෞතුක භාණ්ඩයක් නම් එය මේ ජාතියේ සම්පතක්; මේ ජාතියට අයිති දෙයක්. ඒ දේ එලෙසම ඒ ආකාරයටම තිබීමට ඉඩ හළ යුතුයි. පුරා විද්‍යාත්මක ගවේෂණයක් කරනවා නම් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ තිබෙන සම්මත නීතිරීති අනුව ඒ ගවේෂණය කළ යුතුයි. ආරක්ෂාව සඳහා නිසි ක්‍රමානුකූල කාර්ය පටිපාටිය අනුගමනය කරලා, නිසි ලෙස වාර්තාකරණය කරලා එක් තැනක සිට තව තැනකට රැගෙන යනවා නම් රැගෙන යා යුතුයි. ඒ වාගේම ඒ එක් එක් භාණ්ඩය මතු පරපුරේ ආරක්ෂාව සඳහා සුදුසු ස්ථානවල තැබිය යුතුයි.

එහෙම නැතුව රජ කාලයේ රජවරු හංගපු දේ හෝ වෙනත් ප්‍රභූන් විසින් සඟවන ලද දේ යම් විශ්වාසයන් අනුව සිතා බලා, ඒවා සඟවා ඇති තැන්වලින් ඉවත් කර ගන්නට, තේරෙන භාෂාවෙන් කිව්වොත් නිදන් හාරන්නට, ආණ්ඩුවටවත් මේ රටේ පවතින කෞතුක භාණ්ඩ පිළිබඳ නීතිය අනුව බැහැ. ඒ නිසා මම අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේට සඳහන් කරන්න කැමැතියි, උන් වහන්සේ මේ රටේ පුරා විද්‍යාවට කර ඇති සේවය අගය කරන ගමන් උන් වහන්සේ වාගේ පුරා විද්‍යාව ගැන කීර්තිනාමයක් තිබෙන අය ඔය විධියට වග කීමෙන් තොර ප්‍රකාශ කරන විට, මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ ඔවැනි ප්‍රකාශ කරන විට මේ රටේ සාමාන්‍ය ජනතාවට යන්නේ වැරදි පණිවුඩයක් බව. ඒ නිසා තමයි මම කියන්නේ, වැරදි කරන අයට අවශ්‍ය කරන න්‍යාය උන් වහන්සේ දැනුවත්ව හෝ නොදැනුවත්ව සපයනවා කියා. ඒක මහා පාප කර්මයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා, මේ ගෞරවනීය හමුදාවන්ට අගරු කරන්නට එපාය කියා; නිල ඇඳුම් ඇඳගෙන ඉන්න යුද හමුදාවට, පොලීසියට අගරු කරන්නට එපාය කියා. අපේ එහෙම අරමුණක් නැහැ. විලච්චියේ නිදන් හැරීමේ ක්‍රියා දාමයට හසු වෙලා ඒ ගම්වාසීන් විසින් පහර දීලා සිර කර තබා ගත්තේ ව්‍යාජ ලෙස නිල ඇඳුම් ඇඳ ගත්ත නිලධාරින් නොවෙයි. පොලිස්පති ඉලංගකෝන් මැතිතුමාගේ නියෝගය පිට කොළඹ සිට යවන ලද කණ්ඩායමක්ය කියා පොලිස්පතිතුමා පිළි අරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක පිළිගත්ත කාරණයක්. ඒ ව්‍යාජ ලෙස නිල ඇඳුම් ඇඳ ගත්ත පුද්ගලයෝ කණ්ඩායමක් නොවෙයි.

ඊළඟ කාරණය, පොලිස්පතිතුමා නිල වශයෙන් පුවත් පත් නිවේදනයේ දැක්වූවා, එතුමාට තොරතුරක් ලැබුණා කියා, ඉතා වටිනා වස්තුවක් විලච්චියේ වැව මැද්දේ තිබෙනවා කියා. ඒ ඉතා වටිනා වස්තුව සොයා ගත්තාද? ඒ ඉතා වටිනා වස්තුව පිළිබඳව ගත්ත ක්‍රියා මාර්ගය කුමක්ද? ඒ ඉතා වටිනා වස්තුව පොලිස් රෙගුලාසි අනුව ලැයිස්තුගත කරලා එහෙම නැත්නම් PR කරලා ඉදිරිපත් කළාද? ඒ ඉතා වටිනා වස්තුව ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයට "බී" වාර්තාවකින් ඉදිරිපත් කළාද? ඒ ස්ථානයේ තිබුණු බුල්ඩෝසර් යන්ත්‍රය නැත්නම් බැකෝ යන්ත්‍රය අධිකරණයට ඉදිරිපත් කළාද? අදාළ ස්ථානයේ හිටපු කට්ටඩි ටිකත්, එහි තිබුණු තටුව එහෙම නැත්නම් ඒ නිදන් ගැනීමට යාගහෝම කරපු උපකරණ මහේස්ත්‍රාත් අධිකරණයට "බී" වාර්තාවකින් ඉදිරිපත් කළාද? බැකෝ යන්ත්‍රයේ ක්‍රියාකරුවා ඉදිරිපත් කළාද? ඒ කිසිවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විලච්චියේ සිද්ධිය කියලා කියන්නේ, ග්‍රීස් යක්කු පෙන්නලා ජනතාව ගෙවල් ඇතුළට රිංගවලා, මිථ්‍යාවක් අනුව හෝ නැතුව දිගින් දිගටම කාලයක් තිස්සේ කරගෙන ගිය නිදන් හෑරීමේ හොර තක්කඩි ක්‍රියා දාමය ගැන ජනතාව අවදියෙන් සිටීම නිසා අසු වුණු එක් අවස්ථාවක්. ඒ නිදර්ශනයෙන් පෙන්නුම් කරන්නේ රාජ්‍ය තන්ත්‍රය නිදන් හෑරීමට සම්බන්ධයි කියන එකයි. ඒක වැරදියි; නුසුදුසුයි; ද්‍රෝහී ක්‍රියාවක්. ඒ නිසා ආණ්ඩුව මේකේ වගකීම භාර ගත යුතුයි. ඒ වාගේම අනාගතයේ මේ දේ නොවන්නට මේ දක්වා ආණ්ඩුව ගෙන ඇති එක් එක් පියවර පැහැදිලි කිරීමේ වගකීම අපේ ගරු ඇමතිතුමාට තිබෙනවා. මෙතෙක් ගත්ත නිශ්චිත පියවරත් ඉදිරියේදී ගන්න නිශ්චිත පියවරත් එකින් එක වෙන් වෙන්ව සඳහන් කරන්න කියා මම ඔබතුමාට සුහදව නමුත් අභියෝගයක් කරනවා.

[6.28 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, according to our Constitution, Chapter II on Buddhism, Article 9 states, I quote:

> "The Republic of Sri Lanka shall give to Buddhism the foremost place and accordingly it shall be the duty of the State to protect and foster the Buddha Sasana, while assuring to all religions the rights granted by Articles 10 and 14 (1)(e)."

Then, Chapter III, Article 10 states, I quote:

> "Every person is entitled to freedom of thought, conscience and religion, including the freedom to have or to adopt a religion or belief of his choice."

It continues and further, Article 14 (1) (e) states, I quote:

> "the freedom, either by himself or in association with others, and either in public or in private, to manifest his religion or belief in worship, observance, practice and teaching;"

Sir, what I say is, according to the Constitution, every religion is given the freedom of thought and conscience.

So, Sir, in Sri Lanka, we have the Buddhists, the Hindus, the Muslims and the Christians. They have their places of worship. The places of religion should not be dented or harmed by anybody else in any way. If they try to do that they will be doing an act against the Constitution of Sri Lanka. I think, there are certain areas which the Government should give serious thought to because for the first time - as it has not happened before - there are certain disturbances in the country. That should be nipped in the bud; that must be buried there without allowing it to prosper.

Now, Sir, in this country, we have lived very happily in harmony with the majority Sinhalese in the Sinhalese areas and the majority Tamils in the Tamil areas. We have therefore built up a culture of our own. Our religion is very free. We are expected to practice our religion at our will. But, there are certain incidents that take place and disturbs all of us. Now, for example, in the Kurunegala area, there is a *Madrasa* at Ariyasinghalewatte. A *Madrasa* is a place where the Holy Quran is taught and also a place where children are trained to pray. That is, you learn the Holy Quran and also learn how to pray. Now, certain elements tried to upset the applecart there.

Now, these type of things, I think, the Hon. Minister and the Government must take serious note of because after a long period of suffering, we have won a war. In Geneva, seven Muslim countries voted for us. Then, when we visited Qatar recently with our President, the abundance of goodwill and friendship they showed him, the amount of honour and dignity they showed him and also the amount of respect they showed for him, is remarkable. We have to protect that *status quo* in this country.

Sir. I should also like to mention that during the times of the Portuguese, Dutch and English, architectural sites of the Muslims were also destroyed in certain areas right along Galle, Hambantota, Beruwala and the rest of the island. Then Sir, even in your area; in Galle, there is a place called Palliyawatta. ඒක මොරගොඩ ඇළ අසලයි තිබෙන්නේ. ඒක මාගාල්ලේ පිහිටි ඉතාම පෞරාණික පල්ලියක්. සුනාමියට හසු වෙලා විනාශ වෙච්ච පල්ලිය වෙනුවෙන් පාරෙන් එහා පැත්තේ ලස්සන පල්ලියක් හදලා තිබෙනවා. කිසිම ප්‍රශ්නයක් නැහැ. අන්න ඒ විධියට අපේ ආගම ඇදහීමේ නිදහස ව්‍යවස්ථාව මඟින් සහතික කර තිබෙන ආකාරයෙන් කරගෙන යන්න අපට ඉඩ දෙන්න ඕනෑ.

You know about the Grand Mosque in Colombo. It is an archaeological site. Certain great Saints who came from India, Indonesia and Malaysia were buried there. Incidentally there was a cannon there. When there were no radios or televisions, the people could hear these cannon sounds and that was heard even at far away places, up to Maharagama, which is about 10 miles away. We too used to hear that. Then, we start our fasting and we end the fasting with the sounds of the cannon that comes from the Grand Mosque in New Moor Street, Colombo.

Also, Sir, adjoining that there is a Mosque at the Peer Sahibo Street and our famous Niyas Moulavi, a very popular priest who appeared often on ITN's "Doramadalawa" programme, was the Pesh Imam there. The "Doramadalawa" Programme telecasts on ITN has become one of the foremost ITN productions in this country that has been graded very high. As I said earlier, there were also some Saints buried. Therefore, the attention of the Government should also be drawn towards this place.

Dharma Kabeer Masjid - the Dharga in Hambantota - has a long history and a great heritage. People came from Malaysia, Java and Batavia. Those Saints were buried there and that must also be taken into reckoning to declare it a place of national heritage.

Then, the *Poruwa Palliwase,* we call it, "Poruwa" Mosque in Godapitiya, Akuressa. Sir, the last suicide bomb attack of the Tigers went off at Godapitiya under the shadow of this Poruwa Mosque. I must also mention about Khair Hajiar who expired very recently, - even Dr. Haris Deen and the family came from London and visited the funeral house - his family and others have been very helpful in order to maintain that Mosque. That was the signal of the end of the Tigers in this country. Even the Hon. Mahinda Wijesekara, former Minister of Posts and Telecommunication, a victim of that attack, is still unable to regain his proper health. The Hon. A.H.M. Fowzie, our Senior Minister of Urban Affairs escaped from this attack through, I should say, divine power. He narrowly escaped from that bomb attack.

Sir, the first Mosque built in this country is the Masjidul Abrar in Beruwala. There were steps taken earlier by the Hon. Minister to declare this place as a national heritage and there was also a proposal to issue a stamp, because that is the first Mosque built in this country after Arab settlers came there.

Our famous distinguished Speaker, the Hon. Deshamanya M.A. Bakeer Markar rebuilt it and renovated it, helped by people of the calibre of A.W.M. Razik Marikar, Abdul Hameed Hadjiar, Mr. T.M.N. Hameed, SSP, A.W.M. Ajward, A.A.M. Shamsudeen and also Mr. Ismath Abdulla, who is now domiciled in London, and a lot of interest was also taken by our Friend, a former minister, the Hon. Imthiaz Bakeer Markar. A famous writer, M.K.E. Moulana from India wrote a voluminous book" - "சிந்துமுதல் சேதுவரை" about *ALLIRANI,* who ruled the area in ancient times. That is regarding this historic Mosque at Silvathurai in Mannar. I think we have to take action in order to discover that place because a large number of people speak about it when we go to India. It is a very historical place. That also should come to the reckoning of the Government, when you declare sites of national heritage.

I want to mention about Jaffna. There is Mankumban - an islet - where a Saint is buried. There is a history behind it. Sir, Moor Street in Jaffna also resembles an archeological site now. I must complain in this House that 20 years ago, 75,000 people were driven away even without anything to wear - including our Muslim ladies, you know how conservative they are. They cover their heads with the *fardha*. They were all driven away. Now, if you go and visit the famous Usmania School, Khadija School for the Ladies, they are in ruins.

Jaffna is a very famous place for great learned men like Senator A.M.A. Azeez - we call him *Aringngner* A.M.A Azeez - Justice M.M. Abdul Cader of the Supreme Court and also certain writers like Zubair Ilankeeran. Now, what has happened there? Houses numbering 50,000 are to be built by the donations given by the Indian Government. I told that earlier in this House and I repeat it that I told it in front of the Leader of the Opposition of the Lok Sabha, Mrs. Sushma Swaraj. I told it in her presence when she visied us in Parliament. These houses which will be built, they say, will not be given to the Muslims who were driven away. Which court of justice are we to go? Is this justice, I am asking?

Therefore, Sir, I even now challenge the TNA in this House. When Muslims were driven away at that time and when the Muslims wre massacred at Kattankudy in Eravur, in Alingipathana and Palliyagodella in Polonnaruwa not a word of sympathy, not a word of protest, was said by them at that time. Therefore, I challenge them to declare in this House, any Member of the TNA, specially Hon. R. Sampanthan and also the others. Let them pledge that these houses that will be built soon will be given to the Muslims because they were sent away and also I want these sites to be remodeled and restructured. I told you about Mankumban.

Sir, this country is a blessed country. We used to have "පැණි රඹුටන්" in Malwana. Now, we get "රත්තරන්" from that land. පින්වත් රටක්. ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා නායකත්වයේ ඉන්න වෙලාවක ඒවා ලැබෙන එකයි මේ ගොල්ලන්ට තිබෙන කැසිල්ල. බලන්නකෝ, විරුද්ධ පක්ෂය දිහා. විපක්ෂයෙන් මේ යෝජනාව ගෙනාපු කෙනායි, ස්ථිර කරපු කෙනායි, කථා කරපු අයයි එක් කෙනකුවත් මේ සභාවේ දැන් නැහැ. එක් කෙනකුවත් මේ ගරු සභාවේ නැහැ. This must go on record. This is the first time when a Motion is moved, not a single Opposition Member is present in this House. This is the callous attitude that they show to this House.

බොරුවට කෑ ගහනවා. අපේ මේධානන්ද හිමිපාණන්ට බොරුවට දෝෂාරෝපණය කරනවා. ඒ පාපයට අහු වෙන්න එපාය කියලා උන්වහන්සේ ප්‍රකාශ කළත් අජිත් පී. පෙරේරා මහත්මයා මොහොතකට ඉස්සෙල්ලා ඒක කෙරුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේක කියලා මගේ කථාව අවසන් කරන්නම්.

අපේ ගරු අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා පිළිබඳව ශෝකය ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් මට ලැබුණේ නැහැ. He was a very good friend of the Muslims in that area. He helped Muslim causes and even the schools in Udathalawinna and other places. I know Mr. Fawzan Anver, the SLFP organizer in Colombo Central; he was very friendly with him. Mr. Fawzan Anver got his assistance from General Anurudha Ratwatte in order to help even the Muslims in the Colombo District. Sir, I once introduced *Viththuwan* Rahuman of Mannar to him. *Viththuwan* Rahuman was also very much interested in the protection of archaeological sites.

பெரும்புலவர், மகா வித்துவான், தமிழறிஞர் எம்.ஏ. றஹ்மானின் நாமம் மன்னார் பிரதான வீதியொன்றுக்குச் சூட்டப்படவிருக்கின்றது. மன்னார் பாலத்திலிருந்து ஊர் நோக்கிச் செல்லும் மூன்று பிரதான வீதிகளில் ஒன்றான எஸ்பிலனட் வீதியே - மைதான வீதியே - வித்துவான் றஹ்மான் பெயரில் மாற்றம்பெறுகிறது. மன்னார் நகரசபை இத்தீர்மானத்தை ஏகமனதாக நிறைவேற்றியிருக்கின்றது.

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

மன்னார் பட்டின சபை, நகர சபை வரலாற்றில் ஒரு முஸ்லிம் அறிஞருடைய பெயர் வீதியொன்றுக்குச் சூட்டப்படுவது இதுவே முதற் தடவையாகும். புலவர் பரம்பரையைச் சேர்ந்த வித்துவான் மதாறு முஹைதீன் அப்துல் றஹ்மானின் சகோதரர்களும் மகளும் நாடறிந்த கலைஞர்களும் இலக்கியவாதிகளுமாவர். இதில் கலைவாதி கலீல், மக்கள் காதர், எம். ஏ. கபூர் ஆகியோர் முக்கியமானவர்கள்.

Mr. M.A. Gafoor has been the cameraman for hundreds of films in this country and he has contributed his share. So, this type of people *Viththuwan* Abdul Rahuman and the Muslims of Mannar, Jaffna and down South have been very much interested in protecting their religious places and also in protecting their archaeological sites. I thank the Hon. Minister for listening to me. I hope he would take positive steps towards that. Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next Speaker is the Hon. Jagath Balasuriya. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මනූෂ නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு மனுஷ நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திநின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MANUSHA NANAYAKKARA *left the Chair and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 6.40]

**ගරු ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. Jagath Balasuriya - Minister of National Heritage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හැටියට හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරමින් ප්‍රශ්න පහක් ඇහුවා. ඒ ප්‍රශ්න පහට උත්තර දීලා මගේ කථාව කර ගෙන යාමට මා අපේක්ෂා කරනවා. එතුමාගේ මූලික ප්‍රශ්නය වුණේ, මේ නිදන් වස්තු කොල්ලකෑම් පිටුපස යම් කිසි දේශපාලන හස්තයක් හෝ රජයේ ඉහළ නිලධාරින්ගේ සම්බන්ධයක් තිබේද යන්නයි. එයට අදාළ උත්තරය වන්නේ එවැන්නක් මෙතෙක් අනාවරණය වී නොමැත යන්නයි.

දෙවැනි ප්‍රශ්නය විධියට, මෙම නිදන් වස්තු කොල්ලකෑම් සම්බන්ධයෙන් නීතිය නිසි ආකාරව ක්‍රියාත්මක නොවන්නේ කිසියම් දේශපාලන අදෘශ්‍යමාන හස්තයක බලපෑමක් නිසාද කියා ඇහුවා. ඒකට උත්තරය වන්නේ, නිදන් වස්තු, පුරා වස්තු කොල්ලකෑම පිළිබඳව අල්ලා ගනු ලැබූ සියලුම සැකකරුවන්ට විරුද්ධව පුරාවස්තු පනත යටතේ පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා නීතිය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ යන්නයි.

එතුමාගේ තුන්වැනි ප්‍රශ්නය වුණේ, එම සිද්ධිය සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන ඇති සිද්ධීන් කොපමණ ප්‍රමාණයක් මේ වන විට වාර්තා වී තිබේද යන්නයි. පුරාවස්තු විනාශය වැළැක්වීමේ විශේෂ පොලිස් ඒකකයක් 2008 මාර්තු 04 වැනි දින පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමෙන් පසුව මේ දක්වා සිද්ධීන් 1,351ක් වාර්තා වී තිබෙනවා. මේ සිද්ධීන් සම්බන්ධයෙන් පුද්ගලයන් 1,381 දෙනෙකු මේ දක්වා අත් අඩංගුවට ගෙන ඇත. එසේ අදාළ කාලය තුළදී, එනම් 2008.03.04 සිට 2012.05.14 දක්වා උසාවිවලින් රුපියල් පන්කෝටි අනූතුන්ලක්ෂ හැටදාස් පන්සියයක් දඩ වශයෙන් අය කර ගෙන ඇත.

එතුමාගේ හතරවෙනි ප්‍රශ්නය මෙයයි. 2012 වර්ෂයේ පමණක් පුරාවස්තු කොල්ල කෑම් පිළිබඳව සිද්ධීන් කොපමණ ප්‍රමාණයක් වාර්තා වී ඇද්ද? එම ප්‍රදේශ මොනවාද යන්නත්, ඒ සම්බන්ධයෙන් කොපමණ පිරිසක් මේ වන විට නීතියේ රැහැනට හසු වී ඇද්ද යන්න පිළිබඳවත් මේ සභාවට දන්වන්නේද? මෙහිදී අපට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් එවූ උත්තරය අනුව 2012 වර්ෂයේ පුරාවස්තු කොල්ල කෑම් පිළිබඳ සිද්ධීන් 121ක් වාර්තා වී ඇති අතර, ඒවා ප්‍රදේශ අනුව පහත සඳහන් පරිදි විස්තර කළ හැක. දකුණු පළාතෙන් 5යි. නැඟෙනහිර පළාතෙන් 10යි. බස්නාහිර පළාතෙන් 9යි. වයඹ පළාතෙන් 26යි. උතුරු පළාතෙන් 3යි. උතුරු මැද පළාතෙන් 26යි. සබරගමුව පළාතෙන් 10යි. ඌව පළාතෙන් 12යි. 2012 වර්ෂයේ මේ සිද්ධීන් සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන ඇති පුද්ගලයින්ගේ සංඛ්‍යාව 347යි.

එම නිධන් කොල්ල කෑම් නවතාලීම සඳහා රජය විසින් ඉදිරියේදී ගනු ලැබීමට නියමිත ක්‍රියා මාර්ගයන් කවරේද යන්න මෙම සභාවට වාර්තා කරන ලෙස එතුමා ඊළඟට ඉල්ලීමක් කර තිබෙනවා. මේ අනුව මේ කාරණය පැහැදිලි කිරීමට මා කැමැතියි. පොලිස්පතිතුමා විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂ පොලිස් ඒකකය තව දුරටත් ශක්තිමත් කොට ඊට අතිරේකව පළාත්බදව ඇති වඩාත් සංවේදී පුරාවිද්‍යා ස්ථානවලට දෙපාර්තමේන්තුවේ පොලිස් ඒකකයේ අධීක්ෂණය යටතේ විශේෂ පොලිස් අනු ඒකක පිහිටුවීමට යෝජිතය. ඊට අමතරව මේ පාර්ලිමේන්තුවේ කැමැත්ත පරිදි 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනත 1998 අංක 24 දරන සංශෝධිත පනත පරිදි සංශෝධනය කිරීමට රජය අපේක්ෂා කරනවා. ඒ අනුව රුපියල් 50,000කට නොඅඩු සහ රුපියල් මිලියන 2ක මුදලක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ වසර 2කට නොඅඩු වසර 5කට නොවැඩි අනිවාර්ය සිර දඬුවමකට යටත් කිරීම සිදු කරනවා. ඒ කියන්නේ රුපියල් 50,000ක් තිබෙන දඩය රුපියල් මිලියන 2 දක්වා වැඩි කිරීමටත්, අවුරුදු දෙකක සිර දඬුවම අවුරුදු 5ක් දක්වා වැඩි කිරීමටත් පනත සංශෝධනය කිරීමට අපේක්ෂා කරනවා. ඒ වාගේම පුරාවස්තු විනාශ කිරීමට හා සොරකම් කිරීමට යොදා ගනු ලබන උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ වාහන රාජ සන්තක කිරීමට පනත සංශෝධනය කරනවා. ඊට අමතරව පුරාවස්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරයකින් තොරව පුරාවස්තු ප්‍රවාහනය කිරීම තහනම් කිරීමට ක්‍රියාදාමයක් ගන්නවා. ඊට අමතරව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරයකින් තොරව පෞද්ගලික කෞතුකාගාර පතවත්වා ගෙන යෑම තහනම් කිරීමට ක්‍රියාමාර්ගයක් ගන්නවා. 2012 ජූනි මාසයේ සිට ජූලි මස දක්වා පුරාවිද්‍යා සතිය නිමිති කර ගෙන මාධ්‍ය මෙහෙයුමකින්, ශ්‍රී ලංකා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරනවා. ලාංකික පුරාවිද්‍යා උරුමය පිළිබඳව ජනතාව

දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, වැඩ මුළු යනාදී වැඩ සටහන් සැලසුම් සහගතව ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනවා. ඊට අමතරව පුරාවස්තු සුරැකීම, පුරාවස්තු වනසන්නන් පිළිබඳව සමාජ වගකීම ඉටු කිරීමේ බලය ලත් ප්‍රජා සහ පාසල් පුරාවිද්‍යා සංගම් පිහිටුවීමට සහ උරුම සංසද පාසල්වල ඇති කිරීමට අපි ක්‍රියා කර ගෙන යනවා.

පුරාවස්තු ආඥාපනත යටතේ ස්ථාපිත කොට ඇති පුරා විද්‍යා තෑගි අරමුදල යටතේ පුරාවස්තු අපහරණය කිරීම හෝ විනාශ කිරීම පිළිබඳව තොරතුරු සපයන්නන්ට ත්‍යාග පිරිනැමීමට ක්‍රියා කරනවා. තෝරා ගත් වඩා සංවේදී පුරා විද්‍යා කෞතුකාගාර හා පුරා විද්‍යා ස්ථාන සඳහා ආරක්ෂාව සැපැයීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයන් යෙදවීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන, ඒ සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කර ගෙන යෑමට සැලසුම් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනිත් කාරණය, නීතියෙන් පමණක් අපට මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ නිසා තමයි මේ සම්බන්ධයෙන් ජනතාව අවදියෙන් සිටීම ඉතාම වැදගත් වන්නේ. මෑතකදී ඇති වෙච්ච සිද්ධීන් ගත්තොත් -එකක් තමයි මහවිලච්චිය සිද්ධිය, අනිත් එක මිහින්තලේ සිද්ධිය- ඒ සිද්ධි දෙකේදීම ජනතාව තමයි අවදියෙන් ඉඳලා වටිනා පුරාවස්තු සොරා ගැනීමට හෝ වෙනත් යම් අරමුණක් ඇතිව ආ පිරිස අල්ලලා පොලීසියට භාර දීලා තිබෙන්නේ. පුරාවස්තු ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය යටතේ ඉතාම වැදගත් කාරණය තමයි ජනතාව අවදියෙන් සිටීම.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමා, ඔබතුමා සඳහන් කළා, විලච්චියේ පුරාවස්තු කොල්ල කෑමට ආ පිරිස ඒ ප්‍රදේශයේ ජනතාව විසින් අල්ලලා පොලීසියට භාර දුන්නා කියලා. එතකොට ගරු ඇමතිතුමා, එසේ පොලීසියට අල්ලලා භාර දීපු පිරිස පිළිබඳව ගත් ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)
ගරු මන්ත්‍රීතුමා, පුරා විද්‍යා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. ඒ තමයි මහින්ද වීරක්කොඩි මහත්මයා, උතුරු මැද. මේ සිද්ධිය ආරංචි වෙච්ච සැණෙකින් එතුමා ගිහින් ඒ ගැන පොලීසියට සඳහන් කිරීමක් කළා. එහෙම කරලා එතුමා පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමාට ලිපියක් එවලා කිව්වා, "පුරා විද්‍යා ආඥාපනතේ ප්‍රතිපාදන අනුව එහි 6වැනි වගන්තිය යටතේ අනවසර කැණීම් සම්බන්ධයෙන් වරද සිදු කළ අයවලුන්ට නීතිමය පියවරක් ගැනීම සඳහා පොලිස් ස්ථානාධිපති, විලච්චිය වෙත අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරන ලෙස කරුණාවෙන් ඉල්ලමි" කියලා. එම ලිපිය මා සතුව තිබෙනවා. එතකොට ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය වෙන්නේ මේකයි. පුරාවස්තු ආරක්ෂා කිරීමේ කාර්යභාරය අපේ අමාත්‍යාංශය සතුව තිබුණත්, හොරුන් ඇල්ලීම සහ පුරාවස්තු විනාශ කිරීමට එන පුද්ගලයන් ගැන කටයුතු කිරීමේ බලය අපට නැහැ. ඒක කෙළින්ම තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට අයත් පොලීසිය සතුවයි. ඒක එක ප්‍රශ්නයක්. ඊළඟට මේ විවාදයේදී ඇති වුණු තවත් ප්‍රශ්නයක් තමයි, "සෙට්ටිකුලම ප්‍රදේශයේ සිදු වූ සිදු වීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් සැකකරුවන් දින දෙකකට පසු ඇප පිට නිදහස් කර ඇත" කියන කරුණ. එය අධිකරණය මඟින් සිදු කර ඇති කාර්යයක්. නමුත්, පුරා විද්‍යා ආඥාපනත යටතේ ඔවුන්ට ඇප දීමට අධිකරණයට අයිතියක් නැහැ. මේ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිසම වෙත පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමා කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ නීති අංශයේ නිලධාරි මහත්වරු ඉදිරිපත් කරපු අදහස් සමූහයක් මේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, පොඩි කාරණයක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, තමුන්නාන්සේ ඉඩ දෙනවාද?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)
ඔව්. කමක් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නීතිඥවරයෙක් හැටියට මම දන්නවා, මෙවැනි වෙලාවල්වල සිදු වන ගැටලුව තමයි, පොලීසිය තෝරා ගත් පුද්ගලයන් ගැන තොරතුරු වාර්තා මහේස්ත්‍රාත්තුමාට ඉදිරිපත් කිරීමේදී පුරා විද්‍යා පනතට නොවැටෙන ලෙස උපක්‍රමිකව ඉදිරිපත් කරන අවස්ථා තිබීම. හැම වෙලාවේම කරනවා කියලා මම කියන්නේ නැහැ. පුරා විද්‍යා ආඥාපනත යටතේ මහේස්ත්‍රාත්වරුන්ටත් ඇප දෙන්න බලයක් නැති බව ඇත්ත. එහෙත් ඉදිරිපත් වන තොරතුරු වාර්තා අනුව පුරා විද්‍යා පනත යටතට වැටෙන වරදක් කළ බවට සැක කරන තත්ත්වයක් මතු පිටින් පෙනෙන්නේ නැත්නම් ඇප දීමේ තත්ත්වයක් මතු වෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය රජයේ කොටසක්; ආරක්ෂක අමාත්‍යාංශය රජයේ කොටසක්. එතකොට රජය සමස්තයක් වශයෙන් මේ වගකීම දැරිය යුතුයි නේද?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)
ඔබතුමා ඉදිරිපත් කරපු එක තර්කයක් නීතිඥයකු හැටියට මාත් පිළිගන්නවා. මොකද, පොලීසිය කරුණු ඉදිරිපත් කර තිබෙන ආකාරය උඩ තමයි මහෙස්ත්‍රාත්තුමාට තීන්දුවක් ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. නමුත් අපේ පුරා විද්‍යා කොමසාරිස්තුමා මේ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යනවා නම් - එතුමාටත් නීති උපදේශකයෝ ඉන්නවා- යම්කිසි පදනමක් තිබෙනවා. ඒ ගැන එතුමා දැන් ක්‍රියා කරලා තිබෙනවා. ඒ අනුව මොකක්ද මේ සම්බන්ධයෙන් ඇති වන තත්ත්වය කියලා අපට ඉදිරි කාලයේදී දැන ගන්න පුළුවන්.

බොහෝ දෙනකු මතු කළ ඊළඟ ප්‍රශ්නය තමයි, කෞතුකාගාරයේ ප්‍රශ්නය. කෞතුකාගාරයේ භාණ්ඩ නැති වෙලා දැන් මාස තුනකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා, නමුත් ඒකට ඵලදායී විසඳුමක් තවම ලැබිලා නැහැයි කියන අදහස තමයි ඉදිරිපත් කළේ. නමුත් අපට ලැබී තිබෙන ආරංචි අනුව ඉදිරි කාලයේදී මේ සම්බන්ධයෙන් මේ ගරු සභාවට පැහැදිලි අදහසක් දෙන්න පුළුවන් වෙනවාය කියන එක අප වග කීමෙන් කියනවා. මොකද, අපට ආරංචි මාත්‍රයක් තිබෙන නිසා ඒ අනුව මේ සොරුන් සම්බන්ධව යම් කිසි ක්‍රියා දාමයක් ගැනීමට පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුරාවස්තු කොල්ලකෑම් ආදී ප්‍රශ්න ගැන කථා කරන කොට, ඒවා පක්ෂ දේශපාලනය තුළින් විසඳිය යුතු දේවල් නොවෙයි. මේක ජාතික ප්‍රශ්නයක්; එක්තරා විධියක සමාජ ප්‍රශ්නයක්. ඒ නිසා අපි සියලු දෙනාම එකතු වෙලා මේ සම්බන්ධයෙන් යම් කිසි වැඩ පිළිවෙළක් ඇති කර ගත යුතුයි.

ලංකාවේ ඉතාම සුප්‍රකට, පිළිගන්නා මහාචාර්යවරයෙක් ඉන්නවා රාජ් සෝමදේව කියලා. එතුමා කැලණිය විශ්වවිද්‍යාලයේ

[ගරු ජගත් බාලසූරිය මහතා]

පශ්වාත් පුරා විද්‍යා ආයතනයේ මහාචාර්යවරයෙක්. එතුමා මෙන්න මේ කාරණය පැහැදිලිව කියනවා. ඒක අපි ඉතා අගය කළ යුතු කාරණයක්. එතුමා කියනවා, "මෙරටෙහි දැන් බෙහෙවින් වර්ධනය වන නිධන් පැහැර ගැනීම ගැන තනි වශයෙන් කථා කරනවාට වඩා - අප දේශපාලන වශයෙන් තනි තනිව කථා කිරීම - ඊට වග කිව යුත්තන් සෙවීමේ වගකීම උනුන් වෙත පවරමින් දෝෂාරෝපණය කරනවාට වඩා, මෙම ප්‍රශ්නය විසඳීමෙහි ලා වඩාත් කාර්යක්ෂම උපාය මාර්ග සෙවීමට තම අදහස් හා ශක්තිය ලබා දීමට අත්‍යවශ්‍ය වන්නේ මෙය අපේ රටට පමණක් සීමා වූ අර්බුදයක් නොවන නිසායි."

පුරා වස්තු කොල්ලය ගැන කථා කරන කොට ඒක ගෝලීය මට්ටමේ තිබෙන ප්‍රශ්නයක්. බොහෝ දෙනෙක් ඒ ගැන අවධානය යොමු කරන්නේ නැහැ. විශේෂයෙන්ම අප්‍රිකාවේ, ලතින් ඇමෙරිකාවේ, ආසියාවේ මෙවැනි තත්ත්වයන් ප්‍රචලිතව දක්නට තිබෙනවා. නිධන් හෑරීම යනුවෙන් හැඳින්වෙන ක්‍රියාවලිය ඇතුළු සියලුම පුරාවස්තු නීති විරෝධී අපහරණ කටයුතු පසුබිමේ තිබෙන නිත්‍ය සාධකය තමයි වාණිජ අරමුණ. එබැවින් එය පාලනය කිරීම හා එම අරමුණ වෙත සංවේදී වීම අවශ්‍යයි. පුරාවස්තු හෝ නිධන් සොයන පුද්ගලයාගේ මානසික මට්ටම මොකක්ද? හැකිතාක් ඉක්මනට පොහොසත් වීමයි; ධනවත් වීමයි. මුදල් හඹා යන සමාජයක එවැනි අදහසක් ඇති වීම ගැන අපි පුදුම විය යුතු නැහැ. හැබැයි, මෙම අර්බුදයට ගොදුරු වී ඇති ලෝකයේ බොහෝ රටවල අදාළ ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රධාන ක්‍රියා මාර්ග දෙක තුනක් අනුගමනය කරනවා. එකක්, නීති විරෝධී පුරා වස්තු අපහරණය නැවැත්වීම සඳහා බලවත් නීතිමය රාමුවක් සකස් කිරීම. දැන් අපිත් ඒ සඳහා දෙන අවුරුදු දෙකේ සිර දඬුවම අවුරුදු පහක් කරන්න යනවා, දඩය රුපියල් 50,000 සිට 20,00,000ක් කරන්න යනවා, මේ පාර්ලිමේන්තුවේ කැමැත්ත අනුව. දෙවන කාරණය තමයි, නීති විරෝධී ලෙස පුරා වස්තු වෙළෙඳාම අත්හිටුවීමට අවශ්‍ය කරන අන්තර් ආයතන මට්ටමේ නෛතික රාමුවක් නිර්මාණය කිරීම. තුන්වැනි කාරණය තමයි, සිවිල් සමාජය තුළ ඇති ස්වේච්ඡා සංවිධාන මඟින් මෙවැනි තත්ත්වයක් වැළැක්වීමට යම්කිසි ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කිරීම. උරුමය කියන අපේ අයිතිය, අපේ අනන්‍යතාව කියන සියල්ලම මේ පුරා වස්තුවල ඇතුළත් වෙලා තිබෙනවා.

දැන් පවතින මේ තත්ත්වය නිසාම නීති විරෝධී පුරාවස්තු අපහරණය පාලනය කිරීමට ලෝක මට්ටමින් ප්‍රඥප්ති ඇති වෙලා තිබෙනවා.

1970 සම්මත කර ගන්නා ලද සංස්කෘතික දේපොළ නීති විරෝධී ලෙස අපනයනය කිරීම හා ආනයනය කිරීම වැළැක්වීමේ UNESCO සම්මුතියත්, 1995 වසරේ රෝමයේදී සම්මත කර ගන්නා ලද UNIDROIT සම්මුතියත් යන මේ සම්මුති දෙක ජාත්‍යන්තර වශයෙන් පුරා කොල්ලය පිළිබඳ යම් කිසි ඵලදායී ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා.

නීති විරෝධී පුරාවස්තු අපහරණය මෙරටට ආවේණික වූ, එසේ නොවේ නම් එක්තරා දේශපාලන පක්ෂයක හෝ ආගමික කණ්ඩායමක මූලිකත්වයෙන් කරන කටයුත්තක් නොව, ධනවාදී විවෘත ආර්ථික රාමුවක් තුළ පැරණි ශිෂ්ටාචාරවලට හිමිකම් කියන කවර වූ ද රටක සමාජයකට මුහුණ දීමට සිදු වී තිබෙන තත්ත්වයක් බව අප විසින් අවබෝධ කොට ගෙන, එය පාලනය කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සිදු කළ යුතුයි.

අද මේ විවාදයේදී බොහෝ විට ඍජු ලෙසත්, අනියම් ලෙසත් රාජ්‍ය නායකයන් වෙත විවිධ චෝදනා එල්ල කළ ආකාරයක් අපි දුටුවා. මෙතැනදී අපි කල්පනා කළ යුතු තවත් දෙයක් තිබෙනවා. මොකක්ද එය? යම් කෙනෙක් යම් දෙයකට සම්බන්ධයි කියලා යම් කිසි විධියකින් ආරෝපණය කරනවා නම් එය සාක්ෂි සහිතව ඉදිරිපත් නොකළොත් එය ඒ පුද්ගලයාට කරන විශාල අසාධාරණයක් වනවා.

දේශ ප්‍රේමීභාවය, ජාතිකත්වය ආණ්ඩුවට ඇත්තේ නැහැයි කියන අදහස මෙහිදී ඉදිරිපත් වුණා. අපි ලාංකික දේශපාලන ඉතිහාසය දෙස බලන කොට, ජාතිකත්වය, දේශප්‍රේමීභාවය නැත්නම් රට කෙරෙහි තිබෙන කැක්කුම ගැන ආඩම්බර විය හැකි ඉතිහාසයක් විරුද්ධ පාර්ශ්වයට තිබෙනවාද කියන එක ප්‍රශ්නයක්.

අපි කල්පනා කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. විවිධ යුගවල විවිධ පුද්ගලයන් විසින් යම් යම් ආකාරයෙන් නිධන් කොල්ලකෑම්, පෞරාණික වටිනාකම් ඇති දේපොළ විකිණීම් කළ බව අපි අහලා තිබෙනවා; එවැනි සිද්ධි දැකලා තිබෙනවා. නමුත් අපි අදහස් කරන්නේ නැහැ, කිසිම පුද්ගලයකුට පෞද්ගලිකව පහර දීමට හෝ ඔහුගේ චරිත ඝාතනය කිරීමට. නමුත් ප්‍රසිද්ධ සිද්ධියක් තිබෙනවා. තමුන්නාන්සේලාත් දන්නවා ඇති, ලංකාවේ තිබුණ ඉතාම වටිනාම චිත්‍රයක් තමයි මුල්කිරිගල විහාරයේ තිබුණු චිත්‍රය. අපි දන්නවා ඒ මුල්කිරිගල චිත්‍රය අතුරුදහන් වුණු බව. ජපානයෙන් තමයි ඒක නැවත සොයා ගන්න අපට පුළුවන් වුණේ.

විශේෂයෙන්ම ඕලන්ද යුගයට අයිති වටිනා ගෘහ භාණ්ඩ සමූහයක් යම් යම් අවස්ථාවලදී රටේ ප්‍රධාන පෙළේ ස්ථානලදී නැති වෙලා තිබෙනවා. ඒ සටහන්, අදාළ පොත්වල සඳහන් වෙලා තිබෙනවා, "මෙන්න මේ ගෘහ භාණ්ඩ දැන් නැහැ, නමුත් කලින් තිබුණා" කියලා. නමුත් අපි කිසි කෙනකුට ඒ ගැන චෝදනා කරන්නේ නැහැ. මේ වාගේ සිද්ධි ඉතිහාසය තුළත් දකින්න පුළුවන් දේවල්. ඒ නිසා, අද මේ වාගේ අවස්ථා ගැන අපි කල්පනා කළ යුත්තේ මේක ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රශ්නයක් හෝ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රශ්නයක් විධියට නොවෙයි. ජාතියක් හැටියට අපි සියලු දෙනාම එකතු වෙලා මේ විනාශය, ව්‍යසනය නැවැත්වීමට පොදු, ශක්තිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට ක්‍රියා කිරීම මා හිතන හැටියට ඉතාම වැදගත්. මොකද, මෙය අපේ අනන්‍යතාව පිළිබඳ ප්‍රශ්නයක්; මෙය අපේ ජාතිකත්වය පිළිබඳ ප්‍රශ්නයක්; මෙය අපේ උරුමය පිළිබඳ ප්‍රශ්නයක්. ඒවා එක දේශපාලන පක්ෂයකට සීමා වෙන්නේ නැහැ. ඒ නිසා එතැනදී අපි සියලු දෙනාම එකට එකතු වෙලා ක්‍රියා කළ යුතුයි කියන මතය ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය භාර ඇමතිවරයා හැටියට මම විශ්වාස කරනවා.

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය හැටියට කථා කරනවා නම් මේ රටේ ජීවත් වන සියලුම පුද්ගලයන්ට ඒ උරුමය, අයිතිය තිබෙනවා; සියලුම ආගමිකයන්ට, සියලුම ජාතිකයන්ට ඒ අයිතිය තිබෙනවා. ඒක රැක දීම තමයි අපේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයෙන් කරන මූලික කර්තව්‍යය.

මෙතැනදී මතු වුණ ප්‍රශ්නය තමයි පොලීසිය නිසියාකාරයෙන් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණේ නැහැයි කියන ප්‍රශ්නය. නමුත් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වශයෙන් අපට කරන්න පුළුවන් වන්නේ, යම් කිසි සොරකමක්, යම් කිසි පැහැර ගැනීමක් සිදු වෙලා තිබෙනවා නම්, පුරා විද්‍යා කොමසාරිස්තුමා මඟින් අදාළ පුද්ගලයන්ට එනම්, පොලීසියට හෝ වෙනත් වග කිව යුතු ආරක්ෂක අංශවලට ඉදිරිපත් කිරීමයි. ආරක්ෂක අංශයේ ක්‍රියාමාර්ගයන් ගැනීමට අපේ අමාත්‍යාංශයට බලයකුත් නැහැ, අයිතියකුත් නැහැ. අපේ විෂය පථයට ඒක ඇතුළත් වෙන්නේ නැහැ. අපට කරන්න තිබෙන්නේ යම් කිසි දෙයක් සිදු වෙලා තිබෙනවා නම් ඒක දැන්වීම පමණයි.

මේ අවස්ථාවේදී අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමා පැවසුවා වාගේම, මේ කල් තබන විවාදයක් තිබෙන අවස්ථාවක

සාමාන්‍යයෙන් එංගලන්තය වැනි රටවල පාර්ලිමේන්තු සම්ප්‍රදායේ තිබෙන ඉතාම වැදගත්කමක් තමයි ඒ යෝජනාව කරපු පුද්ගලයාත්, ස්ථිර කරපු පුද්ගලයාත් අවම වශයෙන් පාර්ලිමේන්තුවේ හෝ ව්‍යවස්ථාදායකයේ රැඳී සිටීම. ඒක මූලික සදාචාර සම්පන්න ක්‍රියාමාර්ගයක්. ඉන් අදහස් කරන්නේ නැහැ, අපේ කථා අහන්න ඔවුන් රැඳී සිටිය යුතුයි කියන එක. නමුත් එවැනි සම්ප්‍රදායයන් පාර්ලිමේන්තු ක්‍රමවේදයේ දකින්නට තිබෙනවා. ඉතින් අපි අනාගතයේදී හෝ මෙවැනි යෝජනා ඉදිරිපත් කරලා මේ පාර්ලිමේන්තු සභා ගර්භයෙන් පිටවී ගොස් සිටීම අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදායට ගැළපෙන කර්තව්‍යයක් නොවෙයි කියන විශ්වාසය මා තුළ තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, ඊයේ දින සභාව කල් තබන යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේදී අඩු ගණනේ ඊට උත්තර දෙන්න ආණ්ඩුවේ ඇමතිතුමා හිටියෙත් නැහැ.

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

ගරු මන්ත්‍රීතුමනි, මම මේ එක කණ්ඩායමකට කියනවා නොවෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

එහෙම කියන්න එපා. ගරු අස්වර් මන්ත්‍රීතුමා කියපු කථාවත් මම අහගෙන සිටියා. අපි කවුරුත් දන්නවා, සභාව කල් තැබීමේ යෝජනාවක් සම්බන්ධයෙන්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Minister is only expressing his view.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අපට ඒක සුදුසු නැහැ. මේ විවාදය කරන්න ඉන්නේ අපි. ඊට පස්සේ මෙතැන කවදාවත් සභාව කල් තැබීමේ යෝජනාවක් කරන්න වෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

He is only pointing out that it is customary; it is a tradition.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

එක එක මන්ත්‍රීවරුන්ට යම් යම් ප්‍රශ්න තිබෙනවා. ඔය තීරණය ගන්න එපා. ඔය තීරණය ගත්තොත් එහෙම ඕක ඉවරයක් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි, එතුමාට කථා කරන්න දෙන්න.

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවේ කවුරු කළත්, විරුද්ධ පක්ෂයේ කවුරු කළත් මේක පාර්ලිමේන්තු සම්ප්‍රදායකට ගැළපෙන්නේ නැහැ කියන එක විතරයි අපි ඉදිරිපත් කරන්නේ. ඒකට හොඳම උදාහරණය පාර්ලිමේන්තු ක්‍රමයේ ප්‍රධාන -මව්- පාර්ලිමේන්තුව හැටියට සැලකෙන එක්සත් රාජධානිය ගත්තාම එහි පාර්ලිමේන්තුවේ මෙවැනි සම්ප්‍රදායක් නැහැ. ඒක ආණ්ඩු පක්ෂයෙන් කළත් වැරැද්දක්. විරුද්ධ පක්ෂයෙන් කළත් වැරැද්දක්. අපි දන්නවා, බොහෝ විට මන්ත්‍රීවරුන්ට කාර්ය භාරයන් තිබෙනවා. නමුත් අවම වශයෙන් යෝජනාව ගෙනාපු මන්ත්‍රීවරයාවත් පාර්ලිමේන්තුවේ රැඳී සිටීම සදාචාර සම්පන්න දෙයක් කියන අදහස පළ කරමින් මම මගේ අදහස් පළ කිරීමේ කථාව මෙතැනින් අවසන් කරනවා. සාවධානව මගේ කථාවට කන් දුන් අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත්, මෙතැන රැඳී සිටි මන්ත්‍රීතුමාටත් අපේ ස්තුතිය හා කෘතඥතාව පළ කරමින් මගේ වචන ස්වල්පය මින් අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි. ඔබතුමාටත් ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.05ට, 2012 ජූනි මස 05 වන අඟහරුවාදා අ.භා.1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 7.05 மணிக்கு பாராளுமன்றம், 2012 யூன் 05, செவ்வாய்க்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.05 p.m. until 1.00 p.m. on Tuesday, 05th June, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.